


# 2018 මාර්තු මාසයේ මහනුවර දිස්ත්‍රික්කයේ ඇති වූ මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කරුණු සෙවීමේ වාර්තාව

LAW & SOCIETY TRUST

# 2018 මාර්තු මාසයේ
# මහනුවර දිස්ත්‍රික්කයේ ඇති වූ
# මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන්
# කරුණු සෙවීමේ වාර්තාව

# 2018 මාර්තු මාසයේ මහනුවර දිස්ත්‍රික්කයේ ඇති වූ මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කරුණු සෙවීමේ වාර්තාව

LAW & SOCIETY TRUST

© නීතිය හා සමාජ භාරය 2021

LAW & SOCIETY TRUST

නීතිය හා සමාජ භාරය
3, කින්සි ටෙරස්
කොළඹ 8

දුරකථන : +94112684845
+94112691228
ෆැක්ස් : +94112686843
වෙබ් : lstlanka.org
ඊමේල් : admin@lstlanka.org
ෆේස්බුක් : www.facebook.com/lstlanka
ට්විටර් : @lstlanka

ISBN : 978 - 624 - 5545 - 04 - 9

පටුන

විධායක සාරාංශය........................................................................................ 01

1 වැනි පරිච්ඡේදය - හැඳින්වීම........................................................................... 11

2 වැනි පරිච්ඡේදය - දිගන, තෙල්දෙණිය හා අකුරණ ඇති වූ ප්‍රචණ්ඩත්වය...................... 14

3 වැනි පරිච්ඡේදය - අකුරණ 8 කණුව ප්‍රදේශය (2018 මාර්තු 7) සම්බන්ධයෙන් සිදුකළ සිද්ධි අධ්‍යයනය................................................................................................ 35

4 වැනි පරිච්ඡේදය - ප්‍රතිවිපාක පිළිබඳ සටහන්.............................................................. 43

5 වැනි පරිච්ඡේදය - නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගෙන් ලැබුණු වාචික සාක්ෂි........... 52

6 වැනි පරිච්ඡේදය - ප්‍රචණ්ඩත්වයෙන් පසුව ඇතිවූ තත්වය තුළ ප්‍රදේශයේ බෞද්ධ භික්ෂූන්ගේ අදහස්.................................................................................................. 59

7 වැනි පරිච්ඡේදය - සහන ක්‍රියාමාර්ග........................................................................ 62

8 වැනි පරිච්ඡේදය - 2018 මාර්තු මාසයේ සිදුවීම් සම්බන්ධයෙන් දේශපාලන ක්‍රියාධරයින් දැක්වූ අදහස් ..................................................................................................... 66

9 වැනි පරිච්ඡේදය - සිවිල් සමාජ මැදිහත්වීම්................................................................ 72

10 වැනි පරිච්ඡේදය - දේශීය හා විදේශීය මාධ්‍ය මගින් සිදුවීම් වලට ලබාදුන් ආවරණය ..................................................................................................... 77

ආශ්‍රේය ලේඛන නාමාවලිය.......................................................................................... 91

ස්තූතිය

ආචාර්ය විජය ජයතිලක (පේරාදෙණිය විශ්වවිද්‍යාලය), මහචාර්ය ෂාමලා කුමාර් (පේරාදෙණිය විශ්වවිද්‍යාලය), ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අර්ජුන පරාක්‍රම (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) සහ මහාචාර්ය සුමති සිවමෝහන් (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) යන මහත්ම මහත්මීන්ගෙන් සැදුම් ලත් පර්යේෂණ කණ්ඩායමේ අනුබලය ඇතිවකොළඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ෆර්සානා හනීෆා විසින් මෙම වාර්තාව සම්පාදනය කරන ලදී.

මෙම කරුණු සෙවීමේ මෙහෙවර සඳහා සංවිධානමය, තාක්ෂණික, පරිපාලන මෙන්ම පර්යේෂණ හා ප්‍රකාශන සහය නීතිය සහ සමාජ භාරයෙන් ලබාදෙන ලදී. විශේෂයෙන්ම, නීතිය හා සමාජ භාරය කණ්ඩායමේ සාමාජික මෙගාරා ටීගල් ක්ෂේත්‍රයේ දී අවශ්‍ය කටයුතු සංවිධානයට සහය ලබාදීමෙන්, වාර්තාව සඳහා අමතර පර්යේෂණ කටයුතු සිදුකර දීමෙන්, හා වින්දිතයින්ට රජයෙන් ලබාදෙන ආධාර සම්බන්ධයෙන් මෙම වාර්තාවේ කොටසක් ලිවීමෙන් ද සහය වන ලදී. කලම්බෝ ප්ලෑන් විද්‍යාර්ථී ඔලිවර් ෆ්‍රීඩ්මන් පර්යේෂණ කටයුතු සහ වාර්තාව ලිවීමට ලබාදුන් සහය වෙනුවෙන් ස්තූතිවන්ත වන්නෙමු. එසේම, නයිජල් නුගවෙල අදාළ ප්‍රදේශවලට පර්යේෂණ චාරිකා සැලසුම්කිරීමට සහය ලබාදීමෙන් ද; නීතිය හා සමාජ භාරයේ සංස්කාරක දිල්හාරා පතිරණ මෙම ප්‍රකාශනය සඳහා සහය ලබාදීමෙන් ද; සන්නිවේදන නිලධාරිනී අමලිනී ද සේරා මෙම වාර්තාවේ පිටකවරය සඳහා ඡායාරූපය සැපයීමෙන් ද; විධායක අධ්‍යක්ෂිකා ආචාර්ය සකුන්තලා කදිර්ගාමර් මෙම වාර්තාව ප්‍රකාශනය සඳහා මෙන්ම, විවිධ ප්‍රමාදවීම් හා අභියෝග මධ්‍යයේ පවා එය සම්පූර්ණ කරන්නට සහය දීමෙන් ද දයක වන ලදී, මෙම වාර්තාව ප්‍රකාශනය සඳහා සංස්කරණය කරනු ලැබුවේ සකුන්‍යා විග්නරාජා විසින් ය.

නජා මොහමඩ්, සම්සුදීන් අබ්දුල් හලීම් ඉෂාක් (අකුරණ, කුරුගොඩ මුහියදීන් ජුම්මා මුස්ලිම්පල්ලියේ ලේකම්), මඩවල පීර් මොහමඩ් නිසාම්දීන් මොහමඩ් ෂෆ්රාස් සහ බලගොල්ල විහාර අභිවර්ධන සමිතිය මෙහි ක්ෂේත්‍ර වැඩකටයුතු සඳහා සහාය දුන්හ.

එමෙන් ම, දිගන ආපදා සේවා මධ්‍යස්ථානයේ ආචාර්ය ලරීෆ් සුබයිර් සහ ඔහුගේ කණ්ඩායමෙන් ක්ෂේත්‍ර සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සඳහා අපට අගනා සහයෝගයක් ලැබුණි.

මෙම කර්තව්‍යය වෙනුවෙන් තමන්ගේ කාලය කැපකරමින්සහාය ලබා දුන් මහනුවර දිසාපතිවරයා ගෙන් සහ අදාළ රජයේ නිලධාරීන්ගෙන් ද, බලපෑමට ලක් වූ ප්‍රදේශවල ප්‍රජා නායකයින්ගෙන් ද ලැබුණු සහාය ස්තූතිපූර්වකව සිහි කරන්නෙමු.

මෙම බේදවාචකයේ මනුෂ්‍ය මුහුණුවර වාර්තාගත කිරීමට සහ, මෙවැනි ගැටුම් 'ඉබේ ඇති වන' ඒවා නොව, බොහෝවිට මේවා ඇතිකරවනු ලබන ඒවා බව අවධාරණය කිරීමට නීතිය හා සමාජ භාරය විසින් මෙම කරුණු සෙවීමේ මෙහෙවරට සහාය ලබාදෙන ලදී. මහජනතාව වන අපි මේ පිළිබඳව දැනුවත් නොමැතිනම්, මේ අන්දමින් වෛරය ඇතිකරවනු ලැබීම නොකඩවා නැවත් නැවතත් සිදුවනු ඇත.පාස්කු ඉරිදා (2019)සිදු වූ බෝම්බප්‍රහාර සහ ඉන් පසුව ඇතිවූ විවිධ සිදුවීම් නිසා දිගන බේදවාචකය කෙරෙහි යොමු වූ අවධානය මැකී ගොස් ඇතත්, සංවාදය සඳහාත්, බලපෑමට හා අවදානමට ලක්ව සිටින සියලුම පුද්ගලයින් ආරක්ෂා කිරීම පිණිස සාධනීය ක්‍රියාමාර්ග ගැනීම සඳහාත්, ප්‍රචණ්ඩත්වයෙන් තොර අනාගතයක් ගොඩනැගීම උදෙසා රජයෙහිසහ ප්‍රජාවන් ගේ කැපවීම සඳහාත් අන් කවරදකටත් වඩා වර්තමානයේ දී අවශ්‍යතාවය ඇතිවී තිබෙන බව අපි අවධාරණය කරන්නෙමු.

**විධායක සාරාංශය**

මෙම වාර්තාව මහනුවර දිස්ත්‍රික්කයේ දිගන සහ ඒ ආසන්න ප්‍රදේශවල 2018 මාර්තු මාසයේ දී සිදු වූ මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩත්වය පිළිබඳව විස්තරයක් වේ. මෙම මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩත්වයෙහි ප්‍රතිඵලයක් වශයෙන් රටපුරා දින 10ක හදිසි අවස්ථා තත්වයක් ප්‍රකාශයට පත් කිරීමත්, සමාජ මාධ්‍ය වෙත ප්‍රවේශ වීම සීමා කරනු ලැබීමත්, පුද්ගලයින් සියයකට (100) ආසන්න සංඛ්‍යාවක් අත් අඩංගුවට ගනු ලැබීමත් සිදු විය. කෝලාහලකරුවන් නිවාස 33කට දැඩි හානි ද, නිවාස 256කට අර්ධ හානි ද සිදුකළ අතර කඩසාප්පු 163ක් සහ වාහන 47ක් ද විනාශ කළහ. තව ද, විවිධ ස්ථානවල වූ මුස්ලිම් පල්ලි 20කට හානි පමුණුවන ලදී (ඇමුණුම 01 බලන්න).

අදාළ ප්‍රදේශයෙහි සිදුකළ ක්ෂේත්‍ර චාරිකා 5ක්, වැදගත් තොරතුරු ලබාදෙන්නන් සමගමහනුවර සහ කොළඹ දී සිදුකළ සම්මුඛ සාකච්ඡා, සිදුවීම සම්බන්ධයෙන් පළ වූ පුවත් වාර්තා පිළිබඳ සමීක්ෂණයක්,සහ සිදුවීමෙන් පසුව දේශපාලනඥයින් ඒ පිළිබඳව දැක්වූ, මාධ්‍ය මගින් ආවරණය කරන ලදප්‍රතිචාර මත පදනම් ව මෙම වාර්තාව සම්පාදනය කර තිබේ.

2009 වර්ෂයේදී යුද්ධය අවසාන වූ තැන් පටන් පෝෂණය වෙමින්, මෙරට සිංහල භාෂාව කථාකරන ප්‍රදේශවලමෙන්ම දෙමළභාෂාව කථාකරන ප්‍රදේශවල ද සැලකියයුතු අනුගාමික පිරිසක් බිහි කර ගෙන තිබෙන, සුපතළ මුස්ලිම්-විරෝධී ව්‍යාපාරය පසුබිම තුළ මෙකී කලහකාරීන්ගේ ප්‍රචණ්ඩත්වය නොහොත් 'කෝලාහළය' ස්ථානගත කිරීමට මෙම වාර්තාවෙන් කටයුතු කරයි. මුස්ලිම්-විරෝධී ව්‍යාපාරයේ සාර්ථකත්වය කෙතරම් ද යත්, සාමාන්‍යයෙන් මැතිවරණ කාලයට අනුරූප වන පරිද්දෙන් කලින් කලට මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩත්වය මුදාහැරීමට පවා හැකි වී තිබේ. දිගන ප්‍රදේශයේ ප්‍රචණ්ඩ ක්‍රියා ඇති වූයේ මැතිවරණ ප්‍රචාරක මෙවලමක් වශයෙන් සුළුතර-විරෝධී හැඟීම් තදින් ම යොදාගනු ලැබූ පළාත්පාලන ආයතන මැතිවරණයකින් සති කිහිපයකට පසුව වේ. තව ද, ප්‍රකාශිත මුස්ලිම්-විරෝධී න්‍යායපත්‍රයක් සහිත මහසෝන් බලකායේ කැඳවුම්කරු වන අමිත් වීරසිංහගේ කාර්යාලයක් ද ප්‍රචණ්ඩත්වය සිදු වූ මෙම ප්‍රදේශය ආසන්නයේ පිහිටා තිබේ. එබැවින්, රාජපක්ෂවරුන්ගේ නායකත්වයෙන් යුත් 'පොහොට්ටුව' පක්ෂය පළාත්පාලන ආයතන මැතිවරණය ජයග්‍රහණය කිරීම ද, මුස්ලිම්-විරෝධී හැඟීම් වපුරුවන සංවිධානයක් එම ප්‍රදේශයේ පිහිටා තිබීම ද මෙම සිදුවීම් වලට සැලකියයුතු දායකත්වයක් ලබාදී ඇති සාධක වශයෙන් වටහාගනු ලැබේ.

මෙම වාර්තාව මගින් පහත කරුණු ආවරණය කෙරේ: සිදුවීම් ඇතිවීමට මගපෑදුණු පසුබිම,සිදුවීම් වලින් පීඩාවට පත් වූ පුද්ගලයින් විසින් විස්තර කරන ලද පරිදි අදාළ ප්‍රචණ්ඩ ක්‍රියා, විවිධ ජනවාර්ගික-ආගමික කණ්ඩායම් නියෝජනය කරන ප්‍රජා නායකයින් විසින් විස්තර කරනු ලැබූ පරිද ප්‍රචණ්ඩක්‍රියාවලට පෙරාතුව මහනුවර ප්‍රදේශයේ පැවති පසුබිම,තෝරාගත් රජයේ නිලධාරීන් විසින් ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලට ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන්ලබාදුන් පැහැදිලිකිරීම්, සහ සිදුවීම් සම්බන්ධයෙන් දේශපාලනඥයින් දැක්වූ ප්‍රතිචාර විස්තර කෙරෙන පුවත් වාර්තා. ප්‍රචණ්ඩත්වයට මුහුණ දුන් පුද්ගලයින්ගේ එම අත්දැකීම් සඳහා වලංගුභාවය ලබාදීමට මෙන් ම විවිධ භූගෝලීය ප්‍රදේශවල සිදුවූ ප්‍රහාර අතර ඇති සමානතා හා රටාවන් අවධාරණය කිරීමටත් මෙම ප්‍රචණ්ඩකාරී සිදුවීම් ඒවාට මුහුණදුන් අය විසින් විස්තර කරන ලද පරිද්දෙන් ම ඉදිරිපත් කර තිබේ. දේශපාලන නියෝජිතයින්ගේ මැදිහත්වීම් සම්බන්ධයෙන් විස්තරයක් ඉදිරිපත් කර ඇත්තේ පහත සඳහන් හේතු මත වේ: අළුත්ගම සිදුවීම්වලින් අනතුරුව ඇති වූ තත්වය තුළ මුස්ලිම් ජනතාව වෙත දෝෂාරෝපණය එල්ල කෙරෙන අන්දමෙන් මේ සම්බන්ධයෙන් වූ වෘත්තාන්තය හැසිරවීමට විවිධ මට්ටම්වලදී රජයේ නියෝජිතයින් විසින් වෑයම් දරන ලදී. පොලිස්පතිවරයා, මානව හිමිකම් කවුන්සිලයට සහභාගී වූරජයේ නියෝජිතයින් සහ එකල බලයේ සිටි රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් මුස්ලිම් ජනතාවගේ සදෝෂත්වය පිළිබඳ එක සමාන වූ වෘත්තාන්තයන් ඉදිරිපත් කරන ලදී.[1] දිගන සිදුවීමෙන් අනතුරුව රජය එවැනි තැතක් දැරූ බවක්පෙනෙන්නට නොතිබුණි. ප්‍රහාරය සඳහා රජයෙන් විවෘතව සහාය ලබාදීමක් සිදු නොවූ බව අවබෝධ කරගැනීම සඳහා රජයේ මේ වාගාලංකාරමය ප්‍රතිචාරය අවධානයට ගැනීම උචිත යැයි අපි සලකන්නෙමු. කෙසේනමුත්, ප්‍රචණ්ඩත්වය සිදුවීම වැළැක්වීම සහ පළමු ප්‍රහාරය වාර්තා වූ වහාම එය තවදුරටත්පැතිර යාම පාලනය කිරීම සම්බන්ධයෙන් රජය ඵලදායී අන්දමින් කටයුතු කිරීමට අපොහොසත් වී තිබේ. මෙම

[1]Farzana Haniffa et al, *Where Have All the Neighbours Gone? Aluthgama Riots and Its Aftermath: A Fact-Finding Mission to Aluthgama, Dharga Town, Valipanna, and Beruwela*, Law and Society Trust 2014.

ප්‍රචණ්ඩත්වය නැවැත්වීමට රජයට නොහැකි වීම සහ මේ සම්බන්ධයෙන් රජය දැක්වූ ඇල්මැරුණු ස්වභාවයේ ප්‍රතිචාරය මගින් මුස්ලිම් ජනතාවට පෙන්නුම් කෙරුනේ මෙම ප්‍රචණ්ඩත්වය එක් ආණ්ඩුවකට සීමා වූවක් නොවන බවකි. මහනුවර ඇති වූ ප්‍රචණ්ඩකාරී තත්වයට ආණ්ඩුවෙන් ප්‍රමාණවත් ප්‍රතිචාරයක් නොදැක්වීම මුස්ලිම් ජනතාවට එරෙහි ප්‍රචණ්ඩත්වය ශ්‍රී ලංකාවේ නව 'සාමාන්‍ය තත්වයෙහි' කොටසක් බවට පත්වීමට හේතු විය.

**සොයාගත් ප්‍රධාන කරුණු**

**නව සාමාන්‍ය තත්වය බවට පත් වූ මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය**

2015 ජනාධිපතිවරණයේ දී පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන ලැබූ ජයග්‍රහණය හරහා මුලින්ම බලයට ආ යහපාලන ආණ්ඩුවට එසේ බලයට පත්වීමට එකල ජනපති මහින්ද රාජපක්ෂට එරෙහි සැලකියයුතු මුස්ලිම් ඡන්ද සංඛ්‍යාවක් ලැබීම උපකාරී විය. රාජපක්ෂ පාලනයට එරෙහිව එලෙස ඡන්දයදීම 2012 වර්ෂයේ සිට ම එම පාලනයඅනුගමනය කළ මුස්ලිම්-විරෝධී ව්‍යාපාරය පෝෂණය කිරීමේ ක්‍රියාමාර්ගයට සහ 2014 වර්ෂයේ අළුත්ගම දී මුස්ලිම් ප්‍රජාවන්ට එරෙහිව මුදාහළ ප්‍රචණ්ඩත්වයට එම පාලනය ව්‍යංගයෙන් කැමැත්ත පළකිරීමට විරෝධතාවය දැක්වීමක් වශයෙන් සලකනු ලැබීය. ඒ අනුව, යහපාලන ආණ්ඩු සමයේ මහනුවර දී සිදුවූ ප්‍රචණ්ඩත්වය කම්පනය ඇතිකරවන්නක්වූ අතර, එවැනි ප්‍රචණ්ඩ ක්‍රියා එක් ආණ්ඩුවකට සීමා නොවන බවත්, කවුරුන් බලයේ සිටිය ද එය නොතකා ප්‍රාදේශීය නගරවල වෙසෙන, ප්‍රමාණයෙන් කුඩා මුස්ලිම් ප්‍රජාවන් මත පහසුවෙන් ම ප්‍රචණ්ඩත්වය මුදාහැරිය හැකි බවත් ඉන් පැහැදිලිව පෙන්වා දුන්නේ ය. 2017 වර්ෂයේ ගාල්ලේ ගිංතොට දී සහ මහනුවර සිදුවීමට සති කිහිපයකට පෙර අම්පාරේ දී වශයෙන් යහපාලන ආණ්ඩු සමය තුළ මුස්ලිම්-විරෝධී සිදුවීම් කිහිපයක් ම සිදු විය. කෙසේනමුත්, එම සිදුවීම් ප්‍රමාණයෙන් කුඩා වූ අතර එතරම් දීර්ඝ කාලයක් පැවතියේ ද නැත. මහනුවර ඇතිවූ සිදුවීම්වලට මගපාදමින් ඊට පෙරාතුව දීර්ඝ සිදුවීම් මාලාවක් සිදුව තිබේ. 2018 පෙබරවාරි 22වැනි දින තෙල්දෙණිය ප්‍රදේශයේ කුඩා ගම්මානයක ජීවත්වූකුමාරසිංහ නම් තරුණයෙකුටඑම ප්‍රදේශයේ ඉන්ධනහලක දී මුස්ලිම් තරුණයින් සිව් දෙනෙකු විසින් පහර දී තිබේ. 2018 මාර්තු 2වැනි දින කුමාරසිංහ ගේ මියයාම සම්බන්ධ පුවත් නිකුත්වීමත් සමග ප්‍රදේශයේ කලබලකාරී තත්වය තවදුරටත් උග්‍ර වී තිබේ. අවසානයේ දී ඔහුගේ අවමංගල්‍යය පැවැත්වූ මාර්තු 5වැනි දින ප්‍රචණ්ඩත්වය පුපුරාගොස් තිබේ. අවසානයේ දී මෙසේ ඇවිළුණු ප්‍රචණ්ඩත්වය බලධාරීන්ට ද පාලනය කරගත නොහැකිව දින කිහිපයක් පුරා පැතිර යද්දී නිරීක්ෂකයින් බොහෝ දෙනෙකුට පැහැදිලි වූ කරුණ වූයේ රාජපක්ෂවරුන්ගේ මතවාදයට වෙනස් මතවාදයක් සහිත පාලනතන්ත්‍රයක් බලයට ගෙන ඒම ම රටතුළ මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහතික කරන්නක් නොවන බව ය.

**ප්‍රචණ්ඩත්වයේ දිස් වූ රටාව**

දිගන සහ අළුත්ගම ප්‍රදේශවල සිදු වූ ප්‍රචණ්ඩක්‍රියා අතර ඇති සමානකම් මෙහි දී අවධානයට ගැනීම වැදගත් වේ. අදාළ සිදුවීම්වලට ආසන්න පූර්ව දින වලදී සමාජ මාධ්‍ය තුළ වෛරී වාගාලංකාරයෙහි විශේෂයෙන් හඳුනාගත හැකි වර්ධනයක් පෙන්නුම් කළ, අතර විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ලේඛනගත කර ඇති පරිදි, ප්‍රචණ්ඩත්වය ව්‍යාප්ත වූ දින කිහිපය මුළුල්ලෙහි ම එම වෛරී වාගාලංකාර සමාජ මාධ්‍ය ඔස්සේ දිගින් දිගටම පැතිරී තිබේ. මහනුවර සිදුවීමට හේතු පාදක වූ සිද්ධියට පෙරාතුව මුස්ලිම් විරෝධී සිද්ධීන් කිහිපයක්ම ඇති වී තිබේ. අළුත්ගම ප්‍රදේශයේ ද, අවසානයේ ප්‍රචණ්ඩත්වය පැතිරයාම ආරම්භ වීමට මාසයකට ආසන්න කාලයකට පෙරාතුව සිට ම එම ප්‍රදේශයේ නොඉවසීමේ තත්වයන් දක්නට ලැබී තිබේ. ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට ප්‍රදේශයේ ප්‍රජා සාමාජිකයින් වෑයම් දරා තිබේ. අළුත්ගම සිදුවීමේ දී ද, අළුත්ගම සහ කොළඹ මුස්ලිම් ක්‍රියාධරයින් පොලීසිය සමග රැස්වීමකටසහභාගී වී බොදු බල සේනා සංවිධානය විසින් පැවැත්වීමට නියමිතව තිබූ කලහ අවුළුවනසුළු ජනහමුව නැවැත්වීමට වෑයම් දරා තිබේ. එහෙත් එකී මහජන රැස්වීම පැවැත්වීමට ඉඩ දෙන මෙන් තමන්ට ඉහළින් නියෝග ලැබී ඇති බව පොලීසිය ඔවුන්ට පවසා තිබේ. අපේක්ෂා කළ පරිද්දෙන් ම, එම ජනහමුව අවසානයේ දී ප්‍රචණ්ඩත්වය ඇතිවිය. දිගන සිදුවීමේ දී ඒ අන්දමින් කලහ ඇවිලවීමට මූලික වූයේ බීමත් (මුස්ලිම්) තරුණයින් හතරදෙනෙක් සමගින් ඇතිවූ අඩදබරයකින් පසුව මියගිය කුමාරසිංහ ගේ අවමංගල්‍ය උත්සවයයි. පැවති කලබලකාරී තත්වය සමනය කිරීම සඳහා මහනුවර මුස්ලිම් දේවස්ථාන කාරක සභාවේ සාමාජිකයින් හා අනෙකුත් ප්‍රජා නායකයින්, පොලීසිය සහ ගමේ විහාරස්ථානයේ භික්ෂූන්වහන්සේ උත්සාහ දරා තිබේ. එම

අවමංගල්‍ය උත්සවය ප්‍රසිද්ධ උත්සවයක් වශයෙන් පැවැත්වීම වැලැක්වීමට අධිකරණයෙන් නියෝගයක් ලබාගැනීමට පොලීසිය කටයුතු කර තිබුණි. අවමංගල්‍ය උත්සවය පැවැත්වීමට නියමිතව තිබූ ගමෙහි භික්ෂූන්වහන්සේවන පූජ්‍ය උපාලි ඥානිස්සර හිමියන් ද මුස්ලිම් නිවාසවලට පහරදීම සඳහා ඒකරාශී වූ කලහකාරී පිරිස් නැවැත්වීමට බලහත්කාරයෙන් මැදිහත් වී තිබේ. කුමාරසිංහ ගේ ගම්මානය වූ අඹල ප්‍රදේශයේ ප්‍රචණ්ඩ ක්‍රියා සිදුකිරීම සඳහා ඉඩ ලබා දී නොමැත. කෙසේනමුත්,එම මාර්ගයේම කිලෝමීටර කිහිපයක් ඔබ්බෙන් පිහිටා ඇති තෙල්දෙණිය නගරයේ සහ දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශවල පැතිර ගිය සංවිධානාත්මක ප්‍රචණ්ඩ ක්‍රියා නවත්වාලීම සඳහා ගම් මට්ටමින් ප්‍රමාණවත් මැදිහත්වීම් සිදුවී නොතිබුණි. පැවතියේ කුමන මට්ටමක තර්ජනයක් යන්න ඇගයීමක් කිරීමට හෝ එයට උචිත පරිදි ප්‍රතිචාර දැක්වීමට හෝ බලධාරීන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත්තේද යන්න තවමත් ප්‍රශ්නයකි. ඇතැම් දේශපාලනඥයින් පෙන්වාදෙන අන්දමට (පහත කියවා බලන්න) යම් කාලයක් තිස්සේ මෙම නොඉවසීම් තත්වයන් ඔඩුදුවමින් තිබූ බව පැහැදිලි ය.

ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක වූආකාරයෙහි සමානකම් තිබුණි. කලහකාරීන් මුලින් ම සී.සී.ටී.වී. කැමරා පද්ධති විනාශ කර, ඉන් පසුව නිවාස හා කඩසාප්පු විනාශ කර තිබේ. විවිධ කණ්ඩායම්වලට විවිධ කාර්යයන් පවරා තිබූ බවක් පෙනුණි. විවිධ ස්ථානවල මීට සමාන ක්‍රමවේදයක් භාවිතා වී ඇතිබව වාර්තා වී තිබේ. අළුත්ගම ප්‍රදේශයෙන් ලැබුණු විස්තර හා සමානව ම, මෙහි දී ද පීඩාවට ලක් වූ පුද්ගලයින් (විශේෂයෙන්ම දිගන වෙළඳපොළෙහි සහ වෙලේකඩේ ප්‍රදේශයේ) සඳහන් කළ පරිදි, ප්‍රහාර සිදුවෙමින් පැවති අතරතුරඑම ප්‍රදේශයේ සෑහෙන පොලිස් නිලධාරීන් පිරිසක් සිටි නමුත් එමප්‍රහාරකයින් නැවැත්වීමට පොලීසිය එතරම් උත්සාහයක් දරා නැත.

පහරදෙනු ලැබුවේ පුද්ගලයින් කිහිපදෙනෙකුට පමණක් වීම අළුත්ගම සිදුවීමත් මෙම සිදුවීමත් අතර ඇති තවත් සමානකමකි. ප්‍රහාරකයින් ඉලක්ක කර තිබුණේ පහළ මැද පාන්තිකයින්ට අයත් කුඩා නිවාසවල සිට ධනවත් ඉහළ මැද පාන්තිකයින්ට අයත් විශාල මැදුරු දක්වා වූ දේපළ වේ. තවද, කුඩා සිල්ලර අළෙවිසැල්වල සිට සුඛෝපභෝගී ගෘහභාණ්ඩ අළෙවිසැල් ද, ප්‍රදේශයේ ජනතාව සේවය කළ කර්මාන්ත ශාලා ද දක්වා වූ ලොකු කුඩා ව්‍යාපාර ස්ථාන 163ක් ප්‍රහාරයට ලක් වී තිබුණි. මහනුවර සහ අළුත්ගම යන සිදුවීම් දෙකෙහි දී ම පුද්ගලයින්ට එරෙහිව සිදුවූ බරපතළ ප්‍රචණ්ඩකාරී සිදුවීම් අවම වශයෙන් එකක් වත් වාර්තා විය. අළුත්ගම දී එක් පුද්ගලයකු කපාකොටා මරාදැමීමේ සිදුවීමක් පිළිබඳ වාර්තාවක් අපට හමුවිය. දිගන ප්‍රදේශයේදී වයස්ගත මුස්ලිම් පුද්ගලයෙක් බස් රථයකින් එළියට ඇද දමා සිහිසුන් වන තෙක් පහරදීමක් පිළිබඳ වාර්තා විය. මෙම පුද්ගලයා නැවතත් යථා තත්වයටපත් නොවූ අතර 2018 වර්ෂයේ පසු කාලයේ දී ඔහු තම තුවාළ හේතුවෙන් මරණයට පත් වූයේ ය. මෙවැනි සිදුවීම් තවතවත් සිදු නොවීමෙන් පෙන්නුම් කරන්නේ ප්‍රචණ්ඩත්වය සඳහා තිබූ ප්‍රවණතාවය පාලනයකට ලක් වී ඇති බවය. මෙම සිදුවීම් ද විශේෂිත සිදුවීම් ලෙස කැපී පෙණුනි. සාමාන්‍යයෙන් සිදුව ඇත්තේ පුද්ගලයින් ඔවුන්ගේ නිවෙස්වලින් පිටවන්නට සලස්වා විවිධ යාන්ත්‍රණ ඔස්සේ එම නිවාස හා දේපළවලට පහරදී විනාශ කරදැමීමයි. අළුත්ගම සහ දිගන යන ප්‍රදේශ දෙකෙහි ම පීඩාවට ලක් වූ බොහෝදෙනා එම ප්‍රහාර හැඳින්වූයේ තමන්ගේ ව්‍යාපාර විනාශ කරදැමීමට සහ ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවගේ ආර්ථික ශක්තිය දුර්වල කිරීමට දැරූ සැලසුම් සහගත ප්‍රයත්නයක් වශයෙනි.

**සිදුවීම් පිළිබඳවඑම සිදුවීම්වලින් පීඩාවට පත් ප්‍රජාවන්ගේ දෘෂ්ටිකෝණය**

දිස්ත්‍රික්කය පුරා ප්‍රචණ්ඩත්වය ඇති වූ නගර හා ගම්මානවල වාසය කරන, ඉන් බලපෑමට පත් වූ විවිධ මුස්ලිම් ජන කණ්ඩායම් සමගින් අපි කථා කළෙමු. එසේ පීඩාවට පත්වූවන් අතර වූ විවිධත්වය විශේෂයෙන් වැදගත් වේ. සීමිත වත්කම් සහිත කුඩා ග්‍රාමීය ප්‍රජාවන්ගේ සිට ධනවත් හා අර්ධ නාගරික ප්‍රදේශවල වාසය කරන මධ්‍යම හා ඉහළ මධ්‍යමපාන්තික පවුල් දක්වා වූඅය ඊට ඇතුළත් විය. අපි දිගන වෙළඳපොළේ ව්‍යාපාරිකයින් සමගින් ද කතා කළෙමු. සිදු කර තිබූ හානියේ තරම සහ පොලිසිය දැක්වූ ප්‍රතිචාරය යනාදිය සම්බන්ධයෙන් විවිධත්වයන් තිබුණ ද, මෙම සියලු ප්‍රජාවන්හි ප්‍රජා නායකයින් තමන්ගේ අත්දැකීම විස්තර කළආකාරයෙහියම් සමානත්වයක් තිබුණි. පොලීසියේ සහ විශේෂ කාර්ය බලකායේ ක්‍රියා කලාපය පිළිබඳව ඔවුහු සෑහීමකට පත් නොවූ අතර, අසල්වාසීන් මෙම කුමන්ත්‍රණයට හවුල්වූයේ දැයි සැකයක් ද ඔවුන්ට තිබුණි. එසේම, රජයේ නිලධාරීන් විසින් ඔවුන්ට වෙනස්කම් කරනු ලැබීම සම්බන්ධයෙන් ද සැකයක් තිබුණි. වන්දි සහ ආධාර ලබාගැනීමට ප්‍රවේශවීමේදී තමන්ට ගැටළුවලට මුහුණ දෙන්නට සිදු වූ බව ද බොහෝදෙනා වාර්තා කළහ. ඉහත පැහැදිලි කළ පරිදි,ප්‍රහාරකයින් ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවට අයත් වත්කම්වලට බරපතළහානි

සිදුකළ අතර පල්ලි බොහෝ ගණනක් ද පුළුස්සාදැමීමට හා කෙලෙසීමට ක්‍රියා කර තිබේ. පල්ලිවල අභ්‍යන්තරය විනාශකර දමා, පොත් අල්මාරි කඩාබිඳ දමා, කුරානයේ පිටපත් හා අනෙකුත් ආගමික ග්‍රන්ථ ඉරා පුළුස්සා තිබූආකාරය අනුවඑම ක්‍රියාවන් කෙතරම් වෛරී මානසිකත්වයකින් සිදුකර තිබුණේ ද යන්න මනාව පැහැදිලි වෙයි.

දිස්ත්‍රික්කය පුරා පොලිසියේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් වූයේ දැඩි කලකිරීමකි. විවිධ මට්ටම්වලදී සිදුවූ ප්‍රචණ්ඩත්වයට සහ විනාශයට පොලීසිය සහ විශේෂ කාර්ය බලකාය සහාය දුන්නේ යැයිසලකනු ලැබේ. බූට් සපත්තු පැළඳ හිජ්රාපුරම් ප්‍රදේශයේ මුස්ලිම් පල්ලියකට ඇතුළු වූ විශේෂ කාර්ය බලකා සාමාජිකයින් එහි මවුලවිවරුන් දෙදෙනෙකුට පහර දී තිබේ. කුඹුක්කඳුරේ එක්තරා පුද්ගලයෙකුගේ නිවසට කඩා වැදුණු ඔවුහුනොඉවසුම් තත්වයන් අවුළුවාලීමට කටයුතු කළේ යැයි චෝදනා කරමින් එම පුද්ගලයා සහ ඔහුගේ මිතුරෙකු නිවසින් පිටතට ඇදගෙන ගොස් තිබේ. ඒ.එස්.එම්. ෆාසිල් සහ එම්.ෆාසිල් යන පුද්ගලයින් දෙදෙනා කුඹුක්කඳුරේ සිට දිගන දක්වා ඇදගෙන ගොස් තිබේ. පළාත් සභා මන්ත්‍රීවරයෙකු වන ඒ.එස්.එම්. ෆාසිල් තෙල්දෙණියේ දී සාකච්ඡාවලට සහභාගි වූවෙකි. අඹතැන්න හා වෙලේකඩේ ප්‍රදේශවල කලහකාරීන් විසින් නිවාස කිහිපයකට පහර දුන් අවස්ථාවේ විශේෂ කාර්ය බලකාය ප්‍රදේශයේ පවුල්වලට උපදෙස් දී ඇත්තේ නිවාසවලින් පිට වී ගොස් අසල්වාසී ගම්මානවල සිටින ඔවුන්ගේ ඥාතීන්ගේ නිවාසවලට යන ලෙසටයි. ඔවුන් එසේ පිටත්ව ගිය පසු කලහකාරීන් නැවතත් පැමිණ ඇති අතර දේපළවලට තවදුරටත් හානි සිදු කර ඇත. වට්ස්ඇප් මාධ්‍ය තුළ සංසරණය වෙමින් තිබූ එක් වීඩියෝ පටයක පොලිස් නිල ඇඳුමකින් සැරසුණු පුද්ගලයෙකු ප්‍රහාරකයින්ට පල්ලියකට ඇතුළු වීමට ඉඩ දෙන අන්දම පෙන්වයි. තවත් වීඩියෝ දර්ශනවල පෙන්නුම් කළේ මාර්ගයේ නැවතී සිටි ප්‍රහාරකයින් එම ස්ථානය පසුකර යන පොලිස් හා හමුදා වාහනවල සිටි අය සමගින් කථාබහ කරන අන්දමයි.

පීඩාවට පත්  වූ මුස්ලිම් ජනතාවට දැනුණු කලකිරීම, පොලිස් සේවාවෙන් ඔබ්බට ගොස් සියළුම රජයේ සේවාවන් සහ දේශපාලනය දක්වා ම ව්‍යාප්ත වී තිබේ. අපි කථාබහ කළ ඇතැම් පුද්ගලයින් සඳහන් කළේ මෙම ප්‍රචණ්ඩත්වය ආරම්භ වූ මාර්තු 4වැනිදා උදෑසන ඔවුන් සිටියේ අකුරණ ප්‍රදේශය තමන්ගේ මුල්ගම වූමහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන හලීම් සමග බවයි. හලීම් මන්ත්‍රීවරයා කොළඹ පොලීසිය අමතා ආධාර ඉල්ලා සිටි අවස්ථාවේ ඔහුට පවසා ඇත්තේ ඔහුගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය විධිවිධාන සලසන බවත් එය ප්‍රමාණවත් වනු ඇති බවත් ය. අපට කථා කළ පුද්ගලයා සඳහන් කළේ සිදුවන්නට යන දෙය වැළැක්වීමට කිසිවෙකු විසින් වෑයම් නොකරනු ඇති බව ඒ අවස්ථාවේ දී ඔවුන්ට වැටහී ගිය බවයි.  අදාළ සිදුවීම් විස්තර කරන ලද ආකාරය අනුවමෙම කුමන්ත්‍රණයට හවුල්වීම් සෑම මට්ටමකදීම තිබුණු බව මෙම පුද්ගලයින්ට පෙනෙන්නට තිබූ බව පැහැදිලි ය. ගොඩනැගිලි ගින්නෙන් ඇවිළී යද්දී පසෙකට වී බලාසිටියේ යැයි විශේෂ කාර්ය බලකායට වෙත චෝදනා එල්ල වී තිබේ. ගිනිනිවන රථය අකුරණට පැමිණි නමුත් එහි රියැදුරා පවසා ඇත්තේ එයට ජලය පිරවීමට තමන්ට අමතක වූ බවකි. මුලින් ම ප්‍රචණ්ඩත්වය ඇති වූ අවස්ථාවේ දිගන ප්‍රදේශයට විදුලිය හා ජල සැපයුම අඩාල වී තිබුණු බැවින් ගිනි නිවාදැමීමට නොහැකි වී තිබේ. සිදුවීම් වලින් පසුව, අදාළ හානි ඇස්තමේන්තු කිරීම භාර වූ ප්‍රාදේශීය පරිපාලන නිලධාරීහු සැබැවින්ම අහිමි වූ දෙයට වඩා වැඩියෙන් ඉල්ලා සිටින්නේ යැයි එම ජනතාවට චෝදනා කළහ. සුබයිර් සහ තවත් අය විසින් ලේඛනගත කර ඇති අන්දමට, සිදුවූ හානිය සඳහා රජයෙන් කළ ඇස්තමේන්තුව හාස්‍යජනක තරමේ අඩු අගයක් ගෙන තිබේ.[2] 2019 වර්ෂයේ දී මෙම පර්යේෂණ කටයුතු නිම කරන අවස්ථාව වන විට රජයෙන් ගෙවා තිබූමුළු වන්දි මුදල රු. 19,000,000.00 තරම් පහළ අගයක් ගත්තේ ය.

2018 වර්ෂයේ මාර්තු මාසයේ සිදුවූ එම සිදුවීම්වල ස්වභාවය සලකා බැලීමේදී, ඉන් පීඩාවට පත් වූ මුස්ලිම් ප්‍රජා නියෝජිතයින් සැකසහිත අන්දමින් සිතන බවඇතැම්විටඅවබෝධ වෙයි.කෙසේ නමුත්,

---

[2]මෙවැනි සිදුවීම් සම්බන්ධයෙන් වන්දි ලබාදීමේ දී ප්‍රමාදයන් සිදුකිරීම පිළිබඳ රජය කුප්‍රකට වී තිබේ. 2014 දී අළුත්ගම සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් සිදුකළ විමර්ශනයක දී අපි සොයාගත් අන්දමට 2006 වර්ෂයේදී සිදුවූ සිදුවීම් සඳහා වන්දි ලැබෙන තෙක් ඒ වන විට ද සමහර පුද්ගලයින් බලා සිටියහ. 2014 වර්ෂයේදී අළුත්ගම සිදුවූ ප්‍රචණ්ඩත්වය සඳහා 2018 ජූලි මාසයේ දී වන්දි ගෙවනු ලැබීම සම්බන්ධයෙන් කොළඹ REPIA අපට දැනුම් දීඇත. මෙම ප්‍රමාදයන් සහ ගැටළු සහගත වන්දි ගණනය කිරීම්පීඩාවට පත් වූ මුස්ලිම් ජනතාවගේ කණගාටුදායක තත්වය සම්බන්ධයෙන් රජය දක්වන නොසැලකිල්ලලෙස අවබෝධ වෙයි. බලන්න: L. Zubair etal.,"Is the State Grossly Underestimating the Losses from the Mob Violence in Kandy?" *Groundviews*, 24 June 2018, https://groundviews.org/2018/06/24/is-the-state-grossly-underestimating-the-losses-from-the-mob-violence-inkandy/

ප්‍රචණ්ඩකාරී සිදුවීම් වලින් පසුව ද එම ප්‍රදේශයේ ප්‍රජාවන් එදිරිවාදී යෙදුම් භාවිතා කරමින් එකිනෙකා සම්බන්ධයෙන් සඳහන් කිරීම පමණක් සිදු වූ බව පැහැදිලි විය. මුස්ලිම් ජනතාව සහ සිංහල බෞද්ධ ජනතාව එම ප්‍රදේශවල ජීවත් වූ ආකාරය පිළිබඳ පොදුවේ ඇති වූ හැඟීම විස්තර කිරීමට යොදගතහැකි වෙනත් ආකාරයක් නොමැති තරම් ය. බොහෝ ප්‍රදේශවල පීඩාවට පත් වූ මුස්ලිම් ජනතාව තමන්ගේ සිංහල මිතුරන් හෝ අසල්වාසීන් ප්‍රහාර අවස්ථාවේ දී එයට මැදිහත්වීමට හෝ උපකාර කිරීමට ඉදිරිපත් නොවූ බව පැවසූහ. අසල්වාසීන් ද මේ ක්‍රියාවන්ට සහාය දුන් බවට හැඟීමක් ඔවුන් තුළ තිබුණේය. මෙය පෙන්නුම් කරන එක් සිදුවීමක් වන්නේ මාර්තු 6වෙනි දින බේරී පලා යාමට නොහැකිව තමන්ගේ නිවස තුළ ම මියගොස් සිටි අබ්දුල් බාසිත් ගේ කථාව යි. ඔවුන්ගේ කඩය ගිනිගත් අවස්ථාවේ ඒ දෙස බලාසිටි අයට අබ්දුල් බාසිත් ගේ ජීවිතය බේරාගැනීම සඳහා ඊට වැඩි දෙයක් කළ හැකිව තිබුණේ ය යන්න ඔහුගේ පවුලේ අයගේ හැඟීමයි.ඇතැම් ගම්මුන්ට ප්‍රදේශයේ විහාරස්ථාන සමග ප්‍රබල සම්බන්ධතාවයක් තිබූ අතර එම භික්ෂූන් වහන්සේ ඔවුන්ට 'මොකුත් වෙන්න දෙන්නේ නෑ' යන සහතිකය ලබා දී තිබුණි. එහෙත් එම ජනතාව පාලනය කරගැනීමට එම භික්ෂූන් වහන්සේ අසමත් වී තිබේ. එහෙත් ඔවුන්ට ඊට වැඩි යමක් කළහැකිව තිබූ බව මුස්ලිම් ප්‍රජාවේ හැඟීමයි. තවත් අවස්ථාවක දී, එක්තරා මවුලවිවරයෙකු අපට පැවසුවේ ප්‍රහාර එල්ල කරනු ලැබුවේ තමන් ළමා කල හොඳින් දැනසිටි පුද්ගලයින් විසින් බවයි. වෙලේකඩේ ප්‍රදේශයේ මුස්ලිම් මව්වරු, තමන්ගේ මිතුරියන් යැයි සිතාගෙන සිටි සහ නිතර දෙවේලේ බස් රථවල දී හා පාසලේ දී තමන් සමග කථාබහ කළ සිංහල මව්වරු ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලින් පසුව දැන් තමන්ව නොසලකා හැර හෝ ලජ්ජාවෙන් මගහැර යන බවක් පෙනී යාම ගැන කණගාටුවෙන් යුතුව කථා කළහ. ප්‍රහාර සම්බන්ධයෙන් කිසිදු භූමිකාවක් නිරූපණය නොකළ සහ බොහෝදුරට මෙම ප්‍රහාර සුදුසු දෙයක් යැයි අනුමත නොකළ අය අතරෙහි පවා මෙම සිදුවීම් හරහා කෙතරම් බරපතල දීර්ඝ-කාලීන හානියක් සිදුවීතිබේ ද යන්නමෙයින් පෙන්නුම් කරයි. තමන්ගේ සිංහල අසල්වාසීන් තමන්ට උපකාර කළා යැයි කියන කතන්දර දැන් නිහඬ වී තිබේ. ඒ වෙනුවට බොහෝදෙනා එදිරිවාදිකම් පිළිබඳ කථා පෙන්වාදීමටත්, මුස්ලිම් විරෝධී හැඟීමක් තිබෙන ආකාරය පෙන්වාදීමටත් වඩාත් උනන්දු වූ අතර මෑත කාලයේදී මෙම ප්‍රජාවන් අතර ඇතිවී තිබෙන බවක් පෙනෙන්නනට තිබෙන දුරස්ථභාවය ඔවුහු අවධාරණය කළහ.

ගමේ විහාරස්ථානයේ භික්ෂූන්වහන්සේ සහ සිංහල ග්‍රාමනිලධාරීවරයාද මෙම ක්‍රියා සඳහා සහායදුන් බව එක් ගම්මානයක දී අප සමග පවසන ලදී. එම ග්‍රාමනිලධාරීවරයා ප්‍රහාරවලට සහභාගි වී ඇති අතර ප්‍රහාරවලට මිනිත්තු කිහිපයකට පෙර පන්සලේ ඝන්ටාරය නාද වී තිබේ. පසුව හෙළිදරව් වූයේ ග්‍රාමනිලධාරීවරයා ඇත්තවශයෙන්ම හානිය අවම කිරීමට වෑයම් දරා තිබූ බවයි. එම කථාවලින් අපට අවබෝධ වූ කාරණය නම්, ප්‍රහාර සිදු වීමෙන් පසු ආසන්නතම කාලයේ දී ප්‍රහාර වලින් පීඩාවට පත් වූ මුස්ලිම් ප්‍රජාව මුස්ලිම් නොවන සියලු ම දෙනා තුළ සතුරෙකු දුටු බවයි. එසේම, සිංහල ප්‍රජාවගේ සිත් තුළමුස්ලිම්විරෝධී හැඟීම් තැන්පත් වී තිබූ පරිද්දෙන් ම මුස්ලිම් ජනතාව තුළ ද තමන් සෑමවිටම ප්‍රහාරයට ලක්වන්නේ ය යන හැඟීමක් ඇතිවී තිබුණු බවඉන් පෙනී යයි. ඉහත සඳහන් කළ ග්‍රාමනිලධාරීවරයා සහ බෞද්ධ භික්ෂූන් වහන්සේ සමග අපි සම්මුඛ සාකච්ඡා පැවැත්වූ අවස්ථාවේදී මුස්ලිම් ජනතාව සම්බන්ධයෙන් ඔවුන් සිදු කළ සමස්ථ කථාබහ ම මුස්ලිම්-විරෝධී ව්‍යාපාරයේ බස් වහර යොදගනිමින් සිදු කළ බව අපට නිරීක්ෂණය විය (දෙදෙනා ම අන්තවාදී යන වචනය භාවිතා කළ අතර මුස්ලිම් ජනතාව සිංහල ජනතාවගෙන් දුරස්ථභාවයක් පවත්වාගෙන යන බව සඳහන් කළහ). මුස්ලිම් ජනතාව සම්බන්ධයෙන් එවැනි අදහස් තිබීම මගින් එම පුද්ගලයින් මුස්ලිම් ජනතාවට එරෙහි ප්‍රචණ්ඩත්වය අනුමත කළ බවක් සෑමවිටම ගම්‍ය නොවේ. බොහෝ මුස්ලිම් සහ සිංහල ප්‍රජා නායකයින්ට එම ප්‍රචණ්ඩ සිදුවීම් පිළිබඳව සහ තමන්ගේ ප්‍රජාව මුහුණ දී ඇති තත්වයපිළිබඳව කථා කිරීමට එකිනෙකා පිළිබඳ සැකය හා අවිශ්වාසය හැඟවෙන යෙදුම් හැරෙන්නට වෙනත් යෙදුම් භාවිතා කළහැකි බවක් පෙනෙන්නට නොතිබුණි.(තමන්ගේ ගමේ ප්‍රචණ්ඩත්වය ඇතිවීම වැළැක්වීමට සටන් කළ අඹල ගමේ භික්ෂූන්වහන්සේ පවා මුස්ලිම් ජනතාව පිළිබඳ කථා කළේ අන්තවාදී යන යෙදුම භාවිතා කරමිනි.).

එඬරුතැන්න ගම්මානයේ කාන්තාවන් සඳහන් කළ කරුණු සහ තවත් ගමක වැඩිහිටියෙක් පැවසූ දේඅනුව මෙම වාර්තාවේ ලේඛනගත වී ඇති පරිදි, බොහෝ මුස්ලිම් ප්‍රජාවන් මෙම ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලින් පසුව ජීවත් වී ඇත්තේ බියෙන් හා අවිනිශ්චිතතාවයෙන් පීඩිතව ය. ඔවුන්ගේ ජීවිත ආපසු හැරවිය නොහැකි සේ වෙනස් වී තිබේ. නුදුරේ දී ම නැවත වරක් ප්‍රචණ්ඩත්වය ඇතිවීමට ඉඩ ඇති බවක් පෙනෙන්නට තිබුණි.

**නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ ප්‍රතිචාරය**

තමන්ගේ පාර්ශ්වයෙන් දක්වන ලද ප්‍රතිචාරයෙහි දෝෂසහගත බව නීතිය ක්‍රියාත්මක කරන ජ්‍යෙෂ්ඨ නිලධාරීහු පිළිගත්හ. එහෙත්, ඔවුන් එසේ ප්‍රතිචාර දැක්වීමට හේතු තිබුණු බවත්, ඒවා පොලිස් නිලධාරීන් ප්‍රහාරයට සහාය වීමක් හෝ මුස්ලිම් ජනතාවට පීඩා කිරීම සඳහා දැරූ කුමන්ත්‍රණයක් වශයෙන් ලඝුකොට දැක්විය නොහැකි බව ත් අප වෙත පවසන ලදී. එම හේතු පහත සඳහන් පරිදි වේ:

අ) සමාජ පිරිහීමෙහි ප්‍රතිඵලයක් ලෙසඇතිවී තිබෙන මෙම සිදුවීම් වලට ආමන්ත්‍රණය කිරීම සඳහා රටෙහි දේශපාලනඥයින් සිදුකර ඇත්තේ ඉතා අල්ප වැඩකොටසක් වන පසුබිමක මෙය සම්පූර්ණයෙන් ම පොලීසියේ වගකීමක් බවට පත් කළ නොහැකි ය.

ආ) මෙවැනි ස්වභාවයේ ප්‍රශ්න සම්බන්ධයෙන් කටයුතු කිරීමට පොලීසිය සූදානම් කර තබා නැත. ඔවුන් මෙවැනි තත්වයන් පිළිබඳ අඩු පුහුණුවක්, අඩු සූදානමක් සහ අඩු අරමුදල් සහිතව සීමිත සම්පත් ප්‍රමාණයක් ඇතිව කටයුතු කරති.

ඇ) සෘජු නියෝග ලැබී නොතිබීම සහ ආයතනික සහායක් නොමැතිකම පොලිස් භටයින් තමන්ගේ ම මුලපිරීමෙන් ප්‍රචණ්ඩත්වය නැවැත්වීමට කටයුතු කිරීමෙන් වැළකී සිටීමට හේතු විය. පමණ ඉක්මවා බලය යෙදීම සම්බන්ධයෙන් අතීතයේ ද ඔවුන්ව විවේචනයට ලක් වී ඇති බැවින් ප්‍රතිචාර දැක්වීමේදී පොලිස් නිලධාරීන් වඩාත් පරික්ෂාකාරී වේ.

ඈ) වඩාත් සුදුසු ලෙස සලකන්නේ සීමාකිරීමේ මූලධර්මය මිස ප්‍රතිහිංසාව නොවේ. පොලීසිය තම ක්‍රියාවන් ඔස්සේ තත්වය තවත් උග්‍ර නොකළ යුතු ය.

ඉ) පොලිස් නිලධාරීන් පස් දෙනෙකුට කලහකාරීන් 500ක් පාලනය කළ නොහැකි ය.

ඊ) ස්ථාන දෙකක ප්‍රහාර ඇති වුවත් එවැන්නක් සිදුවේවි යැයි අපේක්ෂාවෙන් සැලසුම් සාදා තිබුනේ එක් ස්ථානයක් සඳහා පමණි. මෙය බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් වූ අසමත්වීමකි.

උ) කලහකාරීන්ගේ ප්‍රහාරවලට එරෙහිව දණ්ඩනීති සංග්‍රහයෙහිනීති විරෝධී රැස්වීම නැමති කොටස යටතේ ක්‍රියාමාර්ග ගතහැකි නමුත් ඒ සඳහා නිසි නායකත්වයක් ගෙන තිබීම අවශ්‍ය ය.

ඌ) පොලිස් නිලධාරීන් සාමාන්‍යයෙන් එම ප්‍රදේශවල ම පුද්ගලයින් වීමත්, ඔවුන් වරදකරුවන්ව දැන හැඳින සිටිනවා විය හැකි වීමත් මෙවැනි තත්වයන්හි දීනීතිය හා විනය පවත්වාගෙන යාමට බාධාකාරී විය හැකි ය.

කෙසේනමුත්, මෙම වාර්තාවෙහිඉදිරි කොටස් වල සාකච්ඡා කර ඇති පරිදි, අදාළ කාලසීමාව තුළ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ සම්බන්ධවීමෙහි පක්ෂග්‍රාහී ස්වභාවයෙහි හෝ තෝරාගත් වරදකරුවන් වෙත සහාය ලබාදීමෙහි මෙන්ම පොලීසිය/ විශේෂ කාර්ය බලකාය තුළ සිදුව ඇති අභ්‍යන්තර ප්‍රතිපත්තිමය දුර්වලතා වල බරපතලකම යෝජිත මෙම සැහැල්ලු කරන කරුණු මගින්අඩු කළ නොහැකි ය.

**ප්‍රදේශයේ විද්වතුන්ගේ ප්‍රතිචාරය**

සිංහල හා මුස්ලිම් සිවිල් සමාජ නියෝජිතයින්, විද්වතුන් සහ පරිපාලනයේ නියුතු නිලධාරීන් (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, ආපදා කළමනාකරණ ඒකකයෙහි නියෝජිතයින් යනාදී අය) සමගින් අපි කථා කළෙමු. මෙහි ප්‍රදේශයේ විද්වතුන් පළකළ අදහස් යන කොටස යටතේ අපි ඔවුන්ගේ දෘෂ්ටිකෝණවල සංයුක්ත සාරාංශයක් ඉදිරිපත් කරන්නෙමු. මහනුවර ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලින් පසුව අප සමග කථා කළ එම ප්‍රදේශයෙහි විද්වතුන් රටේ ජනවාර්ගික සබඳතා පිරිහීයමින් තිබෙන අන්දම පිළිබඳව ඔවුන්ට ඇති කණගාටුව පිළිබඳව අපට පැවසූහ. එහිදී සිංහල විද්වතෙක් සඳහන් කළ එක් ප්‍රයෝජනවත් අදහසක් නම්, රටේ මුස්ලිම් විරෝධී හැඟීම් පෝෂණය කරන අන්දමේ බොහෝ හානිකර තොරතුරු මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණය වන විට, එවැනි වාගාලංකාර නිවැරදි කිරීමට හෝ ඒවා අවබෝධ කරගතහැකි වෙනත් රාමුවක් සපයාදීමට ප්‍රසිද්ධ තලය තුළ පිළිගත් හඬනැගීම් එකක් හෝ නොතිබුණු බවයි. ප්‍රචණ්ඩත්වයට විරුද්ධ වූ හා යහපත් චේතනාවෙන් කථා කළ සිංහල

පුද්ගලයින්ට පවා 2012 වර්ෂයේ පටන් මුස්ලිම් විරෝධී ව්‍යාපාරය විසින් පතුරුවන ලද ජාතිවාදී වාගාලංකාර භාවිතා නොකර මුස්ලිම් ජාතිකයින් පිළිබඳව සඳහන් කළ නොහැකි වූ බව අපගේ පර්යේෂණය තුළ අපට පැහැදිලි වූ තවත් කරුණක් වේ.තමන්ගේ ආගම ඇදහීමටත්, තමන්ගේ පිළිගත් ආගමික සංවේදීතා අනුව ඇඳුම්ඇඳීමටත් තිබූ අවකාශය වඩාත් සීමාකිරීම පිළිබඳව මුස්ලිම් විද්වත්තු විවේචනය කළහ. ප්‍රදේශය තුළ තමන් ආන්තිකකරණයට ලක්වීම සහ කලකිරීම පිළිබඳව කථා කරමින් මුස්ලිම් ජනතාවට වූ අධ්‍යාපන අවස්ථා සීමාවීම පිළිබඳව ද ඔවුහු කථා කළහ. දිස්ත්‍රික්කයේ තිබෙන 'හොඳ' පාසල්වලට ඇතුළත් කරගන්නා මුස්ලිම් සිසුන් සංඛ්‍යාව දැන් පෙරට වඩා අඩු වී ඇති අතර, එසේ සිසුන් ඇතුළත් කරගන්නා පාසල් ද මුස්ලිම් කාන්තාවන්ගේ ඇඳුම සම්බන්ධයෙන් වැඩිවැඩියෙන් ජාතිවාදී ප්‍රතිපත්ති අනුගමනය කරයි. එබැවින් මුස්ලිම් පාසල්වලට පමණක් සීමාවීමට ඔවුන්ට සිදුවී තිබේ (එම පාසල් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැත). මුස්ලිම් ජාත්‍යන්තර පාසල් ද බොහෝවිට එතරම් ම හොඳ තත්වයක නොමැත. අදහස් පළ කළ ඇතැම් සිංහල පුද්ගලයෝ ඉංග්‍රීසි මාධ්‍ය පාසල්වලට මුස්ලිම් පුද්ගලයින් යාම තුළින් අනාගත රැකියා වෙළඳපොළ තුළ ඔවුන් සිංහලයින්ට තර්ජනයක් විය හැකිය යන බියක් පළ කළෝය.

**භික්ෂූන්වහන්සේලාගේ ප්‍රතිචාරය[3]**

බලපෑමට ලක්වූ ප්‍රදේශය තුළ සහ ඒ අවට, අපි කථාබහ කළ භික්ෂූන් වහන්සේ එක හඬින් මෙම ප්‍රචණ්ඩත්වය හෙලාදුටු අතර එය නවත්වාගැනීමට නොහැකිවීම පිළිබඳව කණගාටුව පළ කළහ. ඇතැම් භික්ෂූන්වහන්සේලා අවතැන් වූ මුස්ලිම් ජනතාව තමන්ගේ විහාර පරිශ්‍රවල නවත්වාගනිමින් සහ වෙනත් ආකාරවලින් උපකාර කර ඇත. පූජ්‍ය උපාලි ඥානිස්සර හිමියන් අඹලට පැමිණි සන්නද්ධ පිරිස් ඉදිරියට ගොස් ඔවුන්ට අභියෝග කර තිබේ. කෙසේනමුත්, ඒ සියළු භික්ෂූන්වහන්සේලා මෙම සිදුවීම් සඳහා වරද පූර්ණ වශයෙන්ම මුස්ලිම් ජනතාවගේ දොරකඩ තබන්නා වූ සිංහල ආධිපත්‍යය පිළිබඳ වාගාලංකාරයකට කැප වී සිටියහ. අදටත් පවත්නා මුස්ලිම්-විරෝධී බස් වහර යොදාගනිමින් මුස්ලිම් ජනතාවගේ 'පිළිගත නොහැකි' හැසිරීම් විස්තර කරන ලදී. ඔවුන් ගෙනහැර දැක්වූ හේතු මුස්ලිම් ජනතාවගේ ආර්ථික බලය සම්බන්ධ ගැටළුවල සිට ඔවුන් අනවශ්‍ය ලෙස ආගමික ව්‍යවහාරවලට යොමුවීම, තමන් අනෙක් අයට වඩා උසස් යැයි ඔවුහු උපකල්පනය කිරීම, තමන්ගේ අරමුණු ඉටුකරගැනීම සඳහා ඔවුන් 'වඳ පෙති' වැනි උපායමාර්ග භාවිතා කරනු ලැබීමට යොමු වී තිබීම යනාදී කරුණු දක්වා පැතිරී තිබුණි. (මෙම අදහස් පිළිබඳව භික්ෂූන් වහන්සේලා සඳහන් කළේ ඒවා දැනටමත් තහවුරු වී ඇති කරුණු පරිද්දෙන් ය. ඉන් පෙන්නුම් කෙරෙන්නේ මුලින් ම බොදු බල සේනා සංවිධානය විසින් ප්‍රචාරය කරන ලද මෙම අදහස් සමාජය තුළ වරින් වර සංසරණයට ලක් කිරීමත්, මුස්ලිම් කණ්ඩායම්, සිවිල් සමාජය හෝ රජය මේවාට විරුද්ධව ක්‍රියා නොකිරීමත් හේතුවෙන් මෙම අදහස් කොතෙක් ගැඹුරට තැන්පත්වී ඇති ද යන්නයි). අනාගතයේ දී මෙවැනි සිදුවීම් ඇතිවීම වළක්වාගැනීමට නම්, මුස්ලිම් ජනතාව තමන්ගේ හැසිරීම් වෙනස් කරගතයුතු බව එක් භික්ෂූන්වහන්සේ නමක් ප්‍රකාශ කළහ.

භික්ෂූන්වහන්සේලාට වඩාත් ම පීඩාවක් ගෙන දුන් කාරණය වශයෙන් සඳහන් වූයේ තරුණ පිරිස් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති (ICCPR) පනත යටතේ අත් අඩංගුවට ගෙන ඇප ලබා නොදී රඳවා තබාගැනීමයි (දිස්ත්‍රික්කය පුරා 100කට ආසන්න පිරිසක් අත් අඩංගුවට ගෙන තිබුණි). එම තරුණයින්ව නිදහස් කරගැනීම සඳහා පහසුකම් සැලසීමට මුස්ලිම් ගම්වලවිවිධ නායකයින් සහ පල්ලි කමිටු සහයෝගය නොදක්වන්නේ යැයි ඔවුහු චෝදනා කළහ. මෙම තරුණයින් එහි බරපතලකම අවබෝධ කර නොගෙන මෝඩ ක්‍රියාවක නිරත වී ඇත්තේ ය යන්න භික්ෂූන්වහන්සේලාගේ අදහස විය. එක් භික්ෂූන්වහන්සේ නමක් ප්‍රකාශ කළේ ඉහත කී ICCPRපනත යටතේ තමන්ට විඳින්නට සිදු වන බරපතළ දඬුවම් පිළිබඳමෙම තරුණයින් දැනුවත් ව සිටියේ නම් ඔවුන් මෙවැනි ක්‍රියාවල නිරත නොවෙනු ඇති බවයි. ඔවුන් තුළපැවති හැඟීම වූයේ මෙවැනි සිදුවීම් බරපතළ නොවන බවත්, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත වැනි දරුණු නීතී මේ සම්බන්ධයෙන් යොදගැනීමට අවශ්‍ය නොවන බවත් ය. මේ අවස්ථාවේ දී තරුණයින්

[3]ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලින් පසුව ඊට විරෝධතාවය දැක්වීම සඳහා භික්ෂූන්වහන්සේලා කණ්ඩායමක් නිහඬ විරෝධතාවයක් සංවිධානය කර තිබූ බව ද මෙහිදී සඳහන් කළ යුතු ය. අප මෙහි විස්තර කර ඇත්තේ මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය මට්ටමින් අප සිදුකළ සම්මුඛසාකච්ඡා පමණි. බලන්න:"Sri Lanka Buddhist Monks Denounce anti-Muslim Riots," *Al Jazeera*, 9 Mar 2018, https://www.aljazeera.com/news/2018/03/sri-lanka-buddhist-monks-denounce-anti-muslim-riots-180309192840779.html

නිදහස් කරගැනීමට සහාය නොදීමෙන් මුස්ලිම් ජනතාව වඩාත් වැඩි ජනවාර්ගික අසමගියක් සඳහා පදනම සාදන බව ද භික්ෂූන් වහන්සේගේ අදහස විය. තරුණයින් නිරත වූ මෙවැනි ක්‍රියා සඳහා එතරම් දරුණු දඬුවම් දීම යෝග්‍ය නොවන බව උන්වහන්සේලාගේ අදහස විය.

බොහෝදෙනෙකුට බොහෝ දේවල් අහිමි වූ මෙවැනි සිදුවීමක දී භික්ෂූන්වහන්සේලාගේ පූර්ණ අවධානය චූදිත වරදකරුවන් ගේ දුක්පීඩා කෙරෙහි යොමු වී තිබීම තුළින් ගම්‍ය වූ අදහස නම් ඔවුන් වඩාත් අනුකම්පාව දක්වන්නේ ඒ අයගේ ක්‍රියාවන් පිළිබඳව බවයි.

**පොදුවේ මුස්ලිම් ප්‍රජාව දැක්වූ ප්‍රතිචාරය**

ප්‍රහාර සිදුවූ වහාම ඉන් පීඩාවට පත්වූ කණ්ඩායම්වලට ආධාර පිණිස විවිධ භාණ්ඩ එක් රැස් කර බෙදදීමට සිවිල් සමාජ සංවිධාන සහ පුණ්‍යායතන කටයුතු කළ අන්දම පිළිබඳව අතුරු කථා බොහොමයක් වෙතත්, මේ අවස්ථාවේ සිවිල් සමාජ සංවිධාන, පල්ලිවල භාරකාර මණ්ඩල සහ සමස්ථ ලංකා ජම්යතුල් උලමා සංවිධානය සිදුකළ සංවිධානාත්මක ප්‍රතිචාර දැක්වීම ලේඛනගත කිරීම වැදගත් වේ. ප්‍රහාරවලින් පසුව මාර්තු 12 හෝ ඒ ආසන්නයේ මුස්ලිම් සිවිල් සමාජ කණ්ඩායම්, පල්ලි කමිටු සහ ජම්යතුල් උලමා සංවිධානයේ සහභාගීත්වයෙන් සහන සැලසීම සංවිධානය කිරීම සඳහා කමිටුවක් ස්ථාපිත කරන ලදී. මහනුවර දිස්ත්‍රික් සහන සම්බන්ධීකරණ කමිටුව නම් වූ මෙම කමිටුව ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා සහන සහ ආධාර බෙදදීම සංවිධානය කරන ලදී. පල්ලි ජාල යොදාගනිමින් සැලකිය යුතු මට්ටමකින් සම්පත් ඒකරාශී කර මෙහෙයවීමක් සිදු විය. එකතු කරන ලද මුදල් ඒ අවස්ථාවේ පීඩාවට පත් වී සිටි ජනතාවට සහන සැලසීමටත්, අර්ථවත් අන්දමින් රජයෙන් ආධාර සපයා දීමක් නොමැති තත්වයක් තුළ, විනාශ වී තිබූ නිවාස හා ව්‍යාපාර නැවත ඉදිකරගැනීමටත් උපකාරී විය.

**රජයේ ප්‍රතිචාරය**

අළුත්ගම සිදුවීමේදී[4]මෙන් නොව මෙම අවස්ථාවේ දී රජයේ දෝෂය වූයේයම් යම් දේ සිදුකිරීමට වඩා කිසිවක් නොකර සිටීම සම්බන්ධයෙන් විය. ඉස්මතු වෙමින් තිබූ ප්‍රචණ්ඩත්වය ඇතිවීමේ තර්ජනයට ප්‍රතිචාර නොදක්වා සිටීමෙන් සහ ප්‍රචණ්ඩත්වය ආරම්භ වූ පසු පොලීසිය සහ හමුදාව කැඳවීමට මන්දගාමී වීම මගින් ඔවුන් නොසැලකිලිමත්ව කටයුතු කර තිබුණි. අළුත්ගම දී සිදුවූවාක් මෙන් සිදුවීමෙන් පසුව එය වසා දැමීමට රජය වෑයම් කළ බවට හෝ සිදුවීම සම්බන්ධයෙන් වූ වෘත්තාන්තය පාලනය කිරීමට වෙර දැරීමක් සම්බන්ධයෙන් මෙහිදී සාක්ෂි නොතිබුණි. රජයෙන් දැක්වූ වාගාලංකාරමය ප්‍රතිචාරය මගින් මෙම සිදුවීම හෙලා දුටු අතර, පීඩාවට පත් වූ මුස්ලිම් ජනතාව සමගින් එක්ව ශෝකවීමක් දක්නට ලැබුණි. මුස්ලිම් විද්වතුන් සමග පැවති හමුවක දී අග්‍රාමාත්‍යවරයා මෙම සිද්ධිය සම්බන්ධයෙන් විමර්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීමේ අදහසට සහයෝගය නොදැක්වූවත් මුස්ලිම් විරෝධී මතවාදය නිෂ්ප්‍රභා කිරීම සඳහා ආණ්ඩුව විසින් එයට එරෙහි ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කළයුතුව තිබූ බව පිළිගත්තේ ය.

ප්‍රහාරවලින් පසුව එයට වරදකරුවන් බවට සැක කළපුද්ගලයින් අත් අඩංගුවට ගෙන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුති පනත යටතේ ඔවුන්ට චෝදනා කරන ලදී. බොහෝදෙනා ඇප රහිතව රිමාන්ඩ් බන්ධනාගාර ගත කරන ලද අතර, ඔවුන්ගේ පවුල් සහ පොදුවේ ප්‍රජාවන් මෙය ඔවුන් සිදු කළ ක්‍රියාවන්ට වඩා බෙහෙවින් බරපතළ අන්දමින් ඔවුන්ට සලකනු ලැබීමක් යන හැඟීමෙන් ඒ සම්බන්ධයෙන් තදබල ලෙස පීඩාවට පත් වූහ. මෙම නඩු සම්බන්ධයෙන් එතරම් ප්‍රගතියක් ඇති වී නොමැති අතර, 2018 අග වනවිට මේ සියළුදෙනා නිදහස් කරන ලදී. මහසෝන් බලකායේ නායකයාව 2018 ඔක්තෝබර් මාසයේදී නිදහස් කළ අවස්ථාවේ ඔහු ආපසු දිගන ප්‍රදේශයට පිළිගනු ලැබුවේ රතිඤ්ඤාපුපුරවා සතුට පළකරමින් වේ. එම ප්‍රදේශයේ වූ හමුදා කඳවුරක හමුදා අණදෙන නිලධාරියා (අළුත්ගම සිදුකළාක් මෙන්) මෙම ප්‍රදේශය නැවත

---

[4] විශේෂ කාර්ය බලකාය විසින් ප්‍රහාරකයින් හෝ කොල්ලකරුවන් නොනැවැත්වීම, ඇඳිරිනීතිය උල්ලංඝනය කරමින් සිටියවුන් අත්අඩංගුවට නොගැනීම, ප්‍රහාර සිදු වූ රටාව යනාදියෙන් අළුත්ගම ප්‍රහාරයේ සංවිධානාත්මක බව පැහැදිලිව පෙනුණි. ප්‍රහාරකයින් සන්නද්ධ වී සිටි ආයුධ, ප්‍රධාන අවධානය දේපළ ක්‍රමිකව විනාශ කර දැමීම කෙරෙහි එල්ල වී තිබීම, කොල්ලකෑ භාණ්ඩ ගෙනයාම සඳහා ම විශේෂයෙන් වාහන ගෙනැවිත් තිබීම යනාදිය මෙම සංවිධානාත්මක බවට තවත් සාක්ෂි විය. බලන්න:Where Have All the Neighbours Gone? Aluthgama Riots and its Aftermath: A Fact-Finding Mission to Aluthgama, Dharga Town, Valipanna and Beruwela, https://lstlanka.org/wp-content/uploads/2017/11/aluthgama-report-final-english.pdf

ගොඩනැංවීම සඳහා සම්බන්ධ වන බවට පොරොන්දු විය. එහෙත් හමුදාව එම ප්‍රදේශයේ සිටියේ එක්දිනක පිරිසිදු කිරීම් සඳහා පමණකි. කිසිදු රජයේ ආයතනයකින් කිසිදු නැවත ගොඩනැඟීමක් සිදු නොවීය. රජයේ නිලධාරීහු පීඩාවට පත්වූ අයගේ වන්දි අයදුම්පත් භාරගෙන ඔවුන්ගේ නිවෙස්වලට ගොස් හානිය තක්සේරු කර වන්දි නිර්දේශ කළහ. ප්‍රහාරවලින් සති කිහිපයකට පසුව පීඩාවට පත්වූවන්ට රු. 100,000ක මූලික ගෙවීමක් ලැබුණි.

2019 වර්ෂයේදී දී අපි ප්‍රවේශ වූ, පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියේ (REPPIA) වාර්තාවලට අනුව, ප්‍රහාරයෙන් මාස පහක් ඇතුළත නිවාස හානි සඳහා වන්දි ලැබුණු නිවාස සංඛ්‍යාව 249ක් වූ අතර ඒ සඳහා රු. මිලියන 10.4ක් වැය කර තිබුණි. කඩසාප්පු 126ක් සඳහා රු. මිලියන 5.46ක් වන්දි ලෙස ලබා දී තිබුණි. හානි වූ වාහන හිමිකරුවන් අතරේ රු. මිලියන 2.45ක් බෙදා දී තිබුණි. ඒ අනුව මාස 5 ක කාලසීමාව තුළපුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය විසින් බෙදාදුන් මුළු වන්දි මුදල රු. මිලියන 18.32ක් විය. කෙසේනමුත්, රු. 500,000ට වැඩි වන්දි ඉල්ලීම් සම්බන්ධයෙන් මාස 5කට වඩා වැඩි කාලයක් ගත වී තිබේ. සුබයිර් සහ තවත් අය තර්ක කරන අන්දමට මෙම සිදුවීම්වලින් වැඩි කලක් යන්නට පෙර රජය විසින් වන්දි සඳහා ඇස්තමේන්තු කර තිබුණු මුදල කිසිසේත් ම ප්‍රමාණවත් නොවෙයි. ඉන් ඇති වූ අඩුව පුරවනු ලැබුවේ මුස්ලිම් සිවිල් සමාජය සහ පල්ලි කණ්ඩායම් විසින් එකතු කරන ලද මුදල්වලින් ය (සිවිල් සමාජ සිදුකළ හානි ඇස්තමේන්තුව - 1 වැනි ඇමුණුමබලන්න).

ප්‍රහාරවලින් වසරකුත් මාස 7ක් ගත වූ පසු පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය සඳහන් කළේ සියලු ම හිමිකම්පෑම්වලින් සියයට 90ක් ගෙවා අවසන් කර ඇති බවයි. ඉතිරි වී ඇති සියයට 10 වන්නේ කමිටු වාර්තාව ලැබෙන තෙක් බලා සිටින, විශාල ප්‍රමාණයේ හිමිකම්පෑම් 16කි. අවශ්‍ය කරන නිවැරදි වන්දි මුදල් පිළිබඳ පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය දැනුවත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් කමිටුවක් ස්ථාපිත කරන ලද අතර සිදුවූ ප්‍රමාදයන් හේතුවෙන් එම ක්‍රියාවලිය දිග්ගැස්සී තිබේ.

මෙම සිදුවීමෙන් පසුව ඒ අත්‍යාසන්නයේ දී ජනාධිපතිවරයා මේ සිදුවීම පිළිබඳ විමර්ශනය කිරීම සඳහා ත්‍රිපුද්ගල කොමිෂන් සභාවක් පත් කරන බව ප්‍රකාශ කළේ ය. එම කොමිෂන් සභාවට විශ්‍රාමලත් විනිසුරන් තිදෙනෙකු පත් කරන බව කියැවුණි. එහෙත් එවැනි කොමිෂන් සභාවක් කෙදිනක හෝ පත් නොකරන ලද අතර, සිදුවීම්වලින් සති කිහිපයකට පසුව මුස්ලිම් සිවිල් සමාජ නියෝජිතයින් හමු වූ අග්‍රාමාත්‍යවරයා ප්‍රකාශ කළේ රජය කොමිෂන් සභාවක් පත් නොකරනු ඇති බවයි. එසේ නොකිරීමට හේතුව වශයෙන් අග්‍රාමාත්‍යවරයා පෙන්වූයේ අර්ථ විරහිත කොමිෂන් සභා පත් කිරීම සම්බන්ධයෙන් මෙරටට ඇති දීර්ඝ ඉතිහාසයයි.

වරදකරුවන්ට එරෙහිව නඩු කටයුතු ඉදිරියට ගෙනයාමට හෝ ප්‍රමාණවත් වන්දි ලබාදීමට හෝ රජය විසින් ශක්තිමත් හා තිරසාර ප්‍රතිචාරයක් නොදැක්වීම මගින් අදහස් වන්නේ ඔවුන්ගේ ක්‍රියා නොඉවසන්නේ ය යන පණිවුඩය වරදකරුවන් වෙත ලබානොදෙන බවකි. පීඩාවට පත් වූ මුස්ලිම් ජනතාවට ඔවුන්ගේඅයිතිවාසිකම් ආරක්ෂා කරනු ලබන බව සහතික කිරීම සඳහා කැප වී සිටින බවට වන පණිවිඩයක්ලබා නොදෙයි. රජයේ මෙම ප්‍රතිචාරය නිසා සිදු වූයේ මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩත්වය තවදුරටත් සාමාන්‍යකරණය වීමයි.

**'දෙපාර්ශවයෙහි ම' වැරදි තිබේ ද?**

අපි සම්මුඛ සාකච්ඡාවට ලක් කළ බොහෝදෙනා කම්පනයට පත්ව සිටිය ද, අපි අදහස් විමසූ බොහෝ දෙනා සිදු වූ අනපේක්ෂිත සිද්ධීන් හේතුවෙන් විමතියට පත් ව සිටි අතර ඉදිරියේ දී තවත් ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවනු ඇතැයි ඔවුන්ට ඒත්තු ගොස් තිබුණි. මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියාවලට හේතුව දේශපාලනමය කරුණු බව ඔවුහු පැවසූහ. එහෙත් අදහස් පළකළ ඇතැම් සිංහල පුද්ගලයින් පැවසුයේ 'දෙපාර්ශවයෙහිම වැරදි තිබෙන' බව හා අනාගතයේ දී එවැනි ප්‍රචණ්ඩකාරී තත්වයන් මගහරවා ගැනීමට නම් මුස්ලිම් ජනතාවට ද වෙනස් වන්නට සිදු වනු ඇති බවයි. පොදුවේ ගත් කල, බහුතර ප්‍රජාවේ භික්ෂූන් සහ ඇතැම් ප්‍රාදේශීය නායකයින් අතරජන ජීවිතයේ සියලම අංග තුළවිවිධත්වය/ආගමික නිදහස යනාදිය සම්බන්ධයෙන් කළ නිස්සාර ප්‍රකාශ සහ සිංහල බුද්ධාගම සඳහා විශේෂ තැනක් ලබාදීම තවත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය අතර සැලකියයුතු නොගැළපීමක් ඇති බව අපි නිරීක්ෂණය කළෙමු. එයට යටින් ගැබ්වී තිබූ අදහස වූයේ සුළුතර කණ්ඩායම් විසින් පසුකර නොයා යුතු, නොඇඳි රේඛාවක් පවතින බවත්, එම රේඛාව තීරණය කිරීම සහ පාලනය කිරීම බහුතර කණ්ඩායම අතේ පමණක් ඇති බවත් වේ. ප්‍රතිවිපාකවලට මගපෑදෙන්නේ මෙම භූමිකාව සහ වගකීම උල්ලංඝනය කළ විට වන අතර, ප්‍රචණ්ඩත්වය සහ දේපළ හානි සිදු කිරීම පිළිගත නොහැකි දෙයක් වුවත්, එහි මූල හේතුව වශයෙන් තවමත් සලකනු ලබන්නේ පවරා ඇති බහුතර-සුළුතර සම්බන්ධතා ධුරාවලි උල්ලංඝනය කිරීමයි.

# 1 වැනි පරිච්ඡේදය

# හැඳින්වීම

2019 මැයි මාසයේ දී ශ්‍රී ලංකාව 2009 වසරේ ජනවාර්ගිය යුද්ධය අවසාන වී දස වසරක් සම්පූර්ණවීම සැමරුවේය. යුද්ධය අවසන් වූ පසුව ගත වූ කාලය තුළ, රටේ විවිධ ජන ප්‍රජාවන් අතරවී වනවිටත් හීනවීමටලක්වී තිබූ සබඳතා තවදුරටත් පිරිහීමට සහ රාජ්‍ය සේවා හා ආයතන කෙරෙහි බලපෑම් ඇති කිරීමට හේතු වූ නව ව්‍යාපාරයක නැගී ඒම ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය තුළ දැකගත හැකි විය. 2012 වර්ෂයේ දී, භික්ෂු-නායකත්වයෙන් යුත් බොදු බල සේනා සංවිධානයේ මුලපිරීමෙන් ඇරඹි මෙම නව මුස්ලිම්-විරෝධී ව්‍යාපාරය එතැන් පටන් මේ දක්වාමහත් පරිවර්තනයකට ලක් වී ඇති අතර, විවිධ නම් යටතේ විවිධ වේදිකා මත මුස්ලිම් විරෝධී පණිවුඩය පතුරුවා හරින බොහෝ නියෝජිතයින් බිහි වී තිබේ. ශ්‍රී ලාංකික මුස්ලිම් ප්‍රජාව යනු 'අනෙකුන්' කොට්ටාසයක් ය යන මතවාදය ඔවුන් කෙතරම් සාර්ථක අන්දමින් ප්‍රචාරය කර ඇත් ද යත් යුද්ධය අවසානයේ පටන් මේ දක්වා කාලය තුළ මුස්ලිම් ජනතාවට එරෙහි ප්‍රචණ්ඩ සිදුවීම් කිහිපයක් ම සිදු වී තිබේ.

2018 මාර්තු 3-9 අතර කාලයේ දී මහනුවර දිස්ත්‍රික්කයේ සිදුවූ මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩත්වය මෙම වාර්තාව මගින් ලේඛනගත කරනු ලැබේ. මෙම සිදුවීම යුද්ධයෙන් පසුව සිංහල බෞද්ධ අනන්‍යතාවයක් ගත් කණ්ඩායම් විසින් සිදුකරන ලදහතර වැනි මහාපරිමාණ මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩකාරී විනාශයයි. එකී සිදුවීම් හතර වන්නේ 2014 වර්ෂයේදී අළුත්ගම, 2017 වර්ෂයේදී ගිංතොට, 2018 වර්ෂයේදී අම්පාර සහ 2018 වර්ෂයේදී මහනුවර සිදු වූ සිද්ධීන් ය.

මහනුවර සිදුවීම් මාලාව බොහෝදෙනාව විමතියට පත්කළ අතර රටේ මුස්ලිම් ප්‍රජාවන්ට එය විශේෂයෙන්ම කම්පනය ඇතිකරවන්නක් විය. 2015 ජනවාරි මාසයේ පැවති ජනාධිපතිවරණය සහ ඉන් පසුව පැවති මහමැතිවරණය අවස්ථාවේ දී මුස්ලිම් ඡන්ද දයකයින් වඩාත් වැඩි සංඛ්‍යාවක් ඡන්දපොළවලට ඇදී එනු දක්නට ලැබුණි. එවකට ජනාධිපති ධූරය හෙබවූ මහින්ද රාජපක්ෂ ජනපතිවරයාගේ පරාජයත් මෛත්‍රිපාල සිරිසේන නොහොත් 'පොදු අපේක්ෂකයාගේ' ජයග්‍රහණයත් සඳහා පෙරපැවති පාලන තන්ත්‍රයෙන් නිදහස්වීම අරමුණු කරගෙන මුස්ලිම් ජනතාව සියලු දෙනා එක්ව ඡන්දය ප්‍රකාශ කිරීම අඩ වශයෙන් දයක වූයේ යැයි සලකනු ලැබුණි. ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාව යහපාලන රජයට පක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමතමන්ගේ ජීවන රටාවත්, ව්‍යාපාරත් නිරන්තරයෙන් මුස්ලිම් විරෝධී ව්‍යාපාරයෙහිඉලක්ක බවට පත්වීම නවත්වාගැනීමට හැකි කරවන ක්‍රියාවක් වශයෙන් දක්නා ලදී.කෙසේනමුත්, දිගන ප්‍රදේශයේ ඇති වූ ප්‍රචණ්ඩත්වය ද, ප්‍රචණ්ඩත්වය ඇතිවීමේ තර්ජනය උග්‍ර වෙමින් පවතින බව මනාව පෙනෙන්නට තිබිය දී පවා රජය දැක්වූ ඇල්මැරුණු ප්‍රතිචාරය ද, අවසානයේ දී ප්‍රචණ්ඩ ක්‍රියා ආරම්භ වූවිට ඒවා නැවැත්වීමට රජය සැලකිය යුතු ප්‍රයත්නයක් නොදැරීම ද රටේ බොහෝ මුස්ලිම් ජනතාවගේ උද්යෝගය හීන කිරීමට හේතු වී තිබේ.මුස්ලිම් විරෝධී හැඟීම් දිගින් දිගටම සාධකයක් වශයෙන් පැවති බවත්, ප්‍රචණ්ඩත්වය ඇතිවීමට ඉඩ තිබෙන බවත් ගම්‍ය වන ඉඟි කිහිපයක්ම තිබී ඇත. මේ වනවිට ගිංතොට හා අම්පාර සිද්ධීන් සිදු වී තිබුණි. කෙසේනමුත් එම සිදුවීම් සීමිතප්‍රමාණයේ ඒවා වූ අතර ඒවා පාලනය කරගෙන තිබුණි. එවැනි ප්‍රචණ්ඩ ක්‍රියා සහිත ඉතිහාසය මගින් පෙන්නුම් කරන්නේ එවැනි සිදුවීමක් දින ගණනාවක් ඔස්සේ ව්‍යාප්ත වී යාමට නම් ප්‍රාදේශීය හා ජාතික මට්ටමෙන් බලයේ සිටින විවිධ බලධාරීන් ඒ සඳහා හවුල්වීම ඔස්සේ ඊට ඉඩදී තිබිය යුතු බවයි. දිගන හා ඒ ආසන්න ප්‍රදේශවල ප්‍රචණ්ඩත්වය දින කිහිපයක් පුරා පැවතීම මගින් පෙන්නුම් කෙරෙන්නේ ප්‍රචණ්ඩත්වය ඇතිවන්නට ඉඩ ලබාදුන් පුද්ගලයින්යහපාලන ආණ්ඩුසමයෙහි පවා බලධාරීන් වශයෙන් සිට ඇති බවයි. මුස්ලිම් විරෝධී ව්‍යාපාරය තවදුරටත් පෙර පැවති ආණ්ඩුවේ දේශපාලනයෙහි උපලක්ෂණයක් වශයෙන් සැලකිය නොහැකි විය. එක්වරම පැහැදිලි වූ කරුණ නම්, මුස්ලිම් විරෝධී 'කෝලාහල' නොහොත් මුස්ලිම් ජනතාවට එරෙහි සංවිධානාත්මක ප්‍රචණ්ඩත්වය නුදුරු අනාගතය සඳහා රට තුළ යථාර්ථයක් වී ඇති බවයි.

සිදුවීම ඇතිවීමෙන් පසු මාසවල දී, ඉන් පීඩාවට පත් වූ ප්‍රදේශවල ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සිදු කර සම්පාදන කළ මෙම වාර්තාව මගින් පහත දැක්වෙන දෑ සිදුකිරීමට ප්‍රයත්න දරනු ලැබේ:

- කලහකාරී පිරිස් අතින් ඇති වූ ප්‍රචණ්ඩත්වය දක්වා ක්‍රමයෙන් වර්ධනය වූ සිදුවීම් විස්තර කිරීම;
- විවිධ දිනයන්හි ප්‍රචණ්ඩත්වය ඇතිවූ අන්දම සිතියම්ගත කිරීම;
- අකුරණ අටේ කණුව ප්‍රදේශය සම්බන්ධයෙන් සිද්ධි අධ්‍යනයක් ලබාදීම (ප්‍රචණ්ඩත්වය ඇතිවීමේ ප්‍රතිවිපාකයක් වශයෙන් සබඳතාවල සිදු වූ බිඳවැටීම සඳහා උදාහරණයක් වශයෙන්);
- තමන් දැක්වූ ප්‍රතිචාරය පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් කළ විස්තරය ඉදිරිපත් කිරීම;
- ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ඒවා සිදුකළපුද්ගලයින් ලබාදුන් විස්තර විශ්ලේෂණය කිරීම;
- සිදුවීමෙන් පසුව දේශපාලනඥයින් සහ සිවිල් සමාජ සංවිධාන එයට දැක්වූ ප්‍රතිචාර ඉදිරිපත් කිරීම;
- සිදුවීමෙන් අනතුරුව ගත වූ සතිවලදී පුවත්පත් එම ප්‍රචණ්ඩත්වය විස්තර කළ අන්දම පිළිබඳව විශ්ලේෂණයක් ලබාදීම.

දිගන වෙළඳපොළේ මුස්ලිම් වෙළඳුන් සිදුවූ දෙයින් විමතියට පත් වූ බවක් පෙනෙන්නට නොතිබුණ අතර, මෙවැන්නක් නැවත වරක් සිදුවේ ය යන විශ්වාසයක් ඔවුන් තුළතිබූ බව පෙනෙන්නට තිබුණි. මහනුවර සිදුවීමෙන් පසුව, ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාවට එරෙහි ප්‍රචණ්ඩත්වය නුදුරු අනාගතය සඳහා යථාර්ථයක් වී ඇති බව පෙන්නුම් කළේ ය. මුස්ලිම් යුධකාමීන් 9දෙනෙකු විසින් පාස්කු දින බෝම්බ ප්‍රහර එල්ල කිරීමත්, ඉන් පසුව පොදුවේ මුස්ලිම් ජනතාවගේ දෝෂාරෝපණත්වය පිළිබඳ වෘත්තාන්තය පෝෂණය වීමත් මගින් එසේ වීමට ඇති හැකියාව තවදුරත් වැඩිවී තිබේ.

2019 අප්‍රේල් 21වැනි දින ඉස්ලාම් යුධකාමී මරාගෙන මැරෙන බෝම්බකරුවන් රටේ ස්ථාන හයක බෝම්බ පුපුරුවාහැරී අතර පුද්ගලයින් 269ක් මරුමුවට පත් කළ මෙමප්‍රහාරය මගින් ජීවිත හා ප්‍රජාවන් විනාශ කර රටේ දේශපාලනය සම්පූර්ණයෙන්ම පරිවර්තනයකට ලක් කළේ ය. එය වැළැක්වීමට ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ඉතාමත් සුළුවෙන් වූ බැවින් යුද්ධය අවසාන වූ තැන් පටන් මෙරට ක්‍රියාත්මකව තිබූ එක්තරා ව්‍යාපාරයක් විසින් ප්‍රචාරණය කළ මුස්ලිම්-විරෝධී මතය සඳහා සැලකිය යුතු ජනතා සහයෝගයක් ලැබෙන්නට විය. මුස්ලිම් ජනතාවගේ ද්‍රෝහීත්වය පිළිබඳව මෙම ව්‍යාපාරය ප්‍රචාරණය කළ වාගාලංකාර ජාතික මට්ටමේ සංවාද තලයට ඔසවා තබනු ලැබීමමෙම බෝම්බ ප්‍රහාරයේ ප්‍රතිවිපාකයක් විය.පහත වාර්තාවේ දැක්වෙන්නේ මෙම බෝම්බ ප්‍රහාරවලට පෙරාතුව සිදුවූ මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්ව සිදුවීම් සම්බන්ධයෙන් වේ. බෝම්බ ප්‍රහාරවලට ප්‍රතිචාර වශයෙන් වර්තමානයේ දී මුස්ලිම් ජනතාවට එරෙහි වෛරය දේශානුකූලනය වෙමින් තිබේ. කෙසේනමුත්, වර්තමානයේ දී බොහෝ සිංහල ජනතාව අතර ඇති ජනප්‍රිය සංවේදීතා සහ දශකයකට ආසන්න කාලයක් තිස්සේ සක්‍රියව ප්‍රචාරණය කෙරුණු මුස්ලිම් විරෝධී ව්‍යාපාරයේ චින්තනය අතර සම්බන්ධතා පවතින බව මෙහිදී අවධානයට ගැනීම වැදගත් වේ.දිගන ඇති වූ ප්‍රචණ්ඩත්වය, අප්‍රේල් මාසයේ සිදු වූ බෝම්බ ප්‍රහාරවලට පෙර සිදු වූ එවැනි බොහෝ සිද්ධි සඳහා එක් උදාහරණයකි. එය බෝම්බ ප්‍රහාරවලින් පසුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුදාහැරුණු මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වයට බොහෝ සමානකම් දක්වයි. බෝම්බකරුවන්ගේ ‘රැඩිකල්කරණය’ අළුත්ගම සහ දිගන ඇති වූ ප්‍රචණ්ඩත්වය සමග සම්බන්ධ යැයි ද කියනු ලැබේ. කෙසේනමුත්, බෝම්බ ප්‍රහාරවලට පෙර සහ පසුව මුස්ලිම් විරෝධී ක්‍රියා සඳහා පිරිස් එක්රැස් කර මෙහෙයවීම තුළ යම් යම් සම්බන්ධකම් තිබේ. එය බෝම්බකරුවන්එයට පෙළඹවීම හා බැඳුණු සම්බන්ධතාවයක් ලෙස දැකීමකට පමණක් එය ලඝු කළ නොහැකි ය. එබැවින්, දිගන සිදුවීමට පාදක වූ හේතු සාධක සහ එම සිදුවීම්වල සමාජ, දේශපාලන හා ආර්ථික ප්‍රතිවිපාක පිළිබඳ දැනුවත් වීම 2019 අප්‍රේල් බෝම්බ ප්‍රහාරවලින් නැවතත් යථාතත්වයට පත්වීමට දරන වෑයම් ඉදිරියට ගෙන යාම සඳහා ද වැදගත් වන බව අපි විශ්වාස කරන්නෙමු. අළුත්ගම සහ දිගන ප්‍රදේශවල ප්‍රචණ්ඩත්වය ඇතිවීම සඳහා වපුරා පෝෂණය කරනු ලැබූ මුස්ලිම් විරෝධී මත, විවිධ මට්ටම්වලින් ප්‍රතිචාර දැක්විය යුතු වන, නැවත නැවතත් ඇතිවන රටාවක කොටසක් වශයෙන් හඳුනා ගත යුතු බව අපගේ විශ්වාසයයි.

**ක්‍රමවේදය**

මෙම වාර්තාව සඳහා සිදුකළ පර්යේෂණ කටයුතු විවිධ පාර්ශ්වකරුවන් සමග පවත්වන ලද සම්මුඛ සාකච්ඡා සහිත ක්ෂේත්‍ර චාරිකාවලින් සමන්විත විය. කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්ය ෆර්සානා හනීෆා එම කණ්ඩායමට නායකත්වය ලබාදුන් අතර (ඇය සියළුම චාරිකා සඳහා සහභාගි වූවා ය) ආචාර්ය විජය ජයතිලක (පේරාදෙණිය විශ්වවිද්‍යාලය), ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අර්ජුන පරාක්‍රම (පේරාදෙණිය විශ්වවිද්‍යාලය), මහාචාර්ය සුමති සිවමෝහන් (පේරාදෙණිය විශ්වවිද්‍යාලය), සහ මහාචාර්ය ෂාමලා කුමාර් (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) එම කණ්ඩායමට ඇතුළත් විය. අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම සහ තාක්ෂණික සහාය සපයා දීම නීතිය හා සමාජ භාරයේ මෙගාරා ටීගල් සහ නයිජල් නුගවෙලගෙන් සැදුම් ලත් කණ්ඩායම විසින් සිදු කරන ලදී. ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සඳහා නජා මොහොමඩ් සහ හලීම් ඉෂාක් පහසුකම් සපයා දුන් අතර, අපගේ කටයුතු සඳහා මහනුවර දිසාපතිවරයාගේ සහාය ලබාගත්තෙමු. ක්ෂේත්‍රයේ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමේ දී කණ්ඩායමට දිගන ආපදා සේවා මධ්‍යස්ථානයේ සහාය ලැබුණි.

සිවු මාසයක කාලයක් තුළ (2018 මාර්තු සිට ජූලි දක්වා) සිදුකළ දෙදින ක්ෂේත්‍ර චාරිකා 5ක් ඔස්සේ මහනුවර දිස්ත්‍රික්කයේ පීඩාවට පත්වූ ප්‍රදේශවල සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. මුස්ලිම් පල්ලි කමිටු සහ ප්‍රජා නායකයින් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා පල්ලි දෙකක දී ද, පුද්ගලයින් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා පීඩාවට පත් වූ එම පුද්ගලයින්ගේ නිවෙස්වල දී ද, මියගිය කුමාරසිංහගේ ගමේ භික්ෂූන් වහන්සේ ඇතුළු භික්ෂූන් වහන්සේලා පස් නමක්සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා විහාරස්ථාන වලදී ද සිදුකරන ලදී. විශේෂ කාර්ය බලකායේ අඩන්තේට්ටම්වලට සහ අත් අඩංගුවට ගැනීමට ලක් වූ (පහත විස්තර බලන්න) එම්. ෆාසිල් සහ ඒ.එස්.එම්. ෆාසිල් සමගින් අපි සම්මුඛ සාකච්ඡා පැවැත්වූ අතර, මහනුවර, දිගන සහ අකුරණ මුස්ලිම් පල්ලි කමිටු සමග ද කථාබහ කළෙමු.

මහනුවර දිස්ත්‍රික්කයේ පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවලට අමතරව අපි පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියේ(වන්දි කාර්යාලයේ)ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග සහ කොළඹ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සමග ද සම්මුඛ සාකච්ඡා පැවැත්වූයෙමු. මුස්ලිම් විරෝධී මත සඳහා පුද්ගලයින් ඒකරාශී කර මෙහෙයවීම සම්බන්ධයෙන් පවතින ග්‍රන්ථ හා ලිපිලේඛන සමාලෝචනයකිරීම මගින් සිදුවීම සම්බන්ධයෙන් වූ පුවත් වාර්තාකරණය පිළිබඳව දළ විශ්ලේෂණයක් සහ විවිධ දේශපාලනඥයින් හා සිවිල් සමාජ ක්‍රියාධරයින් මෙම සිදුවීම සම්බන්ධයෙන් පළකළ අදහස් පිළිබඳ විශ්ලේෂණයක් සිදුකරන ලදී.

ෆර්සානා හනීෆා විසින් වාර්තාව ලියන ලද අතර මෙගාරා ටීගල් ඊට සහාය ලබාදුන්නාය. 2018 අගෝස්තු මාසයේදී සාරාංශ වාර්තාවක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී (2 වැනි ඇමුණුම බලන්න). වාර්තාව සම්පාදන කිරීමේ අවධියේ දී කණ්ඩායමේ සාමාජිකයින්ගේ අදහස් විමසීමේ වට පහක් පවත්වන කරන ලදී.

2018 මාර්තු මාසයේ දී ඇති වූ සිදුවීම්වලින් දෙවසරකට පසුව සිදුවූ තවත් බොහෝ සිදුවීම් හේතුවෙන් එදා 2018 මාර්තු මාසයේ සිදු වූ සිදුවීම් පිළිබඳ මහජනයාගේඅවධානය මැකී ගිය කාලයක මෙම වාර්තාව නිකුත් කරන බව අප සටහන් කරන්නේ කණගාටුවෙනි. කෙසේ නමුත්, ඉතිහාසගත වන වැදගත්කමකින් යුත් තොරතුරු හා විශ්ලේෂණ මෙම වාර්තාවේ අන්තර්ගත වන බවත් වර්තමාන ක්‍රියාවාදයට සහ ප්‍රතිපත්තිවලට ඉන් බලපෑමක් ඇති කෙරෙනු ඇති බවත් අපගේ හැඟීමයි. දිගන සිදුවීම් වර්තමාන තත්වයට අදාළ වන අන්දම සම්බන්ධයෙන් මෙම වාර්තාව පසුබිම සකසා දෙයි.

# 2 වැනි පරිච්ඡේදය

# දිගන, තෙල්දෙණිය හා අකුරණ ඇති වූ ප්‍රචණ්ඩත්වය

**පසුබිම: ජාතික සහ ප්‍රාදේශීය දේශපාලනය**

අප සමග කථාබහ කළ දිගන හා ඒ අවට ප්‍රදේශවල බොහෝදෙනා මුස්ලිම් විරෝධී මත ප්‍රචාරය වීමට සහ පුද්ගලයින් ප්‍රචණ්ඩත්වයට පෙළඹවීම සඳහා 2018 ජනවාරියේ පැවති පළාත්පාලන ආයතන මැතිවරණය හේතු වූ බව සැලකූහ. එම මැතිවරණය වැදගත් වූයේ 2015 ජනාධිපතිවරණයෙන් සහ මහමැතිවරණයෙන් යන දෙකෙන් ම පරාජය වූ රාජපක්ෂ දේශපාලන වංශයේ 'නැවත පැමිණීම' එයින් සනිටුහන් වූ බැවිනි. පොහොට්ටුව ලකුණ යටතේ රාජපක්ෂ පවුල හා සබැඳි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් මැතිවරණයට තරඟ කළ අයට එම මැතිවරණයේ දී පෙර නොවූ විරූ ජයග්‍රහණයක් ලැබුණි. පළාත්පාලන ආයතන 350කට[5] ආසන්න සංඛ්‍යාවකින් ඔවුන් ආයතන 222ක ම බහුතර ආසන ප්‍රමාණයක් බැගින් ජයග්‍රහණය කළ අතර එක්සත් ජාතික පක්ෂය ආයතන 41ක් ජයග්‍රහණය කළේය. සිරිසේන ජනාධිපතිවරයාගේ නායකත්වය යටතේ වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජයග්‍රහණය කළේ ආයතන 7ක් පමණි. විවෘතව සුළුතර විරෝධී සහ සිංහල ආධිපත්‍ය පිළිබඳ පරමාදර්ශ පෝෂණය කළ පෙර පාලනතන්ත්‍ර සාමාජිකයින් මෙම මැතිවරණයෙන් ධෛර්යය ලැබූ අතර, ප්‍රචණ්ඩත්වය ඔවුන්ට ලැබුණු වලංගුභාවයේ ප්‍රතිවිපාකයක් වශයෙන් සලකනු ලැබීය. මෙම සිදුවීමෙන් පසුව අත් අඩංගුවට ගනු ලැබූ පුද්ගලයින් අතර අලුතින් පළාත්පාලන ආයතනවලට තේරී පත්වුනු සභිකයෝ ද සිටිති. තවද, මෙම මැතිවරණය රටේ දේශපාලන වින්‍යාසය තුළ සැලකියයුතු වෙනසක් ඇතිවන බව බොහෝ විශ්ලේෂකයින් වෙත සංඥා කළේය. ජනාධිපතිවරයා විසින් අගමැතිවරයාට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් ගෙනැවිත් තිබුණි. රාජපක්ෂ මන්ත්‍රීවරයා නව මැතිවරණයක් ඉල්ලා සිටියේ ය. අනෙකුත් විශ්ලේෂකයින් (ජනතා විමුක්ති පෙරමුණෙහි පක්ෂ නායකයා ද ඇතුළුව - මෙහි ඉදිරි පරිච්ඡේදයක අපි ඔහුගේ ස්ථාවරය ඉදිරිපත් කර ඇත්තෙමු) තර්ක කළේ, එම ප්‍රචණ්ඩක්‍රියා එක්සත් ජාතික පක්ෂයට ද වාසි සහගත වූ බවයි. මෙම සිදුවීම් හේතුවෙන් අග්‍රාමාත්‍යවරයාට එරෙහිව නැගුණු විශ්වාසභංග චෝදනාවට යොමු වී තිබූ අවධානය අඩුවූ අතර, ආර්ථිකය වැනි කරුණු සම්බන්ධයෙන් එම පාලනතන්ත්‍රයේ තිබූ අසමත්වීම් තාවකාලිකව පසෙකට අතුගා දැමිය හැකි විය. පීඩාවට ලක්වූ ප්‍රදේශයෙහිසිටින අදහස් දැක්වූ පුද්ගලයින් දුටුවේ ප්‍රදේශයේ සිංහල ව්‍යාපාරික ප්‍රජාව මෙන්ම ප්‍රාදේශීය දේශපාලන ප්‍රභූන් ද තම එදිරිවාදීන්ගේ ව්‍යාපාර විනාශ වී යාමෙන් වාසි ලබා ගන්නා බවයි. ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ රවුෆ් හකීම් පෙන්වාදුන්නේ (පහත විස්තර බලන්න), ඉහත කී මැතිවරණයෙන් පසුව සභාග ආණ්ඩුව බරපතළ අවුල් ජාලයක පැටලී සිටි බවත්, රට අස්ථාවර තත්වයකට පත්ව තිබූ බවත් ය. මෙම අවුල් ස්වභාවය, ප්‍රචණ්ඩත්වය කළමනාකරණය කරගැනීම කෙරෙහි ද බලපෑ බවක් දැකිය හැකි යැයි හකීම් යෝජනා කරයි.

විවිධ කණ්ඩායම් විසින් සිදුකරන ලද මුස්ලිම් විරෝධී උද්ඝෝෂණ සඳහා වරින් වර මහනුවර දිස්ත්‍රික්කය විෂයය වී තිබේ. 2013 පෙබරවාරි මාසයේ දී බොදු බල සේනා සංවිධානය තම ප්‍රධානතම ජනහමුවක් මහනුවර දී පැවැත්වූ අතර, එහි දී හැඟීම් අවුස්සනසුළු කථාවක් පැවැත්වූ ඥානසාර හිමියන් බොදු බල සේනා සංවිධානය සහ මුස්ලිම් විරෝධී ව්‍යාපාරයට සහභාගී වන සියලු ම සිංහල ජනතාව බ්‍රිතාන්‍යයින්ට එරෙහිව කටයුතු කළ මහනුවර රදළ පරම්පරාවට සම කරමින් මුස්ලිම් ජනතාව යනු බ්‍රිතාන්‍ය යටත්විජිතකරුවන් මෙන් පිටස්තරයින් කොට්ඨාසයක් වන බව ඇඟවීය.[6] පසුව, 2013 ඔක්තෝබරයේ දී කොළඹ සිට මහනුවර දක්වා රිය පෙරහැරක් සංවිධානය කර තිබූ අතර, එම වසරේ මුල් කාලයේදී සමනය කරන ලද හලාල් විරෝධී උද්ඝෝෂණ එමගින් නැවත අවදි

[5]2017 දී 341ක් විය.

[6]Haniffa, Farzana (2017) *Conflict legacies and plural histories: what are the possibilities for Sri Lanka's future?* In Transitional Justice in Sri Lanka: moving beyond promises. Edited by Bhavani Fonseka. Colombo: Center for Policy Alternatives.

කරවන බවට බොදු බල සේනා සංවිධානය තර්ජනය කළේය.[7]එයට වසර කිහිපයකට පසුව මහසෝන් බලකාය විසින් දිගන නගරයේ කාර්යාලයක් විවෘත කරන ලදී. ඉන් පසුව, ඉතා මෑතකාලයේදී මහනුවර ඇති පැරණිතම මුස්ලිම් පල්ලිය සඳහා යෝජිත කුළුණක් සම්බන්ධයෙන් මතභේදයක් ඉස්මතු විය. 2016 ජුනි 5වැනි දින, ඉදිකිරීමට යෝජිතව තිබූ එම කුළුණ දළදා මාලිගාවට වඩා උස් වනු ඇතැයි චෝදනා කරමින් මැලේ හමුදා මුස්ලිම් පල්ලිය ඉදිරිපිට උද්ඝෝෂණයක් පවත්වන ලදී.[8] මහනුවර මුස්ලිම් පල්ලි කමිටුවේ නියෝජිතයෙකු පැවසූ අන්දමට, බොදු බල සේනාව මහනුවර වඩාත් ම ක්‍රියාකාරී වූ අවධියේ දී ප්‍රදේශයේ මුස්ලිම් ජනතාව සංවිධානය වී විවිධ බලධාරීන් හමුවට ගොස් එම ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවගේ ආරක්ෂාව සහතික කරන ලෙස ඉල්ලා සිට ඇත. ඔවුන් නියෝජ්‍ය පොලිස්පතිවරයා, පළාතේ ආණ්ඩුකාරවරයා හා ප්‍රධාන අමාත්‍යවරයා හමු වී මෙම ක්‍රියාකාරකම් මහනුවර වෙසෙන මුස්ලිම් ජනතාවට අනතුරු ඇඟවීමක් වන බව පවසා තිබේ. බලධාරීන් එය එතරම් සැලකිල්ලකට ගෙන නොමැති අතර, වර්තමානයේ සිට ආපසු හැරී දෙස බලන කල, අනිවාර්යයෙන්ම සිදුවන බවක් පෙනෙන්නට තිබූ එම ප්‍රචණ්ඩත්වය සිදුවීම වැළැක්වීම සඳහා කිසිදු සක්‍රීය ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව පැහැදිලි ය. සිදුවීම්වලින් පසුව අප හා කථාකළ මුස්ලිම් පුද්ගලයින්ගේ හැඟීම වූයේ තවත් එවැනි ප්‍රචණ්ඩ සිදුවීම් බොහොමයක් සිදුවනු ඇති බවයි.[9]

**අමිත් වීරසිංහ සහ මහසෝන් බලකාය**

පෙර සඳහන් කළ අන්දමට මහනුවර දිස්ත්‍රික්කය සහ දිගන ප්‍රදේශය, මහසෝන් බලකාය නැමැති මුස්ලිම් විරෝධී කණ්ඩායමකට නිවහන විය. අමිත් වීරසිංහ මෙහි නායකයා වන අතර ඔහුව හසුරුවන්නා ප්‍රාදේශීය දේශපාලනඥයෙකු බවට චෝදනා එල්ල වී තිබේ. සිංහල පුරාවෘත්තවල එන මහසෝනා නැමැති යක්ෂයාගේ නමින් අරඹන ලද මෙම සංවිධානයේ සාමාජිකයින් තමන් බුදුබණට හීලෑ වුනු යක්ෂයින් යැයි කියාගනු ලැබේ (අපි බුදුබණට හීලෑ වුනු යක්කු බොලවු). ඔවුන්ගේ සටන් පාඨ ෆේස්බුක් සහ විවිධ යූටියුබ් වීඩියෝ දර්ශන හරහා දැකගත හැකි අතර, ඒවායෙහි අරමුණ සුළුතර කණ්ඩායම්වලට එරෙහිව සිංහල තරුණයින් එක් රැස් කර මෙහෙයවීමයි.

ප්‍රචණ්ඩ ක්‍රියා ඇතිවීමට වසර කිහිපයකට පෙර සමාජ මාධ්‍යතුළ'වයිරල් වූ' නැත හොත් ශීඝ්‍රයෙන් සුපතළ වූ වීරසිංහ පෙනී සිටින වීඩියෝ දර්ශනයක් පිළිබඳව දිගන ප්‍රදේශයේ පීඩාවට පත් වූ මුස්ලිම් පුද්ගලයින් විසින් නැවත නැවතත් සඳහන් කරන ලදී. එම වීඩියෝවෙහි දැක්වෙන්නේ මහසෝන් බලකායේ අත්පත්‍රිකා බෙදමින් වීරසිංහ දිගන නගරයේ සැරිසරන අන්දමයි. තමන්ට අත් පත්‍රිකා බෙදදෙන්නට සිංහල කඩ විස්සක්වත් සොයාගැනීමට නොහැකි වූ බව ඔහු එම වීඩියෝපටයේ පවසයි. කඩ සාප්පු සියල්ලක් ම පාහේ මුස්ලිම් පුද්ගලයින්ට අයත් ඒවා ය. 'මේ ස්ථානය අහිමි වෙලා' ඇතැයි ඔහු එම වීඩියෝ පටයේ ප්‍රකාශ කරයි. තවත් වීඩියෝපටයක[10] වීරසිංහ තම තමන්ගේ නගරවල සිංහල ව්‍යාපාර ආරක්ෂා කරගත හැකි අන්දම පිළිබඳ සොයාබලන්නට වෙළඳුන්ව උනන්දු කරවයි. දිගන ප්‍රදේශයේ මුස්ලිම් ජනතාව මෙම වීඩියෝ දර්ශන සහ ප්‍රචණ්ඩත්වය අතර සම්බන්ධතාවයක් දුටුවෝය. අප්‍රේල් මාසයේ දී අමිත් වීරසිංහ අත් අඩංගුවට ගැනුණු අතර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුති පනත යටතේ චෝදනා එල්ල වූ ඔහුට මාස කිහිපයක් සිරභාරයේ සිටින්නට සිදුවිය. අප්‍රේල් මාසයේ පැවති නඩුවිභාගයේ දී ඔහුට ඇප ලබා නොදුන්නත් 2018 ඔක්තෝබර් මාසයේ දී රු. 25,000ක මුදල් ඇප සහ රු.50,000ක ශරීර ඇප මත ඔහුව මුදාහරින ලදී. ආපසු පැමිණි ඔහුව දිගන නගරයේ දී උත්සවාකාරයෙන් පිළිගනු ලැබීය.

2018 ජුනි මාසයේ දී කලම්බු ටෙලිග්‍රාෆ් වෙබ් අඩවියේ බොදු බල සේනා සංවිධානයේ ලේකම් ඥානසාර හිමියන් සහ මහසෝන් බලකායේ කැඳවුම්කරු අමිත් වීරසිංහ යැයි හඳුනාගත හැකි

---

[7]"BBS Re-launches Anti-Halal Campaign," *Daily Financial Times*, 23 October 2013. http://www.ft.lk/news/bbs-re-launches-anti-halal-campaign/56-204356

[8]Mass L. Usuf, "Protest Opposite the Malay Military Mosque in Kandy," *Colombo Telegraph*, June 9, 2016. https://www.colombotelegraph.com/index.php/protest-opposite-the-malay-military-mosque-in-kandy/

[9]උදාහරණ වශයෙන්, මෙම වාර්තාවේ සාරාංශ කොට ඇති ජ.වි.පෙ. නායක අනුර කුමාර දිසානායක ලබා දුන් විශ්ලේෂණය සහ ඉන්දි සමරජීව විසින් පළකර ඇති පහත බ්ලොග් අඩවිය බලන්න: https://medium.com/@indica/riots-will-happen-again-in-srilanka-a12510823a1d

[10]Zaheena Rasheed, "In Sri Lanka, Hate Speech and Impunity Fuel Anti-Muslim Violence," *Aljazeera, 13 Mar 2018* https://www.aljazeera.com/news/2018/3/13/in-sri-lanka-hate-speech-and-impunity-fuel-anti-muslim-violence

දෙදෙනෙක් තරුණ හා මැදිවියේ පුරුෂයින් විශාල පිරිසක් මධ්‍යයෙහි සිට මුස්ලිම් ප්‍රජාවන්ට පහර දෙන ආකාරය පිළිබඳ විස්තර කථා කරමින් සිටින වීඩියෝවක් පළකරන ලදී. එම සාකච්ඡාව මුස්ලිම් ජනතාවට 'ගහන්න'[11]අවශ්‍ය කරන සැලසුම් සම්බන්ධයෙන් විය. ඔවුන් සිටි එම ස්ථානයේ (අම්පාර)තවදුරටත් ප්‍රහාර සිදුකිරීමෙන් වැළකී සිටීම සඳහා ඥානසාර හිමියන් සහ අනෙක් පිරිස පොළඹවා ගැනීමට අමිත් වීරසිංහ වෑයම් දරන අන්දමක් පෙනෙන්නට තිබේ. මෙවැනි කටයුතු සංවිධානය කිරීමේ සහ ඊට මුදල් සොයාගැනීමේ දුෂ්කරතා පිළිබඳව (පිරිස් සඳහා දිවා ආහාර පාර්සල් සැපයීමට අම්පාරේ ව්‍යාපාරිකයින්ට වැඳ වැටීමට තමන්ට සිදුවූ අන්දම පිළිබඳව) සහ මෙවැනි කටයුතු කිරීමේ දී පොලීසියට හසුවන්නට ඇති ඉඩ පිළිබඳව ඔවුහු සාකච්ඡා කරති. පොලීසිය කඳුළු ගෑස් භාවිතා කිරීමට ඉඩ ඇති බවත්, එබැවින් ඔවුන්ගේ කණ්ඩායමේ සාමාජිකයින් පොලීසියට හසුවීමට ඇති ඉඩකඩ වැඩි බවත් පවසන වීරසිංහ, පොලීසියට හසුවන අයට උදව් කිරීමත්, ඔවුන්ට ඇප මුදල් හා ශරීර ඇප සොයාගැනීමත් දුෂ්කර වියහැකි බව පවසයි. දැනට එම ක්‍රියාවලින් වැළකී සිටින මෙන් ඔහු ඔවුන්ගෙන් ඉල්ලා සිටියි. 'නුවරට, කොහෙට හරි ගහමු'[12] යනුවෙන් ඔහු පවසන අන්දම ද ඇසේ. ප්‍රහාරයෙන් සති කිහිපයකට පසුව පවා මහසෝන් බලකායෙහි බලපෑම පෙනෙන්නට තිබුණි. ප්‍රහාරවලින් මාස 4කට ආසන්න කාලයකට පසුව එම ප්‍රදේශයේ ජනතාව සමගින් කථාකරන විට ද, පැවති පීඩනයට ලක්වූ පරිසරය සහ අනාරක්ෂිත හැඟීම් පිළිබඳව ඔවුන් අපට පවසන ලදී. එක් පවුලකට එරෙහිව එල්ල කර තිබූ නිර්නාමික මරණ තර්ජනයක් ද අපට පෙන්වන ලදී. එම සටහනෙහි අපි යක්කු යනුවෙන් ලියා තිබුණි.

### ක්‍රියාරම්භක සිදුවීම සහ ප්‍රජාවෙහි ප්‍රතිචාරය

2018 මාර්තු 3වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ අඹල නගරයේ පදිංචිකරුවෙකු වූ කුමාරසිංහ තමන්ගේ නිවසට කිලෝමීටර 25ක් පමණ දුරින් පිහිටි දිගන මහවැලි නගරය ආසන්නයේ ඉන්ධන පිරවුම්හලක දී බීමත් මුස්ලිම් තරුණයින් සිවු දෙනෙකු සමගින් ඇති වූ අඬදබරයක් අතරතුර සිදු වූ තුවාල හේතුවෙන් මරණයට පත් විය. මෙම බීමත් මුස්ලිම් තරුණයින් හතරදෙනා ත්‍රිරෝද රථයකින් පැමිණ කුමාරසිංහගේ වෑන් රථය පසුකර යන්නට උත්සාහ කර ඇති අතර, එයට ඉඩ නොලැබීම හේතුවෙන් ඔවුන් දැඩි සේ කෝපයට පත් වී තිබේ. මෙම කලහය සිදු වූයේ කුමාරසිංහගේ මරණයට දින නවයකට පෙරයි.

කුමාරසිංහ ගේ මරණය සිදු වූයේ රට පුරා මුස්ලිම් විරෝධී ආතතීන් පවතින පසුබිමක් අතරවාරයේ ය. එම සිද්ධියෙන් පසුව සමාජ මාධ්‍ය තුළ මුස්ලිම් විරෝධී වෛරී වාගාලංකාර ක්‍රමයෙන් වර්ධනය වී තිබේ. කුමාරසිංහ ගේ මරණය වාර්තාවීමට දින කිහිපයකට පෙර නැගෙනහිර පළාතේ අම්පාර නගරයේ ගැටුම්කාරී තත්වයක් නිර්මාණය වීතිබූ අතර, එහිදී සිදුව තිබුණේ සිංහල පාරිභෝගිකයින්ට ලබාදෙන ආහාරවලට වඳ පෙති එක් කළේ යැයි එම ප්‍රදේශයේ ආපනශාලා හිමිකරුවකුට චෝදනා එල්ලවීමයි. එම පාරිභෝගිකයා තමන්ගේ මිතුරන් කිහිප දෙනෙක් කැඳවාගෙන හෝටල් හිමියාට පහර දී හෝටලයට ද හානි කර එයට ගිනිතබා තිබේ. එම රාත්‍රියේදී එකතු වූ කලහකාරී පිරිස වර්ධනය වී ඒ ආසන්නයේ වූ පල්ලියකටත්, කඩවල් හතරකටත්, වාහන කිහිපයකටත් හානි කර තිබේ.[13] මෙම සිද්ධිය සිදු වූයේ 2018 පෙබරවාරි 26වැනි දින ය. 'ඉස්ලාම් ආගමට හැරෙන ලෙස පුද්ගලයින්ට බල කරන්නේ යැයි සහ බෞද්ධ පුරාවිද්‍යාත්මක ස්ථාන විනාශ කරන්නේ යැයි ඇතැම් දැඩිමතධාරී බෞද්ධ කණ්ඩායම් මුස්ලිම් ජනතාව වෙත චෝදනා කිරීමත්' සමග එයට පෙර වර්ෂයේ සිට ම එම

[11]"Exclusive: Mahason Balakaya Leader Caught On Video Plotting Anti-Muslim Attacks With BBS Gnanasara," *Colombo Telegraph*, March 7, 2018
https://www.colombotelegraph.com/index.php/exclusive-mahason-balakaya-leader-caught-on-video-plotting-antimuslim-attacks-with-bbs-gnanasara/

[12]කලම්බු ටෙලිග්‍රාෆ් වෙබ් අඩවියේ මෙම වීඩියෝ පටය පළකරන ලද්දේ 2018 ජූනි මාසයේදී ය. එතරම් පැහැදිලි නැති, දින නොයෙදූ, පටිගත කළ අයෙක් සඳහන් නොවන මෙවැනි වීඩියෝවකින් කොතරම් දෑ හඳුනාගත හැකි ද යන්න නොපැහැදිලි ය. එහෙත් අවම වශයෙන් ඉන් අපට ඒක රාශී වී සිටින පිරිස්වල වයස පිළිබඳව වත් අදහසක් ලබාගත හැකිය. එහි සිටින්නේ වයස අවු. 30 මුල්භාගය නොඉක්මවූ තරුණ සිංහල පිරිමින් වේ. එසේම මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය ඇවිලවීමේ ව්‍යාපාරය සඳහා ඥානසාර හිමියන් සහ අමිත් වීරසිංහ කැපවී සිටින බවක් ද ඔවුන්ගේ ව්‍යාපෘති කරගෙන යාම සඳහා ව්‍යාපාරිකයින්ගෙන් ලැබෙන මුදල් මත යැපෙන බවක් ද පෙනේ.  පසුව හෙළිදරව්වූ වූ අන්දමට  මෙම වීඩියෝපටය 2015දී පටිගත කළ එකක් විය.

[13]"Mosque vandalised in Ampara," *Aljazeera*, 27 Feb 2018
https://www.aljazeera.com/news/2018/02/mosque-vandalized-sri-lanka-ampara-180227144548660.html

ආතතීන් කැකෑරෙමින් පැවතී ඇත.[14] අඟහරුවාදා දින(පෙබරවාරි 27) පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමක දී රවුෆ් හකීම්, මනෝ ගනේෂන්, දයා ගමගේ සහ රිෂාඩ් බතියුදීන් යන අමාත්‍යවරුන් අම්පාරේ ජාතිවාදී ප්‍රචණ්ඩත්වය සඳහා වගකිවයුත්තන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට රජය උනන්දු කරවා තිබේ.[15]අම්පාරේදී මුස්ලිම්වරුන්ට එල්ල වූ ප්‍රහාරයෙන් සහ කලහකාරීන් විසින් ඔවුන්ගේ දේපළ විනාශ කිරීමෙන් පසුව ඉස්ලාමික සහයෝගිතා සංවිධානය (OIC) ඒ පිළිබඳව තමන්ගේදැඩි කනස්සල්ල ප්‍රකාශ කර තිබූ බව සවුදි පුවත් ඒජන්සිය වාර්තා කර තිබුණි.[16] ඊට සතියකට ආසන්න කාලයකට පසුව, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය අනිල් ජාසිංහ විසින් නිකුත් කළ ප්‍රකාශයකින් වඳපෙති යනු මිථ්‍යා මතයක් බවට ජනතාව දැනුවත් කළ අතර, වන්ද්‍යාකරණය කළහැක්කේ සැත්කම්වලින් පමණක් බව අවධාරණය කරන ලදී.[17] ඒ වනවිට පොලීසිය විසින් ඉදිරිපත් කර තිබූ මූලික වාර්තාව අසම්පූර්ණ බැවින් නැගෙනහිර සිදුවූ සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වන මෙන් අග්‍රාමාත්‍ය හා නීතිය හා සාමය පිළිබඳ අමාත්‍ය රනිල් වික්‍රමසිංහ විසින් (මාර්තු 4) නියෝග කරන විටත් මහනුවර දිස්ත්‍රික්කයේ ආතතීන් වර්ධනය වෙමින් පැවතී ඇත.[18]

ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සිදුවීම් පිළිබඳව ශ්‍රී ලංකාවට දීර්ඝ ඉතිහාසයක් ඇති අතර, දිගන සිදුවූ මෙම සිදුවීම් ද එක් කොටසක් වන මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්ව සංසිද්ධිය ද එම ඉතිහාසයෙහි කොටසක් ලෙස හඳුනාගත යුතු ය. එවැනි සිදුවීම් ඇතිවීම සඳහා යම්කිසි මූලාරම්භකසිද්ධියක් සාමාන්‍යයෙන් මුලින්ම ඇති වෙයි. 2014 වර්ෂයේ අළුත්ගම ඇතිවූ සිදුවීම් වලදී එමමූලාරම්භක සිද්ධිය වූයේ වෑන් රථයක ගමන්ගත් භික්ෂුවක් සහ ගමන්මග අහුරා තිබූ ත්‍රීරෝද රථයක සිටි මුස්ලිම් තරුණයින් තිදෙනෙකු අතරේ ඇතිවූ බහින්බස්වීමකි. තෙල්දෙණිය, දිගන දී අවසානයේ ජීවිතය අහිමි වී ගිය කුමාරසිංහ වෙත එල්ල වූ ප්‍රහාරය එම මූලාරම්භක සිද්ධිය විය. මෙම සිදුවීම් දක්වා වන කාලය තුළසිදු වූ මූලාරම්භක සිද්ධි සොයාගිය හෝ ඒවා නිර්මාණය කළ වරදකරුවන් හෝ කණ්ඩායම් සඳහා ද සාක්ෂි තිබේ. අම්පාරේ හෝටලයක වඳපෙති සහිත ආහාර සොයාගැනීමේ ගැටළුව දිගන සිදුවීමට පූර්විකාවක් විය. 2014 වර්ෂයේ අළුත්ගම සිදුවීමට මාසයකට පෙර ද, මේ හා සමාන ම මූලාරම්භක් වියහැකි සිද්ධියක් සිදුවිය. සිංහල පාරිභෝගිකයකුගේ දරුවෙකු අනිසි ලෙස ස්පර්ශ කළේ යැයි මුස්ලිම් කඩහිමියෙකුට චෝදනා එල්ල විය. ඊට විරෝධතාවය පළ කරමින් විශාල පිරිසක් රැස් වූ අතර, එම කඩය ගිනිබත් කරන ලදී. ඉහත සඳහන් කළ සිද්ධියට මාසයකට පසුව, ජන කණ්ඩායම් පොළඹවාගැනීම සඳහා කුපිතකරවනසුළු වාගාලංකාර යොදගත් පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර හිමියන් නොහොත් බොදු බල සේනා සංවිධානයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ ජනහමුවකින් අනතුරුව වඩාත් විශාල විනාශකාරී සිදුවීම් ඇතිවිය.[19]

අළුත්ගම හා තෙල්දෙණිය යන සිදුවීම් දෙකෙහිදී ම, ප්‍රචණ්ඩත්වය පුපුරායාම අඩුකරගැනීම සඳහා ප්‍රයත්න දරා තිබේ. අළුත්ගම ප්‍රදේශයේ නොඉවසුම් තත්වයන් වැඩිවන විට මුස්ලිම් ක්‍රියාධරයින් ප්‍රදේශයේ පොලීසිය සහ කොළඹ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකු සමග සම්බන්ධ වී මුස්ලිම් විරෝධී මතවාද ඇවිස්සීම සම්බන්ධයෙන් සුප්‍රකට පූජ්‍ය ඥනසාර හිමියන්ගේ නායකත්වයෙන් පැවැත්වීමට නියමිත බොදු බල සේනා ජනහමුව අවලංගු කරන මෙන් ඉල්ලා තිබේ. එය ප්‍රතික්ෂේප කළ පොලීසිය රැස්වීම පැවැත්වීමට ඉඩ දෙන මෙන් තමන්ට 'ඉහළින්' උපදෙස් ලැබී තිබෙන බව පවසා ඇත (පුද්ගලික සන්නිවේදනය, දර්ගා නගරයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී බතියුදීන් හාජියාර්).

---

[14]"Mosque Vandalised in Ampara," *Aljazeera*, 27 Feb 2018
https://www.aljazeera.com/news/2018/02/mosquevandalized-sri-lanka-ampara-180227144548660.html

[15]Kelum Bandara, "Four Ministers Want Action against Ampara Violence," *Daily Mirror*,
http://www.dailymirror.lk/article/Four-Ministers-want-action-against-Ampara-violence-146600.html

[16]"OIC Voices Concern Over Attacks Against Muslims in Sri Lanka," *Saudi Gazette*, March 2, 2018
http://saudigazette.com.sa/article/529535/SAUDI-ARABIA/OIC-voices-concern-over-attacks-against-Muslimsin-Sri-Lanka

[17]"No Infertility Tablets in Western Medicine: Health DG," *Daily Mirror*, 4 March 2018
http://www.dailymirror.lk/article/No-infertility-tablets-in-western-medicine-Health-DG-146732.html

[18]Yohan Perera, "PM Orders to Probe Ampara Incident," *Daily Mirror*, 4 March 2018
http://www.dailymirror.lk/146738/PM-orders-to-probe-Ampara-incident

[19]Farzana Haniffa et al., *Where Have All the Neighbours Gone? Aluthgama Riots and Its Aftermath: A Fact-Finding Mission to Aluthgama, Dharga Town, Valipanna, and Beruwela*. Law and Society Trust 2014,
https://lstlanka.org/wpcontent/uploads/2017/11/aluthgama-report-final-english.pdf

ප්‍රදේශයේ විශේෂ කාර්ය බලකායේ සාමාජිකයින් විශාල සංඛ්‍යාවක් සිටින බැවින් ප්‍රචණ්ඩත්වය වලක්වාගත හැකි බවට ඔවුන්ට සහතික කරනු ලැබුව ද,එසේ තිබියදීත් අවසානයේ දී ප්‍රචණ්ඩත්වය ඇතිවිය.

කුමාරසිංහ සහ මුස්ලිම් තරුණයින් අතර ඇතිවූ බහින්බස්වීමෙන් පසුව දිගන සහ තෙල්දෙණිය ප්‍රදේශවල නොඉවසුම් තත්වය කෙමෙන් උත්සන්න වෙමින් පැවත ඇති අතර, කුමාරසිංහ සිහි සුන්වී රෝහලේ සිටි කාලය තුළ එය උග්‍ර වී තිබේ. ඒ කාලය තුළඋත්සන්න වෙමින් පැවති ආතතිකාරී තත්වය සම්බන්ධයෙන් කුමක් කළයුතුදැයි සාකච්ඡා කිරීමට පොලීසිය, මුස්ලිම් නියෝජිතයින් සහ අඹල විහාරස්ථානයේ ස්වාමීන්වහන්සේ අතර රැස්වීම් සහ සංවාද කිහිපයක්ම පවත්වා තිබේ. කුමාරසිංහගේ මරණය සම්බන්ධ පුවත නිකුත් වූ විට අනිවාර්යයෙන්ම සිදුවනු ඇති බවක් පෙනෙන්නට තිබුණු ප්‍රචණ්ඩත්වය අඩුකරගැනීම සඳහා වෑයම් දැරීමට තවත් රැස්වීමක් පවත්වා තිබේ. තෙල්දෙණිය අඹලප්‍රදේශයේ පැවැත්වූ එම රැස්වීමට මහනුවර නියෝජ්‍ය පොලිස්පති, තෙල්දෙණිය පේරකැටිය විහාරයේ පූජ්‍ය කීනපැලැස්සේ උපාලි ඥානිස්සර හිමි, තෙල්දෙණිය පොලීසියේ මූලස්ථාන පොලිස් පරීක්ෂක ඇතුළු අය සහභාගි වූහ. මහනුවර හා දිගන මුස්ලිම් ජනතාව නියෝජනය කරමින් සහභාගිවූවන්ට ප්‍රාදේශීය සභා නියෝජිතයකු වූ ෆාසිල් (පහත විස්තර බලන්න), මහනුවර මුස්ලිම් පල්ලි සම්මේලනයේ සභාපති සිදීක්, සහ දිගන මුස්ලිම් පල්ලි සම්මේලනයේ ලේකම් ඇතුළත් විය.


එම සාකච්ඡාවේදී තීරණය වූයේ අදාළ පවුලට වන්දි ලබාදිය යුතු බවකි. ඒ අනුව, කුමාරසිංහගේ බිරිඳට ඇති සුදුසුකම්වලට සරිලන රැකියාවක් සොයාදීමට ප්‍රාදේශීය සභාවේ සභිකයින් උත්සාහකළ යුතු යැයි තීරණය කෙරිණි. මුස්ලිම් පල්ලියෙන් එම පවුලට ලක්ෂ 15ක් ගෙවිය යුතු බවට ද තීරණය කර ඇති බව සිදීක් මහතා පවසා තිබේ. ඉන් ලක්ෂ දෙකක් අවමංගල්‍යයේ කටයුතු සඳහා ඒ අවස්ථාවේ ම ලබා දීමට තීරණය විය. අම්පාරේ සිදුවූ සිද්ධිය, එනම්, මුලින්ම බහින්බස්වීම සිදුවූ හෝටලය සහ ඒ ආසන්නයේ වූ මුස්ලිම් පුද්ගලයින්ට අයත් තවත් කඩකාමර කිහිපයක් ද ගිනිබත් කරමින් පැතිර ගිය ප්‍රචණ්ඩත්වය වැනි සිද්ධියක් අඹලේ සිදුවීමට ඉඩ නොදෙන බව ප්‍රදේශයේ භික්ෂුන්වහන්සේ පවසා තිබේ. ප්‍රචණ්ඩත්වය ඇති වූ විට කුමාරසිංහගේ අසල්වාසීන් වූ මුස්ලිම් පවුල් 26 ක්අතහැර තිබේ.

භික්ෂුන්වහන්සේ සහ මුස්ලිම් ප්‍රජාවේ සාමාජිකයින් ද ප්‍රදේශයේ පොලීසිය ද දැරූ මෙම උත්සාහයන් අගය කළයුතු ය. කුමාරසිංහට සිදුවූ ප්‍රහාරයෙන් පසුව ඔවුන් අවස්ථා ගණනාවකදී ම එකිනෙකා සමග රැස්වීම් පවත්වා ඇති අතර, රට තුළකලබල උත්සන්න වෙමින් පවතින බවත්, කුමාරසිංහට සිදුකළ ප්‍රහාරය ප්‍රදේශයේ ජනවාර්ගික ගැටළුවක් බවට පත් කරගනිමින් පුද්ගලයින් ඒක රාශී කර මෙහෙයවමින් තිබෙන බවත් ඔවුන්ට අවබෝධ වී තිබේ. කුමාරසිංහගේ මරණය මුස්ලිම් විරෝධී මත ප්‍රචාරණය සඳහා යොදගෙන ඇති බවත්, කුමාරසිංහ අයත් වූ ප්‍රජාවෙන් ඔබ්බට එය පැතිරුණු බවත් මෙහිදී අවධානයට ගත යුතු වේ. අලුත්ගම භික්ෂුව සම්බන්ධ සිද්ධියේ දී ද මෙවැනි ම ආකාරයකින් පුද්ගලයින් ඒකරාශී කර මෙහෙයවීමක් සිදු වී ඇති බව දක්නට ලැබේ. කුමාරසිංහට පහරදුන් දිනයේ (පෙබරවාරි 23) සිට ඔහුගේ මරණය සිදුවූ දිනය (මාර්තු 3) දක්වා වූ කාලය තුළ ප්‍රජා කණ්ඩායම, කලබල උත්සන්න වෙමින් පවතිද්දී පවා දිගින් දිගටම එකිනෙකා සමගින් සන්නිවේදනය කර ගෙන තිබේ. කුමරසිංහගේ ගම්මානය හා ඒ ආසන්නයේ ප්‍රචණ්ඩත්වය ඇවිලීම වළක්වාගැනීමට මෙම කණ්ඩායමට හැකි වුවත් වඩාත් විස්තීර්ණව පැතිරුණු විනාශය වළක්වාගැනීමට ඔවුන්ට නොහැකි විය. මෙවැනි පසුබිමක් තුළ ප්‍රචණ්ඩත්වය අඩුකරගැනීම සඳහා මෙම ප්‍රජා නායකයින් දැරූ ප්‍රයත්නය ව්‍යවර්ථ වීමෙන් ගම්‍ය වන අදහස කුමක්දැයි වඩාත් සමීප වී සලකාබැලීම සිත්ගන්නාසුළු මෙන්ම සිත් කරදරයට පත්කරවනසුළු වේ. අළුත්ගම මෙන් නොව මෙම අවස්ථාවේ දී ප්‍රදේශයේ ප්‍රජා නායකයින් සහ පොලීසිය ප්‍රචණ්ඩත්වය ඇතිවීම වැළැක්වීමට සක්‍රියව උත්සාහ දරා ඇත. මෙහිදී හඳුනාගතයුතු කරුණ නම්, මෙම සියළු ක්‍රියාමාර්ග ගෙන තිබියදී පවා ප්‍රචණ්ඩත්වය ඇතිවූ බවයි. මෙම සිදුවීමෙන් පෙන්නුම් කරන්නේ, ජනවාර්ගික ගැටළුවක් බවට හරවාගනු ලැබූ මෙවැනි ඝට්ටනවලින්, එනම් මූලාරම්භක සිදුවීම්වලින් සැබැවින්ම බලපෑමට ලක් වූ ප්‍රජාව තුළ පමණක් මැදිහත්වීම් සිදුකිරීම ප්‍රමාණවත් නොවන බවයි. කුමාරසිංහගේ නිවස ආසන්නයේ ප්‍රචණ්ඩත්වය ඇති නොවුණ ද, ඔහුගේ මුස්ලිම් අසල්වාසීන් ඉන් බේරී සිටිය ද, පොදුවේ තෙල්දෙණිය ප්‍රදේශයේ දිගන (කුමාරසිංහ සහ බීමත් මුස්ලිම් තරුණයින් අතර අඩදබරය ඇති වූයේ දිගන ප්‍රදේශයේ දී ය), සහ සිද්ධියට සම්බන්ධවූවන් සමග කිසිදු සම්බන්ධතාවයක් නොමැති ප්‍රදේශ, එනම් අකුරණ වැනි ප්‍රදේශ බරපතල අන්දමින් පීඩාවට ලක් විය.

ප්‍රදේශයේ මුස්ලිම් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්, මුස්ලිම් පල්ලි සහ දේශපාලන නියෝජිතයින් සමග එක් වූ මහනුවර සහ දිගන මුස්ලිම් පල්ලි කමිටු නියෝජිතයින් ප්‍රදේශයේ සහෝදර මුස්ලිම් ජනතාව ගන්නා ක්‍රියාමාර්ගවලින් ඇතිවියහැකි හානි අඩුකරගැනීමට මුලපුරා එහි වගකීම භාරගෙන කටයුතු කර තිබේ. මෙවැනි සිදුවීම් ප්‍රචණ්ඩත්වයක්දක්වා උත්සන්න වීමට ඉඩතිබෙන පසුබිමක් තුළ ප්‍රදේශයේ මුස්ලිම් නායකත්වය සාමාන්‍යයෙන් මේ අන්දමින් මැදිහත් වෙනු ලැබේ. ඇතැම්විට මෙවැනි ප්‍රයත්නයන් අගයකළයුතු වුවත්, මුස්ලිම් ‘ප්‍රජාවට’ එම ප්‍රජාවේ ඇතැම් සාමාජිකයින්ගේ ක්‍රියා සම්බන්ධයෙන් මුල්‍යමය වගකීම දැරීමට සිදුවීම සහ එයට ප්‍රතිචාර දැක්වීමට රජය සම්බන්ධ නොකිරීම කුතුහලයල දනවන්නක් වන අතර,එමගින් සිත් කරදරයට පත්කරවනසුළු පූර්වාදර්ශයක් සපයා දෙයි. නීතිය හා සාමය ක්‍රියාත්මක කරන යාන්ත්‍රණ නිසි පටිපාටියට ක්‍රියාත්මකවීම කෙරෙහි සහ අනෙකුත් බලධාරීන් වෙනුවෙන් කවර ආකාරයකින් හෝ සමථකරණයේ නියැළීම කෙරෙහි නොව, සහන සැලසීම සඳහා මුස්ලිම් ප්‍රජාවගෙන් ලැබෙන මුල්‍යමය දායකත්වය කෙරෙහි අවධානය කේන්ද්‍ර කර තිබේ.

කුමාරසිංහ මියගිය රාත්‍රියේදී, ඥානසාර හිමියන්, මුස්ලිම් විරෝධී මත සඳහා පොළඹවන්නෙකු ලෙස කුප්‍රකට සහ නව සිංහලේ ව්‍යාපාරයේ ප්‍රධානියා වන ඩෑන් ප්‍රියසාද්, මහසෝන් බලකායේ කැඳවුම්කරු වන අමිත් වීරසිංහ, සහ මඩකලපුව මංගලාරාමයේ භික්ෂූන් වහන්සේ වන අම්පිටියේ සුමනරතන හිමි යන අය අවමංගල්‍ය පැවති නිවසට ගොස් තිබේ. ඔවුන් පිටත්වී ගොස් ස්වල්ප මොහොතකට පසු, දැනට දශක කිහිපයකට ඉහත දී මෙම ප්‍රදේශයේ විවෘත කළප්‍රථම ව්‍යාපාර වලින් එකක් වන එම්.කේ.එම්. ග්‍රොසරි ව්‍යාපාර ආයතනයට පහර දී එය විනාශ කොට තිබේ. කලබල උත්සන්න වනවිට පොලීසිය මැදිහත් වී එම අවමංගල්‍යය තෙල්දෙණියේ පැවැත්වීම සඳහා අධිකරණයෙන් නියෝගයක් ලබාගත් අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් කුමාරසිංහගේ ගම්මානය වන අඹල ප්‍රදේශයේ ප්‍රසිද්ධ අවමංගල්‍ය පෙරහරක් පවත්වනු නොලැබීය. පූජ්‍ය උපාලි ඥානිස්සර හිමියන්(කුමාරසිංහගේ ගමේ පේරකැටිය විහාරයේ භික්ෂූන්වහන්සේ)පසුව අපට පවසා සිටියේ කුමරසිංහගේ සිරුර ප්‍රසිද්ධ අවමංගල්‍ය පෙරහැරක් සඳහා මුදාහරින මෙන් ප්‍රදේශයේ සංවිධානය වූ තරුණ පිරිස් අතරින් ඉල්ලීම් බොහොමයක් ලැබුණු නමුත් තමන් ඒවා ප්‍රතික්ෂේප කළ බවයි. අවමංගල්‍ය උත්සවයේ වියදම් සඳහා මුදල් ලබාදීමට උත්සාහකර තිබේ. එහෙත් එම මුදල් භාරදීම සඳහා අවමංගල්‍ය ශාලාව වෙත ගිය (මුස්ලිම්) පුද්ගලයින් අපට දැනුම් දුන්නේ තමන් එම ස්ථානයට ගිය අවස්ථාවේ මුදල් භාරදීම සඳහා කුමාරසිංහගේ බිරිඳ සොයාගැනීමට නොහැකි වූ බවත්, පවුලේ සාමාජිකයින් මුදල් භාරගැනීම ප්‍රතික්ෂේප කළ බවත් ය. ප්‍රචණ්ඩත්වය ඇතිවීමෙන් පසුව තවදුරටත් එම මුදල් පිළිබඳ කථාබහක් සිදු නොවූ, අතර එම පවුලට ජීවත් වීම සඳහා මුදල් ලබා දීම හා බිරිඳට රැකියාවක් සොයාදීම සම්බන්ධයෙන් ද තවදුරටත් සාකච්ඡා නොකෙරුණි.

**සිදුවීම්වල කාලානුක්‍රමික සාරාංශය**[20]




**මාර්තු 2 (0 වැනි දිනය)** - එම්.ජී. කුමාරසිංහ මහනුවර ශික්ෂණ රෝහලේදී මියයන අතර ඔහුගේ සිරුර අඹලේ ඇති ඔහුගේ නිවසට රැගෙන යාම.

**මාර්තු 3 (1 වැනි දිනය)** - හිම්දිරි උදෑසන මරණය පිළිබඳ ආරංචිය පැතිර යාම. උඩිස්පත්තුවේ ප්‍රහාර සිදු වීම. තෙල්දෙණියේ සමූහ ප්‍රචණ්ඩත්වය ඇති වීම.

**මාර්තු 4 (2 වැනි දිනය)** - මැදමහනුවර එම්.කේ.එම්. ස්ටෝර්ස් ගිනිබත් වීම. දිගන මුස්ලිම් පුද්ගලයින්ට තර්ජන/අනතුරු ඇඟවීම් සිදු කිරීම. මැණික්හින්න සහ තෙල්දෙණිය පොලීසි ප්‍රභාරකයින් විසිහතරදෙනෙක් අත් අඩංගුවට ගැනීම. මඩකලපුවේ මංගලාරාමයේ අම්පිටියේ සුමන හිමි, 'සිංහලේ ගැලවුම්කරුවෝ' සංවිධානයෙහි ඩෑන් ප්‍රසාද්, 'මහසෝන් බලකායේ' අමිත් වීරසිංහ, බොදු බල සේනා සංවිධානයේ ගලගොඩ ඥානසාර හිමියන් අවමංගල්‍ය පැවැත්වෙන නිවසට පැමිණීම. මුස්ලිම් පුද්ගලයින් ද ඇතුළුව සියළුදෙනාට තමන්ගේ කඩ හා නිවාස වලින් ඉවත්වී සිටින ලෙස සහ පොලීසිය කෙරෙහි විශ්වාසය තබන ලෙසට මවුලවි ෆස්රුඊ රහ්මාන් (මහනුවර ජම්යතුල් උලමාප්‍රධානී) විසින් උපදෙස් දෙනු ලබයි.

**මාර්තු 5 (3 වැනි දිනය)** - උදෑසන අඹාල ප්‍රදේශයේදී අවමගල්‍ය උත්සවය සිදු කිරීම. කි.මී. 40ක් දුරින් පිහිටි දිගන දක්වා පිරිස ගමන් කරති. එයට අමතරව තවත් ජන පිරිස් දිගනට රැස් වේ. තවද, මාතර, වවුනියාව, මඩකලපුව වැනි විවිධ ප්‍රදේශවල සිට අන්තවාදී කණ්ඩායම්වල ආධාරකරුවන් මහනුවරට ඒකරාශී වන්නේයැයි කටාබහක් පවතියි. කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පුරා (දිගන, කෙංගල්ල, බලගොල්ල, කුන්ඩසාලේ, නත්තරන්පොත) ගිනි බෝම්බ සහ පුද්ගල පහරදීම් සිදු වේ; නිවාස සහ පල්ලි 4කට ගිනි බෝම්බ ප්‍රහාර එල්ල වේ; හිජ්රාපුර පල්ලියේ රැස්වී සිටි පිරිසකට විශේෂ කාර්ය බලකාය පහර දෙයි. මවුලවිවරයා ළඟ අවිආයුධ තිබුණේ යැයි ව්‍යාජ ලෙස පෙන්නුම් කිරීමට දැරූ තැතක් සී.සී.ටී.වී. කැමරාවල පටිගත වී එය පැතිර් යයි. මුර සංචාරයේ යෙදුණු විශේෂ කාර්ය බලකාය ඒ.එස්.එම්. ෆාසිල් සහ එම්.ෆාසිල් කුඹුක්කඳුරේ පිහිටි ඔවුන්ගේ නිවසේ සිට දිගන දක්වා විසින් ඇදගෙන යනු ලැබේ. භික්ෂුවකගේ සහ පූජකවරයෙකුගේ විරෝධතාවය හේතුවෙන් විශේෂ කාර්ය බලකාය මවුලවිවරුන්ට පහර දීම වැළකේ. එහෙත් ඔවුන් නිල වශයෙන් අත් අඩංගුවට ගැනෙන අතර පොලීසිය ඔවුන්ව රෝහලට ගෙනයයි. ඔවුන්ට තුවාල වී ඇතත්

[20]බලන්න:මහනුවර කලහකාරීන්ගේ ප්‍රචණ්ඩත්වය, ඊට පූර්වගාමී සිදුවීම්, සිද්ධිය හා ඉන් පසුව තත්වය
https://disaster.lk/kandy-mobs-timeline/
ප්‍රවේශ වූ දිනය- 2020 නොවැම්බර් 25

තෙල්දෙණිය රෝහලේ සිටි වෛද්‍යවරයා ඔවුන්ට ප්‍රතිකාර කිරීම ප්‍රතික්ෂේප කරයි. පසුදින ඔවුන්ට මහනුවර රෝහලේ දී ප්‍රතිකාර ලබා දෙයි.

**මාර්තු 6 (4 වැනි දිනය)** - තැන්නෙකුඹුර, හාරිස්පත්තුව, මැනික්හින්න සහ මහනුවර ඉලක්ක කරගත් ප්‍රහාර පිළිබඳව අනතුරු අඟවන කටකතා පැතිරේ. අම්පිටියේ සුමනරතන හිමි සහ තවත් හිමිවරුන් 11 දෙනෙක් ද, අමිත් වීරසිංහ ද තෙල්දෙණිය පොලීසිය විසින් අත් අඩංගුවට ගත් අයව නිදහස් කරන මෙන් ඉල්ලා සිටිති. පල්ලෙකැලේ බසාර් හි තිබී අබ්දුල් බාසිත් ගේ මලසිරුර හමුවිය. ජාතික මට්ටමින් රට තුළ හදිසි අවස්ථා තත්වයක් ප්‍රකාශයට පත් කරන ලද අතර, මහනුවරට ඇඳිරිනීතිය පනවන ලදී.

**මාර්තු 7 (5 වැනි දිනය)** පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (මුල්ලේගම සහ වෙලේකඩේ පෙ.ව.10.00), හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (4 කණුව එඬරුතැන්න, කුරුඳුගොල්ල, දහවල් 12.00 සිට), අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (8 කණුව, ප.ව.2.00 සිට 2.30, දීගල්ල, කුරුගොඩ, මල්වානාහින්න) ප්‍රහාර සිදුවේ, යටිනුවර දී (දන්තුරේ, ඇඹිල්මීගම, පිළිමතලාව) රාත්‍රියේ දී ප්‍රහාර  සිදු වේ. වෙලේකඩේ දී අත්බෝම්බ පිපිරුමකින් ගුණරත්න බණ්ඩා මරුමුවට පත් වෙයි. ෆේස්බුක් සහ අනෙකුත් සමාජ මාධ්‍ය සීමා කෙරේ.

**මැයි 8 (7 වැනි දිනය)** - ජනාධිපතිවරයා මහනුවරදී ආගමික නායකයින් හමුවී සන්සුන් වනමෙන් ඉල්ලාසිටියි. ත්‍රස්ත විමර්ශන අංශයෙන් අමිත් වීරසිංහ සහ තවත් 9දෙනෙක් පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේදී අත් අඩංගුවට ගැනේ. ඔවුන් කොළඹට රැගෙනයනු ලැබේ.

**මාර්තු 9 (7 වැනි දිනය)** - දිගන, කෙංගල්ල හා අකුරණ ප්‍රදේශවලට සංචාරය කරන අග්‍රාමාත්‍යවරයා කඩිනම් සහන සැපයීම සඳහා නියෝග දෙයි. නත්තරම්පොත ඇති මහසෝන් බලකායේ කාර්යාලය ත්‍රස්ත විමර්ශන අංශයෙන් වටලයි. දුරකථන හා පරිගණක රාජ සන්තක කරයි.

## ප්‍රචණ්ඩ සිදුවීම්වල විස්තර

### 2018 මාර්තු 5 (3 වැනි දිනය)

මැදදුම්බරින් ආරම්භ වූ ප්‍රචණ්ඩත්වය කුණ්ඩසාලේ ප්‍රදේශය වෙත පැතිර ගිය අතර ඉන් පසු එළඹුණු දිනවලදී එය පූජාපිටිය, හාරිස්පත්තුව, අකුරණ, පාතදුම්බර සහ යටිනුවර ප්‍රදේශවලට ද පැතිර ගියේය. අසල්වාසී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ද විටින් විට යම් සිදුවීම් ඇති විය. ඊට පෙරදින රාත්‍රියේ තෙල්දෙණිය පොලීසිය තෙල්දෙණිය ප්‍රදේශයේ ඇතිවූ ප්‍රචණ්ඩත්වය (එම්.කේ.එම්. ස්ටෝර්ස් ගිනිතැබූ අවස්ථාවේ) සම්බන්ධයෙන් පුද්ගලයින් 24දෙනෙක් අත් අඩංගුවට ගෙන තිබුණි. මාර්තු 5වැනි දින, එනම්, අවමංගල්‍යය දිනයේ දී කුණ්ඩසාලේ හා මැදදුම්බර ප්‍රා.ලේ. කොට්ඨාසවල මුස්ලිම් කඩසාප්පු හා නිවාසවලට පහර දෙනු ලැබීය. කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෙංගල්ල, බලගොල්ල, කුණ්ඩසාලේ, නත්තරම්පොත, හා දිගන ප්‍රදේශ එසේ බලපෑමට ලක් විය. මැදදුම්බර ප්‍රදේශයේ ප්‍රචණ්ඩත්වයෙන් බලපෑමට ලක්වූයේ තෙල්දෙණිය හා අඹල ප්‍රදේශයි. මාර්තු 5වැනි දින, අත් අඩංගුවට ගත් අය නිදහස් කරන මෙන් ඉල්ලාසිටිමින් තෙල්දෙණිය පොලිස් ස්ථානය ඉදිරිපිට විරෝධතා සිදුකෙරෙමින් පැවතණි. අත් අඩංගුවට ගැනීම් ඔස්සේ තවතවත් ප්‍රචණ්ඩත්වය ඇවිලෙනු ඇතැයි පවසමින් බොහෝ භික්ෂූහු ද එහි පැමිණ සිටියහ. නැවත දිගන ප්‍රදේශයේදී (කුණ්ඩසාලේ ප්‍රා.ලේ. කොට්ඨාසය) කලහකාරීන් පිරිසක් එක් රැස් වූ අතර තෙල්දෙණියේ ජනතාව ද ඔවුන්ට එකතු වී තිබේ (කුමාරසිංහට පහර දුන් තරුණයින් වාසය කරන්නේ ද දිගන වන අතර මහසෝන් බලකායේ කාර්යාලය පිහිටා ඇත්තේ ද දිගන ය). අවසානයේ දී පොලීසිය දිගන ප්‍රදේශයට පැමිණ, කඳුලු ගෑස් පාවිච්චි කර කලහකාරීන් විසුරුවා හැරියහ. ඉන් පාලනය නොවූ කලහකාරීන් විසිර යමින් සිටින අතරෙහි ද මුස්ලිම් නිවාස සහ ව්‍යාපාරවලට පහර දී තිබේ. ප්‍රහාර උදෑසන ආරම්භ වී තිබුණි. රජයෙන් ඇඳිරිනීතිය පැනවූයේ පස්වරු 3.00 ට ය. පිරිස් දිගන ප්‍රදේශයට ඒකරාශී වනු ඇතැයි තමන් අපේක්ෂා නොකළ බවත්, තෙල්දෙණියේ පොලිස් ස්ථානය ඉදිරිපිට උද්ඝෝෂණය කරමින් සිටි, තමන් විසින් පාලනය කළ පිරිස නොව වෙනත් පිරිසක් දිගනට එක් රැස් වූ බවත් පොලිස්  නියෝජිතයෝ ප්‍රකාශ කළහ. මේ අන්දමින් තවත් කලහකාරීන් පිරිසක් ඒකරාශී වනු ඇතැයි අපේක්ෂා නොකිරීම 'බුද්ධි තොරතුරු සම්බන්ධ අසමත්වීමක්' බව ද ඔවුහු පැවසූහ. මෙම 'බුද්ධි තොරතුරු සම්බන්ධ අසමත්වීම' යන යෙදුම මාධ්‍යවලද භාවිතා විය.

තමන් පත් වූ අසීරු තත්වය පිළිබඳව පීඩාවට ලක්වූවන් විසින් මඉදිරිපත් කළවිශ්ලේෂණයතරමක් විදග්ධ වූ අතර අනාගතයේ දී සියල්ල හොඳින් සිදු නොවනු ඇතැයි යන අනතුරක පූර්ව නිමිති ඔවුන්ට දැනී ඇත. දිගන බසාර් හි (නගරයේ වෙළඳපොළෙහි) එක් වෙළෙන්දෙකු අප සමග පවසා සිටියේ දිගන ප්‍රදේශයේ මෙවැනි දෙයක් සිදුවේ යැයි අපේක්ෂා කළ බවකි. එම ප්‍රදේශයේ කාර්යාලයක් පිහිටුවා තිබුණු මුස්ලිම් විරෝධී කණ්ඩායම වන මහසෝන් බලකායේ නායක අමිත් වීරසිංහ විසින් නිකුත්කළ බොහෝ වීඩියෝ පට අතරින් එකක සැබැවින්ම දිගන ප්‍රදේශය මුස්ලිම් පුද්ගලයින් විසින් අල්ලාගෙන ඇති බවක් ඔහු පවසයි. ඉහත කී මුස්ලිම් වෙළෙඳ ව්‍යාපාරිකයාතවදුරටත් සඳහන් කළේ මෙම හැඟීම ගෙවී ගිය දස වසර තිස්සේම වපුරා පෝෂණය කරන ලද්දක් බවයි. 'මේ අය ප්‍රාදේශීය මට්ටමෙන් දේශපාලන වාසි ගන්න මේක පොඩි මොන්ටිසෝරි මට්ටමෙන් වර්ධනය කරන්න ඇති' යනුවෙන් ඔහු පැවසීය. 'ඒත් දැන් රටේ හැමතැන ම පෙට්‍රල් දාලා වගේ, මුළු රටම ගිනිජාලාවක් කරන්න ඕනැ වෙන්නේ එක ගිණිකූරක් විතරයි.' මෙය මිනිසුන් අතරේ ඇති වූ එදිරිවාදිකමක් නොව, දේශපාලන වාසි ලබාගැනීමේ අරමුණින් දියත් කළ සැලසුමක් බවත් අවුරුදු දහයක පමණ කාලයක් තිස්සේ එය ක්‍රියාත්මකව පවතින බවත් ඔහු පැවසීය. මේ කරුණු පහසුවෙන්ම ලබාගත හැකි ඒවා බවත් එය විවෘත රහසක් වී ඇති බවත් වෙළෙන්දෝ තවදුරටත් පැවසූහ. 'රටක් විදිහට අපට මීට වඩා බරපතළ දේවල් නවත්වාගන්න පුළුවන් වෙලා තියෙනවා. ප්‍රශ්න ඇතිවෙන්න පැය 8-16කට විතර කලින් මොකක් හරි වෙන්න යන බව අගමැතිවරයාට දැනුම්දීලා තියෙනවා, ඒත් ඒක නවත්වන්න එයා කිසිම දෙයක් කරලා නැහැ.' මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීන් 21දෙනා පිළිබඳව අවලාදත්මක ස්වරයෙන් කථා කළ ඔහු පැවසුවේ මෙවන් අවස්ථාවල ඔවුන් කිසිම වැඩකට නැති බවයි. ඒ අය තමන්ගේ කාර්යභාරය හරියට ඉටුකළේ නම් මෙවැනි ප්‍රශ්න ඇතිවීම වළක්වාගැනීමට ඔවුන් මැදිහත්විය යුතුව තිබූ බව අපට පවසන ලදී.

මෙම කලබල මධ්‍යයෙහි මුස්ලිම් කඩ හිමියන් අවමංගල්‍ය අවස්ථාවේ කඩ වසා දමා සුදුකොඩි දැමීමට ජමියතුල් උලමා සංවිධානයෙන් ගත් තීරණය අනුව යමින් එසේ කළ බව තවත් වෙළෙන්දෙක් සඳහන් කළේය. උලමා සභාවෙන් මෙම තීරණය ගනු ලැබුවේ මහනුවර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගෙන් අදහස් විමසීමෙන් අනතුරුව ය. දිගන ප්‍රදේශයේ ඇතැම් කඩ කහකොඩි ඔසවා තිබුණි. මුස්ලිම් ව්‍යාපාර හිමි ඇතැම් අය පැවසුවේ තමන් මුස්ලිම් නොවන බව ඇඟවීමට බෞද්ධ කඩ හිමියන් විසින් එම කහකොඩි ඔසවා තිබුණු බවකි (මෙය එසේ වූයේ ද යන්න නොපැහැදිලි ය. කෙසේ නමුත් මින් පෙන්නුම් කරන්නේ තමන්ගේ අසල්වාසීන් මෙම ක්‍රියා සඳහා සහාය දැක්වූයේ යැයි ප්‍රදේශයේ ජනතාව ඇතිකර ගෙන තිබූ විවිධ විශ්ලේෂණ වේ.)

මෙම සිදුවීම්වලින් සති තුනකට පසුව, අප මුලින්ම දිගනට ගිය අවස්ථාව වනවිට, පීඩාවට පත් ව තිබූ කඩ හිමියන් අලුතින් ස්ථාන කුලියට ගෙන හෝ තමන්ගේ පැරණි ස්ථානයටම සුලු අලුත්වැඩියා සිදුකර නැවතත් තමන්ගේ ව්‍යාපාර ආරම්භ කර තිබුණි. සම්පූර්ණ කඩය ම දැවී අළු වී හෝ ගින්නෙන් සම්පූර්ණයෙන්ම විනාශ වී වඩාත් බරපතළ සිද්ධිවලට මුහුණ දුන් කඩ හිමියන් පැවසුවේ විනාශ වී ගිය කඩයේ නටබුන්වලට ඉදිරිපසින් කාඩ්බෝඩ් පෙට්ටිවල දමාගෙනවිත් තමන්ගේ භාණ්ඩ අළෙවි කරන බවයි. අවුරුදු සමය අත ළඟම පැමිණෙමින් තිබූ අතර උත්සව සමයේ පාරිභෝගිකයින් සිදුකරන මිලදීගැනීම් අහිමි කරගැනීමට තරම් හැකියාවක් ඔවුන්ට නොවීය. එම කාලයේදී, එනම් මාර්තු අගභාගයේ දී ඔවුන්ගේ අදහස වූයේ නැවත ගොඩනැංවීම් ආරම්භ කරන්නේ ද නැතහොත් රජයෙන් ලැබෙන වන්දි ලබාදෙන තෙක් බලා සිටින්නේ දැයි තීරණය කිරීම සඳහා රැස්වීමක් පැවැත්වීමටයි.

පහත දැක්වෙන්නේ ප්‍රදේශයේ ඇතිවූ කලබල සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳව දිගන වෙළෙන්දෙකු තමන් ලැබූ අත්දැකීම් විස්තර කළ අන්දමයි:

> 'මාර්තු 3වැනිදා (ඉරිදා) හැන්දෑවේ ඉඳලාම උණුසුම්ගතියක් තිබුණා. මලගෙදරට වැල නොකැඩී වාහන ඇදී ආවා. කඩවල් වහලා ගෙදර යන්න කියලා පල්ලියෙන් අපිට කිව්වා. තරුණයින්, පොඩි කොල්ලෝ රංචු ඇවිල්ලා අපේ ශෝකය ප්‍රකාශ කරන්න කඩවල් වහන්න කියලා අපට කිවුවා. ගෝනාවල (තෙල්දෙණියේ සිට දිගනට පැමිණෙන අතරමග) හැමතැනම මහ පිරිස් එකතුවෙලා හිටියා.
>
> එදා රෑ (මැදියම් රාත්‍රියට පසු, 4වැනිදා උදෑසන) මෙහෙ තියෙන පැරණි ම කඩය වන එම්.කේ.එම්. ට්‍රේඩර්ස් එකට ගිනි තිබ්බා. අඹල ට්‍රේඩර්ස් එකටත් එහෙම කළා. බඩු කොල්ල

කාලා, කඩේට ගිණි තිබ්බා. පාන්දර 3.00ට විතර උඩිස්පත්තුවේ කඩයකට ගිනි තියලා කියලා අපට අහන්න ලැබුණා. අපි හැමෝම එකතුවෙලා විවිධ අයට කෝල් කරන්න පටන් ගත්තා. ජනාධිපතිතුමාට, අගමැතිතුමාට, අසාත් සාලිට, පූජිත සර්ට (පොලිස්පති).

සඳුදා උදේ බසාර් එකට සෙනග රැස්වෙලා හිටියා. ගැංග් (කල්ලි) වගේ පිරිස් පොඩි පොඩි කණ්ඩායම් විදියට එකතුවෙලා හිටියා. මම කඩේ පොත් ටිකත් අරන් ගෙදර ගියා. කඩ ඔක්කෝම වහලායි තිබ්බේ. එන්ඩ එන්ඩම උණුසුම් තත්වය වැඩි වුණා. උදේ 11 වෙනකොට ඒ අය කඩවල් ගිනිතියන්න පටන් ගෙන තිබුණා. හැමතැනම සෙනග පිරිලා හිටියා. තෙල්දෙණියට මහා සෙනගක් රැස්වෙලා හිටියා. ඒ අය අපේ කඩේට එනකොට හවස 2ට විතර ඇති. විදුලියත් ජලයත් කපලායි තිබ්බේ. ඒ දිගන විතරයි. විනාශය කරගෙන ගිය විදියට මේක හොඳට සැලසුම් කරලා කළ බව පැහැදිලිව පෙනුණා.

ඒ අය මුලින්ම කළේ ගල් ගහලා සී.සී.ටී.වී. කැමරා කඩා දාපු එකයි. ඊට පස්සේ කඩවල් කඩලා ඇතුළුවුණා. බඩු තොග අරගන්නවා අල්ලපු කඩේ එක්කෙනා දැකලා තියෙනවා. ප්‍රදේශයේ සියලුම කඩවල්වලට මේ විදිහට කරලා තියනවා.

පොලීසිය සහ සන්නද්ධ හටයින් 2,000-3,000ක් විතර හිටියා. විශේෂ කාර්ය බලකාය හිටියා. ඒ අය කිසිම දෙයක් කළේ නැහැ. ඒ අය අහසට එක වෙඩිල්ලක් තිබ්බානම් ප්‍රමාණවත් වෙන්න තිබ්බා. ඇඳිරිනීතිය දැම්මාට ඒක බලපැවැත්වුණේ අපට විතරයි. කැරළිකාරයෝ තමන්ගේ මෝටර්බයිසිකල්වල දෙන්නා දෙන්නා එහාමෙහා ගියා. ඒ අයට එදා නත්තල් වාගේ.'

පල්ලෙකැලේ බසාර්වෙළඳ පොළ මුස්ලිම් පල්ලිය වන ලාෆීර් මුස්ලිම් පල්ලිය පිහිටවනු ලැබුවේ මහවැලි ජලයෙන් පැරණි තෙල්දෙණිය නගරය යටවන අවස්ථාවේදී ය. එම පල්ලිය දශක ගණනාවක් පැරණි ය. මෙම පල්ලියට පහර දී ගිනිබත් කරන ලද අතර, එතුළ වූ කුරාන එළියට ගෙනගොස් මහමගට දමා ඇතැම් ඒවා ගිනිතබා තිබූ අතර තවත් ඒවා කාණු තුළට විසිකර තිබුණි. පල්ලියේ මවුලවිවරයා ගින්නෙන් කළුගැහුණු ගොඩනැගිලි ව්‍යුහය ඔස්සේ අපව කැඳවාගෙන යමින් සිදු වූ දෙය විස්තර කළේ ය. ප්‍රහාරයට සහභාගි වූ පුද්ගලයින්, ඔවුන් ළමා කාලයේ එකට සෙල්ලම් කළ අය බවත්, එකිනෙකාගේ නිවෙස්වලට ආගිය අය බවත් ඔහු පැවසුවේ ය. 'විදුලිය නැති වෙලාවට අපි ඒ අයගේ ගෙවල්වලට ගිහින් ඇඳුම් මැදගන්නවා. අපි ළමයින් විදිහට එකටයි හිටියේ. ඒ ඔක්කෝමලා එකතුවෙලා අපට ගැහුවා' යනුවෙන් ඔහු පැවසී ය. 'දැන් ඒ අය අපේ මූහුණු බලන්නේ නැහැ. තමන් වරදක් කළ බව ඒ අයට දැනෙනවා ඇති කියලා අපි දන්නවා' ඔහු කීවේය. 'ඒ අය කියන එකම දේ තමයි මුස්ලිම්වරු අන්තවාදීන් කියන එක. එයාලා නරක මිනිස්සු නෙවෙයි. එයාලා වැරදි තොරතුරුවලින් මුලාවෙලා.' ඔහු තවදුරටත් ප්‍රකාශ කළේ 'මේ පැත්තේ ඉන්න මුස්ලිම්වරුන්ට හොඳ උඩරට සිංහල වාසගම් තියෙනවා. සිදුවුණු දේ ගැන කණගාටු වෙන බව ඇතැම් අය කියලා තියෙනවා.'

පල්ලේකැලේ බසාර් වෙළඳ පොළේ ලාෆීර් මුස්ලිම් පල්ලිය ආසන්නයේ තිබූ කුඩා සපත්තු කඩයකට ගිනිතබා ඇති අතර ඉන් අබ්දුල් බාසිත් නැමැති තරුණයකු මියගොස් තිබේ. මාර්තු 6වැනිදා ඔහුගේ සිරුර සොයාගන්නා ලදී.

මාර්තු 5වැනිදා ඇඳිරිනීතිය අවස්ථාවේ තවත් සිදුවීම් දෙකක් සිදුවිය.එදින සවස යාඥා සිදුකර මද වේලාවකට පසු හිජ්රාපුරම් මුස්ලිම් පල්ලියට විශේෂ කාර්ය බලකාය ඇතුළු වී එහි සිටි මවුලවිවරුන් දෙදෙනෙකු ඇතුළුව යාඥා කර අවසන්ව සිටිසමහර පුද්ගලයින් ට පහර දී තිබේ. බූට් සපත්තු පැළඳ පල්ලියට ඇතුළු වූ විශේෂ කාර්ය බලකා සාමාජිකයින් තමන්ට හිංසා කර පහරදීමෙන් අනතුරුව විවිධ දේවලින් තනාගත් ආයුධ පල්ලිය තුළ තිබී හමු වූ බවක් පෙන්වන්නට උත්සාහ දැරූ බව එම මවුලවිවරුන් පැවසූහ. ඉන්පසු ඔවුන්ව ජේළියට පල්ලියෙන් එළියට කැඳවාගෙන ගොස් තිබේ. මාර්ගයේ සිටින අවස්ථාවේ බෞද්ධ භික්ෂුවකගේ මැදිහත්වීම මත මෙම මවුලවිවරුන් දෙදෙනා නිදහස් කර තිබේ. ඇතැමුන් ප්‍රකාශ කළේ, ප්‍රධාන මාර්ගයෙන් බැහැරට වන්නට පිහිටා ඇති මෙම පල්ලියට විශේෂ කාර්ය බලකාය ඇතුළුවූයේ එම ස්ථානයට පැමිණ සිටි අය ඇඳිරිනීතියට අනුකූලව කටයුතු නොකළ හේතුව මත බවයි. දිගන ප්‍රදේශයේ ඇඳිරිනීතිය පවතින අතරතුර විශේෂ කාර්ය බලකාය විසින් ඒ.එස්.එම්. ෆාසිල් සහ එම්. ෆාසිල් යන දෙදෙනා සොයා තිබේ. ඉන් එක් අයෙකු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු වන අතර, පොලීසිය සහ මහනුවර මුස්ලිම් පල්ලි සභාව සමග කුමාරසිංහගේ ගමේ පැවැති රැස්වීම්වලට ඔහු සහභාගී වී තිබේ.

එම්.ෆාසිල් ගේ නිවසට ගිය විශේෂ කාර්ය බලකාය ඔවුන්ට තර්ජනය කර දොර අරින මෙන් ඔවුන්ට පවසා තිබේ. 'තම්බියා, දොර ඇරපිය!' යනුවෙන් ඔවුන් කියා තිබේ. ඒ.එස් එම්. ෆාසිල් (ප්‍රාදේශීය සභා මන්ත්‍රී) නිවසින් පිටතට ආ විට විශේෂ කාර්ය බලකායෙන් ඔහුට පහරදෙන්නට පටන් ගෙන තිබේ. මේ පහරදීමේදී ඔහුගේ හිසට පහරක් වැදී ඇති අතර ඉන් නොනවත්වා ලේ ගලාවිත් තිබේ.ඉන්පසු නිවසට ඇතුළු වූ විශේෂ කාර්ය බලකා සාමාජිකයින් එම්. ෆාසිල් ගේ කුඩා පුතණුවන් ඉදිරිපිට ම ඔහුව නිවසින් එළියට ඇදගෙන ගොස් තිබේ. ෆාසිල් නම ඇති මේ දෙදෙනා ම පැවසූ අන්දමට ඒ අය භාවිතා කර ඇත්තේ පරිභවසහගත සහ ජාතිවාදී යෙදුම් ය. තමන් ප්‍රාදේශීය සභා නියෝජිතයකු බව ඒ.එස්.එම්. ෆාසිල් ඔවුන්ට දැනුම් දී තිබේ. ඔවුන් ෆාසිල්ට සිදුවීම මෙහෙයවීම පිළිබඳ චෝදනා කර තිබේ (ඔහු විසින් මෙහෙයවූ සිදුවීම කුමක්දැයි පැහැදිලි නැත). ඔවුන් එම්. ෆාසිල් ලවා ගෝනියකට බෝතල් පුරවා තිබේ. ඉන්පසුව ඔහුගේ දෑත් බැඳ, ගැටගැසූ දෑතින් එම බෝතල් ගෝනිය ඔසවාගෙන යාමට සලස්වා තිබේ. ඔවුන් විසින් යොවුන් වියේ පිරිමි ළමයෙකු ද අල්ලාගෙන ඇති අතර, ඔහුව ද ගැටගසා තිබේ. ආපසු නගරය දෙසට ඔවුන්ව දක්කාගෙන යන අතරතුර විශේෂ කාර්ය බලකායෙන් නැවත නැවතත් ඔවුන්ට පහර දුන් බව ෆාසිල් පැවසීය. ඒ යන අතරතුර, මාර්ගයේ ඔවුන් පසුකර ගිය අය (ඉන් බොහෝදෙනා මෝටර් බයිසිකල්වල ගමන්ගත් තරුණයින් විය) නවත්වමින් විශේෂ කාර්ය බලකා සාමාජිකයින් ඒ අයට පවසා ඇත්තේ අල්ලාගත් මුස්ලිම් පුද්ගලයින් සිංහල ජනතාවට පහර දෙන්නට බෝම්බ තනමින් සිටි බවකි. පරිස්සමින් පලයල්ලා යනුවෙන් විශේෂ කාර්ය බලකා සාමාජිකයින් මාර්ගයේ ගමන්ගත් අයට පරිස්සම්වීම සඳහා උපදෙස් දී තිබේ. අවසානයේ දී විශේෂ කාර්ය බලකා සාමාජිකයින් ඔවුන්ව පොලීසියට ගෙන ගොස් නිලවශයෙන් ඔවුන් අත් අඩංගුවට ගෙන තිබේ. පෙට්‍රල් බෝම්බ තැනුවේ යැයි චෝදනා කරමින් ඔවුන්ට එරෙහිව නඩු ගොනුකර තිබේ. විශේෂ කාර්ය බලකාය පිළිබඳ සඳහන් කරමින් ඒ.එස්.එම්. ෆාසිල් පැවසුවේ 'ජාතිවාදීන් හැටියට හැසිරුණේ, නිලධාරීන් හැටියට නොවේ' කියා ය.

දිගින් දිගටම පහරකෑමෙන් එම්. ෆාසිල් සිහි මද ගතියකින් සහ සිහි එළවාගත නොහැකි තත්වයක සිට ඇත. පොලීසියට නිසි ප්‍රකාශයක් ලබාදීමට ඔහුට නොහැකි වී තිබේ. වාර්තා වී ඇති ප්‍රකාශයේ ඔවුන් දෙදෙනාම බෝම්බ සෑදූ බව පිළිගත් බව ප්‍රකාශ වන බැවින් එය ව්‍යාජ ප්‍රකාශයක් බව ඔහු සඳහන් කළේ ය.

ඉන්පසුව ඒ දෙදෙනාගේ තුවාල සඳහා ප්‍රතිකාර ලබා දීමට ඔවුන්ව තෙල්දෙණිය රෝහලට රැගෙන ගොස් ඇතත් එහි සිටි වෛද්‍යවරයා එසේ කිරීම ප්‍රතික්ෂේප කර ඇත. තමන් ඉතා දුර්වල තත්වයේ පසු වූ බැවින් ඒ.එස්.එම්. ෆාසිල් තමාව රෝහලට ඇතුළත් කරගන්නා මෙන් බැගෑපත් වී තිබේ. එහෙත් වෛද්‍යවරයා 'ඔහේලා එක සිංහල මනුස්සයෙක්ව මැරුවා, දැන් හදන්නේ තවත් මිනිස්සු මරන්නද? ඔහේලාව යවන්න ඕනැ හිරේ, ඉස්පිරිතාලෙ නෙවෙයි' යනුවෙන් පවසනවා ඔහුට මතකය. රෝහලෙන් ප්‍රතික්ෂේප වූ ඔවුන්ව විශේෂ කාර්ය බලකාය විසින් නැවතත් පොලිස් ස්ථානයට රැගෙන ගොස් තිබේ.

පසුව, ඒ.එස්.එම්. ෆාසිල් (ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා) මහනුවර රෝහලේ දින තුනක් ප්‍රතිකාර ලැබූ අතර එහිදී ඔහුගේ හිසට මැහුම් අටක් යොදා තිබේ. ඒ අවස්ථාවේදී ප්‍රතිකාර ලබාගන්නට බිය වූ එම්. ෆාසිල් ඊට නොගොස් ඇති අතර, තමන් වෛද්‍යවරයෙකු හමුවීමට ගියේ ඉන් සතියකට පමණ පසු තත්වය සන්සුන් වූ පසුව බව හෙතෙම පැවසීය. තමන්ගේ අත්දැකීම විස්තර කරමින් එම්. ෆාසිල් පැවසුවේ 'මට ඒක විශ්වාස කරන්නත් බැරිවුණා. අපිව ආරක්ෂා කරන්න ඕනැ අය අපට පහර දුන්නා. කොහොමද එහෙම වුණේ? මේ රටේ නීතිය හා සාමයෙහා තත්වය මොකක්ද? මට පිළිකුළක් ඇති වුණා.'

ෆාසිල් නම ඇති මේ දෙදෙනා පසුපස විශේෂ කාර්ය බලකාය හඹායාමට හේතුව පැහැදිලි නොමැති අතර ප්‍රදේශයේ ජනතාව සමග අප සිදු කළ බොහෝ කථාබහවලදී මේ කාරණය ඉස්මතු විය. ඇතැම් අය සිදුවීම් උත්සන්න වීම වැළැක්වීමට අඹල පැවැත්වූ රැස්වීම්වලට ප්‍රාදේශිය සභා මන්ත්‍රී ෆාසිල් සහභාගිවීම සහ මෙම සිද්ධිය අතර සම්බන්ධතාවයක් දුටු අතර, ප්‍රචණ්ඩ ක්‍රියා සංවිධානය කිරීමට ප්‍රදේශයෙන් සම්බන්ධ වුවන් ඔහුගේ නම විශේෂ කාර්ය බලකායට ලබාදුන්නා වියහැකි යැයි අනුමාන කළහ. තවත් අය අනුමාන කළේ එය පෙට්‍රල් බෝම්බ තනමින් ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම සඳහා මුස්ලිම් පුද්ගලයින් සංවිධානය වන බවට ලබාදුන් ඔත්තුවක් වියහැකි බවකි.

පොලීසිය හෝ විශේෂ කාර්ය බලකාය මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් ලබා නොදුන්හ. පොලිසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු සමගින් අපි පැවැත්වූ රැස්වීම් (පහත විස්තර බලන්න) ඔස්සේ මෙම සිදුවීම් දෙක සම්බන්ධයෙන් කිසිවක් හෙළිදරව් කරගත නොහැකි විය. එක් නිලධාරියෙක් බොහෝදුරට එය වැරදීමක් වියහැකි යැයි පවසමින් එය ඉවත දැමුවේ ය. ඒ.එස්.එම්. ෆාසිල් (ප්‍රාදේශීය සභා මන්ත්‍රී) තෙල්දෙණියේ රැස්වීම්වලට සහභාගි වූ බව ඒ නිලධාරියා දැන සිටියේ ය. වැඩි විස්තර නොකියා වක්‍රාකාරයෙන් අනෙක් නිලධාරියා අපට පැවසුවේ ගැටුමක දී සටන් වදින දෙපාර්ශවය වෙන් කර හඳුනාගැනීමට පොලීසියට දුෂ්කර බවකි. මුස්ලිම් ජනතාව තමන් වින්දිතයින් වශයෙන් දකිනවා වියහැකි  නමුත්, ගැටුමක් මැඩපැවැත්වීමේ දී පහරදුන් පුද්ගලයා කවුද යන්න සෑම අවස්ථාවකම පැහැදිලි නොවෙයි. පොලීසිය උත්සාමකරන්නේ සිදුවීම පාලනය කරගැනීමට මිස කවුරුන් විසින් කුමක් කළේදැයි තීරණය කිරීමට නොවේ. අප වෙත තවදුරටත් පවසනු ලැබුවේ, මේ සිදුවීම් දෙකම සිදු වූයේ ඇඳිරිනීතිය පනවා තිබෙන අවස්ථාවක බවත්, ඇඳිරිනීතිය බලපවත්වන අතරතුර හිජ්රාපුරම් පල්ලියට මුස්ලිම් පුද්ගලයින් යාම ඒම පිළිබඳව විශේෂ කාර්ය බලකායට ඔත්තුවක් ලැබුණා වියහැකි බවකි. කෙසේ නමුත්, පැහැදිලිව පෙනුණු සහ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සමගින් අප පැවැත්වූ සාකච්ඡාවලදී තහවුරු වූ (පහත විස්තර බලන්න) කරුණ නම් රටේ පවතින ජාතිවාදයට පොලිස් බලකායේ සාමාජිකයින් ද ගොදුරු වියහැකි බවයි. එබැවින්, කලබල සහිත පසුබිමක් තුළ, විශේෂ කාර්ය බලකාය එකී තීරණය ගැනීමට කුමන සාධක හේතුපාදක වුවත් ඔවුන් පවා ජාතිවාදී සංවේදීතාවයන්ගේ බලපෑමට හසුවී තිබූ බව පෙනෙන්නට තිබුණි.  විශේෂ කාර්ය බලකාය ඇතුළුව පොලීසිය එම සිදුවීම්වලට ප්‍රතිචාර දැක්වූ අන්දම සම්බන්ධයෙන් බොහෝ ප්‍රශ්න තිබුණි. 2018 ජූලි මාසයේ දී අප පොලිස් බලකායේ සාමාජිකයින් සම්මුඛ සාකච්ඡාවට ලක් කරන අවස්ථාවේ දී පොලීසියේ ප්‍රතිචාරය සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්වෙමින් ඇති බව අපට පවසන ලදී.

සඳුදා (මාර්තු 5), දිගන ප්‍රදේශයේ මහා පරිමාණයේ ප්‍රහාර සිදුකළ කලහකාරී පිරිස් විසිරවීමට පොලීසිය කඳුළු ගෑස් පාවිච්චි කරන ලදී.[21] මුල් ප්‍රහාරය සිදුවී දින ගණනාවකින් සහ සිද්ධිය පාලනය කරගත නොහැකි මට්ටමකට යාමෙන් අනතුරුව පමණක් ක්‍රියාත්මක වූ සිරිසේන ජනාධිපතිවරයා, ඉලක්ක බවට පත් වූ කණ්ඩායම්වල ආරක්ෂාව සහ ප්‍රචණ්ඩත්වය නැවැත්වීම සහතික කිරීම පිණිස පොලීසිය සහ ආරක්ෂක බලකා විසින් මෙම සිදුවීම් සම්බන්ධයෙන් අපක්ෂපාතී සහ ස්වාධීන විමර්ශනයක් සිදුකළයුතු බව පැවසීය.[22] අම්පාරේ සහ දිගන සිදු වූ ප්‍රචණ්ඩත්වය හෙලා දකිමින් රජය විසින් නිල ප්‍රකාශයක් ද නිකුත් කරන ලදී.[23] මේ අන්දමින් එක්වරම, රජයේ නිලධාරීන්ගේ සැලකිලිමත්වීම ආරම්භ වූයේ ය. මුස්ලිම් ජනතාවට එරෙහිව සමාජ මාධ්‍ය ඔස්සේ සිදුකෙරුණු වෛරී ප්‍රකාශ සහ දැඩි ලෙස වැරදි තොරතුරු ප්‍රචාරණය හෙලාදුටු රජය, ඒවාට නොරැවටෙන මෙන් ජනතාවගෙන් ඉල්ලා සිටි අතර එම වරදකරුවන්ට දැඩි දඬුවම් පමුණුවන බව ද ප්‍රකාශ කළේය.[24] එදිනම, දිගන කුඹුක්කඳුරේ සිදුකළසෝදිසි මෙහෙයුමක දී විශේෂ කාර්ය බලකාය පෙට්‍රල් බෝම්බ 13ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් තිදෙනෙක් අත් අඩංගුවට ගත්හ.

කුමාරසිංහගේ මරණය සිදුවූ පසු ඒකාබද්ධ විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රි විමල් වීරවංශ සහ පාර්ලිමේන්තු මන්ත්‍රී දිලුම් අමුණුගම විසින් ප්‍රදේශයට ආරක්ෂාව ලබාදෙන මෙන් මධ්‍යම පළාත් නියෝජ්‍ය පොලිස්පතිවරයාගෙන් ඉල්ලා තිබේ.[25][26] එහෙත්, තත්වය පාලනය වී ඇති බවක් පවසමින් නියෝජ්‍ය පොලිස්පතිවරයා එය ප්‍රතික්ෂේප කර තිබේ. ඒ හා සමගාමීව ම, මුදල් හා ජනමාධ්‍ය ඇමති මංගල සමරවීර ජාතිවාදී ප්‍රචණ්ඩත්වය ඇවිලවීම ඇප ලබානොදෙන වරදක් බවට පත් කළයුතු බව

---

[21]"Clash in Digana: Police Use Teargas," *Daily Mirror*, 5 March 2018
http://www.dailymirror.lk/article/Clash-in-Digana-Police-use-teargas-146773.html

[22]"President Orders Impartial Probe into Digana Incidents," *Ada Derana*, March 5, 2018
http://www.adaderana.lk/news/46248/president-orders-impartial-probe-into-digana-incidents

[23]"Govt. Condemns Acts of Violence," *Daily Mirror*, 5 March 2018
http://www.dailymirror.lk/146797/Govt-condemns-acts-of-violence

[24]Yusuf Ariff , "Govt Condemns Incidents of Violence in Ampara and Digana," *Ada Derana*, March 6, 2018
http://www.adaderana.lk/news/46253/govt-condemns-incidents-of-violence-in-ampara-and-digana

[25]Ajith Siriwardana and Yohan Perera, "Govt. used Digana Violence to Divert Attention: Wimal," *Daily Mirror*, 6 March 2018 http://www.dailymirror.lk/article/Govt-used-Digana-violence-to-divert-attention-Wimal-146845.html

[26] එම

පැවසීය.[27]එදින සවස් වනවිට මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයට පොලිස් ඇඳිරිනීතිය පනවන ලදී.[28] රජයේ බලධාරීන්ගේ අකර්මන්‍ය ස්වභාවයෙන් නොසතුටට පත් වූ රිෂාඩ් බතියුදීන් ඇමතිවරයාගේ නායකත්වයෙන් යුත් මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් එකොලොස්දෙනෙක් පාර්ලිමේන්තුවේ සභා ගර්භය මධ්‍යයේ බිම වාඩි වී මුස්ලිම් ජනතාවට ආරක්ෂාව ලබා දෙන ලෙස ඉල්ලා සිටියහ. ඔවුන් මෙම විරෝධතාවය පළකළේ රටේ සිංහල-මුස්ලිම් ගැටුම් සහ වර්තමාන තත්වය සම්බන්ධයෙන් සභාව කල්තබන අවස්ථාවේ විවාදයක් පැවැත්වෙන අතරතර දී ය.[29]

**2018 මාර්තු 6 (4 වැනි දිනය)**

තැන්නෙකුඹුර, හාරිස්පත්තුව, යටිනුවර සහ මහනුවර ප්‍රදේශවල ආතතිය දිගින්දිගටම උත්සන්න වූයේ ය. ප.ව. 11.30ට මඩවල ප්‍රදේශයේ කඩයක් ගිනිතැබීමක් සම්බන්ධයෙන් අල් ජසීරා මාධ්‍ය ආයතනය වාර්තා කර තිබුණි. 6වෙනි ද උදෑසන පල්ලේකැලේ බසාර් හි කඩයක පසුපස තිබී අබ්දුල් බාසිත් ගේ සිරුර සොයාගන්නා ලදී.

රජය විසින් හදිසි අවස්ථා තත්වයක් ප්‍රකාශයට පත් කරන ලද අතර, විමර්ශන පැවැත්වීම සඳහා පොලිස්පතිවරයා විසින් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ නිලධාරී කණ්ඩායමක් එවා ඇති බව මාධ්‍ය වාර්තා කළහ. යෝජනා සම්මතයක් සම්මත කරගතයුතු බවත්, දිගන හා තෙල්දෙණිය ප්‍රදේශවල සිදුවූ ප්‍රචණ්ඩත්වය වෙනුවෙන් බෞද්ධයින් මුස්ලිම් ජනතාවගෙන් සමාව ඉල්ලා සිටියයුතු බවත් පාර්ලිමේන්තුවේ සභානායක ලක්ෂ්මන් කිරිඇල්ල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින් පැවසූ බව ඩේලි මිරර් පුවත්පත වාර්තා කර තිබුණි. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මුස්ලිම් ප්‍රජාවෙහි සාමාජිකයින් සමගින් රැස්වීමක් කැඳවා මෙම ප්‍රචණ්ඩත්වය මගින් එ.ජා.ප. රජයේ අසමර්ථභාවය පෙන්නුම් කෙරෙන බව සඳහන් ප්‍රකාශයක් නිකුත් කළේ ය. පොදු ජන පෙරමුණු නායක ජී.එල්.පීරිස් විසින් නිකුත් කළ මාධ්‍ය ප්‍රකාශයේ ද මේ අදහස ම පුනරුච්චාරණය විය.

අපිදිගන ප්‍රදේශයේ ක්ෂේත්‍ර චාරිකාවල නිරත වූ පළමු දිනයේ අබ්දුල් බාසිත් ගේ පවුලේ සාමාජිකයින් හමුවුනෙමු. 27 හැරිවිදි පරිගණක කාර්මික ශිල්පියෙකු වූ ඔහු ගින්නත් සමග ඇතිවූ දුම ආශ්‍රහණය වීමෙන් හුස්ම ගැනීමට නොහැකිව මිය ගොස් තිබුණි. කඩකාමරයට ගිනි ඇවිලෙද්දී පිටුපස දොරක් නොතිබුණු කඩය පසුපස වූ නිවාස කොටසේ ඔහු සිර වී ඇත. ගින්නෙන් කළු ගැහුණු කඩ කාමරය හා නිවස මෙන්ම අබ්දුල් බාසිත් ට සිහි නැතිවගිය ස්ථානය ද අපි දුටුවෙමු. ඔහුගේ සහෝදරයා සහ පියා සමගින් අප කථා කළ අතර ඔහු බේරාගැනීමට ඊට වඩා වැඩි යමක් කළයුතුව තිබුණේ ය යන්න ඔවුන්ගේ අදහස විය. දැඩි ලෙස ගින්නෙන් පිළිස්සුණු සහෝදරයා කඩයෙන් පිටතට දිව විත් බාසිත් තවමත් ඇතුළේ සිර වී සිටින බව පිටත එක් රැස් වී සිටි පොලීසියට පවසා තිබේ. කිසිවෙකු හෝ ඔහුට අවධානය යොමුකළ බවක් නොපෙනෙයි. සහෝදරයාව රෝහලට රැගෙන ගොස් තිබේ. අසල්වාසී නිවසක සැඟවී සිටි මව සහ පියා ඊට මද වේලාවකින් එළියට පැමිණි විට අසල සිටි අය පවසා ඇත්තේ පුතුන් දෙදෙනාම රෝහලට ගෙන ගිය බවකි. අබ්දුල් බාසිත් මියගොස් ඇති බව පවුලේ අයට දැනගත හැකි වූයේ පසුදින උදෑසන ය. පසුදිනයේ දී තමාත් තමාගේ තවත් පුතෙකුත් ගිනිගත් නිවසේ ඉතිරිව ඇත්තේ මොනවාදැයි බැලීමට ගිය විට බාසිත් ගේ මලසිරුර හමු වූ අන්දම (එතෙක් ඔවුන් සිතා සිට ඇත්තේ ඔහු රෝහලේ සිටින බවකි) බාසිත් ගේ පියා විස්තර කළේ ය. අසල සිටගෙන බලාසිටි පුද්ගලයින් තරුණයින් දෙදෙනාවම රෝහලට ගෙනගියා යැයි පැවසීම පිළිබඳව බාසිත්ගේ පියා කෝපයෙන් පසු විය. කඳුළු පිරි දෑසින් ඔහු ඒක එයාගෙ වෙලාව තමයි යනුවෙන් පැවසීය. 'රෝහලට අරගෙන ගියා කිව්වේ නැති නම් අපි එයාව හොයන්න ඉඩ තිබුණා' යනුවෙන් කී ඔහු තවදුරටත් මෙසේ කීවේ යː 'මිනිස්සු දිගින්දිගටම මේ විදිහට පහර කමින් ඉන්න එකක් නැහැ. කොයිතරම් කාලයක් මේවා ඉවසාගෙන ඉන්නද? අපිත් අනිත්පැත්තට සටන් කරන්න ගත්තොත්? ප්‍රතිචාර දැක්වුව හොත්?'

[27]Weekly Media Updates, "Inciting Racial Violence must be Made Non-Bailable Offence – Minister, India Council of World Affairs, 5-11 March, 2018, https://www.news.lk/news/sri-lanka/item/19706-inciting-racial-violencemust-be-

[28]"Police Curfew in Kandy Administrative District," *Daily Mirror*, 5 March 2018 http://www.dailymirror.lk/article/-Police-curfew-in-Kandy-administrative-district-146776.html

[29]http://www.ft.lk/Front-Page/Muslim-Ministers-protest-in-Well/44-650751

2018 මාර්තු 7 (5 වැනි දිනය)

මාර්තු 6 වැනි දින ප්‍රචණ්ඩත්වය යම් තරමකට සමනය වුවත්, 7 වැනි ද උදෑසන එය නැවතත් ඉස්මතු වූයේය.

***අඹතැන්න - වෙලේකඩේ***

අඹතැන්න යනු පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති ගමක් වන අතර, මාර්තු 7වැනිද උදෑසන මෙම ගම්මානයට පහර දෙන ලදී. අඹතැන්න පන්සල මුස්ලිම් පුද්ගලයින් විසින් වනසා දමා ඇති බවට කටකතාවක් පැතිර ගොස් තිබේ. පන්සල තුළ පිළිම කිහිපයක් තබා තිබූ, වීදුරුවලින් තැනූ කුඩා සෘජුකෝණාස්‍රාකාර ආකෘතියකට හානි වී තිබූ අතර වීදුරුව බිඳී ගොස් තිබුණි. පන්සල ඉදිරිපිට ඇති තකියා මුස්ලිම් පල්ලියට සිදුකළ ප්‍රහාරයට සහ වෙලේකඩේ ප්‍රදේශයේ නිවාසවලට එල්ල කළ ප්‍රහාරවලට මූලාරම්භක සිදුවීම වශයෙන් පුද්ගලයින් සඳහන් කළේ මෙම වීදුරු ආකෘතියට හානි කර තිබීමයි. පන්සලේ ඝන්ටාරය නාද වී ඇති අතර පන්සලට පහර දුන් බවක් කියමින් විශාල පිරිසක් ඒකරාශී වී තිබේ. මෙහිදී එතරම් වාර්තා නොවූ කරුණ නම් පල්ලිය විසින් අත්පත් කර ගෙන තිබූ එක්තරා බිම් කැබැල්ලක් සම්බන්ධයෙන් පන්සල සමගින් ඒ වනවිටත් පැවති ආරවුලක් තිබූ බවයි. 2013 දෙසැම්බර් මාසයේ දී පල්ලියට ප්‍රහාරයක් එල්ල වී ඇති අතර, ඒ සම්බන්ධයෙන් නඩුවක් විභාගවෙමින් පවතියි. 2013 වර්ෂයේ සිදුවීම සම්බන්ධයෙන් පුද්ගලයින් දහදෙනෙක් අත් අඩංගුවට ගෙන ඇති අතර, 'සංහිඳියා සාකච්ඡාවල' කොටසක් වශයෙන් නඩුව අතහැර දැමීමට යොමුකරවාගැනීමේ වෑයමක් තිබුණද, විනිසුරුවරයා එයට ඉඩ දී නැත. අප කථා කළ අලීම් සහ පල්ලි භාරකරු පැවසුවේ පල්ලිය සමගින් තරහෙන් පසුවන පුද්ගලයින් ප්‍රදේශයේ සිටින බවයි. සිදුවීමෙන් සති කිහිපයකට පසුව අපි තකියා පල්ලියේ සංචාරය කරන විට ද ප්‍රහාරයේ සලකුණු තවමත් පෙනෙන්නට තිබුණි. පල්ලි භාරකරු සහ අලීම් තවමත් සිටියේ කම්පනයෙන් වුවත් සිදුවූ දේවල් පිළිබඳව ඔවුන්ඉවසිලිවන්තව සිටියහ. සිදුවූ දෙය පිළිබඳව වෙලේකඩේ ආසන්නයේම ප්‍රදේශවල භික්ෂූන් වහන්සේ ඇතුළු කිහිපදෙනෙක් සමග අපි කථාකළ විට ඔවුන් ඇඟවූයේ එකී 'මූලාරම්භක සිදුවීම' රඟ දක්වන ලද්දක් වියහැකි බවත් එම කුඩා ආකෘතියට හානි කිරීම සඳහා කිසිදු මුස්ලිම් පුද්ගලයෙකු පන්සලට ඇතුළු වූ බවට සාක්ෂි නොමැති බවත් ය. කලබලතවදුරටත් දිග්ගැස්සීමට විවිධ ක්‍රියාකාරීන් විසින් දැරූ වෑයම් සඳහා සාක්ෂි ලෙස මෙම සිදුවීම පිළිබඳව කථා කෙරුණි.

ප්‍රහාර සිදු වූ අවස්ථාවේ විශේෂ කාර්ය බලකාය ඉටු කළ භූමිකාව කෙරෙහි ද ප්‍රදේශයේ ජනතාව අපගේ අවධානය යොමු කරවූහ. විහාරස්ථානයටඑල්ලවූ 'ප්‍රහාරය' සම්බන්ධ පුවත පල්ලියට ළඟා වූ පසු, ඒ සම්බන්ධයෙන් කළයුත්තේ කුමක්ද යන්න පිළිබඳ"මෂූරාවක්",එනම් සාකච්ඡාවක් ඇතිවී තිබේ. විශේෂ කාර්ය බලකාය සහ පොලීසිය ෆෝ-වීල් වර්ගයේ වාහන දෙකකින් එම ස්ථානයට පැමිණ පල්ලිය ඉදිරියේ රථ නවතා තිබේ. එවිට එම ස්ථානයට පුද්ගලයින් කණ්ඩායමක් පැමිණ විශේෂ කාර්ය බලකා සාමාජිකයින් සිටියදී ම පල්ලියට ගල් ගසා ඇත. එම කණ්ඩායම එතැනින් ඉවතට යැවීමට විශේෂ කාර්ය බලකායට හැකිවී තිබේ. ඊට මිනිත්තු කිහිපයකට පසුව ඔවුන් ද එම ස්ථානයෙන් ඉවත්ව ගොස් ඇත. ඊට යම් වේලාවකට පසුව වඩාත් විශාල පිරිසක් එතැනට පැමිණ පල්ලියට සහ වෙලේකඩේ ප්‍රදේශයේ නිවාසවලට පහර දී තිබේ. එම ප්‍රහාරය පල්ලියේ සී.සී.ටී.වී. කැමරාවලට හසුවී තිබේ. විශේෂ කාර්ය බලකාය නැවත වරක් එහි පැමිණියත් කලහකාරීන් නැවැත්වීමට කිසිවක් කර නැත. ඒ දිනවල මාධ්‍යවල වාර්තා කර තිබුණේ ආරක්ෂක බලකායන්ට යමක් කිරීමට නොහැකි තරම් එම කලහකාරී පිරිස් ඉතා විශාල වූ බවයි. මෙම ප්‍රහාරය අවස්ථාවේ තමන්ගේ අතේ තිබූ අත් බෝම්බයක් පුපුරා යාමෙන් ගුණරත්න බංඩා නැමැති අයෙක් මිය ගියේ ය. පොලීසිය සමග අප කළ කථාබහේ දී අපට ඉදිරිපත් කළ අදහසක් වූයේ එම අත්බෝම්බයතබා ගෙනසිටි පුද්ගලයාට එවැනි පුපුරන ද්‍රව්‍ය ක්‍රියාකරන ආකාරය පිළිබඳ කිසිදු දැනුමක් නොතිබූ බවයි.ඒ අනුව එම අත් බෝම්බය 'බාහිර බලවේග' විසින් ඔහු වෙත සපයා තිබූ එකක් බව පැහැදිලි වේ.

කලහකාරීන් ඉදිරියට ගිය අතර ප්‍රදේශවාසීන්ට නොපමාව තම නිවෙස්වලින් පිට වී යන ලෙසට විශේෂ කාර්ය බලකාය විසින් උනන්දු කරවා තිබේ. පල්ලියේ මෙන්ම නිවාසවල ද පුද්ගලයින් සිදුවූ හානිය කොපමණදැයි බලමින් සහ ගිනි නිවාදැමීමට උත්සාහ කරමින් සිටියහ. එහෙත් විශේෂ කාර්ය බලකාය තරයේ පවසා ඇත්තේ ඔවුන් එම ප්‍රදේශයෙන් පිටවිය යුතු බවකි. අෆ්රා නිවාස් පවසන

අන්දමට වෙනත් 'ආරක්ෂිත' ස්ථාන කරා ඔවුන්ව ප්‍රවාහනය කිරීම සඳහා විශේෂ කාර්ය බලකායේ වාහනවලට ගොඩවෙන ලෙසටඑම පවුල්වලට පවසා ඇත. ඇතැම් අයට තම නිවෙස්වල දොරවල් අගුළු දැමීමට පවා අවකාශයක් ලබා දී නැත. ප්‍රදේශවාසීන් පිටව ගිය පසු කලහකාරීන් ආපසු පැමිණ තවදුරටත් හානි සිදුකර, කොල්ල කා, නිවාසවලට ද ගිනි තබා ඇති බවක් පෙනෙයි.[30] එම ප්‍රදේශයේ පුද්ගලයින් පසුව පැවසුවේ තමන් පිටව නොගියානම් වඩා සුදුසු යැයි ඔවුන්ට සිතුණු බවයි. විශේෂ කාර්ය බලකායේ ක්‍රියාමාර්ගය නිසා තමන්ව පාවා දෙන ලද බව බොහෝදෙනාගේ හැඟීම විය.

අතීතයේ ප්‍රශ්න තිබුණ ද පල්ලිය සහ පන්සල අතර සාමාන්‍යයෙන් හොඳ සම්බන්ධතාවයක් තිබුණු බව පල්ලියේ භාරකරු සහ අලීම් පැවසූහ. පන්සලේ භික්ෂූන් වහන්සේ පස් නමක් සිටින බවත්, එක් භික්ෂුවක් පමණක් 'එතරම් හොඳ නැති' බවත් (මුස්ලිම් විරෝධී මතවලට සහාය දෙයි) ඔවුහු පැවසූහ. 'මේ වගේ ප්‍රහාරයක් වෙන්න යන බව හඳුනන අයගෙන් අපට දැනගන්න ලැබුණා' ඔවුහු පැවසූහ. 'ඒ වෙලාවේ අපි මෙහෙම දේවල් වෙන එක නවත්වාගැනීම ගැන පන්සල සමග කථාබහ කරමිනුයි හිටියේ.' මෙම ප්‍රහාර පිළිබඳව ඔවුන් ප්‍රධාන වශයෙන් ම පැවසුවේ පහත සඳහන් කරුණු වේ:

1. ඔවුන්ට රටේ ආරක්ෂක බලකායන් පිළිබඳ විශ්වාසය තබා තිබුණු නමුත් රජයේ බලකායන් මෙම ප්‍රහාර නැවැත්වීමට කිසිවක් නොකළ අන්දම ඔවුහ දුටුවෝය. දැන් ඔවුන් තුළින් එම විශ්වාසය පහව ගොසිනි.

2. ප්‍රදේශයේ බෞද්ධ ප්‍රජාවන් සමගින් ඔවුන්ට ඇති සම්බන්ධතාවය මීට වඩා හොඳ වන්නේ නම් ඔවුන් කැමති ය. මේ සිදුවීම් අවස්ථාවේ ඔවුන් වෙනුවෙන් කථා කිරීමට කවුරුන් හෝ සිටියේනම් මෙම තත්වය මගහරවාගත හැකිව තිබූ බව ඔවුන්ගේ හැඟීමයි.

වෙලේකඩේ ප්‍රදේශයේ පදිංචි පවුලක් සමග අපි කථා කළෙමු. ඔවුන්ගේ නිවසට පෙට්‍රල් බෝම්බ ගසාතිබූ අතර ඉන් නිවසේ උඩුමහල දැවීගොස් තිබුණි. ආභරණ සහ වටිනා ලිපිලේඛන ඇතුළු ඔවුන් සතු බොහෝ දෑ එම ගින්න හේතුවෙන් ඔවුන්ට අහිමි වී තිබේ. වාහන ද ගරාජවලින් ඉවතට ගෙන ගිනිතබා ඇත.

විහාරස්ථානය ආසන්නයේ පිරිසක් රැස්ව සිටින බව දුටුවද ඔවුන් ඒ පිළිබඳ එතරම් දුරට නොසිතූ බව ඔවුහු පැවසූහ. මීට පෙර ද පල්ලියට පහර දී තිබේ. නැවතත් එවැනි යමක් සිදුවිය හැකි යැයි සිතුවද වෙනත් ස්ථානවලට ප්‍රහාර එල්ල වෙතැයි ඔවුන් අපේක්ෂා කර නැත. ප්‍රහාරකයින් ටික වේලාවකින් ඉවත්ව යතැයි ඔවුන් සිතාගෙන සිට ඇතත්, එම ප්‍රහාරකයින් නිවාසවලට ප්‍රහාර එල්ල කරන්නට පටන් ගෙන ඇත. නිවසේ හිමිකරු අපට මෙසේ කීවේය: ඒ අය මේ ගෙදර ඉදිරියට ඇවිත් ජනෙල් කඩලා ඇතුල් වෙන්න හැදුවා. ඒත් එහෙම කරගන්න බැරි වුනා. ඒ වෙලාවේ මිනිස්සු සියදෙනෙක් විතර පාරේ හිටියා.8ක් 10ක් වගේ ගේ ඇතුළට කඩාවදින්න උත්සාහ කළා.' උඩු මහළේ පදිංචි ඔවුන්ගේ දියණිය ප්‍රහාර ආරම්භ වන අවස්ථාවේ පහත මාලයට පැමිණ තිබේ. ප්‍රහාරය සිදුවන විට බිය වූ දරුවන් අඬන්නට පටන් ගෙන ඇත. ඇසුණු ඝෝෂාව කන් බිහිරි කරවන තරම් විය. 'එක පැත්තකින් ළමයි අඬනවා, අනෙක් පැත්තෙන් එක එක දේවල් කඩාබිඳ දන සද්දේ ඇහෙනවා.' පොලීසිය එම ස්ථානයේ සිට ඇති බවත් ප්‍රහාර ආරම්භ වීමට පෙර ඔවුන්ට ඇමතුමක් ලැබී එම ස්ථානයෙන් පිටත්ව ගිය බවත් ඔවුහු ද තහවුරු කළහ.

> '11.30-12.00 විතර වෙනකොට අපි ගෙයින් පිටත් වුනා. අපේ බඩුභාණ්ඩ බේරාගැනීම ගැන අපට සිහියක් තිබුණේ නැහැ. අපේ සිහියේ තිබුණේ ළමයින්ව බේරාගැනීම ගැන. එක ශ්‍රේණියේ ඉගෙන ගන්න මගේ පුතාට තවමත් රෑට භයානක හීන පේනවා. සති දෙකක් විතර යනකම් පොඩි දරුවෝ හැමකෙනාම රෑට නින්දෙන් අඬනවා.'

මුල්ලේගම (පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ම ගම්මානයකි) සිට එම නිවසේ අය බැලීමට පැමිණ එදින එහි සිටි ඥාති කාන්තාවක් තමන්ගේ අත්දැකීම් විස්තර කළා ය. ඉන් උපුටාගත් කොටස් පහත දැක්වේ:

---

[30] Afrah Niwas, "Through the Scorched Frames: The aftermath in Welekade," *Groundviews*, 03/20/2018 https://groundviews.org/2018/03/20/through-the-scorched-frames-the-aftermath-in-welekade/.

'මගේ ගෙදරට කිසිම දෙයක් වෙන එකක් නෑ කියලා මම විශ්වාස කළා. මුල්ලේගම එච්චර හොඳට හිටපු ගමක්'

'200ක් 300ක් විතර සෙනගක් මම දැක්කා. ඒ ගොඩක් දෙනා තමන්ගේ මුණ වහගෙනයි හිටියේ. අපේ ගෙදර ළඟ බස් එකක් නවත්තලා තියෙනවාත් මම දැක්කා. කළුකරපු වීදුරු දාපු ලොකු ටුවරිස්ට් බස් එකක්'

'එස්.ටී.එෆ්. එක අපට ගිනි නිවාගන්න දුන්නේ නැහැ. මට ඒ ගින්න නිවාගන්න පුළුවන්කම තිබුණා. ගෙවල් ගිනි තියන එක මරා දානවාටත් අන්ත වැඩක්'

'ආයෙත් මෙහෙම දෙයක් වෙන්න පුළුවන් කියලා අපට හිතෙනවා. වරද කළ අයට දඬුවම් නොලබා ගැලවිලා යන්න පුළුවන් වුනොත් මෙහෙම දෙයක් ආපහු වෙන එක සියයට සියයක් ම සහතිකයි. අපි ඉස්සර හිටපු විදිහයි, ඒ අය දැන් අපි දිහා බලන විදිහයි දැක්කම මේක ආපහු වේවි කියලා මට හිතෙනවා.'

නිවසේ ඉහළ මාලයට ගිණි තැබුවේ එම නිවස ඉදිකළ පෙදරේරුවාගේ පුත්‍රයා බව නිවසේ පදිංචිකරුවන් පැවසුහ. පල්ලියේ සී.සී.ටී.වී. දර්ශනවලින් හෙළිදරව් වූ අන්දමට ප්‍රහාරකයින් අතරින් බොහෝදෙනා පෙදරේරුවන් සහ පදිංචිකරුවන් දැන හඳුනන ප්‍රදේශයේ ත්‍රිරෝද රථ රියැදුරන් ය.

මාර්ගයේ අනෙක්පස වූ සිංහල පවුලේ උදවිය එම ස්ථානයට විශේෂ කාර්ය බලකාය ගෙන්වා දීමෙන් ඔවුන්ට උදව් වී තිබේ. තවදුරටත් ප්‍රශ්න ඇතිවේ යැයි බියෙන් නිවසින් පිටව යන මෙන් විශේෂ කාර්ය බලකාය ඔවුන්ගෙන් ඉල්ලා තිබේ. එම පවුලේ පියා 'ඔයාලා මෙච්චර වෙලාවක් බලන් හිටියේ ඇයි? ඔයාලා ඉන්නේ අපිව ආරක්ෂා කරගන්න නේ' යනුවෙන් විශේෂ කාර්ය බලකායේ පුද්ගලයකුට පවසා තිබේ. එම පුද්ගලයා ඊට පිළිතුරු දී නොමැති අතර මද සිනහවක් පා තිබුණා පමණකි.

එම ප්‍රදේශයේ ප්‍රහාරයට ලක්වූ දෙවන නිවස මෙයයි. පළමු නිවස සම්පූර්ණයෙන්ම විනාශ වී ඇති අතර කලහකාරීන් නිවසේ තිබූ දෑ කොල්ල කා තිබේ.

එම නිවසට අසල්වාසී කාන්තාවක් මෙම සිදුවීම්වලින් කෙතරම් කැළඹීමට පත් වූයේ ද යත් සිද්ධියෙන් සති දෙකකට පසුව ඇය කම්පනයෙන් මිය ගොස් තිබේ.

සිදුවීමෙන් පසුව, මුල් අවස්ථාවේ දී ඔවුන්ට උදව් කළ අසල්වාසීන් හා දන්නා හඳුනන අය කිසිවෙක් ඔවුන් බැලීමට පැමිණ හෝ ඔවුන්ට කිසිත් පවසා හෝ නැත. සංහිඳියාව සඳහා වැඩසටහන් පවත්වා ඇතః පල්ලියේ එක් වැඩසටහනක් ද බොක්කාවල විහාරයේ වැඩසටහන් දෙකක් ද පවත්වා තිබේ. මෙවැනි දෑ නැවතත් සිදුවීම වැළැක්වීම සඳහා බාල පරම්පරාව දැනුවත් කිරීමේ සැලසුමක් තිබී ඇත. එහෙත්, එහිදී කිසිවෙකු විසින් සිද්ධ වූ මෙම සිද්ධිය ගැන කථා කර නැත.

පොලීසියෙන් ඔවුන්ගේ පැමිණිල්ල ලියාගෙන ඇත්තේ 'පුද්ගලයින් නිවස බිඳීමක්' වශයෙනි. 'අපි ඒක ඉදිරිපත් කළේ ජාතිවාදී කෝලාහලයක් කියලා. ඒත් එයාලා පැමිණිල්ල ලියාගත්තේ එහෙම නෙවෙයි. අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවත් ත්‍රස්ත විමර්ශන දෙපාර්තමේන්තුවත් ප්‍රකාශ සටහන් කරගත්තා.'

ප්‍රදේශයෙන් පුද්ගලයින් දොළොස්දෙනෙකු අත් අඩංගුවට ගෙන තිබුණි. අප එම ප්‍රදේශයට සංචාරය කළ අවස්ථාව වන විට අත් අඩංගුවට පත් එම පුද්ගලයින් නිදහස් කරනමෙන් පන්සල් දෙකකින් ඉල්ලීම් ඉදිරිපත් කර තිබූ අතර ඔවුන් නිදහස් කරගන්නට සහාය දෙන මෙන් පීඩාවට පත් පවුල්වලින් ඉල්ලා තිබේ. 'මේ කාරණය සාමකාමීව විසඳගමු කියලා අපෙන් ඉල්ලනවා. ඒ පවුල්වල අය දැන් ඇවිත් අපට කරදර වෙන විදියට ඇවිටිලි කරනවා'යනුවෙන් අප සමග පවසන ලදී.

වෙලේකඩේ ප්‍රදේශයේ ඇති වූ මෙම ප්‍රචණ්ඩත්වය හේතුවෙන් ප්‍රජාවේ තිබූ බොහෝ සම්බන්ධතා උඩුයටිකුරු වී ඇති අතර, තමන්ගේ මුල්ගම සමගින් මෙම ප්‍රජාවන්ට වූ බැඳීම සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන් වශයෙන් තමන් පිළිබඳව ඔවුන්ට තිබූ අවබෝධය ද ඉන් බලපෑමට ලක් වී තිබේ. ප්‍රචණ්ඩත්වය හේතුවෙන් ඔවුන්ගේ නිවාස හා ජීවනෝපායයන් විනාශ වූ අතර ළමයින් තුළකම්පනය ඇති විය. මෙම සිදුවීම් වලින් සෑහෙන කලකට පසුව ද මිනිසුන් පැමිණ තම නිවෙස්වලට පහර දෙන අන්දම නපුරු සිහින ස්වරූපයෙන් තවමත් ළමයින්ට පෙනෙයි. ප්‍රචණ්ඩත්වයෙන් මාස පහකට පසුව

අපි එහි ගිය අවස්ථාවේ පවා අපට පැවසුවේ 'මිනිස්සු අදත් අපිට පහර දෙන්න ඒවිද?' කියා ළමයින් තවමත් ඔවුන්ගෙන් විමසන බවයි.

***එඬරුතැන්න***

හාරිස්පත්තුව ප්‍රා.ලේ. කොට්ඨාසයේ පිහිටා ඇති එඬරුතැන්න, සිංහල ගම්මානවලින් වට වූ, ප්‍රධාන වශයෙන් ම මුස්ලිම් ජනතාව පදිංචි ගම්මානයක් වේ. එයට ග්‍රාම නිලධාරී කොට්ඨාස තුනක් අයත් වේ. ඒවා නම්, එඬරුතැන්න, උලඳුපිටිය සහ රජපිහිල්ල යි. ප්‍රදේශයේ මුස්ලිම් ප්‍රජාව එඬරුතැන්නේ පදිංචි මුස්ලිම් පවුල් 168කින් සහ ඒ ආසන්නයේ ඇති උලඳුපිටියේ පදිංචි මුස්ලිම් පවුල් 20කින් සමන්විත වේ. ප්‍රදේශයේ මුස්ලිම් ජනතාව ව්‍යාපාරික කටයුතු, කෘෂිකර්මාන්තය සහ බටහිර ආසියානු රටවලට සංක්‍රමණය ඔස්සේ තම ජීවිකාව සරි කරගනිති. එම ප්‍රදේශයේ සිංහල ජනතාව ප්‍රධාන වශයෙන් ම කුළුබඩු වතු වගාකිරීමෙහි නිරත වන අතර,වඩු වැඩ සහ පෙදරේරුකර්මාන්තයේනියුතු ශිල්පීන් ද සිටිති. මාර්තු 7වැනි දින උදෑසන මෙම ගම්මානයට පහර දෙන ලදී.

සිද්ධියට පෙර තම අසල්වාසීන් සමග නොඉවසුම් තත්වයක් හෝ සැලකියයුතු තරමින් මුස්ලිම් විරෝධී අදහස් පළ කිරීමක් හෝ නොතිබුණු බව ඔවුහු පැවසූහ. ඔවුන් අතරේ සියළු දෙයක් ම හොඳින් සිදුවෙමින් තිබුණි. ඔවුහු එකිනෙකාගේ මංගල්‍ය සහ අවමංගල්‍ය උත්සවවලට සහභාගී වූහ. ප්‍රදේශයේ ඇතැම් මුස්ලිම් පුද්ගලයින්ට සිංහල වාසගම් තිබූ අතර, මධ්‍යම පළාතේ බොහෝ මුස්ලිම් ජනතාව අතර මෙය සාමාන්‍ය දෙයකි. සංවිධානය වූ මුස්ලිම්-විරෝධී කණ්ඩායම් සිටින බවක් ද විශේෂයෙන් පෙනෙන්නට නොවීය. ජාතිවාදී අදහස් සහිත පුද්ගලයින් එක්කෙනෙකු නැතිනම් දෙදෙනෙකු සිටින්නට ඇතත්, අනෙක් පිරිස් එවැනි අදහස් වටා සංවිධානය වන බවක් පෙනෙන්නට නොතිබුණි. ප්‍රචණ්ඩත්වයෙන් පසුව සිංහල ජනතාව එතරම් ම ගම්මානයට පැමිණ නැත. මෙම ගම්මානය මෙවැනි ප්‍රහාරයක් අත්විඳි පළමු අවස්ථාව මෙයයි. ආසන්නයේ වූ ඇඹුල්පුර විහාරයේ විහාරාධිපති හිමියන් තමන්ගේ ප්‍රදේශයේ කිසිවකුට ඔවුන් වෙත ප්‍රහාර එල්ල කරන්නට ඉඩ නොදෙන බව සහතික වී තිබේ. කෙසේ නමුත්, ප්‍රහාර සඳහා අසල්වාසීන්ගේ ද යම් සම්බන්ධතාවයක් තිබෙන්නට ඇතැයි ඔවුහු සැක කරති. පහර දුන් පුද්ගලයින් මහනුවර පුද්ගලයින්ට වඩා පෙනුමෙන් බොහෝ වෙනස් වූ හෙයින් ඔවුන් පිටස්තර අය බව ස්ථිර නමුත් ඔවුන්ට මෙම ගම සොයාගත හැකි වූයේ කවුරුන් හෝ ඔවුන්ට පාර කියූ නිසා ය. මෙය විශාල ගම්මානයක් නොවන අතර, එය පිහිටා ඇත්තේ ප්‍රධාන පාරක ද නොවේ.

මාර්තු 5 හා 6 වැනි දිනවල මහනුවර ඇතිවූ තත්වය හේතුවෙන් එඬරුතැන්නේ පදිංචිකරුවන් පරීක්ෂාවෙන් සිට ඇති අතර මාර්තු 6 වැනි ද රාත්‍රියේ තමන් කල්පනාවෙන් සිටීම සුදුසු බවක් ඔවුන්ට සිතී ඇත. එදින ඔවුන්ට බොහෝ ගිලන් රථවල නලාහඬ ඇසී තිබේ. කුමක් සිදුවූයේ දැයි ඔවුන් පුද්ගලයින්ගෙන් ඇසූ විට ඒ අය පිළිතුරු දී ඇත්තේ මුස්ලිම් පුද්ගලයින් බෝම්බ ගැසූ බවකි. එබැවින් එදින රාත්‍රියේ ගමට ප්‍රහාරයක් සිදුවේවිද යන බිය ඔවුන් තුළ තිබී ඇත. පල්ලිය අසල පොලිස් නිලධාරීන් දෙදෙනෙකුද රාජකාරියට යොදවා තිබී ඇත. මාර්තු 6 වැනිද රාත්‍රියේ නැතහොත් පසුදින හිමිදිරි උදෑසන ප්‍රධාන පල්ලියට පසුපසින් ඇති කුඩා සිද්ධස්ථානයට පෙට්‍රල් බෝම්බ දෙකක් ගසා ඇත. එහෙත් වෙනත් කිසිවක් සිදුවී නැත. රාත්‍රියේ එතරම් කිසිවක් නොවූ හෙයින් ගමේ පුරුෂයින් බොහෝදෙනෙක් පසුදින තමන්ගේ රැකියාවලට පිටත් වී ගොස් තිබේ. ප්‍රහාරය සිදුව ඇත්තේ පෙ.ව.11.00ට පමණ ය. අනපේක්ෂිත වූ එම ප්‍රහාරයෙන් ගමේ කාන්තාවෝ විමතියට පත්වූහ. ඔවුන් පැවසූ අන්දමට එම පිරිස් රජවැල්ලේ සිට කලින් දින අත් බෝම්බයක් පිපිරුණු වෙලේකඩේ දෙසට ගමන්කර ඇත. පුද්ගලයින් 30 දෙනෙකුගෙන් පමණ සමන්විත පළමු කණ්ඩායම පෙ.ව. 10.30ට පමණ පැමිණ තිබේ. පසුව ප.ව. 1.00ට පමණ තවත් කණ්ඩායමක් පැමිණ ඇත. එම දෙවන කණ්ඩායම පුද්ගලයින් 70ක් 80ක් පමණ සිටි විශාල කණ්ඩායමකි. ගම්වාසීන් ඔවුන්ව විස්තර කළේ මත්පැන් හෝ මත් ද්‍රව්‍යවලින් මත් වූ ළාබාල තරුණයින් වශයෙනි.

මෙම ගම්මානය පිහිටා ඇත්තේ කන්දක එක් පසෙක වේ. කන්ද මුදුනේ ඇති පල්ලියට යාම සඳහා පහළ සිට පියගැට 93ක් නැගිය යුතු ය. එම පියගැට 93 දෙපස ගම්වාසීන්ගේ නිවෙස් පිහිටා තිබේ. ප්‍රහාරකයින්ට ඉතා සැහැල්ලුවෙන් මේ පියගැට පෙළ දිගේ ඉහළ පහළ දුවන්නට හැකිව තිබූ බව ගම්වාසීහු පැවසූහ: 'සියළුදෙනාම හොඳින් සංවිධානය වී සිටි බවක් පෙනුණා,' ඔවුහු පැවසූහ. එක් එක් කාර්යය එක් එක් පුද්ගලයාට පවරා තිබූ බවක් පෙනුණි. උදාහරණ වශයෙන් ඇතැමුන්

ජනේලවල වීදුරු බිඳ දැමූ අතර තවත් අය විදුලිය හා ජල මීටර බිඳ දැමූහ. තවත් කොටසක් නිවාස තුළ වූ බඩුභාණ්ඩ කඩාබිඳ දැමූහ.

සිදුවන්නට යන ප්‍රහාරය පිළිබඳ දැනගත් වහාම ගමේ කාන්තාවන් තම පවුලේ වැදගත් ලිපිලේඛන රැගෙන නිවෙස්වලින් පිටව ගොස් තිබේ. නිවෙස් ඉදිරිපස ඇති කඳුගැටයට රැස්වූ මෙම කාන්තාවන් කලහකාරීන් තම නිවෙස්වලට කඩාවදින අන්දම බලා සිට ඇත. පළමු කණ්ඩායම පැමිණ ඇත්තේ ත්‍රිරෝද රථ දෙකකින් සහ එල්ෆ් වර්ගයේ වෑන් රථයකිනි. කාන්තාවන් විස්තර කළ අන්දමට එම ප්‍රහාරකයින්ළාබාල තරුණයින් ('තවමත් ළමයි වගේ'; 'කිරිබොන සයිස් එකේ') විය. ඔවුන් ඉතාමත් දැඩි ජවයකින් යුතුව තම කටයුතුවල නිරත වී තිබේ. සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ අයගේ අදහස වූයේ තරුණයින් ඒකරාශී වූ විට ඔවුන් තුළ ජවයක් ඇති බවයි. 'හොඳට ෆෝම් කරපු කට්ටිය - කොල්ලෝ එකතුවුනාම හයියක් එනවා'

මේ පිරිස් කන්ද මුදුනට නැග පල්ලියට ළඟා වන විට ඔවුන්ගේ අතේ ආයුධ නොතිබුණු අතර ඔවුන් තුළ වූ ශක්තිය ද හීන වී ගිය බවක් පෙනුණි. එහෙත් කන්ද පාමුල වූ කුඩා පල්ලිය කඩාදමා එහි කුරාන පුළුස්සා තිබුණි. 'මේ පල්ලිය ඊළඟ වතාවට ඉතුරු කරලා ගිය බවක් අපට හිතුණා. යන ගමන් එයාලා එහෙම කිවුවත් එක්ක.'

මේ ගම්මානයේ වැසියෝ දිවි ගැටගසාගත්තේ ඔවුන් බැලීමට පැමිණි අය ලබාදුන් ආධාරවලිනි. බේරුවල, ගාල්ල, මඩවල, මීගමුව සහ අකුරණ වැනි ප්‍රදේශවල සිට පැමිණි අය ඔවුන්ට මුදල් ආධාර ලබාදී තිබේ. ඒ සියලු දෙනා මුස්ලිම් පුද්ගලයන් වේ. ජාතික මට්ටමේ ඇතැම් දේශපාලනඥයින් ද ප්‍රදේශයට පැමිණ තිබේ. අනුර කුමාර දිසානායක ඒ අතරින් එක් අයෙකි. එහෙත් ගම්වාසීන්ගේ අදහස වූයේ හැමදෙයක්ම සිදුවුවායින් පසුව නොව සිද්ධියට පෙර මේ සම්බන්ධයෙන් යමක් කළයුතුව තිබුණු බවයි. සිද්ධියෙන් පසුව පොලීසිය හා හමුදාව ප්‍රදේශයට පැමිණ ඇති අතර දින තුනක් යනතෙක් මුර සංචාර සිදුකර තිබේ.ඔවුන් පල්ලියේ කාමරයක නැවතී සිට ඇති අතර ගම්මානයෙන් ඔවුන් වෙත ආහාර ලබා දී තිබේ. විශාල මෝටර් බයිසිකල්වල නැගී හමුදා සෙබළු ද සිට ඇත. ඔවුන් දෙස බැලීමත් බිය උපදවන බව ගම්වාසීහු පැවසූහ. අවසාන සිකුරාදා දිනයේ විශාල හමුදා වාහනයක් ද පැමිණ තිබේ. ඔවුන් යුද්ධයකට යන්නට සූදානම් වන අන්දමක් පෙනුණු බව අප වෙත පවසන ලදී.

මෙවැනි දෙයක් නැවත සිදුවිය හැකි යැයි ඔවුන් සිතන්නේ දැයි විමසූ කල ඔවුන්ගේ පිළිතුර වූයේ එසේ වනු ඇති බවකි. මෙවැනි දෙයක් සිදුවිය හැකි නම් මීට වඩා විශාල ආපදාවක් ද මෙහි සිදුවිය හැකි බවට ඔවුහු තර්ක කළ අතර, 'එහෙම වේවි කියලා බලාපොරොත්තු වෙන්න ඕනැ' යැයි පැවසූහ. බෙහෙවින් හැඟීම්බරව එක් අයෙක් මෙසේ ද පැවසීය:

> 'අපි ඉවසුවා ඇතියි කියලා අපට හිතෙනවා. අපට පැත්තකට වෙලා බලන් ඉඳලා ගෙවල් හදන මිනිස්සුන්ට තව තවත් වැඩ ලබා දෙන්න බැහැ. ඒවගේම අපට හැංගෙන්නත් බැහැ. ඊළඟ වතාවේ නම් ඉවසීමෙන් ඉන්න අපේ අදහසක් නැහැ. මේවගේ ජීවත්වෙනවාට වඩා මැරෙන එක හොඳයි. මේකෙන් පස්සේ අපට අනාගතයක් නෑ. ආණ්ඩුවෙන් අපට ආරක්ෂාව ලබාදෙන්න ඕනැ. ඒ වගකීමෙන් එයාලාට මිදෙන්න බැහැ. ප්‍රහාරයට කලින් දා රෑ පල්ලිය ළඟ පොලිස් නිලධාරීන් දෙන්නෙක් හිටියා. පොඩි පල්ලියට දාපු පෙට්‍රල් බෝම්බ දෙක එයාලා දැක්කත් එක්ක. එයාලට ඕනැ කමක් තිබුණා නම්, මේක නවත්තගන්න තිබ්බා. අපට එක දේශපාලන පක්ෂයකටම දොස් කියන්න බැහැ. සමස්ථ රජයම, බලයේ ඉන්න හැම කෙනාම වගකියන්න ඕනැ. හැමෝම මේ තත්වයෙන් දේශපාලන වාසි ගන්නවා මිසක් කවුරුත් ජනතාවට තමන්ගේ යුතුකම් ඉටුකරන්නේ නැහැ. එයාලා සන්නද්ධ හමුදාවෙන් දහ දෙනෙක් එවලා තිබ්බානම් ඇති.'

පහත විස්තරය ප්‍රහාරකයින් සම්බන්ධයෙන් තමන් ලැබූ අත්දැකීම් විස්තර කළ එඬරුතැන්නේ කාන්තාවන් පැවසූ කරුණු මත පදනම් වේ:

> 'පාන්දර 1.00ට විතර තකියා පල්ලියට (කඳු පාමුල වූ කුඩා පල්ලිය) පෙට්‍රල් බෝම්බ දන සද්දෙ අපට ඇහිලා බලනකොට අපි ගිනිදැල් දැක්කා. ඊටපස්සේ 2.00 ට විතර පොලීසිය ඇවිත් පාන්දර 3.00 විතර වෙද්දි ආපහු යන්න ගියා. අපේ පිරිමි රෑ එළිවෙනකම් ඇහැරලා හිටියා. ඒක එතනින් ඉවරයි කියලා හිතලා පහුවදා උදෑසන පිරිමි අය වැඩට යන්න පිටත්

වුණා. උදේ 10.30ට විතර තමයි අපේ පුතාගෙන් කෝල් එකක් ආවේ කලහකාරී කණ්ඩායම් එනවා කියලා. ළමයින්වත් අරන් කැලේට දුවන්න කියලා අපට කිව්වා. අපි හතරදෙනෙක් එකතුවෙලා ළමයිනුත් එක්ක පිටත් වුනා. ඒ අය ඇවිත් අපේ ගෙවල් කඩා බිඳ දන සද්දෙ අපට ඇහුණා. එනගමන් ඒ අය කුනුහරුපෙන් - තම්බිලා වරෙල්ලා කියමින්, කපනවා, මරනවා කියලා කෑ කෝ ගසමින් එන සද්දෙ අපට ඇහුනා. අපි 12.00 විතර වෙනකම් හිටියා. ඊට පස්සෙ සිංහල මිනිස්සු ඇවිල්ලා කිව්වා කෝලාහලකාරයෝ ගියා, අපිට දැන් එන්න පුළුවන් කියලා. අපි හිටියේ සිංහල ගෙදරක් පිටිපස්සේ. ඉතින් පස් දෙනෙක් විතර තීරණය කළා ගිහින් අපේ ගෙවල්වලට වෙලා තියෙන දේ බලන්න.

ආපහු යන අතරේ කලහකාරී සෙනග ආපහු එනවා අපට ඇහුණ නිසා අපට දුවන්න සිද්ධ වුණා. මාව අනෙක් අයගෙන් වෙන්වුණු නිසා මට වෙන පැත්තකට දුවන්න සිද්ධ වුනා. ළමයිනුත් අරගෙන තණ පඳුරු අතරින් හැංගි හැංගී බිම දිගේ තමයි ඉදිරියට ගියේ. ඕං තම්බිලා කැලේට පනිනවා කියලා ඒ අය කෑගනවා අපිට ඇහුණා. මූණුවල දැඩි තරහක් එක්ක, අවි ආයුධ අරන් අපට නරක වචනයෙන් බැනවදිමින් ඒ මිනිස්සු යන හැටි මම දැක්කා... චලාර්, චලාර් ගාලා එක එක දේවල් කැඩෙන බිඳෙන සද්දේ ඇහුණා. බුස් බුස් ගාලා ගිනි ඇවිලෙමින් තිබුණා!

අපි කැලේට වෙලා යාඥා කළා. අපි හවස හතර විතර වෙනකම් වතුර පොදක් නැතුව එතන හිටියා. අවුරුදු තුනේ දරුවට මූත්‍රා කරන්නවත් බැරිවුණා.

ඊට පස්සේ දවස් තුනක් යනකම් අපි යන එන තැනක් නැති අය වාගේ ඉස්කෝලේ කෑම්ප් එකේ හිටියා. ඇති යන්තම්, කාගෙවත් ජීවිත කෆීර් වුනේ නැහැ.'

පෙනෙන ඕනෑම මතුපිටකට මහ හඬක් නැගෙන සේ වැරෙන් තලන්නට හැකි විශාල දඬු අතැතිව, තර්ජන හා අසැබි වදන් හඬ ගා කියමින්, මහත් හඬක් නගාගෙන කලහකාරී පිරිස් පැමිණි අන්දම කාන්තාවෝ විස්තර කළහ. තවත් කණ්ඩායමක් පැවසුයේ කලහකාරීන් එද්දී තමන් කන්දේ අනෙක් පස තිබූ විශාල නිවසකට දිව ගිය බවකි. ඒ නිවසතුළ කාන්තාවන් හා ළමයින් සියදෙනෙක් පමණ තදබද වී සිට තිබේ. ඔවුන් දොර ජනෙල් සියල්ල වසාගෙන සිට තිබේ. තම්බිලා කැලේට දිව්වා කීවා? කෝ නෑ නෙ යනාදි වශයෙන් කථා කරමින් කලහකාරීන් පිටත ඇවිදින හඬ ඔවුන්ට ඇසී තිබේ.

'ගරාජ් එකේ පරණ කාර් එකක් තිබුණා. සෙනග ඇවිත් කාර් එක එළියට ඇදගෙන ගිහින් ගිනිතිබ්බා. අපි හිටියේ ගේ ඇතුළෙ. එළියෙන් යන එන අඩි හඬවල් අපිට ඇහුනා. ඒ අය ගේ වටේ දෙතුන් පාරක් ගියා. අපි හැමෝම ඇතුළේ හිටියේ. ළමයින්ව නිශ්ශබ්ද කරලා තියාගන්න වුනා. එළියේ සර සර ගාලා එක එක සද්ද ඇහුනා. අපි ඇතුළේ ඉන්නවා ඒ සෙනගට අහුවුණා නම් හරි ඒ අය ගේ කඩන්න තීරණය කළානම් හරි මොනවා වෙයිද කියලා හිතාගන්නවත් බැහැ!'

කලහකාරී පිරිස් එම ස්ථානය පහු කර යන අවස්ථාවේ එක් කාන්තාවන් පිරිසක් යා ගැනීමට නොහැකිව ඔවුන්ගේ වත්තේ සිරවී සිට තිබේ. තරුණ පිරිස් ඔවුන්ට 'තමුන්ගේ කට්ටියට කියන්න අපි ඉවරකරන්න බැරිවුණ ඒවා ඉවරකරන්න ආපහු එනවා කියලා' යනුවෙන් පවසා තිබේ.

මෙම පිරිස් ආපසු පැමිණෙනවායි සහ පස්සේ 'බලාගැනීමට' පල්ලිය ඉතිරිකර ගොස් ඇතැයි ගම්වාසීන්ට ඒත්තු ගොස් තිබුණි.

'මම නුඹලාව පරීක්ෂා කර බලනවා කියලා අල්ලා දෙවියන් කිව්වා. ඒත් මුස්ලිම්වරුන් ශක්තිමත්ව හිටියොත් අපිට බේරෙන්න පුළුවන්'යනුවෙන් ඔවුන් අතරින් එක් අයෙක් පැවසුවේය.

ආරක්ෂක බලකායන් සිටීමෙන් සහ ඇඳිරිනීතිය පැනවීමෙන් පවා ප්‍රචණ්ඩත්වය වළක්වාගත හැකි වී නොමැති බව පැහැදිලි ය. එවිට රජය විසින්මාර්තු 6වෙනි දින මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක වන පරිදිදිවයින පුරා බලපැවත්වෙන දින දහයක හදිසි අවස්ථා තත්වයක්[31] ප්‍රකාශයට පත් කරන ලදී. මෙම ක්‍රියාව මානව හිමිකම් නීතිඥයින්, සංවර්ධන වෘත්තිකයින් හා ක්‍රියාධරයින් විසින් දැඩි සේ විවේචනයට ලක්කරන ලදී. තමන්ට එරෙහිව එල්ල වූ විවේචනවලින් නොසැලුණු රජය සමාජ මාධ්‍ය

[31]Yusuf Ariff, "Govt to Declare State of Emergency for 10 Days," *Ada Derana*, March 6, 2018 http://www.adaderana.lk/news/46261/govt-to-declare-state-of-emergency-for-10-days

ජාලාකිහිපයක් ද තහනම් කළේය. බොහෝදෙනා මින් සැනසිල්ලට පත් වූහ.[32] අමතර ආරක්ෂක ක්‍රියාමාර්ගයක් වශයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ පාසල් දින නියමයක් නොමැතිව වසාදමන ලදී.[33] පොලිස්පති පූජිත ජයසුන්දර විශේෂ පොලිස් කණ්ඩායම් තුනක් මහනුවරට යැව්වේය. එම කණ්ඩායම්වලට නියෝජ්‍ය පොලිස්පතිවරුන් හා පොලිස් අධිකාරීවරුන් තිදෙනෙක් බැගින් ඇතුළත් වූහ.[34]තවදුරටත් ක්‍රියාමාර්ග ගනිමින් සියලු ම පොලිස් නිලධාරීන්ගේ නිවාඩු අවලංගු කරන ලදී.[35] මෙම ක්‍රියාමාර්ග ගන්නා අතරෙහි, මැණික්හින්න ප්‍රදේශයේ ප්‍රචණ්ඩකාරී අන්දමින් හැසිරුණු පුද්ගලයින් හත් දෙනෙකු අත් අඩංගුවට ගන්නා ලදී.[36] මේ අතර, මහනුවර ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවට එරෙහිව පැතිරෙමින් තිබූ ප්‍රචණ්ඩත්වය නොපමාව අවසාන කෙරෙන බව රජයෙන් සහතික නොකරන්නේ නම්, අග්‍රාමාත්‍යවරයාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් වුවොත් එහිදී අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහට එරෙහිව ඡන්දය ප්‍රකාශ කරන බවට මුස්ලිම් ඇමතිවරු සහ මන්ත්‍රීවරු තර්ජනය කළහ.[37]

මාර්තු 8වැනිදා උදෑසන රංජිත් මද්දුම බණ්ඩාර අමාත්‍යවරයා නව නීතිය හා සාමය අමාත්‍යවරයා වශයෙන් පත් කරන ලදී.[38] එදින ම අම්පාරේ සිංහල පුරුෂයෙකුට ලබාදුන් ආහාරවල තිබූ කුඩා කොටස් වෙනයමක් නොව පිටිගුලි කිහිපයක් බව තහවුරු කිරීමට රජයේ රස පරීක්ෂකට හැකිවිය.[39] පස්වරු 6.30 සිට පැය 12ක ඇඳිරිනීතියක් පනවා තිබූ අතර රජයෙන් ගත් රැඩිකල් ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල පෙනෙන්නට විය. ප්‍රහාර සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වූ අතර ප්‍රහාරවල රළු භාවය හීනවී ගියේ ය. 'මහනුවරින් පිටත ස්ථාන කිහිපයක පුද්ගලයින් විසින් යම් යම් ආයතන වෙත ගල් ගැසීම වැනි සුළු සිදුවීම් කිහිපයක් හැරුණු විට තත්වය පාලනය වී ඇති බව' එදින සන්ධ්‍යාවේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ විසින් සහතික කළේ ය. ගිරිඋල්ල, කුරුවිට හා වැලිගම ප්‍රදේශවලින් සුළු සිදුවීම් වාර්තා වී තිබුණි.[40]

එම අවස්ථාවේ බොහෝදුරට පුද්ගලයින් සැනසවූ කාරණය වූයේ අමිත් වීරසිංහ අත් අඩංගුවට ගැනීමයි.[41] ත්‍රස්ත විමර්ශන ඒකකයේ නිලධාරීන් දිගන හා බෝපිටියේ දී තවත් සැකකරුවන් 9 දෙනෙකු සමගින් වීරසිංහව අත් අඩංගුවට ගන්නා ලදී.[42] මේ සමගින් අත් අඩංගුවට පත් මුළු සංඛ්‍යාව 81ක් දක්වා ඉහළ ගියේ ය.[43] ඉන් 10 දෙනෙක් ආරක්ෂක අංශයේ (විශේෂ කාර්ය බලකා

---

32Rosie Perper , "After Declaring a State of Emergency, Sri Lanka has Banned Facebook, Instagram, and WhatsApp," *Business Insider*, Mar 8, 2018, http://www.businessinsider.com/sri-lanka-bans-facebook-to-topviolence-2018-3

33Yusuf Ariff, "Kandy Schools Closed until Further Notice" *Ada Derana*, March 7, 2018 http://www.adaderana.lk/news/46279/kandy-schools-closed-until-further-notice

34Yusuf Ariff, "IGP Dispatches 3 Special Police Teams to Kandy," *Ada Derana*, March 7, 2018 http://www.adaderana.lk/news/46275/igp-dispatches-3-special-police-teams-to-kandy

35Yusuf Ariff, "Leave of all Police Officers Cancelled," *Ada Derana*, March 7, 2018 http://www.adaderana.lk/news/46285/leave-of-all-police-officers-cancelled

36Manushi Silva, "Police Curfew in Kandy Administrative District Re-imposed," *Ada Derana*, March 7, 2018 http://www.adaderana.lk/news/46273/police-curfew-in-kandy-administrative-district-re-imposed

37Yohan Perera and Ajith Siriwardana, "Muslim MPs may Vote against PM if not Violence Controlled: Harees," *Daily Mirror*, 7 March 2018, http://www.dailymirror.lk/article/Muslim-MPs-may-vote-against-PM-if-not-violencecontrolled-Harees-146915.html

38"Muslim MPs may vote against PM if not Violence Controlled: Harees," *Daily Mirror*, 7 March 2018 http://www.dailymirror.lk/146915/Muslim-MPs-may-vote-against-PM-if-not-violence-controlled-Harees
SF denounces appointment of new Law and Order Minister," *Daily Mirror*, 8 March 2018 http://www.dailymirror.lk/article/SF-denounces-appointment-of-new-Law-and-Order-Minister-146966.html

39Indika Ramanayake and Tharindu Jayawardena, "Ampara: Carbohydrate Clumps; not Sterilizing Chemical- Govt. Analyst," *Daily Mirror*, 8 March 2018 http://www.dailymirror.lk/article/Ampara-Carbohydrate-clumps-notsterilizing-chemical-Govt-Analyst-146954.html

40"Situation under Control, Riots have Dealt a Huge Blow to Economy: PM," *Daily Mirror*, 8 March 2018 http://www.dailymirror.lk/article/Situation-under-control-riots-have-dealt-a-huge-blow-to-economy-PM-146980.html

41"Kandy Communal Violence: Main Suspect Arrested," *Daily News*, March 9th 2018, http://www.dailynews.lk/2018/03/09/local/145064/kandy-communal-violence-main-suspect-arrested

42Yusuf Arif,"Main Suspect in Kandy Incident Arrested," *Ada Derana*, March 8, 2018 http://www.adaderana.lk/news/46301/main-suspect-in-kandy-incident-arrested

43Darshana Sanjeewa, "81 Suspects Arrested over Kandy Violence, Four During Curfew," *Daily Mirror*, 8 March 2018 http://www.dailymirror.lk/article/-suspects-arrested-over-Kandy-violence-four-during-curfew-146962.html

සහ/හෝ පොලිස් යැයි අනුමාන කෙරේ) විය. පොලිස් ප්‍රකාශක පොලිස් අධිකාරී රුවන් ගුණසේකර සඳහන් කළ පරිදි එම සැකකරුවන් 10 දෙනා අත් අඩංගුවට ගෙන ඇත්තේ ත්‍රස්ත විමර්ශන ඒකකය විසිනි. සැකකරුවන් 71 දෙනෙක් ප්‍රචණ්ඩ සිදුවීම් සම්බන්ධයෙන් අත් අඩංගුවට ගත් බවත්, 4 දෙනෙක් ඇඳිරිනීතිය කඩ කිරීම සම්බන්ධයෙන් අත් අඩංගුවට ගත් බවත් ඔහු පැවසීය.[44]

මාර්තු 9වැනි සිකුරාදා වනවිට කලබලකාරී තත්වය සමනය වෙමින් තිබූ නමුත් පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග ගනිමින් තිබුණි. පොලිස් නිලධාරීන් 3,000ක්, යුධ හමුදා භටයින් 2,500ක් සහ නාවික හමුදා භටයින් 600 දෙනෙක් මහනුවර දිස්ත්‍රික්කයේ සාමය පවත්වාගෙන යාම සඳහා එසේ යෙදවූ පිරිසට ඇතුළත් විය. පස්වරු 8.00 සිට පැය 9ක ඇඳිරිනීතියක් ද පනවන ලදී.[45] පීඩාවට පත් වූවන්ට හානි වූ තමන්ගේ දේපළ නැවත ගොඩනැගීම ආරම්භ කිරීම සඳහා මූලික වශයෙන් ලබාදෙන සුළු මුදලක් නොපමාව ලැබෙන්නට සලස්වනු ඇති බව රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයා පැවසීය. අග්‍රාමාත්‍යවරයා කළ ප්‍රකාශයේදී සමාජ මාධ්‍ය තුළ සිතාමතාම ප්‍රචාරය කළ වැරදි තොරතුරු ප්‍රචණ්ඩත්වය පැතිරයාමට මග පෑදූ බව ඔහු පැවසීය.[46] වැරදි තොරතුරු ප්‍රචාරයට එරෙහිව දැඩිව කටයුතු කිරීමත් සමගින් සමාජ මාධ්‍ය ඔස්සේ එවැනි තොරතුරු ප්‍රචාරය කළ 17 හැවිරිදි සහ 18 හැවිරිදි පුද්ගලයින් දෙදෙනෙක් කොළඹින් අත් අඩංගුවට ගන්නා ලදී.[47] මාර්තු 9 වැනිදා, සිකුරාදා පෙරවරු 5.00 ට අවසාන ඇඳිරි නීතිය ඉවත් කළ අතර සමාජ මාධ්‍ය කරා ප්‍රවේශය සහ අන්තර්ජාල සබඳතාවයන් කඩින්කඩ පැවතියේ ය. ප්‍රචණ්ඩ ක්‍රියා සම්පූර්ණයෙන්ම නැවතී තිබුණි.

---

44 එම

45 Yusuf Ariff, "Curfew in Kandy Administrative District During the Night," *Ada Derana*, March 9, 2018 http://www.adaderana.lk/news/46324/curfew-in-kandy-administrative-district-during-the-night

46 Compensation for Victims Soon – PM," *Ada Derana*, March 9, 2018. http://www.adaderana.lk/news/46311/compensation-for-victims-soon-pm

47 Keshala Dias, "Two Youth Arrested for Causing Communal Disharmony Through Social Media" *News lst*, 9 March 2018 https://www.newsfirst.lk/2018/03/09/two-youth-arrested-for-causing-communal-disharmony-through-socialmedia/

## 3 වැනි පරිච්ඡේදය

## අකුරණ 8 කණුව ප්‍රදේශය (2018 මාර්තු 7) සම්බන්ධයෙන් සිදුකළ සිද්ධි අධ්‍යයනය

අකුරණ අටේ කණුව ප්‍රදේශයේ සිදු වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් දෘෂ්ටිකෝණ කිහිපයකින් ම අදහස් ලබාගැනීමට අපටඅවස්ථාව උදා විය. මෙම ප්‍රදේශයේ අසල්වාසී ගම්මානයක් වන කොනකලගල පුද්ගලයින් දෙදෙනෙකු ප්‍රචණ්ඩත්වයට සහභාගිවීම සම්බන්ධයෙන් අත් අඩංගුවට ගෙන තිබුණි. තවද, ප්‍රදේශයේ ආරච්චි නොහොත් ග්‍රාමනිලධාරීවරයා මෙම ක්‍රියා සඳහා සහභාගි වූයේ හෝ අඩුම තරමින් ඒ සඳහා ආධාර සහ අනුබල දුන්නේ යැයි ප්‍රදේශයේ බොහෝ මුස්ලිම් පුද්ගලයෝ චෝදනා කළහ. අකුරණ යනු  බහුලවම මුස්ලිම් පුද්ගලයින් සිටින ප්‍රදේශයක් වුවත් ඒ වටා ඇති ගම්මානවල සෑහෙන ප්‍රමාණයක සිංහල ජනතාවක් වාසය කරති. කොනකලගල පන්සල සහ එහි භික්ෂුන් වහන්සේ තමන් ප්‍රදේශයේ සිංහල සහ මුස්ලිම් ප්‍රජාව තුළ එක හා සමාන වැදගත් ස්ථානයක් උසුලතැයි සිතාසිටින බවක් පෙනෙන්නට තිබුණි. අටේ කණුව ප්‍රදේශයේ ප්‍රජාවෙහි සාමාජිකයින්, කොනකලගල පන්සලේ භික්ෂුන් වහන්සේ සහ ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ වූයේ යැයි චෝදනා ලැබූ ආරච්චි සමගින් කථාබහ කරන්නට අපට අවස්ථාව ලැබුණි. ගම්මාන දෙකේ එදිනෙදා ජන ජීවිතයට විනාශකාරී හා බාධාකාරී බලපෑමක් එල්ල කළ මෙම ප්‍රචණ්ඩක්‍රියා සමගින් එම ගම්මානවල සැඟව තිබූ බොහෝ ආගමික සහ ජනවාර්ගික බෙදීම් රේඛා මතුපිටට ඉස්මතු වූයේ ය.

පෙර සඳහන් කළ පරිදි මාර්තු 5 සහ 6 දිනවල ප්‍රචණ්ඩත්වය ඇතිවී තිබූ අතර දිගන හා ඒ ආසන්න ප්‍රදේශවලට එල්ල වූ ප්‍රහාරවලින් පල්ලි හා නිවාස ගිනිබත් වී ව්‍යාපාර විනාශ වී තිබුණි. අටේ කණුවේ පදිංචිකරුවන් අපට පැවසුවේ වෙලේකඩේ පන්සලට ප්‍රහාර එල්ල කර ඇති බවටත් හාමුදුරුවෝ මරා දමා ඇති බවටත් කටකතාවක් මාර්තු 7වැනිදා පැතිරී ගිය බවයි. අඹතැන්නේ පල්ලියට පහර දුන්නේය යන කටකථාවක් ද පැතිරී තිබේ. අටේ කණුව ප්‍රදේශයේ ද ප්‍රශ්න ඇති විය හැකි යැයි කටකථාවක් තිබූ අතර මාර්තු 7වැනිදා උදෑසන වනවිට සමස්ථ අකුරණ ප්‍රදේශයේ ම පාහේ කලබකාරී තත්වය උග්‍ර වී තිබුණි. පෙරවරු 11.00 පමණ වනවිට මිනිසුන් කෙමෙන් කෙමෙන් කඩවල් වසාදමන්නට පටන්ගෙන තිබේ. පස්වරු 12.30  වනවිට සියලුම කඩ වසා තිබුණි. එක් පුද්ගලයෙක් පැවසුවේ කොනකලගල ගමේ සිට 'බසාර්එකට' මිනිසුන් 'එනවා යනවා, එනවා යනවා' තමන් දුටු බවකි. 'ප.ව.12.45 ට අපට පන්සලේ ඝන්ටාරෙ නාදවෙනවා ඇහුණා' යනුවෙන් අප වෙත පවසන ලදී.

එම අවස්ථාවේ පැවති නොඉවසුම් තත්වය කෙතරම්වූයේ ද සහ ප්‍රදේශයේ වාසය කරන මුස්ලිම් ප්‍රජාවන් මුහුණ දෙන යථාර්ථය වන ප්‍රචණ්ඩත්වය අපේක්ෂාවෙන් ජීවත්වීම කෙබඳු ද යන්න අටේ කණුවේ මන්සූර් හාජියාර් ගේ නිවසේ දී අපට අසන්නට ලැබුණු විස්තර වලින් පෙනී ගියේ ය. ප.ව. 12.45ට පන්සලේ ඝන්ටාරය නාද වීම අනතුරක පූර්ව නිමිති හඟවන්නක්ලෙස සහපුපුරායාමට ආසන්නව තිබූ සංවිධානාත්මක ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් අනතුරු අඟවන්නක් ලෙසඑය සලකන ලදී. ඝන්ටාරයේ කථාවෙන් පෙනී යන්නේ සිදුවූ ප්‍රචණ්ඩත්වයට පන්සල පාර්ශ්වයෙන් යම් සහායක් ලැබුණුබවක් ඔවුන් සිතන බවයි.

තමනුත් තවත් පස් දෙනෙකුත් ගසාලි හාජියාර් ගේ නිවසට රැස් වී සිටි බව තවත් පුද්ගලයකු පැවසුවේ ය. අලවතුගොඩ පොලිසියේ ස්ථානභාර නිලධාරී ජයතිලක තමන්ගේ පොලිස් වසම තුළ කිසිවක් සිදුවන්නට නොදෙන බව පැවසුවේ යැයි එක් පුද්ගලයකු සඳහන් කර තිබේ:

> 'දිගන දීත් ඒ කථාවම කියලා තිබුණු නිසා අපි ඒක විශ්වාස කළේ නැහැ. අපි කොනකලගල නායක හාමුදුරුවන්ට කථා කරන්න උත්සාහ කළා. උන්වහන්සේ දුරකථනයට පිළිතුරු දුන්නේ නැහැ. පොහොට්ටුව පක්ෂයෙන් අලුතින් පත් වූ චමින්ද කියලා මන්ත්‍රී කෙනෙක්ව අපි දැනගෙන හිටියා. අපි එයාට කෝල් කලාම එයා කිව්වේ 'ෆායිස්, මිනිස්සු මට ඡන්දෙ දුන්නට මම මේ දේවල් ගැන කථා කළත් මට ඇහුම්කන් දෙන එකක් නැහැ, මට මොකුත් කරන්න

> බැහැ' කියලයි. ඊළඟට මොකක්ද කරන්නෙ කියලා හිතාගන්න බැරුව අපි ගෙය ඇතුළේ හිටියා. මේ අතරේ අපට ආරංචි වුණා කොනකලගල ගම්මානයේ සීමාවේ ඇති කූරුගොඩ කැති, පෙට්‍රල් බෝම්බ එහෙම ගත්තු පිරිසක් එකතු වෙනවා කියලා. අපට කෝල් එකක් ආවා. ඒ අය මුහුණු වහගෙන කෑකෝ ගසමින් එන බව අපට දැනගන්න ලැබුණා.'

ප්‍රදේශයට අලුතින් ඡන්දයෙන් පත් වූ දේශපාලන නියෝජිතයින්ට ලබාදුන් ඇමතුම් සහ තමන්ට කිසිවක් කරගත නොහැකි යැයි ඔවුන් පාපොච්චාරණය කිරීමෙන් පැහැදිලිවන යමක් තිබේ. මෙම කථා විස්තර කිරීමේදී එමපුද්ගලයින් පෙන්නුම් කළේ සිංහල ප්‍රජා සාමාජිකයින්,එනම් සාමය පවත්වාගෙන යාමට දායක වෙන ප්‍රදේශයේ ප්‍රජාවෙහි බලසම්පන්න පුද්ගලයින්, මේ අවස්ථාවේදී සහාය ලබා දී නොමැති බවයි. ජනවාර්ගික ආගමික අනන්‍යතාවයෙන් ඔබ්බට ගිය ප්‍රාදේශීය ජාලය මේ අවස්ථාවේදී ප්‍රචණ්ඩත්වය වළක්වා ගැනීම සඳහා කිසිදු එලදයී අන්දමකින් ක්‍රියාත්මක වී නැති බව පැහැදිලි ය.

අපි මෙම සාකච්ඡා සිදුකළේ මන්සූර් මහතාගේ නිවසේ වන අතර, ඔහු අටේ කණුවේ ප්‍රජාව තුළ වඩාත් ප්‍රමුඛ පෙළේ සාමාජිකයෙකි. ව්‍යාපාරිකයකු වූ ඔහුත්, ඔහුගේ සහෝදරයාත් අකුරණ ඇති විශාලතම ලී බඩු අලෙවිසැලක හිමිකරුවෝ වෙති. තමන් කොනකලගල නායක හාමුදුරුවන්ට ඇමතූ බවත්, උන්වහන්සේ නොපමාව පැමිණි බවත් මන්සූර් මහතා පැවසීය. කලහකාරීන් මන්සූර් මහතාගේ ලී බඩු ප්‍රදර්ශනාගාරයට පහර දී එයට ගිනිතබන අන්දම ඔවුන් බලාසිට ඇත. මන්සූර් මහතාගේ අයහපත් සෞඛ්‍ය තත්වය (ඔහුට අධි රුධිර පීඩනය තිබුණි) පිළිබඳ දැන සිටි 'ලොකු හාමුදුරුවෝ' මන්සූර් මහතාගේ අත අල්ලාගෙන 'ගින්දරට එරෙහිව ගින්දරෙන් සටන් කරන්න එපා' යැයි පවසා තිබේ. මන්සූර් මහතා ලොකු හාමුදුරුවන්ට සමීප අයෙක් වශයෙන් සලකනු ලැබූ අතර, පසුව අප සමගින් කථා කළ උන්වහන්සේ කලහකාරීන් කඩයට පහරදීම වලක්වාගත නොහැකිවීම ගැන කණගාටුවෙන් කථා කළහ. මිල අධික ගෘහ භාණ්ඩ අලෙවි කළ එම සාප්පුව සම්පූර්ණයෙන්ම විනාශ වී තිබේ.

එදින සිදුවූ සිද්ධීන් විස්තර කරමින් එක් පුද්ගලයකු මෙසේ පැවසීය:

> 'සෙනග ඇවිත් බසාර් එකේ කඩවලට ගහන්න පටන් ගත්තා. ඒ අය ගල් ගැහුවා; ජනේල කඩා දලා ඇතුළට පෙට්‍රල් බෝම්බ විසිකළා. නමුත් ඒ අය පල්ලියට එන්න කලින් අපිත් සංවිධානය වෙලා ගල් ගහමින් ඒ අය එලවා දන්න පටන් ගත්තා. වික වේලාවක් යනකොට ඒ පිරිස් ආපහු සැරයක් කොනකගල පැත්තට තල්ලු කරගන්න අපිට පුළුවන් වුණා. මේ වෙලාවේ පොලිසියේ ෆෝ වීල් වාහනෙන් ඇවිත් ඕ.අයි.සී. බැහැලා අහසට වෙඩි තිබ්බා. එතකොට හැමෝම විසිරිලා යන්න පටන් ගත්තා. ඊට පස්සේ හමුදවත් (විශේෂ කාර්ය බලකාය) ආවා, ඇවිත් අපේ කොල්ලන්ට විසිරිලා යන්න කිව්වා.'

පොලීසිය, ප්‍රාදේශීය ලේකම්, විශේෂ කාර්ය බලකාය සහ ගිනි නිවන හමුදාව එකම අවස්ථාවේ එම ස්ථානයට පැමිණ තිබේ. එම අවස්ථාවේ බලධාරීන් මෙම කණ්ඩායම් දෙක අතර යම් ආකාරයක බාධකයක් පිහිටුවා දෙපිරිස අතර ගැටුම තවත් උග්‍ර වීම වළක්වාගෙන තිබේ. ඉන් පසු පිරිස් සන්සුන් කරවා විසිරුවා හැර තිබේ. ගිනි නිවන හමුදාවෙන් පැමිණියත් ගිනි නිවන රථයට ජලය පුරවාගෙන පැමිණ නැත (අටේ කණුවේ වැසියන් මෙය ද දුටුවේ  පහරදෙන්නන්ට ලබාදුන් සහයෝගය සඳහා තවත් උදාහරණයක් වශයෙනි. රථයේ ජලය පුරවා ඇත්දැයි බැලීමට තමන්ට අමතක වූ බවක් රියැදුරා පවසා තිබේ.)

අටේ කණුවේ පදිංචිකරුවන් විසින් සිදුකළ මෙම ප්‍රතිප්‍රහාරය අවධානයට ගතයුතුව තිබේ. 'බසාර් එකේ'තිබූ මුස්ලිම් කඩවලට හානි කිරීමේ අරමුණින් ඊට සූදානම්ව පැමිණි කලහකාරී පිරිස් ගල් මුල් යනාදියෙන් සන්නද්ධ වී පලවාහැරීමට මුස්ලිම් කඩහිමියන්ට හැකි වී තිබේ. මෙම ප්‍රතිප්‍රහාරයේ දී මුස්ලිම් පුද්ගලයින් සිංහල අයට හිමි කඩසාප්පුවලට ගිනි තැබූ බව සාක්ෂිකරුවෝ පැවසූහ. පිරිස විසුරුවා හැරීම සඳහා පොලීසියත්, ඉන් මද වේලාවකට පසු විශේෂ කාර්ය බලකායත් නොපැමිණියේ නම් කුමක් සිදුවේ දැයි නොපැහැදිලි ය. අනාගතයේ දී ඇතිවන මෙවැනි සිදුවීම් වලදී මුස්ලිම්

ප්‍රජාවන් තෝරාගන්නා ප්‍රතිචාරය වන්නේ පෙරලා පහරදීම වන බව පැහැදිලි ය. ඒ අන්දමින් මහා පරිමාණයෙන් හා සංවිධානාත්මකව පෙරලා පහර දුනහොත් එහි ප්‍රතිවිපාකය කුමක් වේවිද? තමන්ගේ ගමේ යම්කිසිවක් සිදුවුවහොත් පොලීසියෙන් වැඩක් නැතැයි පුද්ගලයින්ට ඒත්තු ගොස් තිබේ. මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය අභිමුව පොලීසියේ අකර්මන්‍යබව සඳහා උදාහරණ වශයෙන් ඔවුහු අපට මාර්තු 5 සහ 6 දිනවල දිගන සහ අනෙකුත් ස්ථානවල ඇතිවූ සිද්ධි ගෙන හැර පෑහ. ඇත්ත වශයෙන් ම ඔවුන් අපට පැවසුවේ අටේ කණුවේ ප්‍රචණ්ඩත්වය නැවැත්වීම සඳහා විශේෂ කාර්ය බලකාය පැමිණීමට ප්‍රමාදවීම පිළිබඳව තමන් සතුටු වන බවකි. දැනට ඔවුන්ට විඳින්නට වූ හානිය 20%ක් නම්, විශේෂ කාර්ය බලකාය එම ස්ථානයේ සිටියේ නම් ඔවුන්ට විඳින්නට වන හානිය 80%ක් වත් වන්නට තිබූ බව ඔවුහු අපට පැවසූහ (වෙලේකඩේ ප්‍රදේශයේ දී විශේෂ කාර්ය බලකාය මුස්ලිම් ජනතාවට තම නිවෙස්වලින් පිටව යන්නට යැයි පැවසීම සලකා ඇත්තේ එම ප්‍රදේශයේ නිවාස හා ව්‍යාපාරවලට සිදුවූ බරපතල හානියට සෘජුවම වගකිවයුතු සාධකයක් වශයෙනි).

ගම්මාන දෙක අතර ඇති සම්බන්ධතාවය පිළිබඳව විමසූ කල, අටේ කණුව ප්‍රදේශයේ පදිංචිකරුවන් මුලින් අපට පවසා සිටියේ තමන් සහ කොනකලගල පදිංචිකරුවන් ඉතාමත් සමීප බවයි. බොහෝදෙනා ඔවුන්ගේ නිවෙස්වල සහ ව්‍යාපාරවල සේවය කළ අතර විටින් විට මුදල් ණයට ඉල්ලාගැනීම සහ වෙනත් ආකාරවල උදව් ඉල්ලාගැනීම සිදුකර තිබේ. මේ සම්බන්ධයෙන් අපි වැඩිදුර විස්තර ඉල්ලා සිටි විට පැහැදිලි වූ කරුණ නම් මෙම ගම්මාන දෙක අතරේ පන්ති පරතරයක් පවතින බවයි. එම සිංහල ගම්මානය ආන්තික කුලයකට අයත් පුද්ගලයින් වාසය කරන ගම්මානයකි. පිළිස්සී ගිය ගොඩනැගිලි ද්‍රව්‍යඅලෙවිසැලක හිමිකරුවෙකු පැවසුවේ තමන්ගේ කඩයට පහර දුන් පුද්ගලයා තමන් හොඳින් හඳුනන බවත්, ඔවුන් අතරේ සෑහෙන සුහදකමක් පැවති බවත් ය. ඔවුන් එකම ව්‍යාපාරයේ නිරත වී සිට ඇති අතර ටික කාලයක් ඔවුන් ව්‍යාපාරික තරගකරුවන් වී සිට තිබේ. කෙසේ නමුත්, එම තරගකරුගේ ව්‍යාපාරය එතරම් සාර්ථක වී නොමැති අතර ඔහුට එය අතහැර දැමීමට සිදුව තිබේ. තරගකරුට එසේ වූයේ ඇයිදැයි අපි විමසූ විට ඔහු ලබාදුන් පිළිතුර වූයේ ඔහුට දැනුම අඩුයි යන්නයි. එමෙන්ම, මේ පුද්ගලයාට විවිධාංගීකරණය වූ ව්‍යාපාරයක් තිබී ඇති අතර තරගකරුට එසේ නොවීය. තවදුරටත් මේ පිළිබඳව විමසීමේදී අප වෙත සඳහන් කළ කරුණ වූයේ මෙසේ ප්‍රචණ්ඩත්වය ඇතිවීම අසාමාන්‍ය දෙයක් නොවන බවත්, මෙය ආවර්තිකව කලින් කලට සිදුවන්නක් බවත් ය. 'රටේ වෙන කොහේ හරි සිංහල මුස්ලිම් පුද්ගලයින් සම්බන්ධ සිදුවීමක් සිද්ධ වෙනවා නම් අපට ඒක මෙහේ දැනෙනවා.' එක් අයෙක් පැවසී ය. 'මේක හැට ගණන්වල ඉඳලා ම සිද්ධ වෙන දෙයක්'.

ප්‍රදේශයේ පොලිසියේ කලින් සිටි ස්ථානභාර නිලධාරියා මෙම ගම්මාන දෙක අතර ඇති සම්බන්ධතා පිළිබඳව මනා අවබෝධයක් තිබූ අයෙක් බවත්, දෙපිරිස අතර ගැටළු සමථ කිරීමට ඔහුට මනා පරිචයක් තිබූ බවත් ඔවුහු අපට පැවසූහ. කෙසේ නමුත්, අලුතින් පත් වී ආ ස්ථානභාර පොලිස් නිලධාරියා මෙම ප්‍රාදේශිය වශයෙන් විශේෂිත කරුණු පිළිබඳ නොදන්නා හෝ එතරම් සංවේදී නොවන බවක් පෙනෙන්නට තිබේ. උදාහරණයක් ලෙස, ගම්මානයට ඇතුල් වීමට එන පිරිසක් වෙතොත් ඔවුන් හරවා යැවීම සඳහා අටේ කණුව හා කොනකලගල ගම් අතර සීමාවෙහි යම් යම් උපායමාර්ගික ස්ථාන කිහිපයක පොලිස් නිලධාරීන් කිහිප දෙනෙක් ස්ථානගත කරන මෙන් භික්ෂූන් වහන්සේ ස්ථාන භාර පොලිස් නිලධාරියාගෙන් ඉල්ලා ඇතත් ඔහු එම උපදෙසට සවන් දී නැත. ප්‍රචණ්ඩත්වය ඇති වූ අවස්ථාවේ එම ස්ථානයට පැමිණීමේ දී පවා ඔහු පැමිණ ඇත්තේ කොස්තාපල්වරුන් දෙදෙනෙක් පමණක් කැටුව ය.

**කොනකලගල රජමහා විහාරය (අකුරණ අටේ කණුව ප්‍රදේශය ආසන්නයේ පිහිටා ඇති විහාරය)**

අටේ කණුව පල්ලියේ භාරකාර මණ්ඩලයේ සාමාජිකයෙකු විසින් අපට කොනකලගල විහාරයේ විහාරාධිපති භික්ෂූන් වහන්සේ හඳුන්වා දෙන ලදී. කොනකලගල විහාරයේ ලොකු හාමුදුරුවන් සමගින් පැවති අපගේ සම්මුඛ සාකච්ඡාවේ දී මුලින්ම උන් වහන්සේ අපගේ ජනවාර්ගිකත්වය සඳහන් කරමින් අපව හඳුන්වාදෙන මෙන් ඉල්ලාසිටියහ. එමෙන්ම, තමන් අතුරලියේ රතන හිමියන් සමගින් විශ්වවිද්‍යාලයේ ඉගෙන ගත් බව ද සාඩම්බරයෙන් අප වෙත පවසන ලදී. බේරුවල වැනි වෙනත් ස්ථානවල වඩාත් 'විශාල සිද්ධි' සිදුවුවත් අකුරණ ප්‍රදේශයේ 'මෙවැනි' ප්‍රශ්න කිසිදිනෙක

නොතිබූ බව උන්වහන්සේ ප්‍රකාශ කළහ. (අපේ කණ්ඩායමේ පදිංචිකරුවන් සඳහන් කළ, කලින් කලට මතුවන විනාශකාරී සිදුවීම් පිළිබඳව මෙම ස්වාමීන්වහන්සේ සඳහන් කළේ නැත). වළක්වාගත හැකිව තිබූ මෙම සිද්ධිය ඇති වූයේ දෙපාර්ශවයේම වූ ජාතිවාදී දේශපාලනය හේතුවෙන් බව පවසන ලදී. සාමාන්‍යයෙන්, මෙවැනි ස්වභාවයේ ප්‍රශ්න සමනය කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්, පොලීසිය සහ පන්සල එකතුවී සමථකරණය කිරීමක් සිදුවේ. මෙවැනි දේවල් විසඳගැනීම සඳහා පොලිස් උපදේශක කමිටුවක් පිහිටුවා තිබේ. ස්ථානභාර පොලිස් නිලධාරියා මෙම ප්‍රදේශයට අලුතින් පත්වී ආ තැනැත්තෙකු බවත්, ඔහු තමන්ට සවන් නොදුන් බවත්, නිවැරදි ක්‍රියා මාර්ග නොගත් බවත් එම භික්ෂුන් වහන්සේ පැවසූහ. කරදර විය යුතු නැති බවක් පවා ස්ථානභාර පොලිස් නිලධාරියා විසින් පල්ලියට පවසා තිබේ. ප්‍රචණ්ඩත්වය ඇතිවීමේ තර්ජනයට ඔහු දැක්වූ ප්‍රතිචාරය එම භික්ෂූන්වහන්සේ විස්තර කළේ මෙසේය:

> 'මාර්තු 6වෙනිදා සිදු වුණු කලබල සම්බන්ධයෙන් අපට අහන්න ලැබුණා. මාර්තු 7වැනිදා හවස 5 වෙනකොට ඇඳිරිනීතිය දාගන්නයි අපට ඕනැ වුණේ. ඒත් පස්වරු 1.30 වෙනකොට ගෙයක් ගිනිතියලා තිබ්බා. මම ඕ.අයි.සී. ට කිව්වා ගමේ සීමාවේ පොලිස් නිලධාරීන් කිහිපදෙනෙක් තියන්න කියලා. එත් එහෙම කළේ නැහැ.'

එක්තරා අවස්ථාවකදී භික්ෂුන් වහන්සේ පැවසුවේ පොලීසියේ 'පන්ඩිතකම' හේතුවෙන් ප්‍රචණ්ඩත්වය පැතිරුණු බවකි.

අකුරණ ප්‍රදේශයේ ජනතාව අතර තිබූ සම්බන්ධය කෙබඳු ද යත් ඇතැම්විට මුස්ලිම් දරුවන් පල්ලියට යාමට වඩා පන්සලට යාමට ප්‍රියකළ බව උන්වහන්සේ පැවසූ හ. මුස්ලිම් පුද්ගලයින් විසින් ලබාදුන් පරිත්‍යාග පිළිබඳව කථා කරමින් සහ තමන්ට එවැනි පරිත්‍යාග සඳහා තිබූ ප්‍රවේශය පිළිබඳ කථා කරමින් 'මට එක කෝල් එකක් දෙන්න විතරයි තියෙන්නේ, බඩු එහෙම කෙලින්ම පන්සලට එවනවා' යනුවෙන් පවසන ලදී. එසේම, තමන් ආයුර්වේද වෛද්‍යවරයකු වන බවත්, මුස්ලිම් රෝගීන් බොහෝදෙනෙකුට ප්‍රතිකාර කර ඇති බවත් සඳහන් කරන ලදී. එම ප්‍රදේශයේ බහුතරය වන මුස්ලිම් ජනතාව පන්සල සමගින් අන්තර්ක්‍රියා කළ අන්දම සහ භික්ෂුවක් වශයෙන් හා ජාතික බහුතරයට අයත් සාමාජිකයෙකු වශයෙන් උන්වහන්සේට කොතරම් ගරුසරු ඇතිව සලකන ලද්දේ ද යන්න අපේ සිතට කාවැද්දීමට උන්වහන්සේ සෑහෙන වෙහෙසක් දැරූහ.

බොදු බල සේනා සංවිධානය මෙම ප්‍රදේශයට නොපැමිණි බවත්, පැමිණියානම් කෙලින්ම පැමිණින්නේ පන්සලට බවත් 'අපි ඒ අයට කරුණු කාරණා කොහොමද කියලා කියන' බවත් සඳහන් කරන ලදී.

> 'කරුණු කාරණා විසඳගන්න මුස්ලිම් අයත් ඇවිත් අපව හමු වෙනවා. ඒ කියන්නේ ප්‍රශ්නයක් තිබ්බා කියන එක නොවෙයි, අපි එකඟ නොවෙන විදියට ඒ අය හැසිරෙනවා නම්, අපි ඒක ඉවසන්නේ නැහැ.'

පහරදීමට පැමිණි සියලු දෙනා පිටස්තර පුද්ගලයින් බවත් (එබැවින් ඒ අය තමන්ගේ දායක පිරිස අයත්වන කොනකලගල ගම්මානයේ අය නොවන බවත්), එමපුද්ගලයින් සංවිධානය වී තමන්ගේ මුහුණු වසාගෙන පැමිණ සිටි බවත් උන්වහන්සේ පැවසූහ. මන්සූර් මහතා තමන්ට ඇමතූ බවත්, තමන් ගිනි ඇවිලෙමින් තිබූ මන්සූර් මහතාගේ කඩය වෙත නොපමාවගිය බවත් පැවසූහ. 'මට ඒ වෙලාවේ ඒක නවත්වාගන්න බැරි වුණා' උන්වහන්සේ පැවසූහ. 'ඒත් පොලීසිය මට කන්දුන්නා නම් මේක වෙන්නෙ නෑ.'

විශේෂ කාර්ය බලකාය ප්‍රදේශයට පැමිණෙන විට ගැටළුව විසඳී තිබුණු බව උන්වහන්සේ පැවසූහ. එම ප්‍රදේශයේ එතරම් දෙයක් සිදු නොවූ බව ද අප වෙත සඳහන් කරන ලදී. සිදුවූ හානියේ බරපතලකම අඩුකර දැක්වීමට එම හිමිනම වෑයමක් දැරූ අතර, කඩ තුනක් පමණක් පිළිස්සුණු බව සඳහන් කරන ලදී. නමුත්, ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි සැල් දෙකක්, ගෘහභාණ්ඩ අලෙවි සැල් හතරක්,

රෙදිපිළි අලෙවිසැල් හතරක්, බේකරියක් සහ බාබර් සාප්පුවක් පිළිස්සී තිබුණි. ඒ සියල්ල ම මුස්ලිම් ජනතාවට අයත් ඒවා නොවේ.

අකුරණ ප්‍රදේශයේ සිංහල වැසියන් 17,000ක් සහ මුස්ලිම් වැසියන් 34,000ක් සිටිති. මේ ප්‍රජාවන් 'දෙගොල්ලන්ට දෙගොල්ලන් නැතුව ජීවත් වෙන්න බෑ' යනුවෙන් හිමිනම ප්‍රකාශ කළේ ය. සියලුම ප්‍රජාවන් අතර යහපත් සම්බන්ධතා පවත්වාගෙන යාමටත්, ප්‍රදේශයේ සමෘද්ධියටත් ඒ.සී.එස්. හමීඩ් විසින් ඉටු කරන ලද කාර්යභාරය පිළිබඳව වර්ණනාත්මකව කථාකළ උන්වහන්සේ ඔහුගෙන් පසු තවත් එවැන්නෙක් නොමැති බව පැවසීය. දැනට එම ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වන හලීම් පිළිබඳව විවේචනාත්මකව කථා කළ උන් වහන්සේ ඔහුගේ මාමා වන හමීඩ් ලබාසිටි ජනප්‍රියත්වය අගයමින්කථා කළේය.

සියළු ප්‍රජාවන්හි අන්තගාමීන් සිටින බවත්, විශේෂයෙන්ම මුස්ලිම් අන්තගාමීන් ඇතිබවත්, අපව එම ස්ථානයට කැඳවාගෙන ගිය අකුරණ පල්ලියේ භාරකරු දෙසට සැලකිය යුතු ලෙස හිස සලමින් හිමිනම බලයෙන්ම ප්‍රකාශ කළේය. සිදුවූ දෙය සම්බන්ධයෙන් තමන් තුළ වූ ඉමහත් සහ අව්‍යාජ බවක් පෙනුණු කණගාටුව පළ කරන අතර ම උන් වහන්සේ උත්සාහ දැරුවේ මුස්ලිම් ජනතාව අත්විඳි ප්‍රචණ්ඩත්වයේ බරපතලකම අඩුවෙන් දැක්වීමටත්, හානි සිදුකිරීම සම්බන්ධයෙන් අත් අඩංගුවට ගත් පුද්ගලයින් අතරින් එක් අයෙක් මුදවාගැනීම සඳහා මුස්ලිම් ජනතාව සහයෝගය නොදක්වන බව අවධාරණය කිරීමටත් ය. අත් අඩංගුවට පත් පුද්ගලයින් සැබැවින්ම වරද කළ අය නොවන බව පැවසූ එම හිමිනම එම පුද්ගලයින් බේරාගැනීමට පොලිසිය සමගින් එක්ව කටයුතු කරන්නට මුස්ලිම් ජනතාව පොළඹවන මෙන් අපෙන් ද ඉල්ලා සිටියහ.

තවද, රටේ සිංහල - මුස්ලිම් ධ්‍රැවීයකරණය සම්බන්ධයෙන් තමන් දරන මතය ද අපවෙත දැනුම්දෙන ලදී. ශ්‍රී ලාංකික සමාජය තුළ මුස්ලිම් ජනතාවට ඇති ස්ථානය පිළිබඳව කථා කරමින් උන්වහන්සේ පැවසුයේ ආගම පල්ලියට සීමා විය යුතු බවත් එදිනෙදා ජීවිතයට සම්බන්ධ නොවියයුතු බවත් ය. අපි ආගම පමණක් වෙනස් එකම ප්‍රජාවක් වශයෙන් සියළුදෙනා කටයුතු කළයුතු බවත් පවසන ලදී.

> 'සංස්කෘතික වශයෙන් අපි සියළුදෙනා එකම විය යුතුයි. අපේ ආගම අනෙක් අයගේ පිට පටවන්න නරකයි. උදාහරණයක් විදිහට මේ 'අසාන්' (යාඥා සඳහා කැඳවීම)- 'අසාන්' වල තියෙන අවශ්‍යතාවය මොකක්ද? හැමෝම යාඥා කරන වෙලාවල් මොනවද කියලා දන්නවා නෙ? ඉතින් අනෙක් අයට බාධා කරන්නේ ඇයි?'

සිදුවීම සම්බන්ධයෙන් තමන්ගේ විශ්ලේෂණය ඉදිරිපත් කරන මෙන් ඉල්ලා සිටි විටඑම හිමියන් නොසැලකිලිමත් ලෙස ලබාදුන් ප්‍රතිචාරය නම් විශ්ලේෂණය කුමක් වුවත් හේතුව පොහොට්ටුව[48] වන බවයි. උන්වහන්සේ ඉන් අදහස් කළේ රාජපක්ෂවරුන්ගේ නායකත්වයෙන් සැදි සංධානය පළාත්පාලන මැතිවරණයේදී ලැබූ ජයග්‍රහණයයි. ඉහත සඳහන් කළ අන්දමින් ඔවුන් ජයග්‍රහණය කළේ මුස්ලිම්-විරෝධී හැඟීම් ඒකරාශී කර මෙහෙයවීමෙන් වන අතර, එසේ මැතිවරණයෙන් තෝරාපත් කරගත් බොහෝදෙනා පසුව ප්‍රචණ්ඩත්වයට සම්බන්ධවීම සම්බන්ධයෙන් අත් අඩංගුවට පත් වී තිබේ.

**ග්‍රාම නිලධාරී / ආරච්චි**

අපි මුලින්ම අටේ කණුව ප්‍රදේශවාසීන් සම්මුඛ සාකච්ඡාවට ලක් කළ අවස්ථාවේ ඉස්මතු වූ එක් කථාවක් වූයේ ආරච්චි නොහොත් ගමේ ග්‍රාමනිලධාරීවරයා, එනම් ප්‍රදේශය භාර රජයේ නිලධාරියා, මුස්ලිම් ජනතාවට එරෙහි ප්‍රචණ්ඩත්වයට සහභාගි වූ බවයි. එසේම, ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලින් පසුව ප්‍රදේශයේ සංසරණය වන කටකථා, අවිශ්වාසය, වැරදි අවබෝධ සහ ක්‍රියාවන් වැරදි ලෙස අර්ථ නිරූපණය සඳහා උදාහරණ වශයෙන් මහනුවර දිසාපතිවරයා විසින් තෝරා ගත්තේ ද මෙම ආරච්චි

[48]2018 පළාත්පාලන මැතිවරණයට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ දේශපාලන පක්ෂය තරග වැදුනේ පොහොට්ටුව ලකුණ යටතේ වේ.

පිළිබඳ කථාවයි. අපි මුලින්ම කථාකළ අවස්ථාවේ අපේ කණුව ප්‍රදේශයේ ජනතාව උදක්ම කියා සිටියේ ආරච්චි ප්‍රචණ්ඩත්වයට සහභාගී වූ බවයි. අනෙක් වෙළඳසැල් වලට හානි කිරීම සඳහා ගෑස් කඩයෙන් ගෑස් සිලින්ඩර ලබාගැනීමට ආරච්චි වරදකරුවන්ට උදව් දුන් බව ඔවුහු පැවසූහ. ආරච්චි මේ සම්බන්ධයෙන් සඳහන් කළේ ගෑස් සිලින්ඩර් පුපුරා ගොස් වඩාත් වැඩි හානියක් සිදුවීම වළක්වාගැනීම සඳහා ඔහු ගෑස් සිලින්ඩර එලියට අදිමින් සිටි බවයි. දිසාපතිවරයා පැවසුවේ ද එම කථාව ම ය.

තමාගේ කඩය පිළිස්සී ගිය එක් පුද්ගලයෙකු පැවසුවේ ආරච්චි තමාගේ කඩයෙන් ගෑස් සිලින්ඩර තබන අන්දම තමන් දුටු බවකි. ඔහුට පොලිසිය වෙත පැමිණිලි කිරීමට අවශ්‍ය වී තිබේ. එහෙත් ප්‍රාදේශීය ලේකම්වරයා ගේ ඇවිටිල්ලෙන් එසේ කිරීම වළක්වාගෙන තිබේ. අප මුලින්ම අපේ කණුව ප්‍රදේශවාසීන්ට කථා කරන අවස්ථාවේ සෑම අතකින් ම ඔවුන්ට පෙනුනේ රජයේ නිලධාරීන් ප්‍රචණ්ඩත්වයට සහාය දෙන අන්දමකි. ආරච්චිගේ ක්‍රියා පිළිබඳව ඔවුන්ට චීත්තු ගොස් තිබුණා පමණක් නොව, එම සහායදැක්වීම ඊට ඉහළ මට්ටම්වලින් ද සිදුවී තිබෙන්නට ඉඩ ඇතැයි ඔවුහු විශ්වාස කළහ. සියළුදෙනාම සංස්කෘතික වශයෙන් එකම කාණ්ඩයකට (එනම්, සිංහල) අයත් වන්නේ ය යනවෘත්තාන්තයට සහාය දුන්කොනකලගල විහාරයේ නායක හාමුදුරුවන් පැහැදිලිවම අපේ කණුව ප්‍රදේශයට ප්‍රචණ්ඩත්වය ගෙන ඒමට සහාය වූ අයෙක් ලෙසින් දක්නා ලදී.

මෙම සිදුවීම්වලට ආරච්චි සම්බන්ධ යැයි අපට සඳහන් කළ, අපගේ පළමු සංචාරයේ දී අපට පවසන ලද තවත් කරුණක් වූයේ ගම්වාසීන්ට නිරන්තරයෙන් ආරච්චිගේ ජාතිවාදී අදහස්වලට මුහුණදෙන්නට සිදුව ඇති බවකි. ආරච්චි අප හා කථාකරන විට පැවසූයේ ගම්මානයේ කණ්ඩායම් දෙකකට අයත් පුද්ගලයින් සිටින බවකි. 'කා සමගිනුත් හොඳින් ඉන්න', 'සාම්ප්‍රදායික', 'වැඩිහිටි' මුස්ලිම් පුද්ගලයෝ සිංහලයෙකු වන ඔහු සමගින් මනා සබඳතාවයක් පවත්වාගෙන යති. ඔහු පැවසූ අන්දමට, ඔවුහු තමන්ගේ ආහාර පවා ඔහු සමගින් බෙදාහදාගනිති. දෙවන කණ්ඩායම නම්, වෙනස් අදහස් ඇති අලුත් තරුණ පිරිස් ය. ඔහු පවසන අන්දමට මේ අය මුස්ලිම් ජනතාව සිංහල ජනතාවගෙන් වෙන්කිරීමට යොමුවූ අය වේ. සිංහල පුද්ගලයින්ගේ ත්‍රිරෝද රථවල ගමන් කිරීමෙන් වළකින මෙන් පැවසීම, සිංහල කඩවලට නොයන මෙන් උපදෙස් දීම වැනි දෑ හරහා ඔවුහු එසේ කරති.

සිදුවීමෙන් මාස තුනකට පසුව අපි ආරච්චි සමගින් සම්මුඛ සාකච්ඡාවක් පැවැත් වූයෙමු. ඒ වනවිට, ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ආරච්චි ගේ භූමිකාව පිළිබඳ කථාව ඒ ප්‍රජාව තුළ යම් මට්ටමකට ප්‍රචලිත වී තිබුණි. තමන්ට එරෙහිව කර ඇති මෙම චෝදනාව සම්බන්ධ කථාව ආරච්චි අප සමගින් පැවසුවේය. ඇතිවූ සිදුවීම හේතුවෙන් මෙන්ම තමන් අවුරුදු 15කට අධික කාලයක් තිස්සේ සේවය කළ මුස්ලිම් ප්‍රජාවේ සාමාජිකයින් විසින් තමන් ඔවුන්ට එරෙහිව මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදුකිරීමට හැකි තැනැත්තෙකු යැයි ඔවුන් විසින් සිතීම පිළිබඳව ඔහු තිගැස්මෙන් සහ කම්පනයෙන් සිටියේ ය. 'මම එහෙම කරානම් තිරිසනෙක්' යනුවෙන් ඔහු පැවසීය. ප්‍රචණ්ඩ සිදුවීම්වලින් පසුව මාස දෙකක් යනතෙක් ඒ පුද්ගලයින් තමන්ගේ මුහුණ වත් නොබැලූ බවත්, කලින් තමන් සමගින් හිතවත්ව සිටි අය පවා තමන්ට කථා නොකළ බවත් ඔහු පැවසීය. තමන් ප්‍රහාරයට සහභාගි වූ බව මුලින්ම ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේ හලීම් අමාත්‍යවරයා බව ඔහු කීවේය- හලීම් එවැනි ප්‍රකාශයක් කරන වීඩියෝපටයක් යූටියුබ් නාලිකාවක කලින් තිබූ නමුත් පසුව එය ඉවත් කර ඇතැයි ඔහු කීවේ ය.

රැකබලාගත යුතු යැයි තමන්ට සංවේදීතාවයක් ඇති එම ප්‍රජාව විසින් ම, තමන් ප්‍රචණ්ඩත්වයේ නිරත වූ වරදකරුවෙකු වශයෙන් සිතන්නේ ය යන අදහසින් ආරච්චි කැළඹී සිටියේ ය. රජයේ සේවකයකු වශයෙන් ඔහු එක් වසරක් පුරා මෙම ප්‍රජාවට සේවය කිරීමට පත් කර තිබී ඇති අතර, තමන් සේවය කරන ජනතාවට ඔහු නායකත්වය ලබාදී තිබේ. ඔවුන් තමන් දෙස බලන ආකාරයෙන් ඔහු පීඩාවට පත් වී සිටියේ ය. තමන්ට භාර වූ මුස්ලිම් කොට්ඨාසවල ජනතාව සමගින් තමන් ඇතිකරගත් දීර්ඝ කාලීන සහ සමීප සබඳතා පිළිබඳව ඔහු කථා කළේ ය. ඔහු මෙම ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ වූවේ ය යන චෝදනාව ප්‍රසිද්ධ වූ විට අකුරණ මුල්ගම කරගත් ලොව වටා පදිංචි අයගෙන් ඔහුට ඇමතුම් ලැබී තිබේ.

ඔහු මුස්ලිම් විරෝධී වෘත්තාන්තය මගින් දැඩි ලෙස බලපෑමට ලක් වී සිටින බව ද පැහැදිලිව පෙනෙන්නට තිබුණේ ය. මුස්ලිම් කතුන් අඳින කළු ඇඳුම් සහ මුහුණු ආවරණය ප්‍රදේශයේ සිංහල ජනතාවගේ දැඩි අප්‍රසාදයට පත් වී ඇති බව ඔහු අපගේ එක් පර්යේෂකයකුට පවසා තිබේ. අන්තර් පුද්ගල සබඳතා මෑතකාලීනව දුර්වල වී ඇතිවාක් පමණක් නොව, ඇතැම් මුස්ලිම් පුද්ගලයින්ගේ හැසිරීම සම්බන්ධයෙන් සැලකිලිමත්වියයුතු දෑ වැඩිවී ඇති බව ද ඔහු පැවසීය. අකුරණ ජිහාඩ් කණ්ඩායමක් නිර්මාණය වී ම පිළිබඳව ඔහුට ඒත්තු ගොස් තිබුණි. මුස්ලිම් කඩවලට පහර දුන් සිංහල පුද්ගලයින් කවුදැයි තමන් නොදන්නා බව ඔහු උදක්ම ප්‍රකාශ කර සිටියේ ය. එහෙත්, ප්‍රහාරවලට ප්‍රතිරෝධය පෑ මුස්ලිම් පුද්ගලයින් කවුදැයි ඔහු දැක ඇති අතර, තමන් දන්නා අයෙක් 'බසාර් එකේ'තිබූ සිංහල කඩයකට පෙට්‍රල් බෝම්බයක් වීසි කරනු ද දැක තිබේ. ඔහු පැවසුයේ පහරදුන් සිංහල පුද්ගලයින් පිටස්තර අය බවත්, ඔවුන් මුහුණු ආවරණය කරගෙන සිටි බවත් ය. (එසේනමුත්, අටේ කණුවේ මුස්ලිම් ජනතාව තරයේ කියා සිටියේ ප්‍රහාරය සිදුකළේ කොනකලගල තමන් දන්නා අය විසින් බවයි.)ආරච්චි විසින් ෆායිස් යන නමින් හැඳින්වූ පුද්ගලයෙක් අකුරණ ප්‍රදේශයේ 'ජිහාඩ්' එකක් සංවිධානය කරන බව ආරච්චි විශ්වාස කළේ ය. අටේ කණුව ප්‍රදේශයේ සිදු වූ සිද්ධීන් පිළිබඳ ලතවෙමින් ඔහු එක් අවස්ථාවක දී 'අපරාදේ' යනුවෙන් කීවේය: 'එයාලට ඕනැ නම් ෆායිස්ට විතරක් ගහන්න තිබ්බා. අනික් අයට ගහන්නෙ නැතිව'.

ආරච්චි සහ කොනකලගල පන්සලේ භික්ෂුන්වහන්සේ සම්බන්ධ සිදුවීම් වලින් පෙන්නුම් කෙරෙන්නේ මුස්ලිම් බහුතරයක් සහිත මෙම නගරයේ පදිංචිකරුවන් සහ ඔවුන්ගේ සිංහල පරිපාලකයින් හා සංවාදකයින් අතර සබඳතාවයට මෙම ප්‍රචණ්ඩත්වය කුමන අන්දමින් බලපා ඇත් ද යන්න සහ එම සබඳතා කෙතරම් පීඩනයට ලක්ව ඇත් ද යන්නයි. මෙය, ප්‍රචණ්ඩත්වය සීමා කිරීම සඳහා මැදිහත්වීමට ප්‍රජා නායකයින් අසමත් වූ සහ, ඒ හේතුවෙන් ජනතාවට මුහුණ දෙන්නට වූ ප්‍රචණ්ඩත්වය නිසා ඔවුන් එම ප්‍රජාවතුළලබා තිබූ තත්වය පහත වැටීමක් සිදුවූ අවස්ථාවකි. තවද, අටේ කණුවේ පදිංචි මුස්ලිම් ජනතාවට ආරච්චි එයට සහාය ලබාදුන් තැනැත්තකු වශයෙන් දැකීම හැර වෙනයමක් කළ නොහැකි විය.

සෑහෙන මට්ටමකට සමෘද්ධිමත් මුස්ලිම් ගම්මානයත් පන්සලත් අතරේ සමීප සබඳතාවයක් තිබුණි. කලබල උච්ඡතම අවස්ථාවේ දී භික්ෂුන් වහන්සේ මන්සූර් මහතාගේ නිවසට පැමිණ ඇති අතර, ජාතීන් අතර මනා සබඳතා පැවතීම පිළිබඳ හොඳම උදහරණයක් වශයෙන් උන්වහන්සේ ආඩම්බරයෙන් සඳහන් කළ මෙම ප්‍රදේශයෙහි මෙලෙසින් ප්‍රචණ්ඩත්වය ඇතිවීම පිළිබඳව උන්වහන්සේ කනස්සල්ලට පත්ව සිටියහ. අකුරණ ප්‍රදේශයේ ඒ වනවිටත් මනා සම්බන්ධතා පැවති හෙයින් ප්‍රතිසන්ධාන ප්‍රයත්නයන් සඳහා අවශ්‍යතාවයක් නොමැති බව භික්ෂුන් වහන්සේ විසින් පවසා තිබුණේ ඊට මාස කිහිපයකට පෙරයි.[49] වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ පොදු අවකාශය පුරා හාත්පස පැතිරී ඇති බවක් පෙනෙන සිංහල අධිපතිවාදී, මුස්ලිම්-විරෝධී මතවාදයට මෙම භික්ෂුව සහ ආරච්චි යන දෙදෙනාම පූර්ණ වශයෙන් සහයෝගය ලබාදෙන බවක් පෙනුනි. එහෙත් ඒ දෙදෙනාගෙන් එක් අයෙක් හෝ මෙම ප්‍රහාරවලට සම්බන්ධ නොමැති බව ද පැහැදිලිව පෙනුණි. ප්‍රචණ්ඩත්වයෙන් පසුව, මෙම සිංහල පුද්ගලයින් දෙදෙනාට ම ප්‍රජාව තුළ තමන්ට අත්වී තිබූ තත්වයට ආමන්ත්‍රණය කිරීමටත්, සිදුවූ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් තමන්ට තිබූ තත්වය සැලකිය යුතු මට්ටමකින් අහිමිවී ඇති බව පිළිගැනීමටත් සිදුවිය. කෙසේ නමුත්, ඔවුන් ප්‍රහාරවලට සහාය දුන්නේ යැයි මුස්ලිම් ප්‍රජාවේ සාමාජිකයින්ටඒත්තු ගැන්වී තිබූ අතර,ඔවුන් ප්‍රහාරවලට පහසුකම් සැලසුවේ යැයි කියා සිතීමට පවා මුස්ලිම් ප්‍රජාව පෙළඹී තිබුණි. ප්‍රහාරවලින් පසුව මුස්ලිම් පුද්ගලයින්ට තමන්ගේ සමීපතම සිංහල මිතුරන් හා අසල්වාසීන් පවා පෙනුණේ ප්‍රහාරයට සහායදුන් අය වශයෙන් වන අතර, ප්‍රහාරයට සහාය ලබාදුන් ජාතිවාදී සිංහල ජනතාව සහ ප්‍රහාරයට සහාය නොදුන් ජාතිවාදී සිංහල ජනතාව වෙන් කර හඳුනාගැනීමට ඔවුන්ට නොහැකි විය. කොනකලගල සිදුවීමෙන් පෙන්නුම් කරන්නේ, අඹල සිදුවීමේ දී මෙන්ම ප්‍රජාවේ සාමාජිකයින්ට තවදුරටත් මෙවැනි ප්‍රචණ්ඩත්වයන් අඩුකරගැනීමේ හැකියාවක් නොමැති බවකි.කුමාරසිංහගේ ගමේ භික්ෂුන් වහන්සේට එම ගමේ ප්‍රචණ්ඩත්වය වළක්වාගත හැකි වුවත් ප්‍රචණ්ඩත්වය පුළුල්ව පැතිරයාම වලක්වාගත නොහැකි විය. කොනකලගල ඇති වූ ප්‍රචණ්ඩත්වය වළක්වාගත නොහැකි විය. ප්‍රචණ්ඩත්වය වළක්වා ගැනීම සඳහා භික්ෂුන් වහන්සේට සහ ආරච්චිට කලින් තිබූ බලය දැන් අහිමි වී ගොස් තිබෙනවා

[49]භික්ෂුන් වහන්සේ අපට ලබාදුන් පුවත්පත් ලිපියක මේ බව සඳහන්ව තිබුණි.

විය හැකිය. මුලින් ම බොදු බල සේනා සංවිධානය විසින් ප්‍රචලිත කළ, එහෙත් දැන් සියලුම මාධ්‍ය ඔස්සේ පහසුවෙන්ම ළඟා වියහැකි මුස්ලිම් විරෝධී මතවාදයට සිංහල ජනතාව ඒකරාශී කරගැනීම පුළුල්ව සිදුවන බව ද මෙම උදාහරණයෙන් පෙන්නුම් කරයි. කෙසේ නමුත්, එමගින් ප්‍රචණ්ඩත්වය පහසුවෙන් සාධාරණීකරණය කළහැකි බවක් පෙන්නුම් නොකරයි. සිංහල සහ මුස්ලිම් ප්‍රජාවන්ට එකිනෙකා සමගින් සම්බන්ධ විය හැකි විකල්ප වෘතාන්තයක්ඉදිරිපත් කළ හැකි, ජාතිවාදයට විරුද්ධ වාගාලංකාරයක් සිංහල මාධ්‍ය තුළ නොමැතිවීම කණගාටුදයක ය. 2019 වර්ෂයේ පාස්කු බෝම්බ ප්‍රහාරවලින් පසුව, එවැනි සාධනීය භාෂාවක් කරා යොමුවන මංපෙතක් නුදුරේ දීනිර්මාණය වනු ඇත්දයන්න අපැහැදිලි ය.

# 4 වැනි පරිච්ඡේදය

# ප්‍රතිවිපාක පිළිබඳ සටහන්

## වරදකරුවන් විසින් ප්‍රචණ්ඩත්වය විස්තර කළ අන්දම

වරදකරුවන්ගේ දෘෂ්ටිකෝණය පූර්ණවශයෙන් ග්‍රහණය කරගැනීමට අපිට නොහැකි විය. ඊට හේතු ගණනාවකි. අපගේ පර්යේෂකයින් කණ්ඩායම පීඩාවට පත් පුද්ගලයින් කරා ප්‍රවේශවීමට යොදගත්තේ ක්ෂේත්‍රයේ තමන් දන්නා හඳුනනමුස්ලිම්පුද්ගලයින් වේ. ප්‍රදේශයේ සිංහල ප්‍රජාව සමගින් අපට තිබූ සබඳතා එතරම් ශක්තිමත් නොවීය. සිරභාරයේ සිටින අය වෙත මහේස්ත්‍රාත්වරුන් හරහා ප්‍රවේශවී, පසුවිපරම් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගෙන් ලැබුණු හෝඩුවාවන් ඇතුළු පසුවිපරම් කළයුතු කරුණු කිහිපයක් ම තිබුණි. එය දුෂ්කර කටයුත්තක් විය. සිංහල ප්‍රජාවෙහිදැන හඳුනන පුද්ගලයින් ඔස්සේ අපි තොරතුරු සොයාගැනීමට උත්සාහකළත් අප සමග කථා කිරීමට පොරොන්දු වූ ඇතැම් අය අවසානයේ නොපැමිණියහ. එක් අවස්ථාවක දී අප හඳුනන මුස්ලිම් පුද්ගලයෙක් එක් රැයක් පොලිස් අත් අඩංගුවේ සිටි වරදකරුවෙකු ලෙස දන්නා පුද්ගලයෙකු හඳුනාගැනීමට අපට උදව්කළේය. මෙම පුද්ගලයා පළාත්පාලන ආයතනයකට අලුතින් මැතිවරණයෙන් තේරී පත් වූ අයෙකු ද විය. අප සමග කථා කිරීමට ඔහුව පොළඹවන ලද්දේ ඔහුගේ මුස්ලිම් අසල්වැසියායි. තමන් දන්නා හඳුනන මුස්ලිම් පුද්ගලයානිසා අප හා කථා කරන්නට ඔහු එකඟ වුවත්, තමන් මෑතකදී තේරී පත් වූ සභිකයෙකු බැවින් ඔහු අදහස් පළකිරීමෙන් වැළකී සිටි අතර, තමා අත් අඩංගුවට පත්වීම සම්බන්ධයෙන් සඳහනක් නොකළේ ය.

දරන ලද ප්‍රයත්න අතරින් එකක් සාර්ථක වූ අතර, ඒ අනුව ප්‍රචණ්ඩත්වය ඇති වූ දිනයේ දිගන ප්‍රදේශයෙස් සිටි 26 හැවිරිදි පිරිමි පුද්ගලයෙකු සමග සම්මුඛ සාකච්ඡාවක් පවත්වන්නට අපට හැකි විය. මුස්ලිම් පුද්ගලයින් විසින් බෞද්ධයෙකුට එරෙහිව එල්ල කළ ප්‍රහාරයකටවිරෝධය පෑම සඳහා සම්බන්ධ වන්නැයි පවසමින් අන්තර්ජාලය හරහා කළ කැඳවීමකට ඔහු ප්‍රතිචාර දක්වා තිබේ. අප කණ්ඩායමේ සාමාජිකයකු වූ ආචාර්ය විජය ජයතිලක විසින් සම්මුඛ සාකච්ඡාවට ලක් කරන ලද මෙම පුද්ගලයා පැවසූ ඇතැම් කරුණු දිගන දී සිදුවූයේ කුමක්ද, සමාජ මාධ්‍ය ඔස්සේ පුද්ගලයින්ව ඒකරාශී කර ප්‍රචණ්ඩත්වය කර මෙහෙයවන ලද ආකාරය කෙබඳු ද, සහ මුස්ලිම් ජනතාව සම්බන්ධයෙන් විවිධ මත නිර්මාණය කර ඒවා සමාජ මාධ්‍ය ඔස්සේ නැවත නැවතත් ප්‍රචාරණය කළආකාරය කවරේද යනාදිය පිළිබඳව අවබෝධ කරගැනීම සඳහා වැදගත්වන බව අපට පෙනී ගියේ ය.

දිගන තමන්ගේ ගම් පළාත වුවත් තමන් දැනට කටුනායක නිදහස් වෙළඳ කළාපයේ විවිධ රැකියා කරන කොන්ත්‍රාත් සේවකයෙක් බවත්, විවාහ වී දරුවෙකු සිටින බවත් එම තරුණයා පැවසී ය. ප්‍රචණ්ඩත්වය ඇති වූ දිනයේ දිගන දී පවත්වනු ලබන 'විරෝධතා පා ගමනක්' පිළිබඳව ඔහුට දැනගන්නට ලැබී තිබේ. පහත දැක්වෙන්නේ ඔහු කළ ප්‍රකාශවල අනුවාදයකි.

> 'දිගන පුද්ගලයෙක් මරා දමන වීඩියෝ එකක් මම දැක්කා. මියගිය පුද්ගලයා සිංහල, ඔහුව මරා දපු අය මුස්ලිම්. ඒ මනුස්සයා අයි.සී.යූ. එකේ ඉන්න දර්ශන දලා තිබ්බා. මේවා තිබුණේ අන්තර්ජාලයේ. මගේ දුරකථනයට ඒවා ලැබුණා. එදෑ විරෝධතා පා ගමනක් යනවා කියලා මට දැනුම් දුන්නා. මම උදෙන්ම එතනට ගියා.'

සමාජ මාධ්‍ය ඔස්සේ තමන්ට ලැබුණු සන්නිවේදනයකට අනුව තමන් එදින දිගනට පැමිණි බව එම පුද්ගලයා තහවුරු කළේ ය. තවත් පුද්ගලයින් පිරිසක් සමගින් ඔහු එම ස්ථානයේ රැස් වී සිට ඇති අතර පැය කිහිපයක් යනතෙක් ඔවුන් එම ප්‍රදේශයේ රැඳී සිට තිබේ. තවත් මූලාශ්‍රයකින් අපට දැනගන්නට ලැබුණු අන්දමට දිගන ප්‍රදේශයට රැස්වන මෙන් සමාජ මාධ්‍ය ඔස්සේ කැඳවීමක් කර තිබූ අතර ඒ අනුව විරෝධතාකරුවන් 3,000ක් පමණ එහි රැස් වී තිබේ. මෙම සංඛ්‍යා නිවැරදි දැයි පැහැදිලි නොමැති නමුත් පැහැදිලිවන එකම කරුණ නම් දිගන ප්‍රදේශයේ සිදුවූ පුද්ගලයින් ඒකරාශී කර මෙහෙයවීම සඳහා බොහෝදුරකට සමාජ මාධ්‍ය උපකාරී වූ බවකි. ඇසින් දුටු තවත් අය පැවසූ විස්තර අනුව, එක් රැස් වූ පිරිස එතරම් සංවිධානාත්මක බවක් පෙනෙන්නට තිබී නොමැති අතර, බොහෝ දෙනා හෙල්මට් පැළඳ හෝ මුහුණ ආවරණය කරගෙන සිට තිබේ.

ඔහු තවදුරටත් මෙසේ පැවසී ය:

> 'මම උදේම එයට සහභාගී වෙන්න ගියා. බොහෝ දෙනා මුහුණු වැහෙන්න මුහුණු ආවරණ දාගෙන හිටියා. මාත් එහෙම කළා. සමහර අය ගොඩනැගිලි ඉදිරිපිට තිබුණු සීසීටීවී කැමරා කඩා බිඳ දැම්මා. පා ගමනත් මහ හඬින් සිදුකළ විරෝධතා ඝෝෂාවත් පැය පහක් විතර තිබ්බා. පොලීසියෙන් හිටියේ නැහැ. ඊට පස්සේ මට තේරුම් යන්න පටන් ගත්තා මෙතන මොකක් හරි වරදක් තියෙනවා කියලා. මේක ඉබේම ඇතිවූ දෙයක් නොවේ, කවුරුහරි හිතාමතා ම සංවිධානය කළ දෙයක් කියලා මට සැක හිතුනා. සාමාන්‍යයෙන් මේ වගේ දෙවල් වෙනකොට වැඩි වෙලා යන්න කලින් පොලිසිය එතැනට එනවා. මම එයින් අයින්වෙන්න තීරණය කළා. මගේ යාලුවෝ කිව්වා එයාලට එකතු වෙන්න කියලා, එත්, මම ඉවත් වෙන්න තීරණය කළා.'

තමන් දිගන දී දුටු හා සහභාගි වූ ප්‍රචණ්ඩත්වය වැනි තත්වයන් ඇතිවීමට මග පාදමින් රට තුළ යහපත් සබඳතා බිඳ වැටීම සම්බන්ධයෙන් ඔහුගේ විශ්ලේෂණය තරුණයා අප වෙත ලබාදුන්නේ ය.

> මිනිස්සුන්ට සාමයෙන් ජීවත් වෙන්නයි ඕනැ. අපේ පැවැත්මට මේ සහයෝගීතාවය අත්‍යාවශ්‍යයි. අපි ඉන්නේ මිශ්‍ර ප්‍රදේශයක, අපි එකිනෙකාට උදව් කරගන්නවා. අපේ පැත්තේ අපි එකිනෙකාට බැනවදින්න, අපහාස කරන්න ගහන්න යන්නේ නෑ. වෛරයත් කෝපයත් අවුස්සන්නේ ආණ්ඩුවයි, ඒකාබද්ධ විපක්ෂයයි, බොදු බල සේනාවයි, ජාතික හෙළ උරුමයයි, බාහිර කණ්ඩායමුයි. මේ අයට නියෝජිතයෝ ඉන්නවා - ඒ තමයි එයාලගෙන් මුදල් අරන් ජීවත් වෙන අය. සමහර අයට වැටුප් ලැබෙනවා. ලොකු මුදලක් ලැබෙනවා - ඉඩම් වාහන අරන් ඒ අය හොඳින් ඉන්නවා, ඒ නිසා ඒ අය තමන්ගේ සැපපහසු ජීවිත පවත්වාගන්න උදව් කරන මේ පක්ෂවලට ණයගැතියි '

අනෙකුත් සියල්ල අතරතුර, මෙවැනි 'කෝලාහල' අවස්ථාවල පුද්ගලයින් වරදකරුවන්ගේ භූමිකා තුළට සිරකිරීමට අනුග්‍රාහක දේශපාලනය කටයුතු කරන අන්දම මේ තරුණයා විසින් සඳහන් කිරීම වැදගත් වේ. මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් කථා කරන, වර්තමානයේ කුප්‍රකට ඇතැම් පරමාදර්ශී කථිකයින් සහ 'විසඳුම්කරුවන්' ගන්නා ස්ථාවරයේ කොටසක් වන යමක් ඔහු තවදුරටත් සඳහන් කළේ ය. එනම්, දේශපාලනය සම්බන්ධයෙන් තමන් සිටි මුලාවෙන් දැන් මිදී සිටින බවක් ඔහු පැවසුවේ ය:

> 'ගම් මට්ටමෙන් මම හැම දේශපාලන පක්ෂයක් එක්ක ම වැඩ කරලා තියෙනවා. ප්‍රාදේශීය සංවිධායකවරු, දිස්ත්‍රික් සංවිධායකවරු, ඒවගේ ම ජාතික මට්ටමේ නායකයො එක්කත් මම වැඩ කරලා තියෙනවා- ඒ සමහර අය නිතරම රූපවාහිනියෙ පෙනී සිටිමින් තමන් ඇත්තටම සිංහල මිනිස්සු ගැන සැලකිලිමත් කියන විශ්වාසයක ඉන්නවා. ඒත් ඒ හැම කෙනාම වැඩ කරගන්නේ තමන්ගේ යහපතට. එයාලාට ධනය එක් රැස්කරගෙන වැඩියෙන් මුදල් උපයාගන්න. ඒ සියළුදෙනා එක්ක ආශ්‍රය කරලා මම ඒ අයව අතෑරලා තියෙන්නෙ. ඒත් 'සිංහල මිනිස්සුන්ට' මොනවහරි අර්බුදයක් හරි තර්ජනයක් හරි එනවා නම් මම ඒ 'කැඳවීමට' පිළිතුරු දෙනවා.'

සිංහලේ සහ මහසෝන් බලකාය යන කණ්ඩායම් වෙනුවෙන් ප්‍රසිද්ධියේ පෙනී සිටින ඩෑන් ප්‍රියසාද් සහ අමිත් වීරසිංහ යන දෙදෙනාම සම්මුඛ සාකච්ඡාවලදී පවසා ඇති කරුණක් වන්නේ, තමන් 'දේශපාලනය' සම්බන්ධයෙන් උනන්දුවක් නැති බවයි. දෙදෙනාම තරයේ කියා සිටින්නේ ඔවුන්ගේ ක්‍රියාකාරකම් කිසිම ආකාරයකින් 'දේශපාලනික' යැයි නොදැකිය යුතු බවයි.[50]ඔවුහු, 'ඔවුන්ගේ ජනතාව' මුහුණ දී සිටින ප්‍රශ්න දෙස බැලීමට 'අලුත්' ක්‍රම සොයාගැනීමටත්, එම ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමටත් කැප වී සිටිති. එහි ඇති 'අළුත්බව' හේතුවෙන් ඒ වෙත නැමුණු බවක් පෙනෙන තරුණ පිරිස් වෙත ඔවුන්ගේ ව්‍යාපෘතිය යොමුවී ඇත. අමිත් වීරසිංහගේ සංවිධානයට තෝරාගෙන ඇති නම සම්බන්ධයෙන් ද සමාජමාධ්‍ය තුළබොහෝ අදහස් පළ වී තිබුණි. මහසෝන් බලකාය, එනම් මහසෝනා නැමැති යකාගේ බලකාය යන නම ඊට යොදා ඇති අතර,බුදු බණට හීලෑ වුණු යක්කු වශයෙන්ඔවුන් තමන් හඳුන්වාගැනීම ප්‍රශංසාවට භාජනය වී තිබේ.එය, යක්ෂයින්ගේ පුරුද්ද යැයි

[50] අප මෙම තොරතුරු සහ අවබෝධය ලබාගත්තේ මහනුවර ප්‍රචණ්ඩත්වයෙන් පසුව අමිත් වීරසිංහ සහ ඩෑන් ප්‍රියසාද් යන දෙදෙනා සම්මුඛසාකච්ඡාවට ලක් කළ ඉරෝම් පෙරේරා විසින් බෙදාහදාගත් තොරතුරු මත ය.

පැවසෙන ප්‍රචණ්ඩ ක්‍රියාදමයකට ඇති අවකාශය සහ පෙර නොවූ විරූ ආකාරයක ප්‍රතිචාරයක් දැක්වීමක් සම්බන්ධයෙන් එක්තරා ආකාරයකට පවසන්නාක් මෙන් පෙනීයයි.

**සමාජ මාධ්‍යවල වැදගත්කම**

2020 මැයි 13වැනි දින බ්ලූම්බර්ග් නිව්ස් නැමති ජාත්‍යන්තර පුවත් ආයතනය 'ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ඉටු කළ භූමිකාව පිළිබඳව ෆේස්බුක් සමාගම සමාව ඉල්ලාසිටියි' යන පුවත පළ කළේ ය. 2018 මාර්තු 7වැනි දින ප්‍රචණ්ඩත්වය පාලනය කරගත නොහැකි වෙමින් පවතින බවක් පෙනී ගිය විට ඒ සම්බන්ධයෙන් අතිරේක ක්‍රියාමාර්ග ගන්නා ලදී. අදාළප්‍රදේශයට අතිරේක ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් යවන අතරෙහි ම රජය මුලින් ම අන්තර්ජාල වේගය අඩු කිරීමටත් ඉන් පසුව ඇතැම් සමාජ මාධ්‍ය වේදිකා අවහිර කිරීමටත් කටයුතු කරන ලදී. ප්‍රචණ්ඩත්වය අවුළුවාලීමට දරන ප්‍රයත්න වලින් සමාජ මාධ්‍ය පිරී තිබූ බව මාර්තු 6වැනිදා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මගින් වාර්තා කර තිබුණි.

එම ප්‍රකාශයේ මෙසේ සඳහන් විය:

> 'මුස්ලිම් ප්‍රජාවට එරෙහිව ප්‍රචණ්ඩත්වයට පොළඹවාලන ආකාරයේ වීඩියෝ පට ශීඝ්‍රයෙන් සංසරණයවීම හේතුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දැඩි සේ කනස්සල්ලට පත්ව සිටියි. බෞද්ධ භික්ෂුවක් යැයි කියා ගන්නා පුද්ගලයෙකුගේ වීඩියෝවක් ද ඇතුළුව එවැනි වීඩියෝ පට කිහිපයක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සතු ය. වීඩියෝපටයේ සිටින පුද්ගලයා ව්‍යාජ බව පැහැදිලිවම පෙන්නුම් කළහැකි දෑ සත්‍ය කරුණු මෙන් හුවා දක්වමින් මුස්ලිම් ප්‍රජාවට එරෙහි ප්‍රචණ්ඩත්වය සඳහා පොළඹවාලන අතර බෞද්ධ ජනතාවට වඩා මුස්ලිම් ජනතාවට පක්ෂපාතීව කටයුතු කරන්නේ යැයි සංඝනායක හිමිවරුන්ට චෝදනා කරයි.'[51]

ශ්‍රී ලංකාවේ මුස්ලිම් විරෝධී ව්‍යාපාරය විසින් ඉතා සාර්ථක ලෙස සමාජ මාධ්‍ය භාවිතා කර තිබේ. 2012 වර්ෂයේදී එය ආරම්භ වූ තැන් පටන් ම විද්‍යුත් මාධ්‍ය සහ විශාල ජන රැලිවලදී භික්ෂූන් විසින් ගෙන ගිය වාගාලංකාරයට සමගාමීව ෆේස්බුක් මාධ්‍ය හරහා වෛරය පැතිරවීමත්, සම්බන්ධීකරණය කිරීමත්, එම කණ්ඩායම් ඉතා හොඳින් සිදුකර තිබේ.

බිම් මට්ටමේ අපගේ පර්යේෂණය සිදුකරගෙන යන අතරතුර සමාජ මාධ්‍ය පිළිබඳ ගැටළුව විවිධ ආකාර කිහිපයකින් ඉස්මතු වී ආවේ ය. මහසෝන් බලකායේ කැඳවුම්කරු වශයෙන් ක්‍රියාකරමින් අමිත් වීරසිංහ සුළුතර කණ්ඩායම්වල ආක්‍රමණය හමුවේ සිංහලයාට අත් වී ඇති ඉරණම පිළිබඳව ඔහුගේ වීඩියෝ පටවල 'සිංහල ව්‍යාපාරවලට අහිමිවී ගිය' ස්ථානයකට උදාහරණ වශයෙන් දිගන පිළිබඳව සඳහන් කිරීම සම්බන්ධයෙන් අප වෙත පවසන ලදී. අපට පැවසූ තවත් කරුණක් වූයේ, ඔහු අන්තර්ජාලයේ බොහෝ ප්‍රසිද්ධ වුවත් ප්‍රජාව තුළ බලපෑමක් කිරීමට ඔහුට වූ ඇති සැබෑ හැකියාව ඉතා අඩු බවකි. අපට සම්මුඛ සාකච්ඡාවට ලක් කරන්නට හැකි වූ එකම වරදකරු අපට පැවසූ අන්දමට ඔහු සමාජ මාධ්‍ය ඔස්සේ කළ කැඳවීමකට පිළිතුරු දෙමින් එයට පැමිණ ඇත. ඒ මුස්ලිම් තරුණයින් හතරදෙනෙකු සමගින් ඇතිවූ ගැටුමකින් පසු තෙල්දෙණියේ පදිංචි කුමාරසිංහගේ මරණය සිදුවීම පිළිබඳව කුපිතකරවනසුළු අන්දමෙන් වාර්තාකර තිබූ ආකාරය දැකීමෙන් පසුවයි. අපි සම්මුඛ සාකච්ඡාවට ලක් කළ පොලිස් නිලධාරීන් ද දැරූ මතය වූයේ ප්‍රචණ්ඩත්වය පැතිර යාම පාලනය සඳහා සමාජ මාධ්‍ය අවහිර කිරීම අත්‍යාවශ්‍ය වූ බවයි. කෙසේ වෙතත්, සිවිල් සමාජ කණ්ඩායම්වල මතය වූයේ සමාජ මාධ්‍ය අවහිර කිරීමෙන් ප්‍රකාශනයේ නිදහස උල්ලංඝනය වූ බවකි.

[51]මහනුවර ප්‍රචණ්ඩත්වයෙන් පසු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශය:https://www.cpalanka.org/cpa-callsauthorities-to-take-swift-action-to-prevent-further-violence-and-to-arrest-and-prosecute-individuals-advocatingnational-racial-and-religious-hatred/ ප්‍රවේශ වූ දිනය: 2020 අගෝස්තු 15

**සිංහල ගම්මානවල ප්‍රජාවගේ ප්‍රතිචාරය: බලගොල්ල බෞද්ධ මධ්‍යස්ථානයේ බලගොල්ල විහාරාභිවර්ධන සමිතියේ රැස්වීම**

ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලින් පසුව, එහි බලපෑමට ලක් වූ ප්‍රදේශවාසී මුස්ලිම් ජනතාවට ආධාර කිරීම සඳහා බලගොල්ල විහාරාභිවර්ධන සමිතිය සංවිධානය වී තිබේ. ප්‍රහාරවලින් පසුව ආ පළමු සිකුරාද දිනයේ, තමන්ගේ පල්ලිය පුළුස්සා දැමීමට ලක් වූ බලගොල්ල මුස්ලිම් ජනතාවට යාඥා කිරීම සඳහා ඒ ආසන්නයේ විවෘත ස්ථානයක් සංවිධානය කරදෙන ලදී. යාඥා කරන අවස්ථාවේ ප්‍රචණ්ඩත්වය ඇතිවේ යැයි බියෙන් යාඥා අවසන් වනතෙක් ප්‍රදේශවාසී ජනතාව හා භික්ෂූන් එම ස්ථානය අවට රැකවල් යොදා සිටියහ. සමාජයේ එම ක්‍රියා ප්‍රදේශවාසී මුස්ලිම් ජනතාවගේ දැඩි පැසසුමට ලක් විය. ප්‍රචණ්ඩත්වය සහ එහි විපාක සම්බන්ධයෙන් අප කණ්ඩායමේ සාමාජික ආචාර්ය විජය ජයතිලක සමගින් එම සමාජයේ සාමාජිකයින් කළ කථාබහ ඇසුරින් මෙම සටහන පිළියෙල කර ඇත.

එම සංවාද තුළ අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයක් ම තිබේ. පහත දැක්වෙන හේතු මත මුස්ලිම් ජනතාව කෙරෙහි සිංහල ජනතාව තුළ ඇති විද්විෂවාදිකම හේතුවෙන් ප්‍රචණ්ඩත්වය ඇතිවූ බවක් පවසන ලදී:

1. මින් පෙර, මුස්ලිම් ජනතාව මිශ්‍ර පාසල්වල අධ්‍යාපනය ලබා තිබේ. මාවනැල්ලේ එක්තරා පාසලක වඩාත්ම සාර්ථකව ක්‍රීඩා කටයුතුවල නියැලුනේ මුස්ලිම් සිසුන් බව එහිදී පැවසුණි. දැන් එය එසේ නොවේ. ඔවුන් දැන් යන්නේ මුස්ලිම් පාසල්වලට වන අතර සිංහල ප්‍රජාව සමගින් ඇති සම්බන්ධතාවය නැති වී ගොස් තිබේ. අලුත් පරම්පරාව අඳින්නේ පළඳින්නේ ඉස්ලාම් අන්තවාදීන් අඳින පළඳින අන්දමට වන අතර එය සිංහල ජනතාවගේ සිත් කනස්සල්ලට පත් කරයි. 'බුර්කාව' මෑතකදී ආ දෙයක් වශයෙන් සඳහන් කරන ලදී. සාකච්ඡාවේදී පවසන ලද තවත් දෙයක් වූයේ දේශපාලනඥයින් තමන්ගේ යහපත තකා ජනතාව ඉත්තන් මෙන් පාවිච්චි කිරීම හේතුවෙන් මෙය සිදුවන බවයි.

2. තැන්නෙකුඹුර, මැදවල සහ අකුරණ යන මුස්ලිම් බහුතරයක් සහිත නගරවල අලුත් පරම්පරාවේ මුස්ලිම්වරුන්ගේ 'අනුචිත හැසිරීම' ප්‍රචණ්ඩත්වය ඇතිවීමට හේතු වූ බව ද පවසන ලදී. එම ප්‍රදේශවල මුස්ලිම් ජනතාවට මාර්ග නීති පිළිබඳ කිසිම ගරුත්වයක් නොමැත, ඔවුහු මාර්ගය මධ්‍යයේ වාහන නවත්වති, එමෙන්ම මාර්ගය භාවිතා කරන්නට උත්සාහ කරන පුද්ගලයින්ට, විශේෂයෙන් ම සිංහල පුද්ගලයින්ට අවහිර කරති. ඔවුන්ට ඒ පිළිබඳ අප්‍රසාදයපළකළහොත් ඔවුන් ඉන් අමනාප වෙති. පොලීසිය මුස්ලිම් ජනතාව විසින් මෙසේ මාර්ග නීති කැඩීම නොදුටුවාක් මෙන් සිටින බව ද පවසන ලදී. මෙය බලාසිටින්නට සිදුවීම සිංහලයින්ව කුපිත කරවන්නක් වී තිබේ.

3. මුස්ලිම් සිසුන් ජාත්‍යන්තර පාසල්වලට යන බවත්, මුස්ලිම් අයගේ උසස් භාෂා දැනුම නිසා අනාගතයේ දී සිංහල ජනතාවට රැකියා වෙළඳපොළ වෙත ඇති ප්‍රවේශය තර්ජනයකට ලක් වනු ඇතැයි බියක් පවතින බවද සඳහන් කරන ලදී.

4. මුස්ලිම් පල්ලිවල අන්තවාදය දේශනා කරන බවට සාක්ෂි ඇති බවත්, ගලේවෙල පවුලක් ඉස්ලාමික් ස්ටේට් සංවිධානයට එක්වීම සඳහා සිරියාවට යාමක් පිළිබඳ වාර්තා වී තිබීම ඊට සාක්ෂි දරන බවත් සඳහන් කරන ලදී.

තෙල්දෙණියේ සිංහල පුද්ගලයෙකුට අයත්ඉන්ධන පිරවුම්හලක දී සිදුවූ සිද්ධිය සම්බන්ධයෙන් පළකරන ලද විමතිය සහ කණගාටුව ද ඉහත සාකච්ඡාවට ඇතුළත් විය. තරුණයින් අතරේ ඇති වූ ප්‍රචණ්ඩත්වයට පුද්ගලයෙකු මරාදමන තැනකට මගපෑදිය හැකි වීම පිළිබඳව කණ්ඩායම විමතිය මුසු වේදනාවක් පළකළහ. කුමාරසිංහ හඳුනන තවත් පුද්ගලයින් අටදෙනෙක් එහි සිටිය ද, කිසිවෙකු ඊට මැදිහත් නොවීම පිළිබඳව ද සඳහන් කරන ලදී. ප්‍රචණ්ඩත්වය පිළිබඳව සහ පහරදීම් ඇතිවූයේ ඇයිද යන්න පිළිබඳව සාකච්ඡා කිරීමේදී, ඉහත අන්දමින් ප්‍රජාවට එරෙහි ප්‍රචණ්ඩත්වය විස්තර කරන්නට වන තරමට ම සම්බන්ධතා පිරිහී ගියේ කෙසේද යන්න පිළිබඳව කිසිවක් සඳහන් නොවුණි. මුස්ලිම් ජනතාව තමන්ගේ ගමේදී පෙන්වූ අයෝග්‍ය හැසිරීම් වලට හා උඩඟුභාවයට පිළිතුරු වශයෙන් ප්‍රජාවේ සාමාජිකයින් තුළින් ප්‍රචණ්ඩ ප්‍රජා ප්‍රතිචාරයක් ලබාදීම සුදුසු ද යන කරුණ ඉස්මතු නොවුණි.

අඹල සිල්ලර කඩයකට පහර දුන් (එම්.කේ.එම්. ග්‍රොසරි - 3වැනි ද රාත්‍රියේ ප්‍රහාරයට ලක් විය) 'නැගෙනහිර පළාතෙන් පැමිණි භික්ෂුවක්' ප්‍රචණ්ඩත්වයට හේතු වූ බව ද ඔවුහු පැවසූහ.

ගෝනවල, දිගන, සහ ඉන් පසුව බලගොල්ල යන ප්‍රදේශවල මාර්තු 5වැනිද ඇති වූ ප්‍රහාර සිදුවූයේ කුමාරසිංහ ගේ මළසිරුර දිගනට ගෙනැවිත් ප්‍රසිද්ධියේ ශෝකප්‍රකාශ කරන්නට ඔවුන්ට අවසර නොලැබීම මත පිරිස් කුපිත වූ හෙයින් යැයි ඔවුහු සඳහන් කළහ. ප්‍රචණ්ඩත්වය පිළිබඳ සාකච්ඡා කරමින් ඔවුන් සඳහන් කළේ කිහිප දෙනෙක් දේශාභිමානී හැඟීම්වලින් පෙළඹී ක්‍රියා කළ ද, කෝලාහල අතරේ තමන්ගේ පෞද්ගලික නොමනාපකම් සහ විරුද්ධතා පිරිමසාගත් බොහෝදෙනෙක් ද සිටි බවයි.

මෙවැනි ප්‍රචණ්ඩත්වයකට මගපාදන ප්‍රජා ගැටුම් නිරාකරණය සඳහා මධ්‍යස්ථානයක් වශයෙන් ගමේ පන්සල යොදගත හැකි දැයි විමසූ විට පවසන ලද්දේ බොහෝ පන්සල් දැන් දේශපාලනීකරණය වී ඇති බවත් වෙනස් අදහස් ඇති අයට පන්සල සමගින් සම්බන්ධ වීමට දැන් නොහැකි හෝ ඔවුන් ඊට අකමැති තත්වයක් උදා වී ඇති බවත් ය. එබැවින්, එවැනි ගැටළු සාකච්ඡා කර විසඳගත හැකි කේන්ද්‍රස්ථානයක් වශයෙන් පන්සලට තවදුරටත් ක්‍රියා කළ නොහැකි ය. එමෙන්ම, මෙවැනි ස්වභාවයේ ක්‍රියා සඳහා ගම් මට්ටමින් පුළුල් සහයෝගයක් නොලැබීමට ඉඩ ඇති බව ද සඳහන් කරන ලදී (එහිදී ඔවුන් තමන් සිදුකළ කාර්යයන් පිළිබඳව කථා කළ අතර, මුල් අවස්ථාවේ දී එම ක්‍රියා සඳහා පුළුල් සහයෝගයක් ලැබී ඇතත් පසුව ගමෙන් ඊට සහභාගි වන පුද්ගල සංඛ්‍යාව කෙමෙන් අඩු වී තිබේ.)

මහසෝන් බලකාය වැනි කණ්ඩායම්වල ක්‍රියා සහ දිගන නගරය මුස්ලිම් ව්‍යාපාර විසින් ආක්‍රමණය කර ඇතැයි ඔවුන් විසින් පැවසීම මෙම කණ්ඩායමේ විවේචනයට ලක් විය. 'ප්‍රාග්ධනය එකතු කරගත්තොත් සිංහල මිනිස්සුන්ටත් ව්‍යාපාර පටන් ගන්න පුළුවන්' ඔවුහු පැවසූහ. රජයේ මාධ්‍ය හරහා බෞද්ධාගම සම්බන්ධයෙන් පමණක් අදහස් හා තොරතුරු ප්‍රචාරය කිරීමත්, අන් ආගම් පිළිබඳ කථා නොකිරීමත් මගින් සිදුවන්නේ අනෙකුත් ප්‍රජාවන්ට තමන් දුරස් කර ඇති බවක් හැඟීම යැයි ඔවුහු සාකච්ඡා කළහ. මාධ්‍ය හරහා සියලු දෙනා සියලු ආගම් පිළිබඳ දැනුවත් කළයුතු බව යෝජනා කරන ලදී. පන්සල මෙන් ම පල්ලිය ද ඕනෑම වේලාවක ඕනෑම අයෙකුටම අවශ්‍ය නම් ඇතුළුවිය හැකි විවෘත ස්ථානයක් වන්නේ නම් සහ ජනතාවට ඉස්ලාම් ආගම පිළිබඳ සහ පල්ලිවල සිදුවන්නේ කුමක්දැයි යන්න පිළිබඳ දැනුමක් ලබාදෙන්නේ නම්, සිංහල ජනතාව තුළ ඇති වැරදි අවබෝධ දුරැලීමට එය බෙහෙවින් උපකාරී වනු ඇතැයි යෝජනා විය.

බලගොල්ලේ කණ්ඩායම සිදුවීම් පිළිබඳව කළ විස්තරයේ සහ ප්‍රචණ්ඩත්වයට හේතු වශයෙන් ඔවුන් දැක්වූ කරුණුවල අපි සියුම් වෙනස්කම් දුටුවෙමු. අපගේ විමර්ශනය මුළුල්ලෙහි ම අපගේ අවධානයට ආ එක් කරුණක් නම්, ප්‍රචණ්ඩත්වය විවේචනය කළ සහ සිදුවීමෙන් පසුව ආධාර උපකාර ලබාදීමට සක්‍රීයව සම්බන්ධ වූ, ඉතාමත් සද්භාවයෙන් යුත් සිංහල කණ්ඩායම් පවා, එම ප්‍රදේශයේ සෑමතැනක ම සහ ජාතික මාධ්‍ය තුළ මුස්ලිම් ජනතාව සම්බන්ධයෙන් සංසරණය වන ජාතිවාදී කථා සමගින් එකඟවන හෝ අවිචාරවත් ලෙස පිළිගන්නා බව යි.

**සිදුවීමෙන් පසුව, පීඩාවට ලක් වූ ප්‍රජාවන්ගේ තත්වය: නොඉවසුම් තත්වයන් තවමත් පවතියි**

සිදුවීමෙන් මාස පහකට පසුව අප සිදුකළ අවසාන සංචාරයේ දී අප සම්මුඛසාකච්ඡාවට ලක් කළ මුස්ලිම් පුද්ගලයින් වඩාත් වැඩියෙන් බියපත් වී සිටින බවක් පෙනුණි. තමන්ගේ සිංහල අසල්වාසීන් සමගින් ඇති එකමුතුකම පිළිබඳව ආඩම්බරයෙන් සිටි තැන්නෙකුඹුරේ එක්තරා පුද්ගලයෙක්(ඔහු ප්‍රදේශවාසීන්ගේ සංගමයේ සභාපති හා එහි සිටින එකම මුස්ලිම් සාමාජිකයා විය) විශේෂයෙන්ම මේ පිළිබඳ සිතේ කනස්සල්ලෙන් පසු විය. ඔහු පැවසූ අන්දමට කලින් ඔහු ආශ්‍රය කළ කිසිවෙකු ප්‍රචණ්ඩත්වයෙන් පසුව ඔහුට කථා කර නැත. ඔහු මහනුවර දිස්ත්‍රික්කයේ කලක සිට ක්‍රියාකාරී රාජ්‍ය නොවන සංවිධාන සේවකයෙකි. මේ වනවිට වයසින් වැඩි තැනැත්තෙක් වන ඔහු, මුස්ලිම් ආගම ප්‍රගුණ කරන, ත්වාබය අඳින හා දිගු රැවුලක් සහිත තැනැත්තෙකි. ඇතැම් අවස්ථාවලදී බිය සහ ආතතිය හේතුවෙන් ඔහු තමන්ගේ ඇඳුම පවා වෙනස් කරගන්නට පෙළඹුනු බවත්, තම ත්වාබ් ඇඳුම කලිසමට යට කර තොප්පිය නොපැළඳීමට පෙළඹුනු බවත් ඔහු පැවසී ය. මෙය ජීවත්වීමට හොඳ විධියක් නොවන බව කීවේය. 'මම තම්බියෙක්, තම්බියෙක් වගේ ජීවත් වෙන්න බයක් තියෙනවා.'

ඇතැම් ස්ථානවල මුස්ලිම් ජනතාව, ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේදී ඉවසීමත් ප්‍රවේශමෙන් කටයුතු කිරීමත් දිගින් දිගටම කිරීමෙන් විඩාපත් ව සිටියහ. වර්තමානයේ ඔවුන් ජීවත්වන අන්දමට බියෙන් ජීවත්වනවාට වඩා සටන් කර මියයෑම සුදුසු යැයි ඔවුන්ට සිතී තිබේ. සිංහල බහුතර ගම්මානයට සිටින එකම මුස්ලිම් පවුල වූ එක් පවුලක අත්දැකීම් අප සමගින් බෙදාහදා ගන්නා ලදී. ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලින් මාස කිහිපයකට පසුව ඔවුන්ට එක්තරා ලියමනක් ලැබී තිබේ. අභ්‍යාස පොතකින් ඉරාගත් පිටුවක කහ පැහැ හයිලයිටර් පෑනකින් පහත දැක්වෙන වගන්තිය එහි ලියා තිබුණි:

> *තොපිලා ළමයි හදන එක නතරකරපල්ලා නැතිනම් තොපි සේරම හරක් කපනවා වාගේ කපනවා.*

එහි අනෙක් පස මෙසේ ලියා තිබුණි:

> *හම්බ කැරියෝ තොපි මරනවා පරයෝ. සිංහලේ අපි යක්කු.*

නොපමාව එම ගම්මානයෙන් පිටත් වී වඩාත් වැඩි මුස්ලිම් ජන පිරිසක් සිටින ගමක පදිංචියට යෑමට එම මුස්ලිම් පවුල එයින් පසු යොමු වී තිබේ (එම ප්‍රදේශය ද සිංහල මුස්ලිම් ආතතීන් බහුල ප්‍රදේශයකි).

මෙවැනි බොහෝ සිද්ධීන්හි දී මෙන් ම, ප්‍රජාවන් තුළනොඉවසුම් තත්වයන් වැඩිවීම සහ දයානුකම්පාව අඩුවීම සෑම තැනක ම එක ම ආකාරයෙන් සිදු නොවී ය. එක් අවස්ථාවක දී දිගන ප්‍රධාන මාර්ගයේ කුඩා සිල්ලර කඩයක් පවත්වාගෙන ගිය එක්තරා මුස්ලිම් පවුලක් අපට පැවසුවේ එක් පවුලක ස්වාමිපුරුෂයාට දියවැඩියාව ඇති බව දැනගෙන අසළ සිටින සිංහල වෛද්‍යවරයෙක් ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලින් පසුව එම නිවසට පැමිණ, ඔහුගේ තුවාලවලට බෙහෙත් දමා ඔහුට අවශ්‍ය ඖෂධ ලබාදුන් බවයි. සිදුවීමෙන් පසුව තම නිවස හැකි ආකාරයකින් යථා තත්වයට ගෙන ඒමට වෑයම් දරන අවස්ථාවේ දී තමන්ටත් පවුලේ අයටත් සැලකුවේ තම සිංහල මිතුරන් බව තවත් මුස්ලිම් පුරුෂයෙක් පැවසීය. කෙසේ නමුත් බහුතරයක් සිදුවීම්වලින් කියැවුනේ පීඩනයට ලක් වූ සිදුවීම් පිළිබඳව ය.

**ප්‍රචණ්ඩ ක්‍රියාවල සංවිධානාත්මක ස්වරූපය**

ප්‍රචණ්ඩත්වයේ සංවිධානාත්මක ස්වරූපය පෙන්නුම් කළ කරුණු අවධාරණය කිරීම වැදගත් යැයි අපට සිතේ. පිරිස් එක් රැස් කිරීමටත්, කුපිතකරවනසුළු තොරතුරු බෙදාහැරීමටත් සමාජ මාධ්‍ය යොදාගත් අන්දම මගින් පැහැදිලි වන්නේ ආතතීන් උත්සන්න කරවීමටත්, ප්‍රචණ්ඩත්වය ඇතිවිය හැකි තත්වයක් පවත්වාගෙන යාමටත් සැලසුම් තිබුණු බවකි. උදාහරණ වශයෙන් මාර්තු 6වැනි දින ප්‍රහාරවල අඩුවීමක් දක්නට ලැබුණත් මාර්තු 7 වැනි දින නැවතත් ප්‍රහාර සිදුවිය. පොලීසියේ අප හා කථා කළ එක් අයෙක් මෙම සිදුවීමට සමාජ මාධ්‍ය වගකිය යුතු යැයි සැලකී ය (අඹතැන්නේ පන්සලකට පහර දී ඇතැයි කටකථා පැතිරීම). සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කෙරුණු කටකථාවලට ප්‍රතිචාර වශයෙන් සෙනග ඒක රාශී වූ බව තහවුරු වේ. කෙසේ නමුත්, එම රැස්වූ පිරිස් අතර, සම්බන්ධීකරණය වූ ක්‍රමයකින් දේපළ විනාශ කරදැමීමේ කාර්යය භාර වූ යම් යම් කණ්ඩායම් ද සිට ඇති බවක් පෙනේ. උදාහරණ වශයෙන්, එඬරුතැන්න ගම්මානයට ඇතුළු වූ පිරිස ඉතාමත් අරමුණු සහගත අන්දමින් ගමට වැදී තිබේ. ඇසින් දුටු සාක්ෂිකරුවන් පවසන අන්දමට ඔවුන් ත්‍රිරෝද රථ දෙකකින් සහ එල්ෆ් වෑන් රථයකින් ගමට පැමිණ තිබේ. ඒ සියළුදෙනා එතරම් වයසක් නැති, මතින් මත් වූ සහ එක් අයෙකු සඳහන් කළ අන්දමට තමන්ට පැවරුණු කාර්යය ඉටුකිරීම සඳහා 'හොඳට ෆෝම් කරපු' පිරිසක් විය.එම තරුණ පිරිස පැමිණ ඇත්තේ තමන් එන බව ප්‍රදේශවාසීන්ට ඇඟවෙන සේ මහා ඝෝෂාවක් කරමිනි. ඉන්පසුව ඔවුන් ක්‍රමානුකූල අන්දමින් දේපළවලට හානි කරන්නට ගෙන තිබේ. ඇසින් දුටු සාක්ෂි අනුව, එක් කණ්ඩායමක් ජල හා විදුලි මීටර විනාශ කරගෙන යද්දී තවත් කණ්ඩායමක් ජනේලවල වීදුරු බිඳදමා තිබේ. තවත් කණ්ඩායමක් නිවෙස්තුළට කඩාවැදී ගෘහභාණ්ඩ විනාශ කර තිබේ. ඉතා කෙටි කාලයක් තුළ විශාල ප්‍රදේශයක් ආවරණය කර ඇති බැවින් සහ විශාල විනාශයක් සිදුකර ඇති බැවින් මෙම ප්‍රචණ්ඩත්වය මනාව සංවිධානය කරන ලද්දක් වශයෙන් මැද දුම්බර ප්‍රාදේශීය ලේකම්වරයා විසින් විස්තර කරන ලදී. අළුත්ගම සිද්ධිය ද මෙයට සමාන විය. ප්‍රහාර සම්බන්ධීකරණයකින් යුක්තව සිදුවී ඇති අතර කෙටි කාලයක් තුළ අවසන් වී තිබේ. අප කථා කළ එක් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙකු ප්‍රහාරයට ලක් වූ සම්පූර්ණ ප්‍රදේශය ම කුමාරසිංහ ගේ

අවමංගල්‍යය වෙනුවෙන් සරසා තිබුණු අන්දම විස්තර කළේ ය. කෙසේ නමුත්, ඔහුගේ ගමට යන පාර සහ ප්‍රධාන මාර්ගයෙන් ඔබ්බට වන්නට පිහිටා තිබූ ඔහුගේ නිවස සරසා තිබී නැත. මෙම සැරසිලිවලින් පෙන්නුම් කළේ ඒවායේ අරමුණ කුමාරසිංහගේ මරණය පිළිබඳ ශෝකය ප්‍රකාශ කිරීම නොව ජනවාර්ගික-ආගමික හැඟීම් අවුළුවා ප්‍රචණ්ඩත්වයට පෙළඹවීම බවයි.දිගන වෙළඳ පොළෙහි වෙළඳුන්ගෙන් ප්‍රහාර සම්බන්ධයෙන් අපට ලැබුණු විස්තරවල ද සඳහන් වූයේ සංවිධානය වූ කළහකාරීන් පිරිස් ප්‍රහාරය ගෙන ගිය බවත්, එක් එක් කණ්ඩායම්වලට වෙන වෙනම පවරා තිබූ කාර්යයන් වූ බවත් ය. සාක්ෂිකරුවන් පැවසූ අන්දමට, වෙළඳ පොළේදී ප්‍රහාරකයින් මුලින්ම සී.සී.ටී.වී. කැමරා ගලවා දමා ඉන් පසු තමන්ගේ අතේ වූ ආයුධ (සාමාන්‍යයෙන් ඒවා දිගු දඬු විය) භාවිතා කර වීදුරු - එනම් ජනේල සහ භාණ්ඩ ප්‍රදර්ශනය කර ඇති පෙට්ටි- කඩා දමා ඇති අතර තවත් කණ්ඩායමක් කඩවල ඇති භාණ්ඩ ඒකරාශී කර ගිනිතබා ඇත. අඹතැන්නේ, දිගන සහ රජවැල්ල යනාදී ස්ථාන කිහිපයක දී ම අපට අසන්නට ලැබුණු අන්දමට ප්‍රහාරවලට පෙරදිනයේ දන්නා හඳුනන අය විසින් ප්‍රචණ්ඩත්වය ඇති විය හැකි බවක් ඔවුන් වෙත අඟවා තිබේ.

**ප්‍රචණ්ඩත්වයේ ආර්ථික විද්‍යාව**

මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් වූ ජනතාවට ගෙවන ලද මුළු වන්දි මුදල රු. 19,000,000.00ක් විය. වඩාත් විශාල හිමිකම්පෑම් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමුකර තිබුණි. 2019 අගභාගයේ අපගේ පර්යේෂණය අවසන් කරන විට ඒවා ගෙවා නොතිබුණි. අළුත්ගම සිදුවීමේ දී හමුදාව පැමිණ හානිවූ ගොඩනැගිලි සියල්ලම නැවත ඉදි කළේ ය. මහනුවර නැවත ඉදිකිරීම් සිදුකරන බවට පොරොන්දු වුවත් රජය එය අවලංගු කළේ ය.[52]

ආණ්ඩුව මාරු වී ඇති බැවින්, ඉතිරි හිමිකම් පෑම් සඳහා ගෙවීම් සිදුකරනු ඇති දැයි නොපැහැදිලි ය. හානියේ පිරිවැය රජයේ තක්සේරුකරුවන් විසින් ලබාදුන් අගයන්ට වඩා බොහෝ ගුණයකින් වැඩි බව සිවිල් සමාජ තක්සේරුවලින් ගණනය කර තිබේ. 2018 ජූනි මාසයේ දී සුබයිර් විසින් ලියන ලද ලිපියට අනුව සිවිල් සමාජයේ ඇස්තමේන්තුව රුපියල් බිලියනයකට ආසන්න වුවත් රජයේ ඇස්තමේන්තුව වූයේ රුපියල් මිලියන 28කි. ව්‍යාපාර 71කට පහර දී හානිකරනු ලැබූ කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වැඩිම හානියක් සහිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වූ අතර එහි හානි ඇස්තමේන්තුව රු. 689,000,000 කි. අඹතැන්න ප්‍රදේශයේ විශාල ව්‍යාපාර දෙකක්, එනම් හාල් මෝලක් සහ ලී මෝලක් ප්‍රහාරයට ලක් වී තිබුණි. මෙම ව්‍යාපාර දෙක පමණක් රුපියල් මිලියන සියගණනක හානි ලබන්නට ඇතැයි ඇස්තමේන්තු කෙරී ඇත. එමෙන්ම, මෙය ද රට පුරා සිදුවූ ප්‍රහාරවල හඳුනාගත හැකි තවත් එක් ලක්ෂණයකි. (අළුත්ගම ද 100කට අධික පිරිසක් සේවයේ යොදවන විශාල ඇඟළුම් කම්හලක් විනාශ කරන ලදී). තව ද, තෙල්දෙණියේ අඹල ප්‍රදේශයේ තිබූ වූ විශාලතම සිල්ලර කඩය, එනම් එම ප්‍රදේශයේ ඇති කරන ලද මුල්ම ව්‍යාපාර අතරින් එකක් වූ සිල්ලර කඩය සම්පූර්ණයෙන් ම විනාශ කර එහි භාණ්ඩ ද කොල්ල කන ලදී.දිගන වෙළඳ පොළේ සිංහල කඩ ඉතුරු කර මුස්ලිම් කඩ කිහිපයක් ම විනාශ කර තිබේ. දිගන නගරය මුස්ලිම් ව්‍යාපාර විසින් ආක්‍රමණය කරන්නේ ය යනුවෙන් අමිත් වීරසිංහ ප්‍රචාරය කළ වීඩියෝපටය හේතුවෙන් මෙය සිදුවනවිට තමන් පුදුම නොවූ බව දිගන ව්‍යාපාරිකයෝ පැවසූහ. මේ සිදුවීම්වලින් පසුව පවා ප්‍රදේශයේ මුස්ලිම් කඩවලට නොයන මෙන් ප්‍රචාරක ව්‍යාපාර ගෙන ගොස් තිබේ. කලින් සඳහන් කළ පරිදිපුද්ගලයින්ට වන හානිය අවම කර දේපළ හානිය උපරිම කිරීමට සැලසුමක් තිබුණු බවක් පෙනෙන්නට තිබේ. එසේ ම, ප්‍රාදේශීය මට්ටමින් යම් යම් ව්‍යාපාරික එදිරිවාදිකම් ද තිබුණු බව පෙනී යයි. අකුරණ අටේ කණුවේ ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිසැල් හිමියෙක් පැවසුවේ තමන්ගේ කඩයට පහර දුන් පුද්ගලයා කලකට පෙර තමන්ට සමාන ව්‍යාපාරයක නිරත වූ කාලයේ තමන්ට ඔහු සමග හොඳ සම්බන්ධතාවයක් තිබූ බවයි. එහෙත් එම පුද්ගලයාගේ ව්‍යාපාරය සාර්ථක වී නැත. ප්‍රහාර සම්බන්ධයෙන් අත් අඩංගුවට පත් වූ දිගන බ්‍රදේශයේ එක් පළාත් පාලන ආයතන සභිකයෙක් දිගන වෙළඳපොළේ 'ව්‍යාපාරවලට සම්බන්ධ' බවක් කියනු ලැබේ.

ඕවිස්ස ගම්මානයේ දී අපට කුඩා කර්මාන්තශාලාවක අත්බෑග් නිපදවන කාන්තාවන් පිරිසක් හමුවිය. එම කර්මාන්ත ශාලාවේ හිමිකරු මුස්ලිම් පුද්ගලයෙක් වූ අතර, එම නගරයේ ඇති මුස්ලිම්

---

[52]රජය සහ ප්‍රජා සංවිධාන වගුගත කළ සංඛ්‍යා සැසඳීමක් සඳහා බලන්න:L Zubair et al., "Is the State Grossly Underestimating the Losses from the Mob Violence in Kandy?" *GroundViews*, 24, June, 2018 https://groundviews.org/2018/06/24/is-the-state-grossly-underestimating-the-losses-from-the-mob-violence-inkandy/

හිමිකරුවකු සහිත එකම ව්‍යාපාරය එය විය. මාර්තු 7වැනි ද එම කර්මාන්තශාලා ගොඩනැගිල්ල ගිනිබත් කොට තිබේ. ඕවිස්ස ගමේ කුලියට ගෙන තිබූ ගොඩනැගිල්ලක වූ එම කර්මාන්තශාලාව වසා තම යන්ත්‍ර සූත්‍ර රැගෙන වඩාත් වැඩි මුස්ලිම් ජනගහනයක් සහිත ප්‍රදේශයකට යාමට එම කර්මාන්ත ශාලාවේ හිමිකරු තීරණය කොට තිබේ. ඔහු යටතේ සේවය කළ සේවිකාවන් කර්මාන්ත ශාලාව වසා නොදමන මෙන් ඔහුට ඇවිටිලි කර තමන්ගේ වියදමෙන් ගොඩනැගිල්ලට වූ හානි අළුත්වැඩියා කර දී තිබේ. එම කාන්තාවන්ට තිබූ එකම ජීවනෝපාය මාර්ගය මෙම කර්මාන්ත ශාලාව වූ අතර අවශ්‍ය වුවහොත් දරුවන් පවා එම ස්ථානයට ගෙන ඒමට හැකි වූ බැවින් කර්මාන්ත ශාලාව තවදුරටත් ඕවිස්සෙහි ම පැවතීම තමන්ට අවශ්‍ය වූ බව එම කාන්තාවෝ පැවසූහ. ඕවිස්සේ මෙම කර්මාන්තශාලාව සම්බන්ධ සිදුවීම මුස්ලිම් ව්‍යාපාර ඉලක්ක බවට පත්වීම සඳහා මෙන්ම මෙවැනි ප්‍රහාරවල ආර්ථිකමය ප්‍රතිවිපාක ප්‍රජාවන් සියලු දෙනාට දැනෙන අන්දම සඳහා උදාහරණයක් වේ.

**ප්‍රදේශයේ විද්වතුන් පළකළ අදහස්**

සිවිල් සමාජ සංවිධාන නියෝජිතයින්, රජයේ නිලධාරීන් සහ පළාත් පාලන ආයතනවල දේශපාලනඥයින්ගෙන් මහනුවර සිදුවූ සිද්ධීන් පිළිබඳව ඔවුන්ගේ දෘෂ්ටිකෝණය කුමක්දැයි පවසන මෙන් අප ඉල්ලා සිටිවිට පළකරන ලද අදහස්වල සම්මිශ්‍රණයක් මෙම කොටසෙහි දැක්වේ. ජනවාර්ගික සබඳතා බිඳවැටීම සම්බන්ධයෙන් එම පුද්ගලයින් කළ ඇගැයුමෙහි බොහෝ සමානකම් තිබුණි. සියළු ජනවර්ග නියෝජනය කළ බහුතර පිරිසක් සිංහල ජාතිකවාදය සහ දේශපාලන වාසි තකා ජනවාර්ගික එදිරිවාදිකම් ඇවිලවීම පිළිබඳව විවේචනාත්මකව කථා කළහ. අපට කථාකළ බොහෝ දෙනා රටේ දේශපාලනය පත්ව ඇති තත්වය මෙන්ම සමාජයේ චර්යාධර්ම හා සාරධර්ම පොදුවේ පිරිහී තිබීම පිළිබඳව ළතැවුනෝය. කෙසේ නමුත් සිංහල හා මුස්ලිම් වශයෙන් හඳුන්වාගත් පුද්ගලයින් විසින් මුස්ලිම්භාවය පිළිබඳව සාකච්ඡා කළකරුණුවල වෙනස්කම් තිබුණි. රටේ නැගී එන මුස්ලිම් විරෝධී මතවාදය පිළිබඳව සිංහල රජයේ නිලධාරීන් දෙදෙනෙක් මෙසේ කථා කළෝ ය. එක් අයෙක් පැවසුවේ, (ශ්‍රී ලංකාවේ) අප අතීතයේදී එකිනෙකාගේ ආගමික විශ්වාස විවේචනය සුදුසු බවක් සැලකුවේ නැතත් වර්තමානයේ දී එය සාමාන්‍ය දෙයක් බවට පත් වී ඇති බවයි. මාධ්‍ය තුළ මුස්ලිම් පුද්ගලයින් පෙන්නුම් කරන අන්දම පිළිබඳව විශේෂයෙන් කථා කළ අනෙක් නිලධාරියා, මාධ්‍ය තුළ පෙන්නුම් කරන දේවල් මහජනයා විසින් විචාරාත්මකව අවබෝධ කරගත යුත්තේ කෙසේදැයි උපදෙස් දීමට, නැතහොත් මග පෙන්වීමට හැකි, ගරුබුහුමනට පාත්‍රවූත්, යුක්ති සහගතවූත් එකදු හඬක් හෝ නොමැති බව ප්‍රකාශ කළේ ය. මේ සඳහා උදාහරණයක් ලෙස හිරු මාධ්‍ය ජාලය විල්පත්තු අභය භූමි ගැටළුව ආවරණය කළ අන්දම සඳහන් කරන ලදී. එහිදී එක් මුස්ලිම් අමාත්‍යවරයකුගේ ක්‍රියාකලාපය අවධාරණය කෙරුණු අතර අභයභූමි ඉඩම් අල්ලා ගැනීම සම්බන්ධයෙන් ඔහුට චෝදනා කෙරුණු බව සඳහන් විය.එහි සත්‍යතාවය පිළිබඳ විනිශ්චයකට පැමිණීම සහ එම කරුණෙහි වලංගුතාවය දැනගැනීම සඳහා ජනතාවට කළ හැකි දෑ කුමක්දැයි යන්න පිළිබඳව කිසිදු තොරතුරක් නොවීය. මුස්ලිම් ආගමේ සීමාකරනසුළු ස්වභාවය ප්‍රශ්නයක් වන බව සඳහන් කළ අය සිටියෝ ය. වෙනත් ආගම්වල අයට පල්ලිවලට ඇතුළු වීමට අවසර නැත්තේ ය යන කාරණය ප්‍රශ්නයක් වශයෙන් දැක්වූ අතර, එය අවිශ්වාසය වර්ධනය වීමට හේතුවක් වශයෙන් දක්වන ලදී. තවත් අයෙක් මුස්ලිම් ජනතාව අතරෙහි 'අන්තවාදීන්' සිටීම පිළිබඳ කාරණය සඳහන් කළේ ය. අන්තවාදියෙකු යනු කවුරුන් දැයි තවදුරටත් විමසූ විට අපට පැවසුවේ ඉන් අදහස් කළේ මුස්ලිම් කඩවල්වලට පමණක් යන, අකුරණ ප්‍රදේශයේ පුද්ගලයින් පිළිබඳව එසේ සඳහන් කළ බවකි. මෑතකාලීන අතීතය තුළ මුස්ලිම් ජනතාවට තමන්ගේ තරාතිරමෙහි පිරිහීමකට මුහුණ දෙන්නට සිදුව තිබීම ගැන මුස්ලිම් විද්වතුන් සාකච්ඡා කළහ.අධ්‍යාපනය සඳහා ප්‍රවේශය පිළිබඳව කථා කරමින්, මහනුවර ඉහළ පෙළේ මුස්ලිම් පුද්ගලයින්ට තවදුරටත් නගරයේ හොඳම පාසල්වලට ප්‍රවේශය අහිමි වී ඇති අන්දම පිළිබඳව ඔවුහු ළතැවුනහ. අතීතයේ දී කිංග්ස්වුඩ් සහ සිල්වෙස්ටර්ස් පාසල්වල සෑහෙන මුස්ලිම් නියෝජනයක් තිබී ඇත. එහෙත් දැන්, එම සංඛ්‍යාව ඉතා අඩු ය. '75%ක් සාමාන්‍ය පෙළ අසමත්' යනුවෙන් විස්තර කරනු ලැබූ අඩු ප්‍රමිතියේ රජයේ පාසල්වලට හෝ අඩු ප්‍රමිතියේ ජාත්‍යන්තර පාසල්වලට තමන්ගේ දරුවන් යැවීමට මුස්ලිම් පුද්ගලයින්ට සිදුවී තිබේ. (රටේ අනෙකුත් සියලුම ජනවාර්ගික කොටස් වල සිටින ධනවත් අය මෙන්) ධනවත් මුස්ලිම්වරුන් ද තමන්ගේ දරුවන්ට වඩාත් හොඳ අධ්‍යාපන අවස්ථා උදාකරදෙන නමුත්, මැදි ආදායම් සහ වඩාත් දුගී පවුල්වලට සිදුව ඇත්තේ අඩු ප්‍රමිතියක පාසල්වලට තම දරුවන් යැවීමට වන අතර එයින් ඔවුන්ගේ අනාගතය අඳුරු වෙයි.මහනුවර වඩාත් හොඳ ශ්‍රේණිගත කිරීම් සහිත කාන්තා පාසල්වල තවමත් මුස්ලිම් සිසු නියෝජනයක් තිබුණි. එහෙත් එවැනි පාසල් සමගින් සම්බන්ධ වීමේදී මුස්ලිම් සිසුන්ට

සහ මවුපියන්ට මුහුණ දෙන්නට වී ඇති ජාතිවාදය සැලකිය යුතු මට්ටමක පවතියි. මුස්ලිම් කාන්තාවන්ගේ ඇඳුම අවධානය යොමුකළයුතු කාරණාවක් වශයෙන් සාකච්ඡා විය. තම දියණිය විවාහ ආරාධනා පත්‍ර ගුරුවරියන්ට දීම සඳහා ගිය අවස්ථාවේ ඇය හිස ආවරණය කරගෙන සිටි හෙයින් මුලින්ම ආරක්ෂක නිලධාරියා ඇයට පාසලට ඇතුළුවන්නට ඉඩ නොදුන් අන්දම ද ඔහු ඒත්තුගන්වාගෙන කාර්යාලය තුළට ගියත් අලුත් විදුහල්පතිනිය ඇයට කථා නොකර සිටි අන්දම ද එක් අයෙක් විස්තර කළේ ය. මිශ්‍ර පාසල්වල අධ්‍යාපනය ලැබීම සඳහා මුස්ලිම්වරුන් දිරිගැන්විය යුතු බව ද තවත් අයෙක් ප්‍රකාශ කළේ ය. එවැනි මිශ්‍ර පාසලක ඉගෙන ගත් අයෙක් වශයෙන් තමන්ට වෙනත් ප්‍රජාවන්හි පුද්ගලයින් සමගින් වඩාත් හොඳින් සම්බන්ධ වීමේ හැකියාව ඇති බවත්, එවැනි නිරාවරණයක් නොලැබුණු සහෝදර මුස්ලිම්වරුන්ට එසේ කිරීමට අපහසු බව හා විශ්වාසය නොමැති බව තමන් දුටු බවත් ඔහු පැවසීය.

## 5 වැනි පරිච්ඡේදය

## නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගෙන් ලැබුණු වාචික සාක්ෂි

ද්වේෂ සහගත ප්‍රතිචාරයක් දැක්වීම සම්බන්ධයෙන් සහ එක් අවස්ථාවකදී පල්ලියකට ගිනිතැබීම සඳහා සැබැවින්ම සහාය දීම සම්බන්ධයෙන් දේශීය සහ ජාත්‍යන්තර මාධ්‍ය මෙන්ම දේශපාලනඥයින් ද පොලීසියට බරපතළ ලෙස චෝදනා කළහ. වඩාත් ම සිත් කනස්සල්ලට පත් කරවන එක් උදාහරණයක් වන්නේ (අපි ඉහත ලේඛනගත කර ඇති අන්දමට)විශේෂ කාර්ය බලකාය බූට් සපත්තු පැළඳ සිටියදීම පල්ලියකට ඇතුළු වී මවුලවිවරුන් දෙදෙනකුට පහරදෙන අන්දම සී.සී.ටී.වී. දර්ශනවල පටිගත වී තිබීම සහ ඒ සඳහා ඇසින් දුටු සාක්ෂි තිබීමත්, තවත් අවස්ථාවක දී ෆාසිල් යන නම ඇති පළාත්පාලන ආයතන දේශපාලනඥයෙක් සහ ඔහුගේ මිතුරා සොයා ගොස්, ඔවුන්ගේ නිවෙසට කඩා වැදී, ඒ දෙදෙනා පිටතට ඇදගෙන විත් ඔවුන් සතුව පෙට්‍රල් බෝම්බ තිබූ බවක් ව්‍යාජ ලෙස පෙන්නුම් කිරීමත් ය.[53] පොලිස් නිලඇඳුමින් සැරසුණු අයෙක් ගොඩනැගිල්ලක දොර කඩා විවෘත කළ පසු කලහකාරී පිරිස් ඒ හරහා ඇතුළුවන අන්දම දැක්වෙන සී.සී.ටී.වී. දර්ශන අඩුම තරමින් එකක් හෝ තිබුණි.

මහනුවර සිදුවීම්වලට සම්බන්ධ වූ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් දෙදෙනක් සහ බලපෑමට ලක් වූ එක් ප්‍රදේශයක ස්ථාන භාර පොලිස් නිලධාරියා නිර්නාමික පදනමින් අප සමගින් කථා කරන්නට එකඟ වූහ. නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල දෘෂ්ටි කෝණයෙන් එම දිනවල දී සිදුවූයේ කුමක්දැයි අවබෝධ කරගැනීම උදෙසා අපි එම සාකච්ඡාවලින් සොයාගත් කරුණු සම්බන්ධයෙන් වඩාත් ම පොදු ප්‍රකාශ පමණක් මෙහි ඇතුළත් කර ඇත්තෙමු.

සම්මුඛ සාකච්ඡාවට ලක් කළ පොලිස් නිලධාරීන් තිදෙනාම පොලිසියේ ප්‍රතිචාරය ප්‍රමාණවත් නොවූබවටත් සතුටුදයක නොවූ බවටත් එකඟ වූහ.

අධීක්ෂණ වගකීම් සහිත, ඉහළ තනතුරු හොබවන මෙම පොලිස් නිලධාරීන් එම අවස්ථාව සම්බන්ධයෙන් සහ ප්‍රචණ්ඩත්වයේ පසුබිම සම්බන්ධයෙන් ලබාදුන් රහස්‍ය පැහැදිලි කිරීම් සහ විශ්ලේෂණ ප්‍රයෝජනවත් අන්දමින් ප්‍රධාන කාණ්ඩ තුනකට බෙදා වෙන්කොට මෙහි ඉදිරිපත් කෙරේ. එහෙත් පොලීසියෙන් ලබාදුන් ප්‍රතිචාරයේ ගුණාත්මකබව තීරණය වූයේ මේ කාණ්ඩ තුනෙහිම එකතුවෙනි. පහත දැක්වෙන බෙදීම කර ඇත්තේ අප සමගින් කථා කළ අය ඒවා සඳහා ලබාදුන් සාපේක්ෂ වැදගත්කම පිළිබිඹු වන අන්දමිනි:

### 1) තාක්ෂණික සහ පරිපාලන සීමාකිරීම් මත පදනම් වූ පැහැදිලි කිරීම්

ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් නොසිටීම සහ එවැනි ප්‍රජා පාදක ප්‍රචණ්ඩත්වයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රමාණවත් පුහුණුවක් නොමැතිවීම සම්බන්ධයෙන් සාක්ෂි පදනම් කරගත් හේතුදැක්වීම් ඇතුළත් විය. භූමි ප්‍රදේශය දුෂ්කරවීමත්, බලපෑමට ලක් වූ මුස්ලිම් ගම්මාන බාහිරට ප්‍රවේශය අඩු හෝ දෛනිකව නිරාවරණය නොවන, ඇතුළත වන්නට පිහිටා ඇති ගම්මාන වීමත් ප්‍රතිචාර ප්‍රමාදවීමට සහ ප්‍රමාණවත් නොවීමට බලපෑ ප්‍රධාන හේතුවක් වශයෙන් දක්නා ලදී. මෙවැනි අර්බුද අවස්ථාවලදී ප්‍රජාව සමගින් සන්නිවේදනයට සහ එලදායී අන්දමින් සිදුවීම් සීමාකරගැනීමට ඉතාමත් වටිනා සාධකයක් වන ජනවාර්ගික හා ආගමික සුළුතර කණ්ඩායම්වල සාමාජිකයින් සේවයට බඳවාගෙන තිබීම මධ්‍යම පළාත තුළ ඉතාමත් අඩු බවත් එය විශ්වාසය ගොඩනැංවීමටත් සම්බන්ධතා ඇතිකරගැනීමටත් බාධාවක් ලෙස හඳුනා ගන්නා ලදී. මෙම ගැටළු සත්‍ය බැව් තහවුරු වී ඇතත්, පොලීසිය සම්බන්ධ වන අනෙකුත් සිදුවීම් හා අවස්ථාවලට ද මේවා එක හා සමානව

[53]මෙම සිදුවීම්වල ඇසින් දුටු සාක්ෂි සඳහා 2018 මාර්තු 24 බී.බී.සී. වාර්තාව බලන්න.Tom Allard, Shihar Aneez,
"Police, Politicians Accused of Joining Sri Lanka's Anti-Muslim Riots" *Reuters*, 25 March 2018
https://uk.reuters.com/article/uk-sri-lanka-clashes-insight/police-politicians-accused-of-joining-sri-lankas-antimuslim-riots-idUKKBN1H102O

අදාළ වේ (අපරාධ පාලනය හා රථවාහන වැරදි). එහෙත් එම අවස්ථාවල දී පොලීසියේ කාර්යසාධනය මෙම අවස්ථාවට සාපේක්ෂව වඩාත් හොඳ ය.

මෙම අංගය සෑහෙන තරමකට සරල කාරණයක් වුවත් මෙම සීමාකිරීම් සඳහා ප්‍රතිකර්ම සැලසීමෙන් වඩාත් ඵලදායී ප්‍රතිඵලයක් ලබාගතහැකිවේද යන්න නොපැහැදිලි ය. ඊට හේතුව වන්නේ පහත දැක්වෙන, වඩාත් දේශපාලනීකරණය වූ හේතු දෙක මෙහිදී නිරූපණය කරන භූමිකාව සහ ඒවාට ඇති බලයයි.

**2)මේ සම්බන්ධයෙන් උදසීන මනෝභාවයක් ඇතිවීමට මගපාදමින්,මෙම සිදුවීම සහ අතීතයේ සිදුවූ මීට සමාන සිදුවීම්වලදී ඵලදායී ලෙස සම්බන්ධ වී කටයුතු කිරීමට පොලීසිය තුළද ඇතුළුව අදාළ ඉහළ බලධාරීන් තුළ දේශපාලනමය අභිමතයක් නොතිබීම මත පදනම් වූ පැහැදිලිකිරීම්.**

ක්‍රියාකාරී නොවීම සහ උදාසීනබව සඳහා දක්වන ලද ප්‍රධානතම නිර්ණායක වූයේ දේශපාලනඥයින් සහ පොලිස් ධූරාවලියෙන් පැහැදිලි උපදෙස් නොලැබීමයි. තවද, රටේ බහුතර ප්‍රජාව ප්‍රචණ්ඩත්වයේ ප්‍රධාන වරදකරුවන් වන මෙවැනි ජනවාර්ගික-ආගමික ගැටුමක දී බියකින් හෝ පක්ෂපාතිකමකින් තොරව තමන්ගේ රාජකාරිය කරන පොලිස් නිලධාරීන් වෙනුවෙන් පෙනීසිටීම සඳහා ආයතනය ඉදිරිපත්වනු ඇතැයි යන්න පිළිබඳ විශ්වාසයක් නොතිබුණි. මෙම තත්වය පැහැදිලි කිරීම සඳහා අළුත්ගම සිදුවීමෙන් උදහරණ ගෙනහැර දක්වන ලදී. තමන්ගේ දේශපාලන ස්ථාවරය විනාශ කරගැනීමකට මග පාදනු ඇති, ජනතාව බෙහෙවින් අප්‍රිය කරනු ඇතැයි ඔවුන් සිතන අන්දමේ ක්‍රියාමාර්ග ගැනීමට දේශපාලනඥයින් සහ අනෙකුත් නායකයින් මැලිවන අතර, හඳුනාගත් වරදකරුවන්ට එරෙහිව නිසි නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සිදුනොවීමටත්, නීති විරෝධී රැස්වීම් ආරම්භයේ දී ම විසිරුවා හැරීමට යොමු නොවීමටත් මගපාදන්නේ එම මානසිකත්වය යි.

සැකෙවින් පවසන්නේ නම්, (විවෘතව ම දේශපාලන අනුග්‍රහය ලබා ගන්නා) බහුතර ප්‍රජාවේ වරදකරුවන් වෙත දෝෂාරෝපණ එල්ල කෙරෙන අන්දමේ පොලිස් ක්‍රියාමාර්ග සඳහා සැබෑ සහායක් නොමැතිවීම (හා එසේ නොමැතිබව වඩාත් ප්‍රබලව දැනීම) ප්‍රබල ක්‍රියාමාර්ග ගැනීමට බාධා කරවයි. එවැනි ප්‍රාදේශීය සිදුවීම්වලදී දෛනික පදනමකින් එම ප්‍රදේශවල සෘජු ප්‍රවේශයක් නොමැති ජාතික දේශපාලන නායකයින්ට වඩා, බිම් මට්ටමේ ප්‍රාදේශීය දේශපාලනඥයින්ට වැඩි සහ අත්‍යාසන්න බලයක් ඇති බව ද අඟවන ලදී. ප්‍රධාන නගරවල සිටප්‍රබල ප්‍රකාශ සිදු කළද, එම ප්‍රකාශබිම් මට්ටමට බලපාන අන්දමින් ගන්නා, එතරම් ජනප්‍රිය නොවන දණ්ඩනීය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් බිම් මට්ටමේ දී සහාය ලබාදීමක් බවට ඉබේම පරිවර්තනය නොවේ.

**3) මතවාදීමය සහ ජනවර්ග-ආගම් කේන්ද්‍රීය සාධක මත පදනම් වූ පැහැදිලි කිරීම්**

දිගන සිදුවීම් සම්බන්ධයෙන් විවිධ ආයතන සිදුකළ අධ්‍යයනවලදී වඩාත්ම සංකීර්ණ වුත් සාපේක්ෂ වශයෙන් අඩුවෙන් ගවේෂණයට ලක් වූත් අංශය වන්නේ මෙයයි. එහෙත්, ඉහත සැකෙවින් දක්වා ඇති හේතු දැක්වීම් දෙවර්ගයටම ඉඩ සලසන්නේ හා ඒවා සාධාරණීකරණය කරන්නේ මෙමගින් වන බැවින් මෙහි වැදගත්කම නොසලකා සිටිය නොහැක. මෙහිදී පළමු සහ හඳුනාගැනීමට වඩාත් ම පහසු කාරණය නම් සිංහල බෞද්ධ බහුතරවාදයේ ජනවාර්ගික-ආගමික ආධිපත්‍යයයි. කෙසේ නමුත් පොලිස් නිලධාරීන් මෙය ඒ නමින් ප්‍රකාශිතව හඳුනාගැනීමකට ලක් නොකරන ලදී. ඒ වෙනුවට යොදගැනීමට වඩාත් කැමති වූ සහ එතරම් විවාදශීලී නොවූ යෙදුම වූයේ සිංහල ජාත්‍යාලය යන යෙදුමයි. එහෙත්, එහි ප්‍රධාන ලක්ෂණ වශයෙන් පැහැදිලිවම විස්තර කෙරුණේ සිංහල ජනවාර්ගික කණ්ඩායමට (සහ බුද්ධාගමට) සුවිශේෂී ස්ථානයක් ලබා දිය යුතු යැයි ඉල්ලා සිටීම සහ සියලුම සුළුතර කණ්ඩායම් බහුතර කණ්ඩායමේ අනුමැතියට යටත්ව ක්‍රියාත්මක විය යුතු තත්වයට ඇද හෙළීම යි. ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් විසින් පැහදිලි කළ අන්දමට 'තමන්ට හිමි තැන කුමක්දැයි දැන සිටීම' සහ 'අපේ ඉවසීමෙන් අයුතු ප්‍රයෝජන නොගැනීම' යනු මෙම මතවාදයේ ප්‍රධාන අංග වේ. එබැවින්, බහුතර කණ්ඩායම තමන්ගේ මහාත්මභාවය හේතුවෙන් කළහැකි වෙනත් යමක් නැති තත්වයට තල්ලුකර දමා ඇත්තේ ය යන අදහස

මෙම ලෝක දෘෂ්ටිය සඳහා අත්‍යාවශ්‍ය වේ. මෙම අදහස එහි වඩාත් සුලභම ස්වරූපයෙන් ප්‍රවර්ධනය කරන්නේ බෞද්ධ පන්සල් සහ ඒවායේ විහාරාධිපති හිමිවරුන් ය.

සාමාන්‍ය පොලිස් නිලධාරීන්ගෙන් වැඩිදෙනෙක් එම ප්‍රදේශයේ ම අය වීමත්, එබැවින් ප්‍රචණ්ඩත්වය සඳහා වරදකරුවන් වන පුද්ගලයින් තමන් දන්නා හඳුනන අය වීමත්, ඇතැම්විටෙක මිතුරන් වීමත්, සහ ඉහත කී මතවාදය පොදුවේ පිළිගන්නා එකම පන්සල් හෝ වෙනත් සමාජ කණ්ඩායම්වලට අයත් පුද්ගලයින් වශයෙන් සැලකීමත් පොලීසිය විසින් දිගන ප්‍රදේශයේ කෝලාහලකරුවන්ට සහ කොල්ලකන්නන්ට එරෙහිව වැළැක්වීමේ සහ දණ්ඩනීය ක්‍රියාමාර්ග නොගැනීමට හේතු වූ පැහැදිලි සහ ප්‍රබල බාධකයක් විය. සැබැවින් ම, තමන්ගේ සීමාවන් ඉක්මවා වැඩ කළ මුස්ලිම්වරුන්ට ලබාදුන් එලදායී දඬුවමක් වශයෙන් මෙම සිද්ධි සැලකීමට පවා සෑම මට්ටමක ම වූ සිංහල පොලිස් නිලධාරීන් යොමුවූ බවක් පවා යෝජනා විය. එතරම් ම තදින් අවධාරණය නොකළත්, සිංහල ව්‍යාපාරික ළැදියාවන් සහ බෞද්ධ ජාතිකවාදය අතර වූ හවුල්වීම ද පෙන්වා දෙන ලදී. අසල්වාසී සිංහල කඩවල බඩුතොග සඳහා හානි නොකර මුස්ලිම් කඩ පමණක් ඉලක්ක බවට පත් කිරීමෙන් මෙය ප්‍රබල ලෙස ඔප්පු වේ.

මුලාවී සිටින 'සුළුතර කණ්ඩායම්වලට' පාඩමක් ඉගැන්වීමේ ක්‍රමයක් වශයෙන් කලින් කලට රට නිතර ප්‍රචණ්ඩත්වයට ගොදුරුවන තත්වයක් උදා නොවීමට නම් මෙම මතවාදීමය සාධකයට ආමන්ත්‍රණය කළයුතුව තිබේ. විශේෂයෙන් ම, අප හා කථා කළ අය මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියා සහ වරදට දඬුවම් නොලබා සිටීම් නොපමාව නැවැත්වීමට ඇති අවශ්‍යතාවය පිළිබඳව පැහැදිලිවම කථා කළ ද, සිංහලයින්ගේ හැසිරීමට හේතුපාදක වූ මෙම මතවාදීමය පදනම විභාග වූයේ සාපේක්ෂව අඩුවෙනි.

අප කථාකළ නිලධාරීන්ගෙන් අපට අසන්නට ලැබුණු කාරණය නම්, පොලීසිය මීට වඩා හොඳින් මෙම තත්වයට ප්‍රතිචාර දැක්විය යුතුව තිබුණු නමුත් සහ පොලිසියෙන් දැක්වූ ප්‍රතිචාරය ප්‍රමාණවත් නොවේයැයි මහජනතාව සිතීම නිවැරදි නමුත්, එසේ වූයේ යම් කුමන්ත්‍රණයක් හේතුවෙන් හෝ මුස්ලිම් ජනතාවට එරෙහිව සංවිධානය කළ ප්‍රහාරයක් හේතුවෙන් නොව, ජාතිවාදය ද කොටසක් වන, විවිධ සාධක ගණනාවක සම්මිශ්‍රණයක් හේතුවෙන් වූ බවයි. මහනුවර භූගෝලීය පිහිටීම අනුව ඇතැම් ප්‍රදේශවලට ප්‍රවේශවීම දුෂ්කර ය. ඇතැම් ප්‍රදේශ පිහිටා ඇත්තේ රට අභ්‍යන්තරයට වන්නට වන අතර ඇතැම් මුස්ලිම් ප්‍රදේශවලට යා යුතුව ඇත්තේ සිංහල ප්‍රදේශ මැද්දෙනි. ඇතැම් මුස්ලිම් නගර සිංහල නගරවලින් වටවී පවතියි. ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේ දී මෙය අභියෝග නිර්මාණය කරයි. තව ද, ප්‍රදේශයේ පොලිස් ස්ථානවලට අනුයුක්ත බොහෝ පොලිස් කොස්තාපල්වරු එම අවට ප්‍රදේශවලම අය වන අතර තමන්ගේ ගම්වල පැතිර තිබූ මුස්ලිම් විරෝධී අදහස් ඔවුන් තුළ ද තිබුණා විය හැකිය. ඇතැම්විටෙක ප්‍රචණ්ඩත්වයේ නිරතවූවන් හා ඊට සහාය දැක්වූවන් ඔවුන් දන්නා අය විය හැක. මෙම ප්‍රදේශවල පොලිස් ප්‍රතිචාරය අලස ස්වභාවයක් ගැනීමට මෙම වාතාවරණයන් මගපෑදුවා විය හැකිය.

ජනවාර්ගික වෙනස්කොට සැලකීම රජයේ ව්‍යුහාත්මක ලක්ෂණයක් වශයෙන් පවතින බව ද ඇතුළුව (උදාහරණ වශයෙන්, පොලීසියේ සුළුතර නියෝජනය අඩු මට්ටමක පැවතීම මෙවැනි දුර්වල ප්‍රතිචාරයක් ඇතිවීමට හේතුවූ තීරණාත්මක සාධකයක් වශයෙන් හඳුනාගන්නා ලදී), ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය යනුවෙන් ප්‍රශ්නයක් පවතින බව සියළුම නිලධාරීහු පිළිගත්හ. ප්‍රදේශයේ පොලීසි සාමාන්‍යයෙන් සියයට 60ක් පමණ ම එම ප්‍රදේශයේ වාසය කරන පොලිස් නිලධාරීන්ගෙන් සමන්විත වන අතර, එබැවින්, ප්‍රචණ්ඩත්වයට සහභාගිවන්නන් සාමාන්‍යයෙන් එම පොලිස් නිලධාරීන්ගේ ම ගම්මානයේ නැතහොත් නගරයේ වැසියන් හෝ ඇතැම්විටක ඔවුන්ගේ ඥාතීන් වේ.තවද, වත්මන් පොලිස් බලකායේ මුස්ලිම් පුද්ගලයින් සිටින්නේ සියයට එකකටත් (1%)අඩු ප්‍රතිශතයකි. එසේම, සුළුතර විරෝධී මතවාදවලට, මෙහිදී නම්, මුස්ලිම් විරෝධී මතවාදවලට කලින් කලට ඉස්මතුවීම සඳහා සහ ප්‍රජාවන් අතර විනාශකාරී බලපෑම් ඇතිකිරීම සඳහා ඉඩ ලබාදී ඇති බව ද ඔවුහු පිළිගත්හ. ඉන් එක් අයෙක් විශේෂයෙන් සඳහන් කළේ, රාජපක්ෂ පාලනතන්ත්‍රය යටතේ ජාතිවාදී හැඟීම්වල විශේෂ වර්ධනයවීමක් තමන් අත්විඳ ඇති බවකි. සිංහලයින්ට වඩාත් වැඩි අයිතීන් ඇත්තේ යැයි කීමේ ඉපැරණි පුරුද්දෙන් රටක් වශයෙන් අප මිදිය යුතු බව තවත්පුද්ගලයෙක් ප්‍රකාශ කළේ ය. ඉතිහාසයේ යම් පැතිකඩක් පෙන්වමින් සිටීම, එනම් '*ඉතිහාසය පෙන්න පෙන්නා අපි තමයි උරුමකාරයෝ*' කියමින් සිංහල අයිතීන් කියාපෑම තවදුරටත් එලදායී

නොවනු ඇති බව ඔහු පැවසුවේ ය. *අපි එකට එක්ව ඉදිරියට යන්න ඕනෑ* යනුවෙන් ඔහු පැවසීය.දිගින් දිගටම පවතින්නා වූත්,ක්‍රමානුකූල වූත්, හොඳින් අරමුදල් සැපයෙන්නා වූත් ක්‍රම ඔස්සේ මෙම එදිරිවාදිකම් පෝෂණය වන බවත්, රජය ඒ සම්බන්ධයෙන් කිසිදු වගකීමක් භාර නොගන්නා බවත්, අවසානයේ දී අනිවාර්යයෙන් ම උද්ගත වන ප්‍රචණ්ඩත්වය වළක්වාලීමට කිසිත් නොකරන බවත් ඔවුහු සියළුදෙනා පිළිගත්හ. මුස්ලිම් විරෝධී ක්‍රියාකාරකම් සිදුකිරීමට අරමුදල් සපයන ව්‍යාපාර පිළිබඳව බරපතළ ලෙස සලකා බැලීමටත්, ඒවාට විරුද්ධව දිගුකල් පවත්නා ක්‍රියාමාර්ග ගැනීමටත්, එහි සම්පූර්ණ වගකීම පොලීසිය මත ම නොපැටවීමටත් රජය විසින් කටයුතු කළයුතු වේ.

දණ්ඩනීති සංග්‍රහයේ නීතිවිරෝධී රැස්වීම් සම්බන්ධයෙන් වන වගන්තියේ ඒ සම්බන්ධයෙන් සම්මත මෙහෙයුම් කාර්යපටිපාටියක් දැක්වෙන බව ප්‍රකාශ කළ, අප සමග කථා කළ එක් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙක්, උදාහරණයක් වශයෙන් අලුත්ගම දී නීතිය හා සාමය බිඳ වැටුනේ එම කාර්යපටිපාටීන් අනුගමනය නොකළ හේතුවෙන් බව ප්‍රකාශ කළේ ය. තෙල්දෙණිය හා දිගන සිදුවීම්වලදී ප්‍රමාණවත් පරිදි ප්‍රතිචාර දැක්වීමට අසමත් වූයේ පොලීසියේ විවිධ පාර්ශ්වකරුවන් අතර නිසි සම්බන්ධීකරණයක් නොතිබීමේ අඩුපාඩුව හේතුවෙන් බව ඔහු ප්‍රකාශ කළේ ය. නීති විරෝධී රැස්වීමක් හේතුවෙන් සාමයට තර්ජනයක් එල්ල වන්නේ නම් ගතයුතු ක්‍රියාමාර්ග කවරේදැයි පොලිස් බලකායේ සෑම නිලයකම නිලධාරීන් විසින් දැනසිටිය යුතු බවත්,රැස්ව සිටින පිරිස් විසිරුවාලීම සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් හමුදාව කැඳවීමට ඇති හැකියාව දමෙයට ඇතුළත් වන බවත් ඔහු පැවසුවේ ය. මෙහිදී, ඒ විවිධ අංග එකට එකතු කිරීමක් සිදුනොවීම අසමර්ථකම වශයෙන් දක්නා ලදී. මහනුවර ඇතැම් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් ද එම ප්‍රදේශයේම පුද්ගලයින් හෙයින් ප්‍රදේශවාසීන් සමගින් තිබූ සබඳතා මත ප්‍රබලව ක්‍රියාත්මකවියයුතු තැන්හි එසේ කිරීමට නොහැකිවූවා විය හැකි බව ද යෝජනා විය.

අලුත්ගම සිද්ධියේදී මෙම යාන්ත්‍රණ බිඳවැටුණේ ඇයි ද යන්න ප්‍රශ්නයට ද අපට පැහැදිලි කිරීම් ලබාදෙන ලදී. පොලීසිය එම කාලයේදී වර්ගවාදී-මනෝභාවයක් වෙත යොමු වූ බවත්, එබැවින් සෙසු නිලවල සිටි සාමාන්‍ය පොලිස් නිලධාරීන් ප්‍රචණ්ඩත්වය අවස්ථාවේ මුස්ලිම් ජනතාවට පක්ෂපාතී බවක් පෙන්නුම් කළහැකි ක්‍රියාමාර්ගවලට යොමු වී අන්‍යයින්ගේ දෝෂ දර්ශනයට පාත්‍රවීමෙන් ගැලවෙන්නට යොමුවූ බවත් එම නිලධාරියා ප්‍රකාශ කළේ ය. ඔවුන් කළයුත්තේ කුමක්දැයි ඉහළින් පැහැදිලි නියෝග ලැබී තිබුණේ නැත. ඔවුන් විසින් නියමාකාරයෙන් නීතිය ක්‍රියාත්මක කළහොත් ඉහළින් ඒ සඳහා අනුමැතියක් ලැබේද යන විශ්වාසයක් ද නොවීය. සෙසුනිලවල සිටින සාමාන්‍ය පොලිස් නිලධාරීන් සාමාන්‍යයෙන් අනුගමනය කරන්නේ ස්ථාන භාර නිලධාරියා වැනි තමන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අගය කරන සාරධර්ම හා වටිනාකම් වන අතර, මෙහිදීජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් නිසි මගපෙන්වීමක් ලැබී නොමැති බව ද ඔහු පැවසීය.

පොලීසිය පාර්ශවයෙන් අඩුපාඩු ඇතිවී තිබෙන බව නිලධාරීන් දෙදෙනා ම පිළිගත්හ. පොලීසියේ ප්‍රතිචාරය විස්තර කිරීමට එක් නිලධාරියකු උදාසීන යන යෙදුම භාවිතා කළේය. යම් අවස්ථාවක දී සේවයේ යෙදවීම සඳහා සිටින පොලිස් නිලධාරීන් සංඛ්‍යාව, ශීඝ්‍රයෙන් ප්‍රතිචාර දැක්වීමට වාහන අවශ්‍ය වීම වැනි සීමාකිරීම් යටතේ ඔවුන්ට කටයුතු කිරීමට සිදුවී ඇති බැවින්, තමන්ට පවතින ප්‍රායෝගික ගැටළු ද පොලීසිය විසින් පෙන්වා දෙන ලදී. උදාහරණයක් වශයෙන්, ප්‍රචණ්ඩත්වය උද්ගත වූ ප්‍රදේශවලට ප්‍රවේශ වීම ප්‍රශ්නයක් විය. එක්තරා ප්‍රදේශයක ප්‍රචණ්ඩත්වය ඇති වෙතැයි අපේක්ෂාවෙන් එම ප්‍රදේශයෙහිපොලීසිය රාජකාරියෙහි යොදවා තිබූ නමුත් ඊට කිලෝමීටර 30 ක් දුරින් පිහිටි වෙනත් ස්ථානයක ප්‍රචණ්ඩත්වය උද්ගත වී තිබේ. ඒ වනවිට පොලීසියේ සම්පත් ඉහත කී පළමු ස්ථානයට ඒකරාශී කර තිබීම ප්‍රශ්නයක් වූ බව අවධාරණය කරන ලදී. දිගන ප්‍රදේශයේ මහත් පිරිසක් ඒකරාශීවීම පිළිබඳව පොලීසිය දැනුවත් නොවීම බුද්ධි තොරතුරු ලබාදීමේ දී සිදුවූ අසමර්ථවීමක් වශයෙන් අපට විස්තර කෙරුණි.

එක් ජ්‍යෙෂ්ඨ නිලධාරියකු මෙසේ ද පැවසීය:

> ‘අපි වැඩකරන්නත් ඕනෑ තත්වය තවත් උග්‍ර නොවෙන විදියටයි. අත් අඩංගුවට ගත් අයත් සිංහල, මියගිය අයත් සිංහල කියලාත් දැන් කථාවක් තියෙනවා. අපිත් (පොලීසිය) මෙතනට මළකඳන් එකතු කළොත් - මේ වගේ පසුබිම්වල තමයි ඇත්තම සිංහල මුස්ලිම් ගැටුම්

ඇතිවෙන්න පුළුවන්. ඒ නිසා අපි පහරදෙන අය දිරිමත් කළා හෝ පහසුකම් දුන්නා නෙවෙයි. පොලීසියට කරන්න පුළුවන් වුණු දේවල්වල සීමාවක් තිබුණා.'

'තෙල්දෙණියේ දී අපි මිනිස්සුන්ට වෙඩි තිබ්බා නම් ඒක ප්‍රමාණය ඉක්මවූ ප්‍රතිචාරයක් වෙනවා. ඒ අය නොහික්මුනු විදියට හැසිරුනේ නැහැ. ඒ අය හවස් වෙනකම්ම හිටියා. සෙනග අතරේ පාසල් ළමයි හිටියා, පාසල් නිල ඇඳුමින් ශිෂ්‍යාවො හිටියා. ඒ අය කලබල කළේ වත්, ප්‍රචණ්ඩ ක්‍රියා කළේ වත් නැහැ.එයාලා කළේ පාර අවහිර කරන එක විතරයි. අපි පොලිසියෙන් 700-800ක් විතර වතුර විදින යන්ත්‍ර රැගෙන ඇවිත් හිටියා. කැරලි මර්දන ඒකකයත් ගෙන්වා තිබුණා. එවැනි වේලාවල කරන්නේ සීමා කිරීමයි. පිරිස විසිරී ගියොත් පාලනය කිරීම අපහසු වෙනවා. සෙනග සීමාකරගත යුතුයි. අපි තෙල්දෙණියේ ඒක කළා. ඒ මොහොතේ අඹලේ අවමංගල්‍ය උත්සවය පවත්වමිනුයි තිබුණේ. පොලීසිය විසින්මයි අඹලෙන් පිටත අවමංගල්‍ය පවත්වන එක නවත්වන්න අධිකරණ නියෝගය අරන් තිබුණේ. මේ අතරේ එක්වරම දිගනට ලොකු පිරිසක් එක් රැස්වෙලා තිබුණා. අපි එවැන්නක් සිදුවේවි කියා අපේක්ෂා කරලා තිබ්බේ නැහැ. ඒක බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් බරපතළ අසමර්ථකමක්. දිගන තියෙන්නේ තෙල්දෙණියේ ඉඳලා කිලෝමීටර් 30ක් විතර ඈතින්. ඒ ඇවිත් හිටියේ සම්පූර්ණ වෙනස් පිරිසක්. ඒ අය මලගෙදරට රැස් වූ පිරිස නෙවෙයි.'

පොලිස් නිලධාරීන් පස් දෙනෙකුට වෙඩි තැබීමකින් තොරව කලහකාරීන් 500ක් පාලනය කළ නොහැකි බව එක් නිලධාරියෙන් පැවසීය. තවද, පහළ නිලවල පොලිස් නිලධාරීන් ඉහලින් සෘජු නියෝගයක් ලැබී නැතිනම් එසේ වෙඩි තබන්නේ ද නැත. එසේ කළ අයට මෑතකාලීනව අත්විඳින්නට සිදුවූ ප්‍රතිවිපාක මත එසේ කිරීමෙන් වැළකෙන බව සඳහන් කරන ලදී. ඔවුන් වෙඩි තැබුවේ නම්, එසේ කිරීම අනවශ්‍ය දෙයක් වශයෙන් සලකනු ඇති අතර ඒ පිළිබඳව ඔවුන්ට චෝදනා කර මාස 8-9කට සිරගත කරනු ඇත. එවැනි වරදක් සිදුකළ අයෙකුට පොලීසියෙන් කිසිදු සහනයක් නොලැබේ. යම් උල්ලංඝනයක් සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහිව චෝදනා එල්ල කරනු ලැබුවහොත් තමන්ගේ වියදමෙන් නීතිඥයෙකු වෙන්කරවාගෙන අවශ්‍ය කටයුතු තමන් ම කරගත යුතු ය. එබැවින් පොලීසියේ පහළ නිලවල සිටින නිලධාරීන් රාජකාරි අවස්ථාවේ ඒ අන්දමින් තමන්ගේ පවුලේ අනාගතය අවදානමේ හෙලන කටයුතු නොකරනු ලැබේ. මැනික්හින්නේ සහ වත්තේගම වෙඩිතැබීම් සිදු කර තිබූ අතර, එබැවින් එවැනි ක්‍රියාමාර්ග නොගන්නවා නොවේ. එහෙත් එය සාමාන්‍ය පිළිවෙත නොවේ.

යම් වේලාවක් ගත වූ පසු පොලීසිය දිගනට පැමිණි බවත් එහිදී කඳුලු ගෑස් සහ ජල විදුම් යන්ත්‍ර භාවිතා කරන ලද බවත් අප වෙත පවසන ලදී. කෙසේ නමුත් විසිරී යමින් සිටි පිරිස එසේ යන අතරතුර ද මුස්ලිම් නිවාස වලට පහර දෙමින් ගොස් තිබේ. මෙහිදී සීමාකිරීමේ ක්‍රමවේදය භාවිතා කර නොමැති අතර එය ප්‍රශ්නයක් වී තිබේ.

මහනුවර ඇතැම් ප්‍රදේශවලට ප්‍රවේශය දුෂ්කරවීම හේතුවෙන් මර්තු 6වැනි දින පොලිස් යතුරුපැදි ගෙන්වා ගන්නා ලදී. මාර්තු 7වැනි ද යතුරුපැදි 40ක් 50ක් පමණ අභ්‍යන්තර ප්‍රදේශවලට යොදවා තිබේ. එක් නිලධාරියෙක් පැවසුවේ ආරම්භයේ දී මහනුවර ලබාදුන් ප්‍රතිචාරය ප්‍රමාණවත් නොවූ හෙයින් ප්‍රචණ්ඩත්වය නැවැත්වීමට මැදිහත්වනලෙස කොළඹින් ඉල්ලා සිටි බවයි. පිටස්තර ප්‍රදේශවලින් අමතර පිරිස් ගෙන්වාගැනීම, ප්‍රදේශයේ කාර්යමණ්ඩලය සියලු දෙනා කාර්යාලීය රාජකාරිවල යෙදවීම, වාහනයකට පෙට්‍රල් සපයන්නේ නම් හැර පෙට්‍රල් අළෙවි කිරීමෙන් වළකින මෙන් ප්‍රදේශයේ ඉන්ධන අලෙවිහල්වලට දැනුම් දීම, මත්පැන් අලෙවිහල් දින නියමයක් නොමැතිව වසා තැබීම ඇතුළු ක්‍රියාමාර්ග ඔස්සේ මෙය සිදුකරන ලදී. කථනයේ නිදහස සැලකීමේදීසමාජ මාධ්‍ය අවහිර කිරීම එම නිලධාරීන් දෙදෙනාම පෞද්ගලිකව අනුමත නොකරතත්,කොළඹ සිට විවිධ කටකථා පැතිරවීම් සිදුවූ බවත්, ප්‍රචණ්ඩත්වය පාලනය කරගැනීමේදී සමාජ මාධ්‍ය අවහිර කිරීම ද වැදගත් කාර්යභාරයක් ඉටු කළ බව අපවෙත පවසන ලදී.

සිද්ධිය සම්බන්ධයෙන් රජය දැක්වූ උදාසීන ප්‍රතිචාරය සලකා බලන කල මෙවැන්නක් යළි සිදු නොවනු ඇතැයි කීම දුෂ්කර බව එක් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් පැවසී ය.

'අපිට සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත[54] ගැන මිනිස්සුන්ට කියන්නතිබුණා. එහෙම වුනානම් ඒ අය මෙවැනි වැඩ නොකර ඉන්න තිබ්බා... පෙට්‍රල් බෝම්බ භාවිතයෙන් තමන්ගේ ආත්මාරක්ෂාව සලසාගන්න සූදානම් වුන මුස්ලිම් අයත් ඉන්න ඇති. පල්ලියක මවුලව්වරුන්ට එරෙහි ප්‍රහාරය පසුපස එවැනි පෙළඹවීමක් තියෙන්න පුළුවන්.'

ප්‍රචණ්ඩත්වයේ සංවිධානාත්මක ස්වභාවය සියල්ලන්ට ම පැහැදිලි වූ බව ද එක් පොලිස් නිලධාරියෙක් පැවසුවේ ය. තෙල්දෙණිය හා උඩුනුවර ප්‍රදේශවල මාර්ග සම්පූර්ණයෙන්ම සරසා තිබුණි. කෙසේ නමුත් මොරගහ හන්දියේ සිට කුමාරසිංහ ගේ නිවස දක්වා ඇති මාර්ගය සරසා නොතිබුණි. මෙය සංවේගය හෝ ආවේගය හේතුවෙන් සිදුවූ දෙයක් නොවේ. එය එසේ වූවානම් පහර දීමට ලක්විය යුතුව තිබුණේ අඹල පල්ලියයි. එහෙත් එසේ නොවීය. අනෙකුත් මූලාශ්‍රවලින් අපට අසන්නට ලැබුණු දේ පොලිස් නිලධාරියා තහවුරු කළේ ය.

'වින්දිතයාගේ පවුලේ අය සමගින් දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. ඒ අවට ප්‍රදේශවල ප්‍රචණ්ඩත්වය ඇති වේ යැයි අපි සිතුවා. ඒත් ඒක සීමා කරගන්න අපිට පුළුවන් වුණා. අවමංගල්‍ය උත්සවය දිගන නොපවත්වා ගමේ පවත්වන බව සහතික කරගන්න අධිකරණ නියෝගයක් අපි ලබාගත්තා. ඒත් කඩවල්වලට ගිනි තිබ්බේ උඩුදුම්බර සිංහල මිනිස්සු'

පොලීසියට මුහුණ දෙන්නට සිදුව තිබූ ප්‍රායෝගික ගැටළු පිළිබඳව ද එක් පොලිස් නිලධාරියෙක් පෙන්වා දුන්නේ ය. ඉන් එකක් නම්, පොලිස් නිලධාරියෙක් සිදුකරන රාජකාරිවලින් 80%ක් ම සැබැවින්ම පොලිස්, නැතහොත් නීතිය හා සාමය පවත්වාගැනීම සම්බන්ධ කටයුතු නොවේ. උදාහරණයක් ලෙස, විහාරස්ථානයේ උත්සව සඳහා ආරක්ෂාව ලබාදීම, සංචාරයේ යෙදෙන දිස්ත්‍රික් විනිසුරුවන්ට ආරක්ෂාව ලබාදීම, දේශපාලනඥයින්ට ආරක්ෂාව ලබාදීම යන සියල්ල කෙරෙන්නේ ප්‍රදේශයේ පොලිස් ස්ථානයෙනි. තව ද, ඔවුන්ට ඇත්තේ සීමිත සම්පත් වේ. පොලිස් ස්ථානයකට සාමාන්‍යයෙන් ඇත්තේ වාහන එකක් හෝ දෙකක් පමණකි. සීමිත සම්පත් තිබීම පිළිබඳ තවත් උදාහරණයක් නම්, පොලිස් මූලස්ථානයෙන් පිහිටුවා ඇති, පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා වන දුරකථන අංකයයි. මුලදී ඊට ලබාදෙන ඇමතුම් සඳහා මිනිත්තු 20ක කාලයක් ඇතුළත ප්‍රතිචාර ලබාදුන්නද දැන් දිනකට ඇමතුම් 3,000කට අධික සංඛ්‍යාවක් ලැබෙන බැවින් වාහන දෙකක් සහිත ඒකකයට ඒවාට ප්‍රතිචාර දැක්විය නොහැක. ඔවුන් ප්‍රතිචාර දක්වන්නේ පැය 48ක පමණ ප්‍රමාදයක් ඇතිව ය.

පොලීසියට බැඳෙන අයට ලබාදෙන පුහුණුව පිළිබඳව එක් පොලිස් නිලධාරියෙක් අවධානය යොමු කළේය. එක හා සමාන මට්ටමේ නිලවල සිටින හමුදා නිලධාරියෙකුටත් පොලිස් නිලධාරියෙකුටත් ලබාදෙන පුහුණු එකිනෙකට බොහෝ වෙනස් ය. හමුදා නිලධාරියෙකුට වසර හතරක උපාධියකට සම මට්ටමේ පුහුණුවක් ලැබෙතත් පොලිස් නිලධාරීන්ට ලැබෙන්නේ වසරකටත් අඩු කාලයක පුහුණුවකි. තවද, පොලිස් පුහුණු පහසුකම් වසර ගණනාවකින් වැඩිදියුණු කර නොමැත. පොලිස් බලකායේ සිටින අතරේ පශ්චාත් උපාධි මට්ටමේ සුදුසුකම් ලබාගැනීම ද බෙහෙවින් දුෂ්කර ය. ඒ සඳහා පහසුවෙන් නිවාඩු යනාදිය ලබාගැනීමට නොහැකි ය. හමුදාවේ සම මට්ටමේ තනතුරු හා සසඳන විට පොලිස් නිලධාරීන්ට ගෙවන්නේ ඉතා අඩු වැටුපකි.

පොලීසිය මුහුණ දී සිටින ප්‍රශ්න සලකා බැලීමේ දී වත්මන් පොලිස් බලකායෙන් වැඩි ප්‍රතිශතයක් 1983 වර්ෂයෙන් පසුව, එනම් රට තුළ යුධ වාතාවරණයක්තිබූ කාලයේ බඳවාගත් අය වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් මරාගෙන මැරෙන බෝම්බකරුවන් සෙවීමට හා හඳුනාගැනීමටත්, අවදානම්පාත්‍ර ආර්ථික ඉලක්ක ආරක්ෂා කරන අන්දමත් පුහුණු වන්නට පොලිස් නිලධාරීන්ට සිදුව තිබේ. සිවිල් වැසියන් සම්බන්ධයෙන් ක්‍රියාකිරීම එකල අවශ්‍යතාවයක් වශයෙන් අවධාරණය නොකළ හෙයින් ඒ සම්බන්ධයෙන් බොහෝවිට පොලිසියට තිබුණේ අඩු ශක්‍යතාවයකි. ඔවුන් කළේ යුද වැදීමත් හමුදාවට සහාය දීමත් ය. පරමාදර්ශී වශයෙන්, රටක ජනතාව පොලීසියට බියවිය යුතු නැත. එහෙත් ශ්‍රී ලංකාවේ තත්වය එසේ නොවේ.

[54]මෙම පනත යටතේ ගැනෙන වරද සඳහා අත් අඩංගුවට ගන්නා පුද්ගලයින්ට ඇප ලබා නොදේ. ඒවා ඇප ලබා දිය නොහැකි වරද වේ.

අත් අඩංගුවට පත් වූ මවුලවිවරුන් දෙදෙනා සම්බන්ධ ගැටළුව පිළිබඳව අපි ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් දෙදෙනා සමග ම සඳහන් කළෙමු. ඉහත සඳහන් කළ පරිදි ඉන් එක් අයෙකුගේ පැහැදිලි අදහස වූයේ පල්ලියේ සිදුවූ විශේෂ කාර්ය බලකා මැදිහත්වීම තත්වය තවදුරටත් උග්‍රවීමට තිබූ ඉඩ පිළිබඳව ලැබුණු විශ්වාසනීය තොරතුරු මත පදනම් වී සිදුවූවක් බවයි.මුස්ලිම්වරුන් තමන්ගේ ආරක්ෂාව වෙනුවෙන් සංවිධානය වෙමින් සිටියා වියහැකි නමුත් පොලිසියේ කටයුතුවලදී අරමුණ වන්නේ ප්‍රචණ්ඩත්වයේ තියුණු බව අඩුකිරීම බැවින් ඒ කුමනපාර්ශවයද යන්න අදාළ නොවන බවක් යෝජනා විය. ඇතැම්විට තමන්ගේ ආරක්ෂාව වෙනුවෙන් හෝ, ඔවුන් අතේ පෙට්‍රල් බෝම්බ තිබීම මත පල්ලියේ මවුලවිවරුන් අත් අඩංගුවට ගැනීමත්, ෆාසිල් නම ඇති දෙදෙනා අත් අඩංගුවට ගැනීමත් සිදුවූ බව පවසන ලදී. එහිදී යුක්තිය උල්ලංඝනයවීමක් සිදුවීමේ වගකීම පොලිස් නිලධාරීන් භාර නොගත් අතර, ඔවුන් පැහැදිලිව ම ප්‍රකාශ කර සිටියේ නිලධාරීන් විශ්වාසනීය තොරතුරු මත ක්‍රියාකළ බවත්, පල්ලියේ සහ අත් අඩංගුවට ගත් පුද්ගලයින්සතුව අවි තිබූ බවට විශ්වාසකළ හැකි හේතු තිබූ බවත් ය. කෙසේ නමුත්,ජ්‍යෙෂ්ඨ නිලධාරියා පැවසුවේ තමන්ගේ රාජකාරිය ඉටුකිරීමේදී 'විශේෂ කාර්ය බලකායට නුසුදුසු අයුරින්' එම විශේෂ කාර්ය බලකා සාමාජිකයින් කටයුතු කර තිබීමට ඉඩ ඇති බවකි. විශේෂ කාර්ය බලකායේ අණදෙන නිලධාරියා විසින් එම මුස්ලිම් ප්‍රජාව වෙත සමාව ඉල්ලීමක් භාරදී ඇති බව අප වෙත පවසන ලදී.

සමාජයේ සදාචාරය සෑහෙන තරමකින් පිරිහී ඇති බව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනා ම පැවසූහ. ශ්‍රී ලංකා සමාජයේ බොහෝ දෙනා පශ්චාත්-කම්පන ආතතිය (PTSD) තත්වයෙන් පීඩා විඳින්නේ ය සහ විවෘත ආර්ථිකයෙන් ඇතිකළ වෙනස්කම් හේතුවෙන් රටේ ජනතාවට බලපෑම් ඇතිවී තිබෙන්නේ ය යන විශ්ලේෂණය එක් නිලධායෙකු විසින් ඉදිරිපත් කරන ලදී. දිගන සහ අලුත්ගම දී පොලීසියෙන් අඩුපාඩු සිදුවූ බවක් පොලිස් නිලධාරීන් දෙදෙනා ම පිළිගත් නමුත් මුස්ලිම්වරුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සඳහා පොලීසියේ සක්‍රිය සහායදීමක් නොමැති බව අවධාරණය කරන්නට දෙදෙනා ම වෙහෙසුනහ. සැබැවින්ම, පොලීසියට ක්‍රියාත්මක වන්නට සිදුවී ඇති අභියෝගාත්මක තත්ත්වය පිළිබඳව වඩාත් ගැඹුරින් අවබෝධ කරගත යුතු බවත්, ජනතාව අතරෙහි ජනවාර්ගික-ආගමික එදිරිවාදිකම් ඇතිවීම යන ගැටළුවට ආමන්ත්‍රණය කිරීම සඳහා රජයට වඩාත් පුළුල් සැලසුමක් අවශ්‍ය බවත් දෙදෙනා ම පැවසූහ.

අප හමුවීම සඳහාසහප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේදී පොලීසියේ හැසිරීම සම්බන්ධයෙන් සිදුකෙරෙන අභ්‍යන්තර විමර්ශනය මගින් සොයාගත් කරුණු පිළිබඳ දැනගැනීමට අපි උනන්දුවෙන් සිටිප්‍රශ්නවලට ආමන්ත්‍රණය කිරීම සඳහා එම නිධාරීන් සිය කාලය කැප කිරීමඅපි අගය කරන්නෙමු. පොලීසියට වඩාත් හොඳ පුහුණුවක් ලබාදීමේ සහ සුළුතර කණ්ඩායම් නියෝජනය කරමින් පොලිස් බලකායට බඳවාගැනීම් සිදු කිරීමේ දැඩි අවශ්‍යතාවයක් තිබෙන බව ද පැහැදිලි විය.

# 6 වැනි පරිච්ඡේදය

## ප්‍රචණ්ඩත්වයෙන් පසුව ඇතිවූ තත්වය තුළ ප්‍රදේශයේ බෞද්ධ භික්ෂූන්ගේ අදහස්

අප සමගින් කථා කළ සිංහල ජනතාව බොහෝදෙනා අතරෙහි මුස්ලිම් විරෝධී වාගාලංකාර පැතිරී ඇති අන්දම පිළිබඳව අපට බොහෝ සාක්ෂි හමු විය. ප්‍රචණ්ඩත්වය හෙළාදුටු සහ මුස්ලිම් ජනතාවගේ දුක්පීඩා කෙරෙහි සංවේදී වූ අය අතරෙහි පවා මෙම තත්වය එසේ විය. මුස්ලිම් ජනතාවගේ 'වෙනස' සහ 'සදෝෂත්වය' පිළිබඳව කථාකළආකාරයන්හිසමානත්වයක් ඇති බව අපගේ අවධානයට යොමු විය. මෙම සමානත්වයෙන් පෙන්නුම් කෙරුණේ සමාජයේ බොහෝ දෙනාතුළමුස්ලිම් ප්‍රජාව අත වරදක් ඇති බව සලකන්නා වූ සංවේදීතාවය සහ භාෂණය පිළිබඳ දැනීමක් තිබුණු බව සහ මුස්ලිම් ප්‍රජාව තර්ජනයක් ලෙස සලකන බවයි.

පහත දැක්වෙන්නේ බලපෑමට ලක් වූ ප්‍රදේශවල විවිධ විහාරස්ථාන වල භික්ෂූන්වහන්සේලා පස්දෙනෙකු සමගින් සිදුකළ සංවාදයන් තුළින් දැනගන්නට ලැබුණු කරුණු වේ. භික්ෂූන් වහන්සේ සියලුම දෙනා එක හඬින් ප්‍රචණ්ඩත්වය ප්‍රතික්ෂේප කළ අතර, එම සිදුවීම් පිළිබඳ කණගාටු වූහ. ඇතැම්හු ඒ පිළිබඳව දැඩි දොම්නස පළ කළ අතර, සිදුවූ දෝෂයන් සම්බන්ධයෙන් පුද්ගලික වගකීම භාරගත්හ. මෙම සිද්ධීන් සිදුවන විට එක් භික්ෂූන් වහන්සේ නමක් ගමේ සිට නැති අතර, තමන් විහාරස්ථානයේ සිටියේ නම් එම ගමේ මෙම සිද්ධි සිදු නොවන බව පැහැදිලි ලෙස ප්‍රකාශ කළහ. කොනකලගල රජමහා විහාරයේ විහාරස්ථානාධිපති හිමියන් වැනි අනෙකුත් අය, මෙම සිදුවීම්අන් අයගේ වරදින් සිදුවූ බව නැවත නැවතත් කියා සිටියහ. ඇතැම් භික්ෂූන් පීඩාවට ලක්වූ මුස්ලිම් ජනතාවට රැකවරණ සලසා තිබේ. ඔවුන් කියා සිටි එම කරුණු කිසිවක් සැක කිරීමට අපට කිසිදු හේතුවක් නොතිබුණි. කෙසේ නමුත්, තම දායකයින් ඔවුන්ගේ මුස්ලිම් අසල්වාසීන්ව අවබෝධ කරගැනීම සඳහා යොදාගන්නා බවක් පෙනේනට තිබූ මුස්ලිම් විරෝධී වාගාලංකාරය කොතෙක් දුරට නිවැරදි දැයි එම භික්ෂූන්වහන්සේලා කිසිවෙක් ප්‍රශ්න කළේ නැත. එසේම, එම සියලු දෙනා ප්‍රශ්න කිරීමකින් තොරව මුස්ලිම් සදෝෂත්වය පිළිබඳ වෘත්තාන්තය පිළිගෙන තිබුණි. මුස්ලිම්වරුන්ට එරෙහිව සිදුවූ ප්‍රචණ්ඩත්වය සඳහා වරද ඇත්තේ මුස්ලිම්වරු අත යැයි දක්නා ලදී. මුස්ලිම්වරුන් ඉලක්ක බවට පත් වීමට හේතුව වූඔවුන්ගේහැසිරීම්වල පිළිගතනොහැකි ස්වභාවය පහත දැක්වෙන පරිදි විස්තර කරන ලදී:

- මුස්ලිම් පුද්ගලයින් සංවිධානය වී ඉඩම් මිලදී ගන්නා අතර නගරයේ ඉඩම් මිල බලෙන් ඉහළ නංවයි.
- මුහුණු ආවරණ (නිකාබ්) පැළඳීම 'විදේශ' සහ දුරස්ථභාවය ඇතිකරවන පිළිවෙතක් වශයෙන් සලකනු ලැබීය. මෙම පිළිවෙත අනුගමනය කිරීමට ඇති අවශ්‍යතාවය ගැන මුස්ලිම් ජනතාව නැවතවරක් සිතා බැලිය යුතු ය.කලින් පරම්පරාවල කතුන් සාරියෙන් තම හිස ආවරණය කළ අතර මෙම මුහුණු ආවරණ සවුදි අරාබියෙන් මෙරටට ගෙන ආ අදහසකි.
- මුස්ලිම් ජනතාවට ඔවුන්ගේ ම දේශපාලන පක්ෂ තිබේ. ජනවර්ගය අනුව වෙන් වූ දේශපාලන පක්ෂ නොතිබිය යුතු ය. ජාතික පක්ෂ පමණක් තිබිය යුතු ය.
- මුස්ලිම් ජනතාවට ඔවුන්ගේ ම නීති තිබේ. එක් ප්‍රජාවක ළමා අපයෝජන වශයෙන් සලකන දෑ තවත් ප්‍රජාවක 'සංස්කෘතිය' වේ (මුස්ලිම් විවාහ නීති පිළිබඳව විශේෂයෙන් සඳහන් කරමින් මෙම තර්කය ගෙන එන ලදී).
- සිංහල කථාකළ හැකි අවස්ථාවල පවා මුස්ලිම් ජනතාව තමන්ගේ භාෂාව භාවිතා කරති. සිංහල අය සිටින තැන පවා ඔවුනොවුන් අතරේ කථාබහ කිරීමට ඔවුන්ගේ භාෂාව යොදාගනිති.
- තමන්ගේ ම පාසල් විවෘත කිරීමෙන් මුස්ලිම් ජනතාව තමන්ව සිංහල ප්‍රජාවෙන් දුරස්ථ කරගනිති.
- මුස්ලිම් අය තම ආගම පමණට වඩා වැඩියෙන් අවධාරණය කරති.

- වඳපෙති භාවිතා කිරීම ව්‍යාප්ත වන අතර වඳපෙති සහිත ආහාර විකුණා හසුවූ මුස්ලිම්වරුවන්ටඅයත් ආපනශාලා ගැන බොහෝ කථා තිබේ.
- ඕනෑම අයෙකුට ක්‍රිස්තියානි දේවස්ථානයකට හෝ පන්සලකට ඇතුළු වියහැකි වුවත් මුස්ලිම් නොවන අයට මුස්ලිම් පල්ලිවලට ඇතුළුවීම තහනම් ය.
- මුස්ලිම් ඇමතිවරු අපේ ජාතික උරුමය විනාශ කරති; විල්පත්තුව විනාශ කිරීම සහ පුරාවිද්‍යා වස්තූන් කෙලෙසීම සිදුකරති.
- වත්මන් සමාජය තුළ ආගමට හැරෙන්නේ නැතිව විවාහවීමේ හැකියාව තිබිය යුතු ය. මුස්ලිම් අයෙක් හා විවාහ වන්නේ නම් ඉස්ලාම් ආගමට හැරිය යුතු ය.
- මුස්ලිම් මූලධර්මවාදීන් (අකුරණ) විසින් මුස්ලිම් පුද්ගලයින් සිංහල කඩවලට යාම වලක්වති.
- මුස්ලිම් අය ජීවත්වන්නේ ඔවුන්ට වඩා වෙනත් කිසිවකු වැදගත් නොවන්නාක් මෙනි.
- ඓතිහාසිකව මුස්ලිම් ජනතාව (මුලින්ම ශ්‍රී ලංකාවට පැමිණි විට) දෙමළ භාෂාව වෙනුවට සිංහල භාෂාව කථා කරන්නට පටන් ගෙන තිබුණේ නම් ප්‍රශ්න ඇති නොවේ.
- කලින් සිටි මුස්ලිම් පුද්ගලයෝ සිංහල ජනතාව හොඳින් හැඳින සිටි අතර වෙනස් ආකාරයකට ඇඳ පැළඳ සිටියහ. ඔවුහු ඉතා හොඳ අය වූහ.

භික්ෂූන් කිහිපදෙනෙක් ප්‍රචණ්ඩත්වයෙන් විමතියට පත් වී ඇති බවක් පෙනුණු අතර ප්‍රචණ්ඩත්වය සඳහා වූ යොමුවීම මීට වඩා හොඳින් පාලනය කරගත යුතුව තිබුණේ යැයි ඒ පිළිබඳව කණගාටු වූහ. නැවතත් මෙවැනි විනාශයක් සිදුවීම වළක්වාගැනීමට නම්, මුස්ලිම් ජනතාව ඉහත සඳහන් කළ ගැටළු වලට ආමන්ත්‍රණය කළයුතුව ඇති බව එක් හිමිනමක් පැවසූහ.

දිගන, තෙල්දෙණිය සහ අකුරණ භික්ෂූන්වහන්සේලා පස් දෙනාම, ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් අත් අඩංගුවට ගත් සහ ඇදිරි නීතිය උල්ලංඝනය කිරීමේ චෝදනා මත රඳවාගත් පුද්ගලයින් පිළිබඳව සඳහන් කළහ. 'ඒ අයගේ පවුල් දුක් විඳිනවා, ළමයින්ගේ පාසල් ගමනට බලපානවා'යනුවෙන් අප වෙත පවසන ලදී. මේ වරදකරුවන් බොහෝදෙනෙක් ගිනිතැබීම් සහ කොල්ලකෑම් සඳහා සහාය දී ඇත්තේ 'ඒ අය තරුණයින්, ඒ අයට වැටහීමක් නැහැ, සිද්ධ වෙන්නේ මොනවාදැයි බැලීමට ඕනැවෙලා තියනවා, ඒ අය බීමතින් ඉඳලා තියෙන්නේ' යනාදී හේතු මත බව පවසන ලදී. එවැනි ක්‍රියා කළහොත් තමන්ට ලැබෙන ප්‍රතිවිපාක මොනවාදැයි පුද්ගලයින්ව කලින්ම දැනුවත් කරන වැඩසටහන් පැවැත්විය යුතු බව එක් හිමිනමක් යෝජනා කළේ ය. ඇතැම් අයට වැරදි සහගත ලෙස චෝදනා එල්ල වී ඇති බව ද අපට පවසන ලදී.

භික්ෂූන්වහන්සේලාගෙන් වැඩි දෙනෙක් චූදිතයින්ට එරෙහිව ඇති චෝදනා අත්හැරදමන මෙන් ඉල්ලා ඒ වෙනුවෙන් ද කථා කළහ. චූදිතයෙකු එම වැරදි වලින් නිදහස් කර ගත හැකි අන්දමේ ලිපියක් ලබා දීම දිගන ප්‍රධාන පල්ලිය විසින් ප්‍රතික්ෂේප කළ අවස්ථාවේ ප්‍රතිසන්ධානය සහ නැවතත් හොඳ සබඳතාවයක් ඇති කරගැනීමට තිබූ අවස්ථාවක් දිගන ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවට අහිමි වී ගිය බව අප වෙත පවසන ලදී. අදාළ පුද්ගලයා මුස්ලිම් ජනතාවට එරෙහි ප්‍රහාරවලදී ප්‍රධාන භූමිකාවක් නියෝජනය කළ බවත් එම පුද්ගලයා රඳවා තබා ඇත්තේ ඇසින් දුටු සාක්ෂිකරුවන් ලබාදුන් තොරතුරු මත බවත් මුස්ලිම් ප්‍රජා සාමජිකයින් විසින් තරයේ කියාසිට තිබේ. පීඩාවට පත් වූ බොහෝ ප්‍රදේශවල මුස්ලිම් ප්‍රජාවන් මත මීට සමාන පීඩනයක් එල්ල කෙරෙන බව අපට අසන්නට ලැබී තිබුණි. මෙම අත් අඩංගුවට ගැනීම් සහ මාස ගණනක් යනතෙක් ඇප ලබාගත නොහැකිවීම ඔස්සේ අනාගතයේ සිදුවිය හැකි විනාශයන් සඳහා මාර්ග සැලසෙන බව භික්ෂූන්වහන්සේලා පැවසූහ. මේ කාරණය 'විසඳගැනීම' සඳහා මාර්ගයක් සොයාගැනීමට කටයුතු නොකිරීම පිළිබඳව මුස්ලිම්වරුන් වගකිවයුතු යැයි ඔවුහු සිතති.

දිගන සහ තෙල්දෙණියේ වරදකරුවන් අත් අඩංගුවට ගැනීමට රජය යොදගත්තේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනතෙහි විධිවිධාන යි. බොහෝදෙනා දීර්ඝ කාලයක් සිරභාරයේ පසුවූහ. මෙය, චූදිතයින් අයත් වූ ප්‍රජාවන්හි සාමාජිකයින්ට බෙහෙවින් ආතතිකාරී තත්වයක් විය. මෙවැනි කටයුතු සම්බන්ධයෙන් පොලීසියට ඇති ඉතිහාසය සලකා බලන කල, ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ නොවූ සහ එම ස්ථානවල බලාසිටි පිරිස් ද අත් අඩංගුවට ගෙන

තිබෙන්නට ඉඩ ඇත. එබැවින්, තමන්ගේ ප්‍රජාවන්හි සාමාජිකයින් සම්බන්ධයෙන් භික්ෂූන්වහන්සේලා දක්වන සැලකිලිමත්භාවය අවබෝධ කරගත හැකිය.

සිදුවීම් මගින් මුස්ලිම් ජනතාවට ඇති වූ බලපෑම පිළිබඳව සඳහන් නොකර භික්ෂූන්වහන්සේලා චූදිතයින්ටබලපා ඇති හානිය පිළිබඳව දිගින් දිගටම කථා කරන්නට යොමුවීමෙන් සිංහල බෞද්ධ සඳහුම් රාමුව තුළ මුස්ලිම් ජනතාවට ලැබී ඇති ස්ථානය පෙන්නුම් කරයි.මුස්ලිම් වින්දිතයින් අත්විඳි ප්‍රචණ්ඩත්වය සහ විනාශය ඒවා සිදු කළ අයට දඬුවම් ලබාදීමට තරම් බරපතල වූ අපරාධ වශයෙන් බොහෝදෙනෙකු නොදකින ලදී.

තමන්ගේ ගම්මානයේ ප්‍රචණ්ඩත්වය ඇතිවීම වළක්වා ගැනීමට හැකි වූයේ තෙල්දෙණියේ පේරකැටිය විහාරයේ පූජ්‍ය කීනපැලැස්සේ උපාලි ඥානිස්සර හිමියන්ට ය. මියගිය කුමාරසිංහගේ ගම්මානයේ ප්‍රචණ්ඩත්වය ඇති නොවන බවට සහතික කරගැනීම සඳහා උන්වහන්සේ ඉටු කළ කළකාර්ය භාරය සියළු පාර්ශවයන්ගේ පැසසුමට ලක් විය. උන්වහන්සේ ප්‍රචණ්ඩත්වය සිදු නොවන බව සහතික කරගැනීමට පැවැත්වූ රැස්වීමට සහභාගි වූවා පමණක් නොව, එම ප්‍රදේශයේ කලහකාරීන් විසින් ප්‍රහාර එල්ල කිරීම නැවැත්වීම සඳහා ශාරීරිකව ද මැදිගත්වී කටයුතු කළහ. තමන්ගේ එම ක්‍රියාකලාපය තවදුරටත් ඉදිරියට ගෙන යාම සඳහා රජය සහ බලධාරීන් විසින් තමන්ට තවදුරටත් හැකියාව ලබාදෙන්නේ නම් සුදුසු බව පූජ්‍ය උපාලි ඥානිස්සර හිමියන් ප්‍රකාශ කළහ. හුදෙක් උන්වහන්සේට පුද්ගලිකව විවිධ උපහාර පැවැත්වීමෙන් නොව, එම ප්‍රදේශයට වඩාත් හොඳ පහසුකම් හා සේවාවන්, උදාහරණ ලෙස වඩාත් හොඳ මාර්ග වැනි පහසුකම් ලබාදීම, ප්‍රහාරයක් එල්ල කිරීම සඳහා පිරිස් එක් රැස්වෙමින් සිටි ස්ථානයට යාමට (එම ප්‍රහාරය වළක්වාගැනීමට උන්වහන්සේට හැකිවිය)උන්වහන්සේටත්‍රිරෝද රථයක් සපයා දෙමින් උදව් කළ තරුණයින් දෙදෙනාට වඩාත් හොඳ රැකියා සොයාදීම යනාදිය ඔස්සේ උන්වහන්සේ දේශනා කරන අවිහිංසාවාදී ආචාරධර්මීය ස්ථාවරය සඳහා වඩාත් වැඩි පිළිගැනීමක් ලබාදීම අවශ්‍ය වන බව උන්වහන්සේ පැවසූහ.පොදුවේ ප්‍රජාව තුළ උන්වහන්සේ කළ ක්‍රියාවට ලැබෙන පිළිගැනීම ඔස්සේ සාධනීය ප්‍රතිඵල අත්කරගැනීමට උන්වහන්සේට වුවමනා විය. නගරයේ පුද්ගලයින් මෙම සිදුවීමේදී නිරූපණය කළ භූමිකාව අගයනු වස් රජයේ නිලධාරීන් පැමිණ අගය කිරීම් වැනිදෑ කළ හැකි බව හිමිනම යෝජනා කළේය. තරුණ පිරිස්වලට තම හැඟීම් වලට වහල්වී මුස්ලිම් ජනතාවට පහර දෙන්නට ඉඩ නොදිය යුතු ය යන තමන්ගේ ස්ථාවරය අනුමත කරන්නේ සුළු පිරිසක් වන බැවින් පොදුවේ ප්‍රජාව තුළ මෙම මතය ප්‍රචලිත කිරීම සඳහා එවැනිදේ කිරීම අවශ්‍ය බව හිමිනමගේ අදහස විය. එසේ නොකළහොත් තම වැඩකටයුතු ඉදිරියට කරගෙන යාම දුෂ්කර වනු ඇතැයි එම හිමියන් ගේ අදහස විය.

# 7 වැනි පරිච්ඡේදය

# සහන ක්‍රියාමාර්ග[55]

මහනුවර මහා පල්ලියේ ප්‍රහාර ඇතිවී මුල් දින දෙකෙන් පසුව මාර්තු 7වැනි ද මහජනයා සඳහා රැස්වීමක් පැවැත්වුණි. හානි වූ නිවාස හමුදාවෙන් නැවත ඉදිකරනු ඇතැයි හමුදා නියෝජිතයා රැස්ව සිටි පිරිසට පවසා තිබේ (අලුත්ගම සිදුවීමෙන් පසු මෙසේ සිදුකරන ලදී). කෙසේ නමුත්, පසුව මෙම පොරොන්දුව ඉෂ්ට වූයේ නැත. නැවත ඉදිකිරීම් සඳහා පොරොන්දු වූ, සහ මහනුවර පල්ලි කමිටු සාමාජිකයින් සඳහන් කරන අන්දමට, ප්‍රජාව සමගින් හොඳ සම්බන්ධතාවයක් තිබූ එම නිලධාරියාව දිස්ත්‍රික්කයෙන් පිටතට මාරුකර තිබේ.

අලුත්ගම ප්‍රචණ්ඩත්වයෙන් පසුව සිදුකළාක් මෙන් විනාශවූ නිවෙස් යළි ඉදිකිරීම සඳහා හමුදාව සම්බන්ධ කරගනු නොලැබුව ද, සෑහෙන ප්‍රමාද වී හෝ, අදාළ පුද්ගලයින්ට ආණ්ඩුවෙන් වන්දි ලබාදෙන ලදී. එම වන්දි ගෙවීම්, පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියසහ ආරක්ෂක අමාත්‍යාංශය වැනි විවිධ අධිකාරී වල විෂයපථය යටතේ සිදුවිය. ඊට සමගාමීව, මුස්ලිම් ප්‍රජාව තුළ පුද්ගලයින් සහ කණ්ඩායම් ද ඒකරාශී වී නිවාස හා පල්ලි නැවත ඉදිකිරීම සඳහා මුදල්මය වශයෙන් දායකත්වය ලබා දෙන ලදී. නිලධාරීවාදයකින් හෝ ප්‍රමාදයකින් තොරව සිදුවූ හෙයින් සහ ප්‍රචණ්ඩත්වය නැවතී මාසයක් පමණ ගතවනවිට නැවතත් සාමාන්‍ය දිවිපෙවෙතක් ආරම්භ කරන්නට ඇතැම් පවුල්වලට ඉඩකඩ සැලසුනු හෙයින් ඉහත කී දෙවැනි උපකාර ක්‍රමය බොහෝදෙනා විසින් අගය කරන ලදී.

**පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය හරහා වන්දි ලබාදීම**

මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රහාරවලින් මාස පහකට පසුව ද, දේපළ අහිමි වූ හෝ හානියට පත් වූ බොහෝදෙනාට රජයෙන් පොරොන්දු වූ වන්දි ලැබී තිබුණේ නැත. පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියෙහි මූලාශ්‍රවලින් දැනගන්නට ලැබුණු අන්දමට මෙම ප්‍රමාදයට සම්පූර්ණයෙන් ම හේතු වී ඇත්තේ 2018 ජුනි 11වැනි දින ඇරඹී දින 16ක් තිස්සේ දිවයින පුරා පැවති තැපැල් වැඩවර්ජනයයි. එම වැඩ වර්ජනය හේතුවෙන් පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියවෙත තැපෑලෙන් එවූ වන්දි හිමිකම් පෑම් ලැබී නැත.

එකල පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියෙහිසභාපති වූ ඊ. අන්නාලිංගම් මෙසේ කීවේය: 'සිද්ධි 280ක විතර (චෙක්පත්) අපි කච්චේරියේ ශ්‍රවණාගාරයේදී පුද්ගලිකවම බෙදදුන්නා. මම පුද්ගලිකවම එහි ගිහින් ඒවා බෙදදුන්නා. තැපෑලෙන් යැවූ ඒවා සම්බන්ධයෙන් වැඩවර්ජනය නිසා ප්‍රමාදයක් තිබුණා. දැන් ඒක විසඳමින් තියෙන්නේ. පුද්ගලිකවම චෙක්පත් දුන් ප්‍රමාණය (රු.) මිලියන 8.2ක්. ඒ (2018) මාර්තු 19 වැනිදයි. ඊට පස්සේ (2018) අප්‍රේල් මාසයේත් දෙවැනිවරට එහෙම කළා.' ඇතැම් ව්‍යාපාර හිමිකරුවන් රක්ෂණ ආයතනවලට හිමිකම්පෑම් ඉදිරිපත් කර තිබූ අතර පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියෙහිනියමයන්ට අනුව එවිට ඔවුන් රජයේ වන්දි සඳහා සුදුසුකම් නොලබන බව ඔහු තවදුරටත් පැවසීය.

2018 ජූලි මාසය වන විට පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියවෙත හිමිකම්පෑම් 633 ක් ඉදිරිපත් කර තිබුණි. හානි වූ නිවාස 335ක්, කඩ සාප්පු 233ක්, වාහන 83ක්, පල්ලි 20ක්, සහ පන්සල් 2ක් ඊට ඇතුළත් විය. මේ සඳහා අනුගමනය කළයුතු කාර්යපටිපාටිය අනුව, බලපෑමට ලක් වූ පුද්ගලයා මුලින්ම ප්‍රාදේශීය ලේකම් වෙත සහ දිස්ත්‍රික් ලේකම් වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ යුතු ය. එමඅධිකාරිය විසින් වන්දි ලබාදෙන්නේ ප්‍රාදේශීය ලේකම් සහ

[55] මෙම පරිච්ඡේදය සඳහා පර්යේෂණ සිදු කිරීම සහ පරිච්ඡේදය ලිවීම මෙගාරා ටීගල් විසින් සිදු කරන ලදී.

දිස්ත්‍රික් ලේකම් විසින් සිදුකරනු ලබන තක්සේරු අනුව ය. කෙසේ නමුත්, මහනුවර සිදුවීමේ දී ප්‍රාදේශීය ලේකම්වරුන්, තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුකරුවන්, පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියෙහිනිලධාරීන් සහ අමාත්‍යාංශ නියෝජිතයකුගෙන් සමන්විත විශේෂ කමිටුවක් ඒ සඳහා ස්ථාපිත කරන ලදී.ගෙවිය හැකි වන්දි මුදල් ප්‍රමාණය තීරණය කිරීම සඳහා මෙම කමිටු බලපෑමට ලක් වූ පුද්ගලයින් සමගින් රැස්වීම් පවත්වන ලදී. පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය ප්‍රමාදවීම් වලට විරුද්ධ බව පැවසූ අන්නාලිංගම්, ප්‍රචණ්ඩත්වය අවසන් වූ වහාම අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ විසින් රැස්වීමක් කැඳවූ බවත්, ක්ෂණිකව ඇති වී තිබෙනපීඩාවන් අවම කිරීමේ අරමුණින් දිස්ත්‍රික් ලේකම් විසින් ලබා දෙන ලද ලැයිස්තුවක් මත පමණක් පදනම් වෙමින්, වෙනත් කිසිදු ලියලිවිල්ලක් නොමැතිව 120දෙනෙකුට අත්තිකාරම් මුදල් ලබාදීමට තීරණය කළ බව සඳහන් කළේ ය. 'පසුව අපි ඔවුන්ට අදාල අකෘති පත්‍ර පුරවා නිල ක්‍රියාවලිය සම්පූර්ණ කරගන්න උදව් කළා' යනුවෙන් ඔහු පැවසීය.

පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියෙහිවාර්තා අනුව, ප්‍රහාර සිදුවී මාස 5ක් ඇතුළත වන්දි ලැබූ, හානි වූ නිවාස සංඛ්‍යාව 249ක් වන අතර ගෙවන ලද මුදල රු. මිලියන 10.4 කි. කඩ සාප්පු 126ක් සඳහා එකතුව රුපියල් මිලියන 5.46ක් වූ මුදලක් වන්දි ලෙස ලබා තිබේ. වාහන හානි වෙනුවෙන් රුපියල් මිලියන 2.46ක් ගෙවා තිබේ. ඒ අනුව මාස 5ක් තුළපුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය විසින් ලබා දෙන ලද මුළු වන්දි මුදල රුපියල් මිලියන 18.32කි. කෙසේ නමුත් රු. 500,000ට වැඩි වන්දි සඳහා වූ ක්‍රියාවලිය ඊට වඩා දීර්ඝ විය. බලපෑමට ලක් වූවන්ට වැඩියෙන් වන්දි ගෙවීම වැළැක්වීම සඳහා වන්දි ගෙවීම් කරන අනෙකුත් රජයේ ආයතන සමගින් පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය සම්බන්ධීකරණය කළයුතු විය. අධිකාරියමුහුණ දුන් තවත් ගැටළුවක් වූයේ පල්ලිවලට වන්දි ගෙවීමේදී ඇතිවූ පැටලිලි සහිත තත්වයයි. ඇතැම් අවස්ථාවල එක් පල්ලියක් යටතේ තවත් උප පල්ලි කිහිපයක් තිබේ. කෙසේ නමුත්, 2018 ජූලි මාසය වන විට මුස්ලිම් සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂවරයා මෙම ගැටළුවට ආමන්ත්‍රණය කළ අතර, එම එක් එක් ආයතනයට වන්දි ලබාගැනීම සඳහා ලිපිය බැගින් නිකුත් කරන ලදී. හානි වූ පල්ලි 20ක් පිළිබඳව පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියේවාර්තාවල සඳහන් වන අතර ඉන් 19ක් සඳහා වන්දි ඉල්ලුම් කර තිබේ. එම 19 සඳහා රු. 640,000ක් ගෙවා ඇත.

ප්‍රහාරවලින් වසරකුත් මාස 7ක් ගත වූ පසුඑම අධිකාරිය සඳහන් කළේ සියලු ම හිමිකම්පෑම්වලින් සියයට අනුවක් (90%) ආවරණය කර ඇති බවයි. ඉතිරි වී ඇති සියයටදහය (10%) වන්නේ කමිටු වාර්තාව ලැබෙන තෙක් බලා සිටින, විශාල හිමිකම්පෑම් 16කි. අවශ්‍ය කරන නිවැරදි වන්දි මුදල් පිළිබඳ අධිකාරිය දැනුවත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් මෙම කමිටුව ස්ථාපිත කරන ලද අතර සිදුවූ ප්‍රමාදයන් හේතුවෙන් එම ක්‍රියාවලිය දික්ගැස්සී තිබේ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි වාර්තාවේ[56] සඳහන් වන අන්දමට, ගෙවන මුදල තිරණය කරන්නේ හා අනුමත කරන්නේ අමාත්‍ය මණ්ඩලයෙන් වූ බැවින් පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියවිසින් වින්දිතයින්ට වන්දි ගෙවීමේදී විෂමතා ඇති වී තිබේ. උදාහරණ වශයෙන් එම වාර්තාවේ මෙසේ දැක්වේ: 'අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ප්‍රකාරව, අළුත්ගම කෝලාහලවලදී දිවි අහිමි වූ අයගේ පවුල්වලට රුපියල් මිලියන 2 බැගින් වන්දි ගෙවන ලදී. එහෙත් මෑතකදී මහනුවර-දිගන ජනවාර්ගික-ආගමික ප්‍රචණ්ඩත්වය හේතුවෙන් දිවි අහිමි වූ අයගේ පවුල්වලට අමාත්‍ය මණ්ඩලයෙන් අනුමත කර තිබුණේ රු. 500,000ක් පමණි. තත්කාර්ය අන්දමින් අනුමැතිය ලබාදුන් මෙම වන්දි හා සසඳන කල පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියේවිධිමත්යෝජනාක්‍රමය යටතේ වින්දිතයින්ට ලබාදී ඇත්තේ සාපේක්ෂ වශයෙන් අඩු වන්දි මුදල් වේ. උදාහරණ වශයෙන්, ඉහත සඳහන් කළ පරිදි 'මහජනතාවගේ වඩාත් ම බලපෑමට ලක්වූ පුද්ගලයින් සඳහා වන වන්දි යෝජනා ක්‍රමය' යටතේ යුද්ධයෙන් පීඩාවට පත්වූ අයට ගෙවන ලද්දේ එක් මරණයක් සඳහා රු. 100,000ක් පමණි.'මෙම

[56]Bhavani Fonseka, "Making a Case for an Office for Reparations", 2018, pp 21-22. Centre for Policy Alternatives. Available at https://www.cpalanka.org/wp-content/uploads/2018/06/Reparations-report-FINAL.pdf [Accessed 25/10/19]

අධිකාරියේ වන්දි යෝජනා ක්‍රම කාලයට ගැළපෙන සේ යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය මෙයින් පෙන්නුම් කරයි. බොහෝ චක්‍රලේඛ 1980 දශකයේ නිකුත් කළ ඒවා වන අතර ගතවූ දශක තුන තුළඒවා සංශෝධනය වී නැත.ප්‍රචණ්ඩත්වයෙන් බලපෑමට පත්වූවන්ට වන්දි ගෙවීම සඳහා අධිකාරිය සතුව ප්‍රමාණවත් අරමුදල් නොමැති බව ද අතීතයේ සිදුවූ විවිධ ප්‍රහාරවල වින්දිතයින් සඳහා වන්දි ගෙවීමේ කටයුතු තවමත් සිදුවෙමින් පවතින බව ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ වාර්තාවේ සඳහන් වේ. මෙයින් පෙන්නුම් කෙරෙන්නේ, මේ වනවිට වාර්ෂිකව පාහේ සිදුවන මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩත්වය සඳහා වන්දි මුදල් දැරීමට තරම් ශ්‍රී ලංකාවට අරමුදල් නොමැති බවකි.ජනවාර්ගික හෝ ආගමික කලබලවල ප්‍රතිඵලයක් ලෙස ඇතිවන කෝලාහල හෝ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් සහන සැලසීම හා වන්දි ගෙවීම සඳහා සම්බන්ධවන අනෙකුත් රජයේ ආයතන අතරට ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා ඊට සම්බන්ධ ආයතන, ආරක්ෂක අමාත්‍යාංශය මෙන්ම බුද්ධ ශාසන අමාත්‍යාංශය, තැපැල් හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය සහ පුනරුත්ථාපන හා නැවත පදිංචිකිරීම් අමාත්‍යාංශය ඇතුළත් වේ.[57] ඩේලි මිරර් පුවත්පතට අනුව, ඉහත කී ආයතන සම්බන්ධ කරගෙන හානි වූ දේපළ මාස හතරක් තුළ පුනරුත්ථාපනය කිරීමේ තීරණය ගෙන ඇත්තේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ විසින් ලබාදුන් නියෝග අනුවයි.[58]2019 මැයි මාසයේ දී පළ වූ එම ලිපියේ සඳහන් වන අන්දමට 2018 මහනුවර දිස්ත්‍රික්කයේ මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් වූ ඇතැම් අයට ඒ වනවිටත් වන්දි ලැබී නොතිබුණි. ලිපිය ප්‍රකාශයට පත් කරනවිට දේපළ හානි සඳහා රු. 178,000,000ක් ද, හානි වූ පල්ලි සඳහා රු.200,000ක් ද ගෙවීමට නියමිත බව එහි සඳහන් විය (කරුණාකර මෙම වාර්තාවේ ඇති ප්‍රචණ්ඩත්වයේ ආර්ථික විද්‍යාව කොටස බලන්න).

තමන්ගේ සිල්ලර කඩය අහිමි වී ගිය එක් වින්දිතයෙක් 2019 මැයි මාසයේ දී GroundViewsනැමති පුවත් වෙබ් අඩවිය සමගින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවක දී මෙසේ තම අත්දැකීම් බෙදාහදාගෙන තිබුණි: 'පීඩාවට ලක් වූ අයට ගෙවිය යුතු මුලු වන්දි මුදල් ලැබී නොතිබුණු අතර නිලධාරීවාදී පැටලිල්ලක එය සැඟවී ගොස් තිබුණි. එමෙන් ම, පල්ලිය නැවත ඉදිකිරීම සඳහා ගොඩනැගිලි බලපත්‍රයක් ගැනීමේදී අනුගමනය කරන්නට සිදුව ඇති පැටලුම්සහගත ක්‍රියාවලිය පිළිබඳව ද ඔහු කථා කළේ ය. සිවිල් සමාජය පසු ගියවසරේ නිකුත් කළ ප්‍රකාශයක මෙසේ සඳහන් වී තිබුණි 'වන්දි ගෙවීම පරිවර්තනීය කාර්යයක් වීම සඳහා එය කඩිනම්, කාර්යක්ෂම සහ අන්තර්කරණය වූවිනිවිදභාවයෙන් යුතුක්‍රියාවලියක් විය යුතු ය.''[59]

ප්‍රචණ්ඩ කලහකාරීන් විසින් ගිනි තබන ලද සිය නිවසේ සිරවී මියගිය 27 හැවිරිදි අබ්දුල් බාසිත් සම්සුදීන් ගේ සිරුර ප්‍රචණ්ඩත්වය නිමා වූ වහාම රජයෙන් ලබාදුන් අරමුදල්වල උපකාරයෙන් භූමදානය කරන ලදී. එහෙත් ඔහුගේ පවුලට ඔවුන්ගේ නිවස සහ පියාගේ කඩය නැවත ඉදිකරගැනීම සඳහා රජයෙන් ලබාදීමට පොරොන්දු වූ වන්දි මුදල් ලැබී නැත. එම සම්සුදීන් පවුල සමගින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවකින් පසුව 'සන්ඩේ ඔබ්සවර්' පුවත්පත 2019 මාර්තු 29වැනි දින මෙසේ හෙළි කර තිබුණි: 'සම්සුදීන් (අබ්දුල් බාසිත් ගේ පියා) වෙත රජයෙන් රු. 150,000ක් වන්දි වශයෙන් ගෙවා තිබුණ ද, විනාශ වී තිබූ තම නිවසත් කඩයත් නැවත ඉදිකිරීම සඳහා ඔහුට රුපියල් මිලියන 3ක් ඉක්මවා වියදම් කරන්නට වී තිබුණි. ෆසාල් (බාසිත් ගේ වැඩිමල් සහෝදරයා) පැවසුවේ පසු ගිය වසරේ කෝලාහලවලින් පසුව ඔවුන්ට නැවත ඉදිකිරීම් සඳහා සහාය ලබා දුන්නේ පල්ලියෙන් බවයි. 'අපට දැනුණු පීඩනය වෙනසක් නොවී ඒ විදියටම දැනුණා. ආණ්ඩුවෙන් ලැබුණේ ගෙදරට රු. 50,000කුත් කඩයට රු.100,000කුත් විතරයි. එය මූලික ගෙවීමක් පමණක් බවත් අපට පස්සේ තවත් මුදල් ලැබෙන බවත් ඒ අය කිවුවා. ඒත් ඒ මුල් ගෙවීමෙන් පස්සේ අපට කිසිම මුදලක් ලැබුණේ නැහැ. සමාජ වගකීම් කටයුතුසඳහා මුස්ලිම් හැම කෙනෙක්ම තමන්ගේ වාර්ෂික ලාභයෙන් සියයට

[57]Piyumi Fonseka,. "Anti-Muslim Attacks: Process of Compensation Causes Trickle of Unease", Daily *Mirror,* 2019 *http://www.dailymirror.lk/news-features/Anti-Muslim-attacks%3A-Process-of-compensation-causes-trickle-ofunease/131-168220*[ප්‍රවේශය25/10/19]

[58] එම

[59]Amalini. De Sayrah, "Digana: One Year On", *GroundViews,* 2019. *https://groundviews.org/2019/03/05/digana-one-year-on/* [ප්‍රවේශය25/10/2019]

2.5ක් ගෙවන අරමුදලක් අපේ පල්ලියේ තියෙනවා. පල්ලියේ ඒ මූල්‍ය ආධාරය ලැබුණේ නැතිනම් අපිට ඉන්න තැනක් නැතිවෙන්න තිබුණා.' ඔහු කීවේය.'[60]

වන්දි මුදල් සඳහා රු.මි. 205ක් වෙන්කර ඇති බව 2018 අගෝස්තු මාසයේ දී අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ පැවසීය. 'ඒ මුදලට මොකක් වුණාද කියලා අපි දන්නේ නෑ. ආණ්ඩුව අපේ ප්‍රජාවට උදව් කළයුතුව තිබුණා. අපේ සමාජයට ඒ ගැන විශ්වාසය නැතිවෙමිනුයි යන්නේ' ඔහු කීවේ ය. සන්ඩේ ඔබ්සවර් පුවත් පතේ එම ලිපියේ ම මුස්ලිම් තරුණයින්ගේ පහරදීමෙන් මියගිය ලොරි රියැදුරාගේ බිරිඳ වන තිලකා පද්මසිරි සමගින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවක් ද ඇතුළත් කර තිබුණි. ඇගේ නිවස නැවත ගොඩගා ගැනීම සඳහා මුදල් හා උපකාර ලබාදීමට බොහෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ඇමතිවරුන් පොරොන්දු වුවත් එම පොරොන්දු ඉටුවී නොමැති බව ඇය පැවසුවා ය. මෙම අමාත්‍යවරු සඳහන් කළේ පෞද්ගලික පරිත්‍යාග සම්බන්ධයෙන් ද නැතිනම් එම වැන්දඹු කතට හිමිකම් කිය හැකි රජයේ අරමුදල් පිළිබඳව ද යන්න පැහැදිලි නැතත් තිලකාට උපකාරයක් නොලැබුණු බව සැබෑවකි. ඇයට ලැබුණු එකම වන්දිය නම්, 2019 ජනවාරි 1වැනිද ජේරකැටිය විහාරයේදී මුස්ලිම් පවුලක් ඇයට ලබාදුන් පෞද්ගලික පරිත්‍යාගයක් වන රු.50,000ක මුදල පමණි.[61]

---

[60]එම

[61]Kandy: What Lingers, Two Years On, http://lawandsocietytrust.blogspot.com/2020/03/kandy-what-lingers-twoyears-on.html

# 8 වැනි පරිච්ඡේදය

# 2018 මාර්තු මාසයේ සිදුවීම් සම්බන්ධයෙන් දේශපාලන ක්‍රියාධරයින් දැක්වූ අදහස්

දේශපාලනඥයින් සහ අදාළ සිවිල් සමාජ පාර්ශ්වකරුවන් සිදුකළ ප්‍රකාශ සම්බන්ධයෙන් වූ පුවත්පත් වාර්තා ඇසුරෙන් පහත කොටස සම්පාදනය කර තිබේ.

**අ: රජයේ දෘෂ්ටිකෝණය**

පොලීසිය සහ හමුදාව කැඳවා මෙහෙයවීම අතින් සහ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට බලකායන්කැඳවා මෙහෙයවීම අතින් ආණ්ඩුවේ ප්‍රතිචාරය දුර්වල බව බොහෝදෙනාගේ අදහස වුවද, ප්‍රචණ්ඩත්වයෙන් පසුව එය වාගාලංගාකර ඔස්සේ ප්‍රතික්ෂේප කිරීම ප්‍රබල ලෙස සිදුවිය. 2018 මාර්තු 8වැනි දින මවුබිම පුවත්පතේ අමාත්‍යමණ්ඩල තීරණ පිළිබඳව සඳහන් කරමින් රාජිත සේනාරත්න, කබීර් හෂීම් සහ සරත් අමුණුගම මහනුවර දිස්ත්‍රික්කයේ සිදුවීම් පිළිබඳ සාකච්ඡාකළ අන්දම ආවරණය කර තිබුණි. එහි ශීර්ෂපාඨය මෙසේ විය:

'දිගන සිදුවීම්වලට වගකිවයුත්තේ පිටපළාත්වලින් ආ අයයි'[62]

ප්‍රහාරවලට පෙළඹවූවන් මෙන්ම ප්‍රහාර සිදුකළ අය ද නොපමාව අත් අඩංගුවට ගන්නා බව කැබිනට් ප්‍රකාශක වෛද්‍ය රාජිත සේනාරත්න පැවසුවේ ය. දිගන ප්‍රදේශයේ ප්‍රහාරවලට වගකිවයුතු පුද්ගලයින් 4 දෙනෙක් ඒ වනවිටත් බලධාරීන් විසින් හඳුනාගෙන ඇති බව ඔහු පැවසීය. මෑතක දී ඡන්දයෙන් පත් වූ ප්‍රාදේශීය සභා සභිකයින් දෙදෙනෙක්, දිස්ත්‍රික් සංවිධායකවරයෙක් සහ එම දේශපාලන පක්ෂයට ම සම්බන්ධ භික්ෂුවක් ප්‍රචණ්ඩත්වය සඳහා වගකිවයුත්තන් වශයෙන් හඳුනාගෙන තිබුණි. තෙල්දෙණියේ වගකිවයුත්තන් වූයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු සහ එම මන්ත්‍රීවරයාගේ ලේකම් විය. ඔවුන්ට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගන්නා බව වෛද්‍ය සේනාරත්න පැවසීය. මාර්තු 6වැනි ද රාත්‍රිය වන විට පුද්ගලයින් 24 දෙනෙකු අත් අඩංගුවට ගෙන තිබූ බව ද ඔහු පැවසුවේ ය. ජාතිවාදී අදහස් ප්‍රතික්ෂේප කරන බව තහවුරු කරමින් පාර්ලිමේන්තුවේ සියලුම පක්ෂ විසින් කළ ප්‍රකාශ පිළිබඳව ස්තුතිය පළ කළ සරත් අමුණුගම, මාධ්‍ය විසින් සිදුවීම වගකීමෙන් යුතුව ආවරණය කිරීම පිළිබඳව ද ස්තුති කළේ ය.සිදුවීම් විශ්ලේෂණය කරමින් රාජිත සේනාරත්න, මෑතක දී පැවැත්වූ මැතිවරණයේදී සිංහල, මුස්ලිම් සහ දෙමළජනතාව ආණ්ඩුවට සහාය පළකරන බව පෙන්නුම් කර ඇතැයිසඳහන් කළේ ය.ඉන් පරාජය වූ පුද්ගලයින් ආණ්ඩුව සුළුතර කණ්ඩායම් සමගින් ඇති යහපත් සම්බන්ධතාවයට බලපෑම් එල්ල කිරීම සඳහා වෑයම් කරන බව ද ඔහු පැවසීය (ඔහු මෙහිදී සඳහන් කළේ 2015 මැතිවරණය පිළිබඳව මිස 2018 ජනවාරියේ පැවති පළාත්පාලන මැතිවරණය පිළිබඳව නොවේ.) වඳපෙති ගැටළුව මතු වූ විට, එවැනිප්‍රකාශයක් සඳහා කිසිදු විද්‍යාත්මක පදනමක් නොමැති බව පැහැදිලි කිරීමට වෛද්‍ය ක්ෂේත්‍රයේ විද්වතුන් එක් රැස් කර මෙහෙයවීමෙන් රජය ඊට ප්‍රතිචාර දැක්වූ බව ඔවුහු ප්‍රකාශ කළහ. එසේම, වෛරී ප්‍රකාශ පාලනය කිරීම සඳහා ද දැඩි ක්‍රියාමාර්ග ගන්නා බව හෙතෙම පැවසීය. අග්‍රාමාත්‍යවරයා විසින් බුද්ධි අංශ වෙත වරද පැටවීම පිළිබඳ විමසූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින්, තත්වය පාලනය කිරීම සඳහා හමුදාව යෙදවූයේ එබැවින් බව සඳහන් කරන ලදී. පොලීසියෙන් රාජකාරිය පැහැර හැරීමක් සිදු වී ඇති දැයි විමසූ කල, දැනටමත් මේ පිළිබඳව විමර්ශනයක් සිදුකිරීම අරඹා ඇතිබව පොලිස්පතිතුමා වාර්තා කර ඇතැයි ඔහු සඳහන් කළේ ය. අලුත්ගම සිදුවීම සම්බන්ධයෙන් යුක්තිය ඉටුවීමට ප්‍රමාදවීම දිගන සිදුවීමට බලපෑමක් ඇතිකරන්නට ඇත් දැයි විමසූ විට, දිගන සිදුවීම සහ අළුත්ගම සිදුවීම අතර වෙනසක් ඇති බවත්, එකල වරදකරුවන් කොටසකට පාලනතන්ත්‍රයේ සහාය ලැබුණු බවත්අමාත්‍යවරයාපැවසීය. කෙසේ නමුත්, යුක්තිය ඉටුකිරීම සම්බන්ධයෙන් ප්‍රමාදයන් නොමැති බව ඔහු පැවසීය.

[62]මවුබිම, 2018-03-08 (දෙනගම ධම්මික රණවීර)

රජය මුස්ලිම් විරෝධී මතවාද නොඉවසනු ඇතැයි යන පණිවුඩයජාතික මට්ටමෙන් පතුරුවා හරින බවක් මෙම මාධ්‍ය සාකච්ඡාවේ දී ලබාදුන් ප්‍රකාශ වලින් ඇඟවුණි. මෙය අලුත්ගම සිදුවීමෙන් පසුව ආණ්ඩුව ලබාදුන් ප්‍රතිචාරයට වඩා බොහෝ වෙනස් ය. එම සිදුවීමෙන් පසුව ආණ්ඩුව එම සිදුවීම මාධ්‍ය හරහා ආවරණය කිරීම අවහිර කළ අතර, ඇති වූ සිදුවීම් ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවගේ කුපිතකරවීම මත සිදුවූ 'ගැටුමක්' වශයෙන් ප්‍රකාශ වන, නිර්මිත සහ සම්බන්ධීකරණය කළවෘත්තාන්තයක් රජයේ ආයතන කිහිපයක් ඔස්සේ කියාපෑවේය. දිගන සිදුවීමෙන් පසුව එවැන්නක් සිදු නොවීය. අසාධාරණයක් සිදුවී ඇති බවත්, වරදකරුවන් වගකිව යුත්තන් කරනු ලබන බව සහතික කරගතයුතු බවත් අවමවශයෙන් වාගාලංකාර මට්ටමෙන් හෝ පිළිගන්නා ලදී.සමාජ මාධ්‍ය තහනම, වෛරී ප්‍රකාශ සම්බන්ධ ක්‍රියාකාරකම් පාලනය කිරීම පිළිබඳව ෆේස්බුක් වැනි වේදිකා සමග ඉන් පසුව සිදු කළ සාකච්ඡා ආදිය ඵලදායීක්‍රියාමාර්ග විය. කෙසේ නමුත්, රජය විසින් දරන ලද බොහෝ උත්සාහයන් මෙන්,සැබැවින් ම දක්වන ලද ප්‍රතිචාර මෙම වාගාලංකාරය සමග ගැළපුනේ මද වශයෙන් පමණි. පහත සාකච්ඡා කෙරෙන පරිදි, වරදකරුවන් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුති පනත යටතේ අත් අඩංගුවට ගන්නා ලදී. ඇප ලබා නොදී ඔවුන් දීර්ඝ කාලයක් සිරභාරයේ තබාගන්නා ලදී. ඊට අමතරව, ඔවුන්ට විරුද්ධව වූ නඩු කටයුතු ඉදිරියට ගෙනයන ලදී. කෙසේ නමුත්, මෙම නඩු නිමවී නැති අතර අත් අඩංගුවට ගත් බොහෝදෙනා මේ වනවිට මුදාහැර තිබේ.

**අග්‍රාමාත්‍යවරයා**

දිනය: 2018 මාර්තු 6

ආණ්ඩුවේ ස්ථාවරය සමග එකඟ වෙමින් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහනුවර ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව අමතමින් කුමාරසිංහගේ මරණය පිළිබඳව විමර්ශනය කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරී කණ්ඩායමක් පිටත් කර ඇති බව ප්‍රකාශ කළේ ය. ප්‍රචණ්ඩත්වය ආරම්භ වූ අන්දම සාරාංශකරමින් කථා කළ ඔහු, ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් වූ සියළුදෙනාට රජයෙන් වන්දි ගෙවනු ඇති බව ද නිවේදනය කළේ ය.

'දේශපාලන බලයට කෑදර ඇතැම් අය මෙවැනි සිදුවීම් ප්‍රයෝජනයට ගන්නට උත්සාහ කරන බව පේනවා. ඒ වාගේ ම, සාමාන්‍ය ජන ජීවිතය කඩාකප්පල් කර ජාතිවාදී ප්‍රචණ්ඩත්වය ඇවිලවීමට සැලසුම් කරන බව පේනවා. ඒ අයට තිබෙන එකම ආයුධය මේ ආකාරයට රට පුරා ජාතිවාදී ප්‍රචණ්ඩත්වය සහ ජාතිවාදය අවුලවා ඉන් ඇතිවන අර්බුදය තුළ රටේ බලය දිනාගැනීමයි. සමාජමාධ්‍ය ඔස්සේ ජාතිවාදය සහ ජනවාර්ගික අසමගිය පතුරුවන්න සංවිධානාත්මකව වෑයම් දරන බවක් පෙනෙන්නට තිබෙනවා. එවැනි එක කණ්ඩායමක් පසුගිය මාස 9 තිස්සේ ම මේ රටේ සිංහල ආධිපත්‍යට මුස්ලිම් ජනතාව තර්ජනය කරන බව කියමින් සමාජ මාධ්‍ය තුළ ප්‍රචාරක ව්‍යාපාර ගෙනගොස් තිබෙනවා. ඒ අය ව්‍යාජ සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරලා තියෙනවා.' ආණ්ඩුව එම කුරිරු ක්‍රියා සහ ඕනෑම ආකාරයක ජාතිවාදී අසමගිය සහමුලින් ම හෙළාදකින බව ඔහු පැවසීය.

ප්‍රචණ්ඩත්වය ඇති වූ පළමු දිනයේ අග්‍රාමාත්‍යවරයා පහත සඳහන් ට්විටර් පණිවුඩය නිකුත් කර තිබුණි:

'කුරිරු යුද්ධයකට මුහුණදුන් ජාතියක් හැටියට අපි සාමයේ, ගරුත්වයේ, එකමුතුකමේ සහ නිදහසේ අගය දන්නෙමු. රජයගතවූ දින කිහිපය තුළ සිදුවූ ජාතිවාදී සහ ප්‍රචණ්ඩ ප්‍රහාර හෙළාදකියි. හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කරඇති අතර තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීමට අපි පසුබට නොවන්නෙමු.'

මූලාශ්‍රය: ට්විටර්

**ජනතා විමුක්ති පෙරමුණ**

ජනතා විමුක්ති පෙරමුණ (ජ.වි.පෙ.) යනු රටේ තරුණ කැරළි දෙකකට වගකිවයුතු මාක්ස්වාදී පක්ෂයක් වේ. දිගන සිදුවීම සම්බන්ධයෙන් කළ හොඳම විශ්ලේෂණයක් සහ ඒ අවස්ථාවේ ආණ්ඩුවේ මෙන්ම විපක්ෂයේ ක්‍රියාකලාපය පිළිබඳව ප්‍රබලතම විවේචනයක් ඉදිරිපත් වූයේ ජනතා විමුක්ති පෙරමුණෙනි. එම පක්ෂයේ නායක අනුර කුමාර දිසානායක මුස්ලිම් ජනතාවට එරෙහිව මුස්ලිම්

විරෝධී මතවාද පැතිරවීම සහ ඉන් පසුව ඇතිවූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් මෙසේ කීවේ ය: 'ඔබ ජාතිවාදයට අත්පොලසන් දෙන්නේ නම් මේ රටේ අනාගතය ලේ විලක් වනු ඇත.'[63]රජය මෙන්ම 'පරාජය වූ අය' (2015 වර්ෂයේ සිදුවූ ආණ්ඩු මාරුව අදහස් වේ) යනුවෙන් ඔහු හැඳින්වූ කණ්ඩායම තදින්ම විවේචනය කරමින් කථා කළ ඔහු ජාතිවාදය පෝෂණය කිරීමෙන් මේ දෙපාර්ශවය ම වාසි ලබාගන්නා බව පැවසීය. ඔහුගේ ප්‍රකාශය පහත පරිදි විය:

> "ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාදීම සම්බන්ධයෙන් රජය අසමත් වී තිබෙනවා, ඒ වාගේ ම, ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන බවත් ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන බවත් සහතික කරන්න ආණ්ඩුව අසමත් වෙලා තියෙනවා. ආදායම අඩුවීම නිසා ගොවීන් දුක්විඳිනවා; රැකියා අවස්ථා නොමැති කමින් සියළු ජනවර්ගවල තරුණ පිරිස් දුක් විඳිනවා. මේ ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තිවලට විරුද්ධව ජනතාව ඒකරාශී වෙන්න ඕනැ වෙලාවක තමයි මේ ජාතිවාදී ප්‍රචණ්ඩත්වය නැගී එන්නේ. මේක මේ වෙලාවේ ම සිද්ධවීම ආණ්ඩුවට ලොකු වාසියක්."

පරාජිත දේශපාලන පාර්ශවය පිළිබඳ කථා කරමින් ඔහු පැවසුවේ ජාතිවාදී වේදිකාවක් භාවිතා කරමින් තමන්ගේ දේශපාලන බලය යළි තහවුරු කර ගැනීමට ඔවුන් මානබලමින් සිටින බවයි.

> 'ඒ අයට වඩාත් හොඳ ප්‍රජාතන්ත්‍රවාදයක්, වඩාත් සාර්ථක ආර්ථිකයක්, හෝ වඩාත් ශක්තිමත් විදේශ ප්‍රතිපත්තියක් ජනතාවට දෙන්න බැහැ. ඒ නිසා ජාතිවාදී මතවාද පෝෂණය කරන එක තමයි ඒ අයට ඉතුරුවෙලා තියෙන එකම ක්‍රමය. ආපහු බලයට එන්න ඕනැ නිසා මැතිවරණ ව්‍යාපාරය අතරතුරේදී එදිරිවාදිකම් අවුළුවන්න කරන්න පුළුවන් හැම දෙයක්ම ඒ අය කළා. ඒ නිසා මේ කණ්ඩායම් දෙකම එක්කෝ බලයේ රැඳෙන්න, එහෙම නැත්නම් නැවතත් බලයට එන්න ජාතිවාදී මතවාද තමන්ගේ වාසියට යොදගන්නවා.'

ප්‍රචණ්ඩත්වය ඇතිවන අතරතුර රජයේ අසමර්ථභාවය පිළිබඳ කථා කරමින් අනුර කුමාර දිසානායක ප්‍රකාශ කළේ සමාජ මාධ්‍යවල සිදුවන ක්‍රියා සම්බන්ධයෙන් අවධානයෙන් සිටියේ නම්, මෙවැනි ප්‍රහාරයකට මග පෑදීගෙන එන බව රජයට පැහැදිලිවන්නට තිබුණු බවයි.

> "ඒ වගේ ම, විශාල තරුණ පිරිසක් එකතුවෙලා කඩවලට පහර දෙනකොට, මහදවල් ඒවාට ගිනි තියනකොට, මහා විනාශයක් කරනකොට ඒක නවත්වාගන්න බැරිනම් එහෙවු ආණ්ඩුවකින් ඇති එලේ මොකක්ද? රටේ සෑම සියළු පුරවැසියකුටම ආරක්ෂාවත් සුරක්ෂිතභාවයත් ලබාදෙන්න ආණ්ඩුව බැඳිලා ඉන්නවා. ඒත් මේ නායකයින් ඒ සියළුදේ සම්පූර්ණයෙන් ම අතහැරලා දලා."

රජය මෙම ප්‍රචණ්ඩත්වය උසිගැන්නුවේ නැතිවා විය හැකි වුවත්, රජය ඉන් වාසි ලබන බව ඔහු පැවසී ය. "ඒක පාලනය කරලා ප්‍රචණ්ඩ ක්‍රියා නවත්වන්න ක්‍රියාමාර්ග ගන්නේ නැතිව මේ ආණ්ඩුව ඒක නොදැක්කා වාගේ ඉඳලා මේ සිදුවීම් සිද්ධවෙන්න ඉඩ අරිනවා." ඔහු කීවේ ය. මෙම සිදුවීම ඉතාමත් හොඳින් සංවිධානය කර සිදුකරන ලද්දක් බවත් ප්‍රහාර සිදුකිරීම සඳහා පිටතින් පුද්ගලයින් ගෙනැවිත් ඇති බවත් ඉතාමත් පැහැදිලි බව ඔහු තවදුරටත් ප්‍රකාශ කළේ ය. ඒ බොහෝදෙනා මුහුණු වසාගෙන සිටීමෙනුත්, ඔවුන්ගේ අතේ දඬු සහ ගිනි පත්තුකරන්නට උපකරණ තිබීමෙනුත් මෙය හොඳින්ම පැහැදිලි වෙන බව ඔහු සඳහන් කළේය. ජනතාවගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව සහතික කිරීම සඳහා ජනාධිපතිවරයා සහ අග්‍රාමාත්‍යවරයා අසමත් වූ බව යෝජනා කරමින් ඔහු මේ සිදුවීම්වල වගකීම ඒ දෙදෙනාම භාරගත යුතු බව පැවසී ය. "මේ කණ්ඩායම්වලට ගැටුම් සංවිධානය කරන්නටත්, මහ දවල් තමන්ට කැමති කැමති හැටියට හැසිරෙන්නටත් අවසර දීලා තියෙනවා" ඔහු තර්ක කළේ ය. "මේ ගැටුම් වලට පාලකයින්ගේ ආශිර්වාදය තියෙන බවක් තමයි පෙනෙන්නේ". මෙම ගැටුම් වළක්වාගතහැකිව තිබූ බව ඔහු තවදුරටත් පැවසුවේ ය. දේශපාලන විරුද්ධකම් තිබුණත් ජාතිවාදය ඇවිලවීමෙන් සියලු ම පක්ෂ වැළකිය යුතු බව ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉල්ලා සිටින ලදී.

පැහැර හැරීම් හරහා රජය ද, රාජපක්ෂ පවුලේ රාජවංශික අභිලාෂයන් ඉදිරියට ගෙනයාම සඳහා සකස් කරන ලද දේශපාලන යටිතලපහසුකම්වල නියෝජිතයින්ගෙන් බොහෝදුරට සැදුම්ලත් විපක්ෂය ද දෝෂාරෝපණිය බව ජ.වි.පෙ. නායකයාගේ විස්තරයෙන් පෙන්නුම්කෙරෙයි. මෙම

---

[63] ලක්බිම - 2018.03.08

විස්තරය දිගන සිදුවූ සිද්ධීන් සම්බන්ධයෙන් බොහෝ දුරකට පැහැදිලි කෙරෙන තීක්ෂණ විස්තරයක් විය. බිම් මට්ටමේ අප සමගින් කථා කළ මුස්ලිම් පුද්ගලයින්, විශේෂයෙන්ම දිගන 'බසාර් එකේ' වෙළඳුන් අප සමග පැවසූ දේ හරහා ද මෙම දේශපාලන කඳවුරු දෙක සම්බන්ධයෙන් මීට සමාන අදහස් පිළිබිඹු වේ. සැලකියයුතු සිංහල ඡන්දදායක පිරිසක් සිටින දේශපාලන පක්ෂ මේ අන්දමින් විශ්ලේෂණ ඉදිරිපත් කිරීමත්, ඒවා ජාතික මට්ටමෙන් සිංහල මාධ්‍යවල පළවීමත් වැදගත් කරුණකි. කෙසේ නමුත්, 2013 වර්ෂයේ දී බොදු බල සේනා සංවිධානය විසින් සහ පසුව අමිත් වීරසිංහගේ මහසෝන් බලකාය වැනි කණ්ඩායම් විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් ඔස්සේ මුස්ලිම් විරෝධී ව්‍යාපාරය පැතිරවූ මතවාදය සමාජ මාධ්‍ය පරිහරණයට වැඩියෙන් නැඹුරු වූ සිංහල තරුණ විඥානය තුළ කෙතරම් දුරට මුල්බැසගෙන ඇත්තේ ද යත්, මුද්‍රිත මාධ්‍ය තුළ පළවන මෙවැනි වඩාත් මධ්‍යස්ථ මතවලට එය වෙනස්කිරීමට කළ හැක්කේ ඉතාමත් සුළු කාර්යභාරයකි.

**කොමියුනිස්ට් පක්ෂය**

කොමියුනිස්ට් පක්ෂ නියෝජිතයින් දිගන සිදුවීම් සම්බන්ධයෙන් දැක්වූයේ සහදායකප්‍රතිචාරයකි. රට පුරාම විසිරී සිටින සමස්ථ මුස්ලිම් ප්‍රජාව ම අවුස්සන ක්‍රියාවන් සිදුකිරීම භයානක බව ඔවුහු පැවසූහ. මෙය ජාත්‍යන්තරකරණය විය හැකි බැවින් මෙම තත්වය දෙමළ විරෝධී නොඉවසුම් තත්වයන්ට වඩා බෙහෙවින් බරපතළ බව ඔවුහු පැවසූහ. මෙම තත්වය සිවිල් යුධ තත්වයක් දක්වා පිරිහුනහොත් එය ඉතාමත් භයානක විය හැකිය. උදාහරණ වශයෙන්, 1983 කළු ජූලියෙන් පසුව රටේ කටයුතුවලට අතපෙවීමට වෑයම් කළේ තමිල්නාඩුව පමණි. එහෙත් ලෝකයේ මුස්ලිම් රටවල් 54ක් ඇත. ඉස්ලාමීය රාජ්‍ය සංවිධානය දැනටමත් මේ පිළිබඳ අවධානයෙන් සිටින බව පවසා තිබේ. එමෙන් ම, මැදපෙරදිග රටවල්අපේ තේ මිලට ගනියි.තවද, කළු ජූලියෙන් පසුව මහජනතාව ඇමතීම සඳහා ජේ. ආර්. ජයවර්ධන දින 6ක් ගතවනතුරු සිටි බව ඔවුන් සඳහන් කළේය 'ඔහු දින 6ක් ගතවනතුරු නිහඬව සිටි අතර මහජනතාව ඇමතුවේ සියළුදේ සිදුවීමෙන් පසුව ය. අපි වසර තිහක් තිස්සේ එහි ප්‍රතිවිපාක අත්වින්දෙමු. සිරිසේන ජනාධිපතිවරයා ද ප්‍රකාශයක් නිකුත් කිරීම ප්‍රමාද කළේ ය.'[64] වචනවලින් සමස්ථ රටක්ම ගිනි ඇවිලවීමට හැකි බැවින් දේශපාලනඥයින් තමන් කියන්නේ මොනවාද යන්න පිළිබඳව සැලකිලිමත් වියයුතු බව ද ඔවුහු පැවසූහ.

සිරිසේන ජනාධිපතිවරයාගේ නිහඬතාවය 1983 කෝලාහලවලින් පසුව ජනතාව ඇමතීමට ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා විසින් බොහෝ ප්‍රමාද කිරීමට සමාන කිරීම මගින් කොමියුනිස්ට් පක්ෂය විසින් දිගන සිදුවීම් කොතරම් බරපතළ ලෙස සැලකුවේ ද යන්න පැහැදිලි වේ. කෙසේ නමුත්, යුක්තිය, මානව හිමිකම්, බහුතරවාදයවිවේචනාත්මකව විග්‍රහ කිරීම වැනි මහජන මතයන්ටආයාචනය කරනවා වෙනුවට මෙම සිදුවීමේ භයානක ප්‍රතිඵල පිළිබඳ වැදගත්සාකච්ඡාවක නිරතවීම පමණක් සිදු කිරීම කනස්සල්ල දනවයි. කෙසේ වෙතත්, මාස කිහිපයකට පසුව ඉස්ලාමීය සටන්කාමීන් ගේ මතුවීමත්, දිගන සිදුවීමෙන් වසරකට පසුව පාස්කු දින ප්‍රහාර ඇතිවීමත් සලකා බැලීමේදී ඔවුන් සැලකිල්ල යොමුකළ කාරණාවන්හි අනාගත ඥානයක් තිබූ බව පෙනී යයි.

**ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය (මීරා ශ්‍රීනිවාසන් සමගින් රවුෆ් හකීම් සිදුකළ සම්මුඛ සාකච්ඡාව මත පදනම් වේ)[65]**

මහනුවර ඇතිවූ ප්‍රචණ්ඩත්වය සිංහල-මුස්ලිම් ගැටුමක් නොව මුස්ලිම් ජනතාව මත සිදුකළ කලහකාරී ප්‍රහාරයක් බව 'ද හින්දු' පුවත්පතේ මීරා ශ්‍රීනිවාසන් සමගින් කළ සම්මුඛ සාකච්ඡාවක දී ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නායක රවුෆ් හකීම් විසින් පවසා තිබේ. යුද්ධයෙන් පසුව රට තුළ අතිවීභීතිකාව (විදේශිකයින් නුරුස්නා බව) සහිත බලවේග සහ ජාත්‍යන්තර තලයෙන් ආ ඉස්ලාම්භීතිකාව ඒකරාශීවීමක් වශයෙන් හකීම් මෙම තත්වය තවදුරටත් පැහැදිලි කළේ ය. මෙම සංවිධානාත්මක ව්‍යාපාරය මුස්ලිම් ජනයා සහ සිංහල ජනයා අතර එදිරිවාදිකම් ඇවිලවීමටත් 'අන්‍යයා' පිළිබඳ සංකල්පයක් නිර්මාණය කිරීමටත් යොදාගත් ක්‍රමවේද ඔහු විසින් සඳහන් කරන ලදී. උදාහරණ වශයෙන් 2013 දී විශාල ප්‍රසිද්ධියක් ලැබූ හලාල් ගැටළුව සහ මුස්ලිම් කාන්තාවන්ගේ

[64] මවුබිම - 2018.03.09

[65] Meera Srinivasan, "It was Not a Sinhala-Muslim Clash, It was a Mob Attack on Muslims: Sri Lanka Minister Rauff Hakeem," *The Hindu*, 14th March, 2018 https://www.thehindu.com/opinion/interview/it-was-not-a-sinhalamuslim-clash-it-was-a-mob-attack-on-muslims/article23229464.ece

ඇඳුම පිළිබඳ ගැටළුව සඳහන් කරන ලදී. එසේම, මෙම භීතිකාව සම්බන්ධයෙන් ව්‍යාපාරික එදිරිවාදිකම් සහ ඊර්ෂ්‍යාවට ඇති ස්ථානය පිළිබඳව ද හකීම් සඳහන් කළේ ය.

අම්පාරේ සහ දිගන සිදුවීම් හොඳින් සැලසුම් කර සිදුකරන ලද බවත් මෙහිදී අවධානයට ගතයුතු කරුණ වන්නේ මෙම සිදුවීම් අතිශයින් ම ජාතිවාදී වේදිකාවක් මත පදනම් වී තරග වැදුණු පළාත්පාලන මැතිවරණයකින් පසුව සිදුවීම වන බවත් හකීම් පැවසීය. මෙම ප්‍රචණ්ඩත්වයට බැහැර කළ නොහැකි දේශපාලන පසුබිමක් තිබුණි. සිදුවීම අතරතුර පොලීසියේ අක්‍රියභාවය පිළිබඳව හකීම් අමාත්‍යවරයා තදින් දෝෂාරෝපණය කළේ ය. ඔහු මෙසේ කීයː

> "එම සිදුවීම් වලටසක්‍රීයව උපකාර කිරීමෙන් නොවුනත්,කලට වේලාවට මුස්ලිම් ජනතාව බේරාගැනීමට නොපැමිණීමෙන් ඔවුන් පෙන්නුම් කළ සිතාමතාම දැකුවූ නොසැලකිල්ල නිසා ඔවුන් මේ ප්‍රචණ්ඩත්වයට සහාය දී තිබෙනවා. එයටත් වඩා බරපතල දෙය නම්, සිදුවන්නට යන දේ පිළිබඳව කලින් අනතුරු ඇඟවීමක් කිරීමට වත් බුද්ධි අංශ අසමත් වී තිබෙනවා. ප්‍රදේශයේ දේශපාලනඥයින් වන අපි, අවමංගල්‍යය දිනයේ දැනගත්තා මොකක් හරි දෙයක් වෙන්න යනවා කියලා.... අපි දිගින් දිගටම අදාළ වගකිවයුතු නිලධාරීන්ට කථා කළා. ඒත් කරදර වෙන්න තරම් දෙයක් නැති බවත්, ඒ අය සියල්ල බලාගන්නා බවත් ඒඅය නැවත නැවතත් අපිට සහතික වුනා. අවසානයේ සිදුවීම වුනාට පස්සේ ඒ අය 'මේ වගේ මට්ටමකින් මෙහෙම දෙයක් වෙයි කියලා අපි හිතුවේ නැහැ, අපට ප්‍රචණ්ඩත්වය පාලනය කරගන්න බැරිවුනා' කියලා විවිධ නිදහසට කාරණා කියනවා. ඒ අය මෙවැනි විපත්තියකට සූදානම්වසිටිය යුතුව තිබුණා."

වඩාත්ම මෑතකදී, වඳ පෙති භාවිතයෙන් සිංහල ප්‍රජාව වඳ භාවයට පත් කිරීම සඳහා මුස්ලිම් ප්‍රජාව ගෙනයන කුමන්ත්‍රණයක් පිළිබඳව සංසරණය වන විවිධ කථා පිළිබඳ සඳහන් කරමින් හකීම් ප්‍රකාශ කළේ මේ ගැටළුවට ආමන්ත්‍රණය කිරීම සඳහා ආණ්ඩුව සන්නිවේදන උපායමාර්ගයක් නිර්මාණය කළයුතු බවයි. වෛරී කථනයේ නිරතවන භික්ෂූන් සම්බන්ධයෙන් නිසි නීතිය හා සාමය රැකීමේ ක්‍රියාමාර්ග ගැනීමට රජය පසුබට වන බවක් පෙනෙන්නට ඇති බව ඔහු කීවේ ය. අලුත්ගම සිදුවීමේ දී ද රජය ප්‍රතිචාර දැක්වීමට ප්‍රමාද විය. ඇතැම්විටෙක සිංහල බහුතරය අතරේ ජනප්‍රියභාවය අඩු වෙතැයි ඇති බිය හේතුවෙන් එසේ කළා විය හැකිය. කෙසේ නමුත්, හකීම් පැවසුවේ එවැනි මත ආකර්ෂණීය වන්නේ බහුතර ජනතාවට නොව රැඩිකල් මතධාරී ඉතා සුළු පිරිසකට බවයි. එසේ ම, එය මුස්ලිම් සුළුතරය ආණ්ඩුවට ලබාදුන් සහාය දුරස්වෙමින් පවතින බව පෙන්වීමට ගත් උපායමාර්ගයක් වියහැකි බව ද ඔහු පැවසීය. ජනාධිපතිවරයා සහ යහපාලන ආණ්ඩුව බලයට පත්කිරීම සඳහා පක්ෂව මුස්ලිම් ජනයා විශාල වශයෙන් ඡන්දය දුන්හ.

අදහස් පළකළ අනෙකුත් අය සඳහන් කළාට වඩා වෙනස් ආකාරයකින් දේශපාලන පසුබිම පිළිබඳ වැදගත් කාරණාවක් හකීම් විසින් ඉස්මතු කරන ලදී. වත්මන් සන්ධාන රජයේ සාමාජිකයින් එතරම් හොඳ ප්‍රතිඵල ලබා නොගත් මෑතකාලීන පළාත්පාලන මැතිවරණයේ ප්‍රතිඵලය හේතුවෙන් සන්ධානය යම්තාක් දුරකට අස්ථාවර වී ඇති බව හකීම් සඳහන් කළේ ය. ඔහුට අනුවː

> "... පළාත්පාලන මැතිවරණ අවසන් වූ වහාම මේ ආණ්ඩුවේ ප්‍රධාන හවුල්කාරයින් දෙපාර්ශවය එකිනෙකා මත දොස් පැවරූ ආකාරය මේ ආණ්ඩුවේ හවුල්කරුවන් වන අපට අපහසුව දනවන කාරණයක් වුනා. පාලනයේ එකිනෙකට ගැළපීමක් නොමැති බවක් ජේනවා, තීරණයකට නොපැමිණීම් බොහොමයක් තිබෙනවා. එවැනි දේශපාලන අස්ථාවරභාවයක් මේ වගේ (අන්තවාදී) බලවේගවලට හොඳ තෝතැන්නක් වෙනවා. ඒක ඉක්මනින් විසඳගත යුතුයි."

**සම්බන්දන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා - දෙමළ ජාතික සන්ධානය**

2018-03-05 දින රජයේ ප්‍රකාශය

දිගන ප්‍රහාරය තදින් ම සහ පැහැදිලිව ම හෙළා දකියි. (රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව) නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ භූමිකාව පැහැදිලිවම ප්‍රශ්නයට ලක් වී තිබේ. තමන්ට මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියාවල නිරත විය හැකි යැයි ද, නීතියේ හස්තය තමන් කරා ළඟා නොවෙතැයි ද, නීතියේ ආධිපත්‍යය තමන්ට එරෙහිව ක්‍රියාත්මක නොවෙතැයි ද යන විශ්වාසය පුද්ගලයින් තුළ ඇතිවී තිබෙන බවක් පෙනෙන්නට ඇති බව ඔහු සභාවට පැවසීය. (සන්ඩේ ඔබ්සර්වර්)

**සුමන්දිරන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා (ශ්‍රී ලංකා බ්‍රීෆ්, 2018 මාර්තු 6)**[66]

*ශ්‍රී ලංකාව: තමන්ගේ ම රටවැසියන් මත ප්‍රචණ්ඩත්වය මුදාහරිද්දී ආණ්ඩුව උරහිස් හකුලා අහක බලාගන්නා විට*

දෙමළ ජාතික සන්ධානයේ යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන් 'සංඛ්‍යාත්මක වශයෙන් පහළ ප්‍රජාවන්' යනුවෙන් ඔහු හැඳින්වූ ප්‍රජාවන්ට එරෙහිව මෙහෙයවනු ලබන ප්‍රචණ්ඩත්වය හමුවේ 'කොන්ද පණනැති' අය වශයෙන් රජයේ නායකයින්ට චෝදනා කළේ ය.

'හරි දෙය වෙනුවෙන් පෙනී සිටින්නට බැරිනම්, ඔබේ රටේ සංඛ්‍යාත්මක වශයෙන් අඩු ප්‍රජාවන් වෙනුවෙන් නැගී සිටින්නට බැරි නම්, ඔබට පාලනය කරන්න කිසිම අයිතියක් නැතැ' යනුවෙන් සුමන්තිරන් මන්ත්‍රීවරයා පැවසීය.

---

[66]"Sri Lanka: When a Government Shrugs its Shoulders & Turns a Blind Eye to the Violence being Perpetrated against its Own Citizens ..- M.A. Sumanthiran ( MP, TNA))", *Sri Lanka Brief* , 12 March 2018 https://srilankabrief.org/2018/03/sri-lanka-when-a-government-shrugs-its-shoulders-turns-a-blind-eye-to-theviolence-being-perpetrated-against-its-own-citizens-m-a-sumanthiran-mp-tna/

# 9 වැනි පරිච්ඡේදය

# සිවිල් සමාජ මැදිහත්වීම්

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

*දිනය: 2018 මාර්තු 6*

මුස්ලිම් විරෝධී මතවාද ව්‍යාප්තවීම වැළැක්වීමටත්, ප්‍රචණ්ඩකාරී ක්‍රියා සිදුකළ බවට චෝදනා එල්ලවී ඇති අයට නඩුපැවරීමටත් නොපමාව ක්‍රියාමාර්ග ගන්නා මෙන් බලධාරීන්ගෙන් ඉල්ලා සිටිමින් මෙම සිදුවීම් සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ප්‍රකාශයක් නිකුත් කරන ලදී. එසේ ම, පහසුවෙන් බිඳෙනසුළු තත්වයකට සීඝ්‍රයෙන් පත්වෙමින්තිබෙන සාමය පවත්වාගෙන යාම සඳහානොපමාව සිදුකරන මැදිහත්වීම් කෙතරම් හදිසි අවශ්‍යතාවයක් වන්නේ ද යන කරුණ කෙරෙහි ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අවධානය යොමු කරයි. එම ප්‍රකාශයෙන් උපුටාගත් කොටස් පහත දැක්වේ:

*මීට අමතරව මුස්ලිම් ප්‍රජාවට එරෙහිව ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සිදුකිරීමට අනුබල දෙන ආකාරයේ වීඩියෝ දර්ශන ජනතාව අතර සංසරණය වීම යන කාරණය පිළිබඳව ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ දැඩි අවධානයක් යොමු වී ඇත. මේ වන විට බෞද්ධ භික්ෂුවක් යැයි කියාගන්නා අයෙක් විසින් සිදුකරන ලද ප්‍රකාශයක් ඇතුළත් වීඩියෝ දර්ශන ඇතුළු මේ ආකාරයේ වීඩියෝ දර්ශන කිහිපයක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සතුව පවතී.*

*සියලූම ජන ප්‍රජාවන්ට අයත් පුරවැසියන්ට තවදුරටත් මෙවැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියාවල නිරත වීමෙන් වළකින ලෙසටත්, අදාළ ප්‍රචණ්ඩකාරී සිදුවීම් වලට වගකිව යුතු පුද්ගලයන් නිසි බලධාරීන් විසින් පවත්නා නීතිමය රාමුව ප්‍රකාරව අත්අඩංගුවට ගෙන නීතිය හමුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසටත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අවධාරණයෙන් ඉල්ලා සිටියි. මෙවන් තීරණාත්මක මොහොතක ක්‍රියාමාර්ග නොගැනීමේ පිළිවෙතක් අනුගමනය කිරීම හා උදාසීන භාවයෙන් යුතුව යම් ක්‍රියා මාර්ග වලට එළඹීම තුළින් සිදුවන්නේ තවදුරටත් ප්‍රජාවන් තුළ හා ප්‍රජාවන් අතර අවිශ්වාසය, භීතිය සහ ආතතිය වඩාත් වර්ධනය වීමට ඉඩ සැලසීම මෙන්ම, වෛරය හා ප්‍රචණ්ඩත්වය තීව්‍ර වීම සහ වාර්ගික ප්‍රචණ්ඩත්වයට තුඩු දෙන මෙවැනි අපරාධ සම්බන්ධයෙන් වරදට දඬුවම් නොදීමේ සංස්කෘතියක් රට තුළ ස්ථාපිත වීමයි.*

*අම්පාර සහ මහනුවර ප්‍රදේශ ආශ්‍රිතව මෑත කාලයේ උද්ගත වූ සිදුවීම් හුදෙකලා සිදුවීම් නොවන අතර, ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ වාතාවරණය තුළ ජනවාර්ගික ආතතීන් පවතින බව සහ ඒවා වර්ධනය වෙමින් පවතින බව එමගින් අවධාරණය කෙරෙයි. නිරන්තරයෙන් උග්‍රවෙමින් පවතින මෙම සිදුවීම් සඳහා සම්බන්ධ පාර්ශව සහ වෛරී ප්‍රකාශ ඇතුළත් ප්‍රකෝපකාරී වීඩියෝ දර්ශන නිෂ්පාදනයට සහ බෙදාහැරීමට සම්බන්ධ පාර්ශව අත් අඩංගුවට ගැනීම සහ නීතිය ක්‍රියාවට නැංවීම සඳහා අදාළ නීතිමය විධි විධාන ද සඳහන් කරමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වරදකරුවන් අත්අඩංගුවට ගෙන චෝදනා ගොනු කරන ලෙස අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්ගෙන් ඉල්ලා සිටිය ද,මේ දක්වා කිසිදු වරදකරුවෙකුට චෝදනා ගොනු කිරීමක් සිදු වී නැත. එනමුත්, සාධනීය නියැළීමක් සිදු කිරීමේ අරමුණින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කඩිනම් සහ සිථිර ක්‍රියාමාර්ග ගන්නා ඉල්ලා සිටිමින් අද දින ද නිසි බලධාරීන් වෙත ලිපියක් යොමු කළේ ය. අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගන්නේ නම් හෝ ක්‍රියාමාර්ග ගැනීමට ඔවුන්ට නොහැකි නම්, ඔවුන් සිය තනතුරු වලින් ඉල්ලා අස්විය යුතු බව, නැත හොත් පවතින නීතිය අනුව ඔවුන්ව ඉවත් කළ යුතු බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දැඩි ලෙස විශ්වාස කරයි. පවත්නා තත්ත්වයෙහි බරපතලකම මගින්, සංහිඳියාව,ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය සහ අසහනය මැඩපැවැත්වීම සහ නීතිය හා සාමය පවත්වා ගෙන යාම උදෙසා වන රජයේ වගකීම*

*ඉවුකිරීමට රජය අපොහොසත් යැයි වර්ධනය වෙමින් පවතින හැඟීම මගින් එයට අඩු දෙයක් ඉල්ලා නොසිටියි.*[67]

**දෙමළ සිවිල් සමාජය**

*දිනය: 2018 මාර්තු 6*

මේ සතියේ මහනුවර දී සහ කලින්, ඊට පෙර සතියේ අම්පාරේ දී මුස්ලිම් ජනතාවට එරෙහිව ප්‍රචණ්ඩත්වය මුදාහැරීම අප තරයේ හෙළා දකින්නෙමු. අම්පාරෙන් සහ මහනුවරින් ලැබුණු මුලික වාර්තා අනුව, ක්‍රියාකාරී නොවී සිටීම මගින් පොලීසිය මෙම ප්‍රචණ්ඩත්වයට සහාය දක්වා තිබේ. උතුරු-නැගෙනහිර ක්‍රියාත්මක වන දෙමළ සිවිල් සමාජ සංවිධාන වශයෙන් අපි මුස්ලිම් ප්‍රජාවට එරෙහිව වර්ධනය වෙමින් පවතින ප්‍රචණ්ඩත්වය හේතුවෙන් බෙහෙවින් කලකිරීමට පත්ව සිටිමු. මේ ආණ්ඩුව බලයට පත් වූයේ, කලින් පාලනතන්ත්‍රය යටතේ අළුත්ගම දී ඇතිවූ සිදුවීම වැනි සිදුවීම් නැවත ඇති නොවනු ඇතැයි පොරොන්දු වෙමිනි. අලුත්ගම දී මුස්ලිම් ජනතාවට එරෙහිව සිදුවූ අපරාධ රජය විසින් විමර්ශනය කළයුතුව තිබුණි. එම සිදුවීම් විමර්ශනය කර තිබුණේ නම් සහ ඒවාට වගකිවයුතු අය නීතිය ඉදිරියට පමුණුවා තිබුණේ නම්, මහනුවර දී, අම්පාරේ දී සහ ඊට කලින් ගාල්ලේ දී එයම සිදුවීම වළක්වාගත හැකිව තිබුණි. වරදට දඬුවම් නොලැබීම තුළින් ප්‍රචණ්ඩත්වය උපදින අතර, මෙය ශ්‍රී ලංකා ඉතිහාසය පුරාවට නැවත නැවතත් මතුවන තේමාවක් බවට පත් වී තිබේ. ප්‍රචණ්ඩත්වය පැතිරයාම වැලැක්වීමට රජය විසින් අවශ්‍ය සියළු දෑ කළයුතුව තිබෙන අතර මහනුවර සහ අම්පාරේ ප්‍රචණ්ඩත්වය ඇතිවීමට හේතු විමර්ශනය කර ඒ සඳහා වගකිවයුත්තන්ටඔවුන් සිදු කළ සාහසික ක්‍රියා සඳහා දඬුවම් ලබා දිය යුතු වේ.

අප මේ දකින ප්‍රචණ්ඩත්වය සඳහා උචිත පරිසරයක් නිර්මාණය කරමින්, සිංහල මෙන්ම දෙමළ ප්‍රජාවන් තුළද වර්ධනය වෙමින් පවතින ඉස්ලාම් භීතිකාව සම්බන්ධයෙන් අපි කනස්සල්ලට පත් වෙමු. ඉස්ලාම් භීතිකාව පැතිරීමට එරෙහිව කටයුතු කිරීමටත් ප්‍රතිකාර්මික ක්‍රියාමාර්ග ගැනීමටත් අපි සක්‍රියව ක්‍රියාත්මක විය යුතු ය. මෙම ප්‍රහාරවලට එරෙහිව අපි මුස්ලිම් ප්‍රජාවට සහයෝගය පළ කරන අතර, අන්තර්-වාර්ගික ආතතීන් විසඳගැනීම සඳහාත්, මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියා වලටමග පාදන වරදට දඬුවම් නොලැබීමේ චක්‍රය නිමා කිරීම සඳහාත් එක්ව වැඩකිරීමට පොරොන්දු වෙමු.

අත්සන් කළේ:

දෙමළ සිවිල් සමාජ සංසදය

ප්‍රතිපත්ති පර්යේෂණ සඳහා වන අදයාලම් මධ්‍යස්ථානය

මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා වන මධ්‍යස්ථානය (ත්‍රිකුණාමලය)

යාපනය විශ්වවිද්‍යාලයේ ආචාර්ය සංගමය

යාපන විශ්වවිද්‍යාලයේ සේවක සංගමය

යාපනය දියෝකීසියේ යුක්ති සහ සාම කොමිසම

SUYAM - කාන්තාවන් සවිබලගැන්වීමේ මධ්‍යස්ථානය

SUYAMPU - රඟහල සක්‍රීය ව්‍යාපාරය

[67]"CPA Calls Authorities to Take Swift Action to Prevent Further Violence and to Arrest and Prosecute Individuals Advocating National, Racial and Religious Hatred", Statement- Centre for Policy Alternative: Colombo, 3 March 2018. https://www.cpalanka.org/wp-content/uploads/2018/03/Kandy_statement.pdf

**බොදු බල සේනා සංවිධානය**

2009 වර්ෂයේ දී යුද්ධය අවසන් වූ පසුව, 2012 වර්ෂයේ දී මුස්ලිම් විරෝධී ව්‍යාපාරය දියත් කිරීම සඳහා බොදු බල සේනාව සහ එහි මහලේකම් පූජ්‍ය ඥානසාර හිමියන් මූලිකත්වය ගත්තේය. එම හිමිනම විසින් සිදුකරන ලද කුපිතකරවනසුළු කථාවකින් පසුව ප්‍රචණ්ඩත්වය ආරම්භ වී පැතිර ගිය අලුත්ගම ප්‍රචණ්ඩකාරී සිදුවීමේ දී මෙම සංවිධානය තීරණාත්මක භූමිකාවක් නිරූපණය කරන ලදී. අවමංගල්‍ය උත්සවය පැවැත්වූ දිනයට පෙර දින රාත්‍රියේ දී දිගන කුමාරසිංහ ගේ නිවසේ ද පූජ්‍ය ඥානසාර හිමියන් දකින්නට ලැබී තිබේ. මාධ්‍ය හමුවක දී ඥානසාර හිමියන් ප්‍රකාශ කර තිබුණේ මෙය අල්ලා දෙවියන් හෝ බෞද්ධ දර්ශනය සම්බන්ධ ප්‍රශ්නයක් නොව, නොදියුණු මිනිසුන් සම්බන්ධ ප්‍රශ්නයක් බවයි. මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් රට පුරා බුද්ධිමත් සංවාදයක් අවශ්‍ය කරන බව එම හිමියන් ප්‍රකාශ කළහ. මෙවැනි සෑම සිදුවීමකදීම මෙන්(2017 ගිංතොට සිදුවීම සහ 2018 දිගන සිදුවීම පිළිබඳ සඳහන් කරමින්)ගැටුම් ආරම්භ කර ඇත්තේ මුස්ලිම් පුද්ගලයින් විසින් වන නමුත්වරද සිදු කරන ලද්දේ බෞද්ධයින් විසින් යැයි විදේශ තානාපති කාර්යාල වලට පෙන්වා දෙමින් ඇති බවත් එම හිමිනම ප්‍රකාශ කළේ ය. මෙය විශාල ප්‍රශ්නයක් බව ද එම හිමියන් පැවසූහ. මෙය මුස්ලිම් හෝ සිංහල තරුණයින්ට බැටන් පොලු ප්‍රහාර එල්ල කර විසඳගත හැකි ප්‍රශ්නයක් නොවන බව හිමිනම තවදුරටත් සඳහන් කළේ ය. ප්‍රකෝප වූ ජනතාව එක් රැස් කර මෙහෙයවන්නට ගතහොත් සියළුම පොල්ගස් එල්ලුම්ගස් බවට පත්වනු ඇතැයි ද පැවසී ය. මෙහිදී හිමිනම සඳහන් කරන්නේ නඩු විමසීමකින් තොරව දඬුවම් පැමිණවීමක් පිළිබඳව ය. සංහිඳියා වැඩසටහන්වලට යොදවන මුදල් කොහේ යන්නේ දැයි හිමිනම විමසීය. ඒ පිළිබඳ නිග්‍රහශීලී ස්වරයෙන් කථා කළ හිමිනම පැවසුයේ ඒ මුදලින් බතල සිටවූයේ නම් අවම වශයෙන් එයින් බඩගින්නේ සිටින මිනිසුන්ට කන්න දෙන්නට වත් තිබුණු බවයි. මහනුවර දී යොදගත් ක්‍රමවේද මගින් මෙම ප්‍රශ්නය විසඳගත නොහැකි බව පූජ්‍ය ඥානසාර හිමියන් පැවසූහ. තනි තට්ටුවේ කඩයකට ගිනි තැබූ විට සිදුවන්නේ ඒ පුද්ගලයින් ආධාර ලබාගෙන එතැන තට්ටු තුනක ගොඩනැගිල්ලක් ඉදිකිරීම බව පවසන ලදී.

භාෂාව හැසිරවීමේ ප්‍රවීණයකු වූ පූජ්‍ය ඥානසාර හිමියන් තම ප්‍රකාශ තුළට භයංකර අදහස් කිහිපයක් ඇතුළත් කර තිබේ. ප්‍රකෝප වූ පිරිස් සෑම පොල් ගසක්ම එල්ලුම් ගසක් කර තමන්ගේ යුක්තිය පසිඳලනු ඇතැයි කීම මීට කලින් ද යොදගත් යෙදුමකි. ලබාදුන් තවත් පණිවුඩයක් නම්, තම කඩය පිළිස්සීගිය අය එම කඩ වෙනුවට අලුතින් කඩ ඉදිකරනු ඇති බවත් මෙම ව්‍යාපාරය නොකඩවා ඉදිරියට කරගෙන යායුතු බවත් ය.

**පුරවැසි බලය**

පුරවැසි බලය සංවිධානය යනු 2015 දී යහපාලන රජය බලයට ගෙන ඒම සඳහා සිවිල් සමාජය එක් රැස් කර මෙහෙයවූ ප්‍රධානතම නියෝජිතයෙකි. මහනුවර ඇති වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ද එම කණ්ඩායමට තමන්ගේ ම විශ්ලේෂණයක් වූ අතර, ඒ සම්බන්ධයෙන් පැවැත්වූ මාධ්‍ය හමුව පුවත්පත් කිහිපයකින් ම ආවරණය කර තිබුණි. එම කණ්ඩායමේ වඩාත්ම කැපී පෙනෙන සාමාජිකයකු වූ දඹර අමිල හිමියන් ගේ ඡායාරූපයක් ද සමගින් මවුබිම පුවත්පතේ පලවූ ලිපියක ශීර්ෂපාඨය වූයේ 'ආණ්ඩුව මේ ජාතිවාදී බල්ලන් බැඳගත යුතුයි' යන්නයි. එහි තවදුරටත් 'විරෝධතා පළ කරන ශිෂ්‍යයින් සහ ගොවීන් පලවා හරමින් පහර දෙන පොලීසිය කළේ කුමක්ද? දිගන දී පොලීසිය කළේ කුමක්ද?' යනුවෙන් සඳහන් විය. ඔවුන් සඳහන් කරන අන්දමට හිටපු හමුදාපති සරත් ෆොන්සේකාට නීතිය හා සාමය අමාත්‍යාංශය භාර දෙන මෙන් පුරවැසි බලය සංවිධානය ඉල්ලා සිටින විට අම්පාරේ ගැටුමක් නිර්මාණය කරවා තිබේ. එසේම 'හොරුන් ආරක්ෂා කරන' ජනාධිපතිවරයා රටේ ප්‍රශ්නවල වගකීම භාරගත යුතු ය.දැන් රටතුළ ගිනි අවුළුවන්නේ පළාත් පාලන මැතිවරණ සමයේ භාවිතා කළ ජාතිකවාදී මතවාද මගින් බව අමිල හිමියන් ප්‍රකාශ කළේ ය. ජනාධිපතිවරයා පතෝල නායකයෙක් යැයි හැඳින්වූ එම හිමිනම, රට එකමුතු කිරීමට අසමත්වීම පිළිබඳව ජනපතිවරයාට දොස් පැවරුවේ ය. ආණ්ඩුව බලයට පත් කළේ පුරවැසි බලයෙන් යැයි ප්‍රකාශ කරමින් ජනපතිවරයාට පක්ෂව ඡන්දය ලබාදුන්නේ සංහිඳියාව සහ යහපාලනය වෙනුවෙන් මිස දේශපාලන පක්ෂ සම්බන්ධයෙන් තමන්ගේ න්‍යායපත්‍ර ඉදිරියට ගෙනයාමට නොවන බව ද ප්‍රකාශ කළේ ය. දැන් මේ සමස්ථ ආණ්ඩුවම

සිතන්නේ හිටපු ජනපති මහින්ද රාජපක්ෂට එරෙහිව කිසිවක් කළ නොහැකි බවක් යැයි ද, රාජපක්ෂ හැසිරෙන්නේ තමන් මේ රටේ නිල නොවන නායකයා මෙන් යැයි ද හිමිනම තවදුරටත් ප්‍රකාශ කළේ ය.

රාජපක්ෂවරු පසුගිය මැතිවරණය පැවැත්වූයේ ජාතිවාදී හැඟීම් ඇවිස්සීම මත බව ද එම හිමියන් සඳහන් කළහ. තව ද, ඔවුන් (පුරවැසි බලය) මෙවැනි ක්‍රියාවලට සහභාගීවීම සම්බන්ධයෙන් රාජපක්ෂ ආණ්ඩුවට දොස් පවරන අතරේ මෙම යහපාලන ආණ්ඩුව යටතේ ද එය ම සිදුවන බව පැවසුයේ ය. දැන් තමන් කාට දොස් පවරන්නද? 1983 ප්‍රචණ්ඩත්වය ඇති වූයේ කිහිපදෙනෙකුගේ ප්‍රචණ්ඩකාරී ක්‍රියා හේතුවෙන් නොව බොහෝදෙනෙකු ගේ නිහඬතාවය හේතුවෙන් බව ද හිමිනම තවදුරටත් ප්‍රකාශ කළේ ය.

පුරවැසි බලය මාධ්‍ය හමුව තවත් පුවත්පතක මෙසේ වාර්තා කර තිබුණි.[68] දිනමින පුවත්පතේ වූ ලිපියේ ශීර්ෂපාඨය වූයේ 'නීතිය නිසි ලෙස ක්‍රියාත්මක වූවා නම් ප්‍රශ්නය තෙල්දෙණිය තරම් දුරකට පැතිරෙන්නේ නැහැ' යනුවෙනි.තවත් උපශීර්ෂයක 'යළිත් වරක් රට ජාතිවාදය දෙසට යොමුකිරීමට අපට ඉඩ දෙන්න බැහැ' යනුවෙන් සඳහන් විය. ඔවුහු ජාතිවාදි මතවාද පෝෂණය කිරීම සම්බන්ධයෙන් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂට සහ ඒකාබද්ධ විපක්ෂයට දොස් කීහ. එක් නියෝජිතයකු 2014 අළුත්ගම සිදුවීම ද සිහිකළේ ය. වත්මන් සිදුවීමේ දී, වඳපෙති සම්බන්ධයෙන් මතුවූ ගැටළුවක් පුද්ගලයකුගේ මරණයක් වාර්තා වූ සිද්ධියක් දක්වා ඔඩුදුවා ඇති බව ඔහු ප්‍රකාශ කළේ ය. 'ලෝකයේ කොහේවත් වඳපෙති කියලා දෙයක් නැහැ, ඒත් ශ්‍රී ලංකාවේ අපිට ඒ විද්‍යාත්මක කාරණාව තේරුම්ගන්න පුළුවත් තරම් අවබෝධයක් සහිත සමාජයක් නැහැ' ඔහු කීවේ ය. එසේ ම, නීතිය හා සාමය නිසි ලෙස ආරක්ෂා කළේ නම් මෙවැනි තත්වයක් උද නොවනු ඇති බව ඔහු පැවසී ය. රජය මෙම ගැටුම ඇතිවන්නට ඉඩ හැර, ඉන් පසුව එය පාලනය කිරීමට වෙර දැරුවා මෙන් පෙනෙයි.

මෙවැනි සිදුවීම් ඇඳිරිනීතිය පැනවීමෙන් පමණක් ම පාලනය කළ නොහැකි බව ද සඳහන් විය. රජයේ විධායකයෙන් තීරණාත්මක ක්‍රියාමාර්ග ගතයුතුව ඇති බව ඔවුහු පැවසූහ. විධායකයෙන් එය සිදු නොකෙරෙන්නේ නම් ඉන් පැහැදිලිව ම පෙනෙන්නේ වත්මන් විධායකය කලින් විධායකය ගත් මාර්ගයම අනුගමනය කරන බවකි. රට නැවතත් වරක් ජනවාර්ගික සහ ආගමික වෛරක්කාර තත්වයකට ඇදවැටෙන්නට ඉඩ නොදිය යුතු ය. මේ අවස්ථාවේ දී පොලීසිය සතුටුදයක අන්දමින් ක්‍රියාකර නොමැත. මෙයට මැදිහත්වන ලෙස දිගන ජනතාව හමුදාවෙන් ඉල්ලා සිටින්නේ එබැවිනි.

මෙම මාධ්‍ය හමුවේ දී පුරවැසි බලකායේ සාමාජිකයෝ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් රාජපක්ෂවරුන්ගේ සදෝෂත්වය දැක්වෙන විස්තීර්ණ විශ්ලේෂණයක් ඉදිරිපත් කළහ. නැවත වරක් බලයට ඒම සඳහා රාජපක්ෂවරුන් අර අඳින බවත්, සෑමවිටක ම ඔවුන් තමන් දේශපාලන තලය තුළ සක්‍රිය පාර්ශවයක් වශයෙන් පෙනී සිටින්නට වෑයම් දරන බවත් පවසන ලදී. රාජපක්ෂ ජනාධිපතිවරයා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් නැවතත් පැමිණියේ ය. වෙනත් කිසිම ස්ථානයක ජනාධිපතිවරයකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් පත්වීම සඳහා තරඟ නොවැදේ. වඩාත් මෑතකාලීනව, ජාත්‍යාලය සම්බන්ධ මතවාද මත පදනම් වෙමින් ඔවුන් පළාත්පාලන මැතිවරණයට තරඟ වැදුණු අතර ඉන් ජයගන්නා ලදී. දැන් ඔවුන් තමන් පරාජය කළ නොහැකි බලවේගයක් ය සහ කිසිවකුට තමන්ට අභියෝග කළ නොහැකිය යන ප්‍රතිරූපයක් නිර්මාණය කරමින් සිටිති.ෆොන්සේකා නීතිය හා සාමය අමාත්‍යධූරයට පත් කරන මෙන් ඉල්ලා සිටීමෙන් ඔවුන් නොසන්සුන් වී තිබේ. මක්නිසාද යත්, රාජපක්ෂ පවුලට සහ ඔවුන්ගේ ගජමිතුරන්ට එරෙහිව ඇති බොහෝ අපරාධ චෝදනා සම්බන්ධයෙන් ෆොන්සේකා යටතේ නොපමාව නීතිමය ක්‍රියාමාර්ග ගැනෙනු ඇති බැවිනි. රාජපක්ෂවරුන්ගේ ප්‍රධාන අරමුණ මේ චෝදනා මගහැර යාම වන අතර, එසේ කිරීමට නම් ඔවුන් දේශපාලන බලය අත් කරගත යුතුව තිබේ. කෙසේ නමුත්, ඔවුන්ට එසේ කිරීමට හැකිවන මැතිවරණයක් නුදුරු අනාගතයේ නොමැත. එබැවින් තමන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම වැළැක්වීම සඳහා තමන්ට කළහැකි කුමන හෝ දෙයක් කිරීමට සිදුව තිබේ. අම්පාරේ ප්‍රචණ්ඩත්වය

[68]දිනමිණ - 2018 මාර්තු 9

දිගන හා තෙල්දෙණිය සිදුවීම්වලට මගපෑදුවේ මේ හේතුවෙනි. එසේහෙයින්, ජනතාවගෙන් බහුතරයක් ජනවාර්ගික ආගමික විදිරිවාදිකම්වලින් පෙළඹවී නොසිටින අතර, සන්සුන්වන ලෙස ජනතාවට පැවසීමක් මෙහිදී අනවශ්‍ය බව තවදුරටත් සඳහන් කරන ලදී.

## 10 වැනි පරිච්ඡේදය

## දේශීය හා විදේශීය මාධ්‍ය හරහා සිදුවීමට ලබාදුන් ආවරණය

සිංහල භාෂාවෙන් පළ වන පුවත්පත්වල ප්‍රචණ්ඩත්වයෙන් දින දෙක තුනකට පසුව (මාර්තු 8 සහ 9) පළ වූ විස්තර දෙස බැලූ විට, දේශපාලන ප්‍රේක්ෂාවලියේ විවිධ ක්‍රියාධරයින් මෙම දිගන සිදුවීම් සම්බන්ධයෙන් ඉදිරිපත්කළ විවිධාකාර වාගාලංකාරයන් දැකගත හැකි ය. සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා දෙකෙහි ම පුවත්පත් මෙම සිදුවීම සම්බන්ධයෙන් වාර්තා පළකළ අන්දම දෙස පොදුවේ බලන කල පෙනී යන්නේ මුස්ලිම් ජනතාව අන්‍යයන් සේ දැකීමේ ජාතිවාදී දේශනාව පසෙකින් තබා, රට නැවතත් 'අයාලේ යාම' සම්බන්ධයෙන් ළතෝනිදීමට මුල්තැන දී ඇති බවකි. අවුරුදු ගනණාවක් තිස්සේ ඇදීගිය යුධගැටුම් පිළිබඳව, 1983 ජූලි සිදුවීම් පිළිබඳව සහ නැවතත් වරක් දේශපාලන වාසි තකා රටේ 'හසරක් නොදන්නා මහජනතාව' මෙහෙයවා ඇති අන්දම පිළිබඳව බොහෝ සඳහන් කිරීම් තිබුණි. විකල්ප සිංහල මාධ්‍ය වන රිවිර සහ රැස වැනි පුවත්පත්වල මේ සම්බන්ධයෙන් වූ විශ්ලේෂණ හා විචාර වඩාත් හොඳ දැනුවත්භාවයකින් සහ ඉතා තියුණු ලෙස ලියා තිබුණ ද, වඩාත්ප්‍රධාන ප්‍රවාහයේ පුවත්පත් වන දිවයින, දිනමිණ සහ මවුබිම වැනි පුවත්පත්වල ද, විචාරාත්මක මතවාද සහ බරපතල ප්‍රශ්නයක් වෙත අවධානය යොමුකිරීමට ඇති සූදානමක්ද දැකගත හැකිවිය.

ආණ්ඩුවට පක්ෂපාති දිනමිණ පුවත්පතෙහි 'මෙය සිදු වූයේ ඇයි?' යන සිරස්තලය යටතේ පළවූ ලිපියේ සඳහන් වන්නේ රජය විසින් ජිනීවා හි මානව හිමිකම් කවුන්සිලයට වාර්තා කළයුතු මාසය වන මාර්තු මාසයේ දී සෑමවිට ම කලබල තත්වයන් ඉස්මතු වන බවයි. රජය අසමර්ථ රජයක් වශයෙන් හුවාදැක්වීම සඳහා මෙම සිදුවීම් සිතාමතා ම සැලසුම් කරන ලද්දකැයි එම ලිපියෙන් යෝජනා කෙරේ. එක්සත් ජනපදය, බ්‍රිතාන්‍ය සහ ඔස්ට්‍රේලියාව වැනි රටවල් මෙරටට පැමිණීම සම්බන්ධයෙන් සංචාරකයින්ට අනතුරු ඇඟවීම් නිකුත් කිරීමට ඉඩ ඇති බවත්, පෙර වසරේ හොඳ මට්ටමකට පැමිණි රටේ සංචාරක කර්මාන්තය ඉන් බලපෑමට ලක් විය හැකි බවත් ලිපියේ සිහිකරවයි. සමාජ මාධ්‍ය ඔස්සේ 'ලැව් ගිනි' සේ කටකථා පැතිර ගිය බවත්, එබැවින් සමාජ මාධ්‍ය මත පැනවූ තහනම අවශ්‍ය වූ බවත් එම ලිපියේ තවදුරටත් සඳහන් විය.

වඳ පෙති සම්බන්ධ මතය සිංහල ජනගහනයෙහි වර්ධන අනුපාතයෙන් මෙන් ම විද්‍යාවෙන් ද ප්‍රලාපයක් බව ඔප්පු කෙරෙන හෙයින් වඳපෙති පිළිබඳ කථාව මෙම ලිපියෙන් නිෂ්ප්‍රභා කරයි. ජනවාර්ගික ගැටුමේ ආරම්භය සනිටුහන් කරන සිදුවීම වශයෙන් බොහෝදෙනා සලකන 1983 ජූලි මාසයේ ඇති වූ ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය පිළිබඳව කථා කරමින් මෙම ලිපියෙහි එම සිදුවීම නොවන්නට ශ්‍රී ලංකාව මේ වනවිටත් සංවර්ධිත රටක් වියහැකිව තිබූ බවට තර්ක කරයි. මෙතෙක් මෙම ලිපියෙහි මුස්ලිම් ජනතාවට විඳින්නට වූ ගැහැට පිළිබඳව කිසිදු අන්දමකින් සඳහනක් කර නොමැති නමුත්, මහනුවර ඇති වූ ප්‍රචණ්ඩකාරී සිදුවීම් වැනි සිදුවීම් රටේ ඉදිරි ගමනට අහිතකර වන්නේ ඇයි ද යන්න පිළිබඳව හේතුභූත තර්කනයක් එහි ඉදිරිපත් කරයි. ලිපියේ මීළඟ කොටසෙහි දැක්වෙන්නේ සංවර්ධනය සඳහා උපකාරී වන වත්කමක් වශයෙන් සංස්කෘතික විවිධත්වය පිළිගැනීමට ලක් කළයුතු බවයි. මහනුවර ප්‍රදේශයේ ජනතාව එකිනෙකා සමගින් ඉතා හොඳින් ජීවත් වූ බවත්, මෙම ප්‍රශ්න ඇතිකරනු ලැබුවේ 'පිටස්තරින් ආ පුද්ගලයින්' විසින් බවත් එහි තවදුරටත් සඳහන් වේ. කිසිදු ජාතියක් ශ්‍රේෂ්ඨ වන්නේ හෝ පහත් වන්නේ නැති බවත්, සියලු ම ආගමික සහ ජනවාර්ගික කණ්ඩායම්වලට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කර දී ඇති සමාන අයිතිවාසිකම් හිමිවිය යුතු බවත් සඳහන් කරමින් මෙම ලිපිය අවසන් වේ.

එ.ජා.ප. විරෝධී ස්ථාවරය සහ රාජපක්ෂවරුන්ට පක්ෂපාතීබව සම්බන්ධයෙන් සුප්‍රකට දිවයින පුවත්පත ද මෙම සිදුවීම් පිළිබඳව විචාරාත්මකව සලකා බලමින් සිදුවීම් සිද්ධ වූ ආකාරයෙන් ම වාර්තා කිරීමට යොමුවී තිබුණි. මෑතකදී පැවැත්වූ පළාත්පාලන මැතිවරණයේ දී අතිවිශාල ජයග්‍රහණයක් අත් කරගත් පක්ෂය හිමි රාජපක්ෂවරුන්ගේ අගය වර්ණනා කරමින් ආණ්ඩුව විවේචනය කිරීමට ද එහි අවස්ථාව උදාකරගෙන තිබුණි. 'රටම තිගැස්සවූ සතියක්' යන සිරස්තලයෙන් යුත් එහි එක් ලිපියක පහත පරිදි සඳහන් වී තිබුණි: 'දැන් රට ම සිතන්නේ සිංහල

මුස්ලිම් ප්‍රචණ්ඩත්වය පිළිබඳව පමණි. බැඳුම්කර වංචාව, ජීවන වියදම ඉහළ යාම ආදී මේ සියල්ලම අමතක වී ගොසිනි.' කුමන්ත්‍රණයක් සිදු වී ඇති බවට යෝජනා කරන මෙම ලිපියේ සඳහන් වන අන්දමට, මේ වනවිට ඒ.ජා.පෙ. සමගින් සම්බන්ධ වී සිටින රාජපක්ෂ පාලනතන්ත්‍රයේ හිටපු සාමාජිකයින් පිරිසක් සුළුතර කණ්ඩායම්වල ඡන්ද රාජපක්ෂගෙන් දුරස්ථ කරනු පිණිස මෙම ජනවාර්ගික වෛරය අවුළුවා තිබේ.බුද්ධි අංශවලට එරෙහිව පාර්ලිමේන්තුවේ චෝදනා එල්ල වී ඇති බව මෙම ලිපියේ සඳහන් වේ. වත්මන් ආණ්ඩුව බුද්ධි අංශවලට එරෙහිව විවිධ චෝදනා එල්ල කර, ඔවුන්ට නිග්‍රහ කර සහ බුද්ධි අංශ සාමාජිකයින් දීර්ඝ කාලයක් රිමාන්ඩ් භාරයේ තබාගනිමින් බුද්ධි අංශවල නිසි ක්‍රියාකාරීත්වයට හානි පමුණුවා තිබේ. මෙම ක්‍රියා හේතුවෙන් සමස්ථ බුද්ධි අංශයම දුර්වල වී තිබේ. රාජපක්ෂ විසින් විශේෂ ප්‍රකාශයක් නිකුත් කර, සන්සුන් වී සිටින මෙන් ජනතාවගෙන් ඉල්ලා ඇති බව ද මෙම ලිපියේ සඳහන් වේ.

රාජපක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට සහාය දක්වන චරිත හේරත් විසින් ලංකාදීප පුවත්පතට ලියන ලද තීරු ලිපියක් මගින් යෝජනා කෙරෙන අන්දමට, පළාත්පාලන මැතිවරණයේ දී රාජපක්ෂවරුන්ගේ මෙහෙයවීම යටතේ වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ජයග්‍රහණය ලැබීමෙන් පසුව රටට සැබැවින්ම නිසි දිශානතියක් නැතිවූ තත්වයක් උදා වී ඇති බැවින් මෙම ප්‍රචණ්ඩත්වය ඇති වී තිබේ. ජාතික ආණ්ඩුවට බලය ඇතත් ඒ කෙරෙහි වූ ජනතා ගරුත්වය සම්පූර්ණයෙන්ම ඊට අහිමි වී ඇති බව මෙම ලිපියෙන් තර්ක කරයි. තෙල්දෙණියේ පිරිස් පාලනය කරගත නොහැකි වූයේ මේ හේතුවෙනි.

මුස්ලිම් විරෝධියකු යැයි කියමින් මහින්ද රාජපක්ෂ වෙත එල්ල කළ චෝදනා අසත්‍ය බව පෙන්වීමට ඒකාබද්ධ විපක්ෂයට මෙය අවස්ථාවක් වන බව ද එම ලිපියේ තවදුරටත් සඳහන් වේ. යටත්විජිතවාදයෙන් මිදුනු ශ්‍රී ලංකාව, තවමත් තමන් කුමන අන්දමේ රටක් වියයුතු ද යන්න පිළිබඳව අරගලයක සිටින්නේ යැයි ලේඛකයා තර්ක කරයි. ඔහු විසින් තවත් අදහස් දෙකක් ප්‍රකාශ කර තිබේ. ප්‍රථමයෙන් ම, රටේ මුස්ලිම් ජනතාවගේ නායකයා වූ අශ්රෆ් ප්‍රබල දේශපාලන ඥනයකට හිමිකම් කියුවෙක් වූ අතර ඔහු මුස්ලිම් ජනතාව එල්.ටී.ටී.ඊ. සංවිධානය සමගින් අත්වැල් බැඳගැනීම නැවැත්වීය. එහෙත්, බදියුදීන්ට සහ හකීම්ට (ආණ්ඩුවේ සිටින ප්‍රබල මුස්ලිම් නායකයින්) අශ්රෆ් ගේ දේශපාලන බුද්ධියෙන් සුළු ප්‍රමාණයක් හෝ නොමැත. දෙවනුව, බුද්ධාගමට මෙරට හිමිකර දී ඇති ස්ථානය ආගමික සංවේදීතාවයක් පමණක් වශයෙන් නොව ශිෂ්ටාචාරමය සංවේදීතාවයක් වශයෙන් ද අවබෝධ කරගත යුතු අතර රටේ අනෙකුත් ප්‍රජාවන් මෙය අවබෝධ කරගැනීම රටේ අනාගතය සඳහා යහපත් පෙරනිමිත්තක් වනු ඇත.මහනුවර දළදා මාලිගාව හෝ අනුරාධපුර පූජනීය නගරය වැනි ස්ථාන සම්බන්ධයෙන් අන්‍යයින් විසින් ඇතිකළ හැකි අහිතකර බලපෑම් සම්බන්ධයෙන් බෞද්ධයින්ට දැනෙන්නට ඉඩ ඇති අනාරක්ෂිතභාවය පහකළ හැක්කේ ප්‍රශ්නය අවබෝධ කර ගත හැකි මධ්‍යස්ථ මතධාරීන්ට මිස දැනටමත් බෞද්ධයෙන්ගේ පිළිකුළට පාත්‍ර වී සිටින පුද්ගලයින් විසින් පූජ්‍ය භික්ෂූන්වහන්සේලාට නිගාකිරීම මගින් නොවන බවක් ඔහු තරමක් ගුප්ත ලෙසින් පවසයි.

පහත දැක්වෙන්නේ රැස පුවත්පතේ වූ ලිපියක සාරාංශයයි. මෙම පුවත්පතේ වූ බොහෝ ලිපි මහනුවර සිදුවීම සම්බන්ධයෙන් විචාරාත්මක ස්ථාවරයක් දරූ අතර ප්‍රත්‍යක්ෂ ඥනය හා සබැඳි විශ්ලේෂණයක් ඉදිරිපත් කර තිබුණි. පහත සඳහන් ලිපිය ලියා තිබුණේ මහනුවර ඇති වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වූ සංවාදවලින් ලේඛකයා දැනගත් තොරතුරු පදනම් කරගනිමිනි. බහුතර කණ්ඩායම, සුළුතර කණ්ඩායම් කෙරෙහි වගකීමෙන් යුතුව ක්‍රියා කළ යුතු ය. සමාගම් ක්ෂේත්‍රයේ ඉහළ ම මට්ටමේ දී, බහුතර කණ්ඩායම සුළුතර කණ්ඩායම කෙරෙහි එදිරිවාදිකම් සිතේ තබාගෙන සිටියි. බොහෝ අවස්ථාවල දේශප්‍රේමයේ නාමයෙන් සහ ජාත්‍යාලයේ නාමයෙන් අන්තර්-වාර්ගික ඝට්ටන නිර්මාණය කරනු ලබන්නේ දේපළ සොරාගැනීමේ අභිප්‍රායෙන් වේ. එහෙත් සිංහල ජනායා අතරින් අතිමහත් බහුතරය මෙය අනුමත නොකරයි. කෙසේ නමුත්, සුළු පිරිසක් විසින් සිදුකරන ක්‍රියාවන් හි ප්‍රතිඵලයට මුහුණ දීමට බහුතර කණ්ඩායමට සිදු වේ. මහනුවර එක්තරා දේශපාලනඥයකු සහ ඔහුගේ අනුගාමිකයින් පිරිස ප්‍රචණ්ඩත්වයට වගකිවයුතු බව තිඹිරියාගම බණ්ඩාර විසින් ලිඛිත මෙම ලිපියේ සඳහන් වේ. මෙම ලිපියේ විවෘතව ම එම සම්බන්ධතාවය පිළිබඳව දක්වා ඇති අතර, වරදකරුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී නීතිය පක්ෂපාතීබවක් නොදැක්විය යුතු බව අවවාද කරමින් මින් පෙර අවස්ථාවල දේශපාලනඥයින් විසින් මැර කණ්ඩායම්

සහ ප්‍රචණ්ඩත්වය යොදගත් අවස්ථා පිලිබඳව ද සඳහන් කරයි. 1983 කෝලාහලවල ඡායාරූපයක් සමගින් මෙම ලිපිය ඉදිරිපත් කර තිබේ.

පුවත්පත්වල වූ විචාරාත්මක විස්තරවලින් පෙන්නුම් කෙරෙන්නේ සිංහල ජනතාව බහුතරයක් තුළ වඩාත් යුක්තිසහගත දැනමුතුකම්දීමක් පවතින බවයි. එසේම මෙම වාර්තාකරණයෙන් පෙන්නුම් කරන්නේ අළුත්ගම සිදුවීමෙන් පසුව ඇති වූ තත්වයට සාපේක්ෂව මෙම අවස්ථාවේදී නිල වශයෙන් පැවති කතිකාවයි. නරක දෙයක් සිදු වූවේය යන්න සහ එහි හානි අවමකරගත යුතුය යන්න සඳහා මෙහිදී පිළිගැනීමක් ඇතිවී තිබේ. දෝෂාරෝපණය බෙදා වෙන්කිරීමක් හෝ වින්දිතයා මත ම දොස් පැවරීමක්, එනම් මුස්ලිම් ජනතාව තමන් විසින්ම මේ තත්වය උදාකරගත් බව පැවසීමක් දක්නට නොමැත. මුස්ලිම් විරෝධී අදහස්වලින් පිරී ගිය, ප්‍රජා මට්ටමේ වෘත්තාන්ත හා සසඳන කල මෙය ඊට ප්‍රතිවිරුද්ධ තත්වයකි. ඉලෙක්ට්‍රොනික මාධ්‍ය, විශේෂයෙන් ම රූපවාහිනී නාලිකා වැඩි වැඩියෙන් වගකීම් විරහිත අන්දමින් සහ බහුතරවාදී අන්දමින් තම වාර්තාකරණයේ නිරතවීම, එම මුස්ලිම් විරෝධී මතවාද ව්‍යාප්තියට හේතුවූ මූලාශ්‍රය වියහැකි බවක් පෙනෙන්නට තිබේ.

**ජාත්‍යන්තර මාධ්‍ය**

මාර්තු 6වැනි දින හදිසි තත්වයක් ප්‍රකාශ කිරීමෙන් අනතුරුව, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන ජාත්‍යන්තර මාධ්‍ය තුළ මෙම සිදුවීම් පිළිබඳ ආවරණය ශීඝ්‍රයෙන් ඉහළ ගියේ ය.[69] සෑම ප්‍රධාන මාධ්‍ය ආයතනයක් ම පාහේ ස්වකීය සාමාන්‍ය වාර්තාකරණය තුළ මේ සම්බන්ධයෙන් වාර්තා එකක් හෝ දෙකක් ඇතුළත් කර තිබුණි. කෙසේ නමුත්, හදිසි තත්වය ප්‍රකාශ කිරීමට පෙර සහ ඉන් පසුව වාර්තා වීම් සීමිත හා කඩින් කඩ විය. සිදුවීම්වල විෂයප්‍රමාණයෙන් ඔබ්බට වාර්තාකරණයේ නියැලුනේ සීමිත මාධ්‍ය ආයතන ගණනකි. ඒ අතර, රොයිටර් සහ අල් ජසීරා මාධ්‍ය ආයතන ප්‍රචණ්ඩත්වය පිළිබඳව වඩාත් සවිස්තරාත්මක ආවරණයක් සිදුකරන ලදී. එම මාධ්‍ය ආයතන දෙකම මාර්තු මාසය මුළුල්ලේ සිදුවීම් හා සබැඳි වාර්තා ගණනාවක්ම පළකරන ලදී. වඩාත් දීර්ඝ වූ විමර්ශනාත්මක වාර්තා ඔස්සේ දේශීය දේශපාලන පසුබිමට යොමුවෙමින් ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වඩාත් සියුම් ඇගැයුමක් ලබාදෙන්නට ඔවුන් වෑයම් දරා තිබුණි. පොදුවේ ගතහොත්, දින දෙක තුනක් මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තරයේ අවධානය ග්‍රහණය කරගැනීමට හැකි වුව ද එය ඊට වැඩි නොවීය.

තේමාත්මක වශයෙන් ගතහොත්, මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය යනුවෙන් නිශ්චිත වශයෙන් මෙම ප්‍රචණ්ඩකාරී සිදුවීම් සම්බන්ධයෙන් එම වාර්තා තුළ කථාකරනු ලැබුවද, ඓතිහාසික වශයෙන් පූර්වගාමී ප්‍රචණ්ඩත්ව සිදුවීම් සම්බන්ධයෙන් සහ සන්දර්භානුගත විද්‍යාමානවීම් සම්බන්ධයෙන් සිතාබැලීමක් එතුළ නොතිබුණු අතර ඇතැම් අවස්ථාවල එය ඔප්පු කිරීම්වලින් තොරව ඉදිරිපත් කර තිබුණි. ශ්‍රී ලංකාව තුළ මුස්ලිම් විරෝධී මතවාද සම්බන්ධයෙන් සලකා ඇති අන්දම ද විවිධ ආකාරයෙන් වාර්තා වී තිබුණි. උදාහරණ වශයෙන්, ප්‍රජාවන් දෙක අතර 'වර්ධනය වූ ආතතීන්' යනුවෙන් සඳහන් කළ කරුණු සඳහා ඔවුන් ඉදිරිපත් කර තිබුණු කාලරාමු එකිනෙකට බොහෝ වෙනස් විය. ඇතැමුන් මෙවැනි ප්‍රචණ්ඩත්වය අළුත් සංසිද්ධියක් වශයෙන් නම් කර තිබුණි. 'ද ඉකොනොමිස්ට්' පුවත්පතෙහි පළ වී තිබුණු ලිපියක මෙම සිදුවීම් විස්තර කර තිබුණේ 'දෙමළ ජනතාවට එරෙහිව තවමත් ඉතිරි වී ඇති එදිරිවාදිකම් මුස්ලිම් ජනතාව කෙරෙහි මාරු කිරීමට (ඒ බොහෝදෙනා තමන්ගේ මව්බස ලෙස භාවිතා කරන්නේ දෙමළ භාෂාවයි) සිංහල අන්තවාදීන් වෑයම් දරන' 'නව සමාජ විඛණ්ඩනයක්' වශයෙනි.[70]තවත් අය යෝජනා කර තිබුණේ මෙම තත්වය, 2009 යුද්ධය අවසන් වූ තැන් පටන් පැවති නැඹුරුවක නිමිත්තක් බවකි.[71] තවත් අය තම අභිමතානුකූලව,

[69]"Govt. to Declare State of Emergency for 10 days," *Daily Mirror*, 6 March 2018 http://www.dailymirror.lk/article/Govt-to-declare-State-of-Emergency-for-days--146826.html

[70]"Anti-Muslim Riots in Sri Lanka Signal a New Social Fissure," *The Economist*, 8 March 2018 https://www.economist.com/asia/2018/03/08/anti-muslim-riots-in-sri-lanka-signal-a-new-social-fissure

[71]"Fresh Violence Erupts in Sri Lanka as Muslim-Owned Restaurant Comes Under Attack," *Hindustan Times*, 11 March 2018, https://www.hindustantimes.com/world-news/fresh-violence-erupts-in-sri-lanka-as-muslim-ownedrestaurant-comes-under-attack/story-s26tFY8iCGONiq7pYsdEwN.html

මෙම නැඹුරුව ආරම්භ වූයේ 2012 වර්ෂයේදී බව සඳහන් කර තිබුණි.[72] මෙකී කාලරාමුවෙන් ඔබ්බට බරපතළකමකින් යුතුව ශ්‍රී ලංකාවේ මුස්ලිම්-විරෝධී මතවාදයන්හි ඉතිහාසය සම්බන්ධයෙන් සලකා තිබුණේ ලිපි අතලොස්සක පමණි.යම්තාක් දුරකට අපේක්ෂා කළයුතුව තිබූ සිදුවීම් වශයෙන් මෙම සිදුවීම් විස්තර කළ බොහෝ ලිපිවල මුස්ලිම්-සිංහල ආතතීන් හි ඉතිහාසයක් පිළිබඳව සඳහන් කර නොතිබූ අතර, ඒ වෙනුවට තර්ක කර තිබුණේ ජාතිවාදී ප්‍රචණ්ඩත්වය ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් පොදු දෙයක් වශයෙනි. එසේ ම, ශ්‍රී ලංකාවේ බහුතර-සුළුතර සබඳතා යන මාතෘකාව ආවරණය කිරීම සඳහා මෙම ලිපිවල වෙන් කර තිබුණේ පේළියක් දෙකක් වූ අතර ඉන් බොහොමයක සඳහන් වී තිබුණේ රටේ ජනවිකාසන සංයුතිය සහ සිවිල් යුද්ධය සම්බන්ධයෙන් කෙටියෙන් පළකළ අදහස් කිහිපයක් පමණි. දේශීය පුවත් වාර්තාවලට වඩා වෙනස්ව යමින් මෙම පුවත් වාර්තාවල මහනුවර සිදුවීම් 1983 ජූලි සිදුවීම්වලට සම කර තිබුණේ ඉතාමත් සීමිත අවස්ථා කිහිපයක පමණි.

වඳපෙති හෝ මුස්ලිම් ප්‍රජාවේ ජනගහන වර්ධනය සම්බන්ධයෙන් වූ කටකතා පිළිබඳව ඒවායේ සඳහනක් නොතිබූ තරම් ය. විදිරිවාදිකම් සඳහා පැහැදිලිකිරීම් ලබාදී තිබූ තැන්හි සාමාන්‍යයෙන් සඳහන් කර තිබුණේබලහත්කාරයෙන් ආගමට හරවාගැනීම සම්බන්ධයෙන් හෝ බෞද්ධ පූජනීය ස්ථාන විනාශ කිරීම සම්බන්ධයෙන් සිංහල පුද්ගලයින් කියාපාන කරුණු වේ.[73]

සියළුම වාර්තාවල පාහේ ‘දැඩිමතධාරී බෞද්ධ’ අංශය ප්‍රචණ්ඩත්වය පෙළඹවූ බලවේගය වශයෙන් සඳහන් කර තිබුණි.[74] බොහෝ තැන්වල, 2017 අග භාගයේ සිදුවූ රොහින්ග්‍යා විරෝධී උද්ඝෝෂණ සමගින් මෙම දෘෂ්ටිකෝණය සම්බන්ධ කර තිබුණි. එම සිදුවීම එකල ජාත්‍යන්තර මාධ්‍යවල යම් තරමක් ප්‍රචලිත විය.[75] වර්ධනය වන බෞද්ධ ජාතිකවාදය සඳහා මෑතකාලීන ඉතිහාසයේ දැකියහැකි සංඥවක් වශයෙන් පෙන්වා දී තිබුණි. අල් ජසීරා හි ‘අළුතින් ඇති වූ මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය මධ්‍යයේ ශ්‍රී ලංකාව ‘සීමාන්තයට පැමිණේ’’ යන ශීර්ෂපාඨය සහිතව පළ වූ වඩාත් දීර්ඝ ස්වරූපයේ ලිපියක, එම කතුවරුන් ප්‍රවර්ධනය කරන අදහස වූයේ මෙම ප්‍රහාර කලින් සැලසුම් කර, ‘දැඩි මතධාරී බෞද්ධ කණ්ඩායම්වලින්’ තවත් ප්‍රචණ්ඩත්වය මුදාහැරීම සාධාරණීකරණය කළ හැකි අන්දමේ මුස්ලිම් ප්‍රතිචාරයක් පොළඹවාගැනීම වෙනුවෙන් සැලසුම් කර සිදුකරන ලද්දක් විය හැකි බවකි.[76] මෑතක දී පැවැත්වූ පළාත්පාලන මැතිවරණයේදී රාජපක්ෂවරුන්ගේ ජයග්‍රහණය මගින් මෙම කණ්ඩායම් ‘නිර්භීත කරවූ’ බව ලේඛකයින් වාර්තා කරනු ලැබේ. තවත් වාර්තා සමූහයක අවධානය යොමුකර ඇත්තේ සමාජ මාධ්‍ය අවහිර කිරීමට රජය ගත් තීරණය වෙතයි. එය පොදුවේ පැහැදිලි කර ඇත්තේ මුස්ලිම් විරෝධී වාගාලංකාර පැතිරීම වැළැක්වීමට ගත් ක්‍රියාමාර්ගයක් වශයෙනි. නැවතත්, එහිදීඑය ‘දැඩි මතධාරී බෞද්ධ කණ්ඩායම්’ විසින් ‘වැරදි තොරතුරු ප්‍රචාරය’ සමගින් එය සම්බන්ධ කර තිබුණි.[77]

ඒ අනුව බලන කල, මෙහිදී දේශීය දේශපාලනය එතරම් වැදගත් තැනක ලා නොසලකා ඇති බවත් ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් දේශීය ජනමාධ්‍ය තුළ ලබාදී තිබූ තර්ක ඇතුළත් සම්පූර්ණ විස්තරය ම බොහෝවිට අඳුරු වී ඇති බවක් අපට කිව හැකිය. ජාත්‍යන්තරයේ සැලකිල්ල වැඩිවශයෙන් යොමු වී තිබුනේ හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත්කිරීම මත බවක් පෙනේ. බොහෝදුරකට ඊට එක් හේතුවක් වන්නට ඇත්තේ ජාත්‍යන්තර වශයෙන් ඇතිවෙතැයි දකින ප්‍රතිවිපාක හේතුවෙන් විය හැකිය. උදාහරණ වශයෙන් බී.බී.සී. සේවය හදිසි අවස්ථා තත්වය විස්තර කර තිබුණේ ‘සැකකරුවන් අත්

---

72“Sri Lanka Violence: State of Emergency Declared over Attacks,” *BBC News*, 6 March 2018 https://www.bbc.com/news/world-asia-43300913

73Shihar Aneez and Aditi Shah, “Hardline Sri Lanka Monk calls for Buddhist Sinhalese Government, “*Reuters*, 7 July 2019 https://www.reuters.com/article/us-sri-lanka-buddhist-idUSKCN1U2078

74“Sri Lanka Violence: State of Emergency Declared over Attacks,” *BBC News*, 6 March 2018 https://www.bbc.com/news/world-asia-43300913

75“Erasing he Rohingya, Point of No Return”, *Reuters*, May 2017 https://www.reuters.com/investigates/special-report/myanmar-rohingya-return /

76Z Rasheed, & I. Cader, “Sri Lanka ‘on the Brink’ Amid Fresh Anti-Muslim Violence,” *Al Jazeera*, March 8, 2018.https://www.aljazeera.com/news/2018/03/sri-lanka-brink-fresh-anti-muslim-violence-180307203031915.html

77A Taub and M. Fisher, “Where Countries are Tinderboxes and Facebook Is a Match,” *The New York Times*, April 21, 2018. https://www.nytimes.com/2018/04/21/world/asia/facebook-sri-lanka-riots.html

අඩංගුවට ගෙන දීර්ඝ කාලයක් රඳවා තබාගැනීමටත්, අවශ්‍ය තැන්වලට බලකා යෙදවීමටත් බලධාරීන්ට හැකියාව ලබාදෙන' අවස්ථාවක් වශයෙනි.[78] ඒ ඔස්සේ ඉස්මතු වූ තවත් තේමාවක් වූයේ, දීර්ඝ කාලයක් පවත්නා 'වරදට දඬුවම් නොලැබීමේ සංස්කෘතියක්' වශයෙන් ඇතැම් ලේඛකයින් විසින් විස්තර කළ තත්වයයි.මෙහිදී, 'මෙම කෝලාහල සඳහා හෝ 2009 අවසන් වූ යුද්ධය සඳහා වරදකරුවන් වගකියන බව සහතික කරගැනීමට' රජය අසමත් වී ඇති බැවින් 'මෙම රටාව ශ්‍රී ලංකාවට නුහුරු නුපුරුදු නොවන' බවක් යෝජනා කෙරෙන තර්ක ඉදිරිපත් කර තිබුණි.[79]වරදට දඬුවම් නොලැබීමේ සංස්කෘතිය මත අවධානය කේන්ද්‍ර කළ තර්ක ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ එය ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ සාකච්ඡාවකට ද සම්බන්ධ කර තිබුණි.[80]2009න් පසු එක්සත් ජාතීන්ගේ සංවිධානය මහින්ද රාජපක්ෂ වෙත එල්ලකළ අතීත චෝදනා පිළිබඳ සඳහන් කිරීම හැරුනුවිට වාර්තාකරුවන් විසින් මානව හිමිකම් කෝණය සෘජුවම සාකච්ඡාවට ගෙන තිබුණේ කලාතුරකිනි. ප්‍රතිසන්ධානය සම්බන්ධයෙන් සිරිසේන ලබාදුන් පොරොන්දුවල ප්‍රගතිය මෙම කෝලාහලවලින් අස්ථාවර කිරීමට ඇති ඉඩ පිළිබඳව ද ඇතැමුන් ප්‍රශ්න කර තිබුණි.[81]

වඩාත් සෘජු ලෙස අභ්‍යන්තර දේශපාලනය කෙරෙහි අවධානය යොමුකළ වාර්තා ඉලක්ක කර තිබුණේ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේදී රජයට ඇති සහ ප්‍රචණ්ඩත්වය සිදුකිරීමට සම්බන්ධව රජයට තිබිය හැකි භූමිකාව වේ. තම ආරක්ෂක ප්‍රතිපාදිතයේ යම් කොටස්වල පාලනය රජය අතින් ගිලිහී ගිය බව යෝජනා කළ වාර්තාකරුවෝ, කෙසේවෙතත්, රජයේ සම්බන්ධතාවයක් පිළිබඳ සියළු චෝදනා රජයේ නිලධාරීන් විසින් ප්‍රතික්ෂේප කළ බව වාර්තා කළහ. කෙසේ නමුත්, රොයිටර් පුවත් සේවය විසින් මාර්තු මාසයේ අග භාගයට වන්නට එක් විචාරාත්මක ලිපියක් පළකර තිබුණි. එහි සාක්ෂි දක්වමින් සඳහන් කර තිබුණේ පොලීසිය සහ 'හිටපු ප්‍රබල පාලක මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ සහාය ලැබෙන' දේශපාලනඥයින් මෙම කෝලාහලවලට සම්බන්ධ වූ බවකි.[82]ප්‍රචණ්ඩත්වය කලින් සැලසුම් කරන ලද්දක් බව ද, එය සමාජ මාධ්‍ය වේදිකා මත බෞද්ධ අන්තවාදීන්ගේ වෛරී කථනය සහ පෙළඹවීම මත නිරායාසයෙන් ඇතිවූවක් නොවන බව ද එම ලිපියෙන් තර්ක කෙරුණි. තම ආරක්ෂක ප්‍රතිපාදිතයේ යම් අංගවල, නිශ්චිතවම කියන්නේ නම් විශේෂ කාර්ය බලකායේ පාලනය ආණ්ඩුවෙන් ගිලිහී ගිය බවට වූ කියමන මෙම ලිපියෙන් අවධාරණය කරන ලදී. කෙසේ නමුත්, මෙම ලිපිය හැරුණුවිට ප්‍රහාර සඳහා වූ දේශපාලන අභිප්‍රේරණය පිළිබඳව සහ ශ්‍රී ලංකාව තුළ මුස්ලිම් විරෝධී වාගාලංකාර දේශපොලනමය වශයෙන් වාසිසහගත වියහැක්කේ ඇයිද යන්න පිළිබඳව වෙනත් ස්ථානවල සඳහන් වී තිබුණේ නැති තරම් ය.

සැකෙවින් දක්වන්නේ නම්, මහනුවර ප්‍රචණ්ඩත්වය ඇති වූ කාලයේ පළ වූ මාධ්‍ය වාර්තා විශ්ලේෂණය කළ විට හෙළිදරවු වන්නේ මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තරයේ උනන්දුව පැවතියේ ඉතා කෙටි කාලයකට බවකි. එම මාධ්‍ය මගින් සිදුකළ ආවරණය තුළ පොදුවේ දක්නට ලැබෙන්නේ ප්‍රචණ්ඩත්වය මුස්ලිම්-විරෝධී බව නිශ්චිත ලෙස හඳුනාගැනීමත්, එය ප්‍රජාවන් අතරේ වර්ධනය වූ ආතතියේ ප්‍රතිඵලයක් වූ බවත්, ශ්‍රී ලංකාවේ බෞද්ධ-මුස්ලිම් එදිරිවාදිකම්වල ඉතිහාසයත්, ප්‍රචණ්ඩත්වයට හේතු පොදු යෙදුම් ඇසුරින් සලකා ඇති බවත්, සාමාන්‍යයෙන් කෙරෙන වාර්තාකරණයෙන් ඔබ්බට කිසිවක් සිදුවී ඇත්නම් ඒ කලාතුරකින් වීමත් යන ලක්ෂණ වේ.

---

[78]"Sri Lanka Violence: State of Emergency Declared over Attacks", *BBC News*, 6 March 2018 https://www.bbc.com/news/world-asia-43300913

[79]G. Anandasangare, "Sri Lanka's Culture of Impunity Leads to Violence,"*The Star,* March 7, 2018, https://www.thestar.com/opinion/contributors/2018/03/07/sri-lankas-culture-of-impunity-leads-to-violence.html

[80]P. Wintour, "Sri Lankan Reform has 'Ground to a Halt' with Torture Used Freely-UN,"*The Guardian*, July 23, 2018.https://www.theguardian.com/world/2018/jul/23/sri-lankan-reform-has-ground-to-a-halt-with-torture-usedfreely-un

[81]A. Amza, "Sri Lanka's Communal Violence Explained," *TRT World,* March 16, 2018, https://www.trtworld.com/asia/sri-lanka-s-communal-violence-explained-15970

[82]Tom Allard and Shihar Aneez, "Police, Politicians Accused of Joining Sri Lanka's Anti-Muslim Riots," *Reuters*, 25 March 2018, https://uk.reuters.com/article/uk-sri-lanka-clashes-insight/police-politicians-accused-of-joining-srilankas-anti-muslim-riots-idUKKBN1H102O

**ජාත්‍යන්තර ප්‍රජාවේ ප්‍රතිචාරය**[83]

සීමිත ව්‍යතිරේක කිහිපයක් හැරුණුවිට, මෙම කෝලාහල සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රජාවේ ප්‍රතිචාරය සාමාන්‍යයෙන් රාජතාන්ත්‍රික ප්‍රජාවෙන් නිකුත් කළ කෙටි ප්‍රකාශ සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් නිකුත් කළ ආචාරසම්පන්න හෙළාදැකීමකට සීමා විය. එක්සත් ජාතීන් නොපමාව ප්‍රචණ්ඩත්වය හෙළා දැක්කේ ය. දේශපාලන කටයුතු පිළිබඳ දෙවන මහලේකම් ජෙෆ්රි ෆෙල්ට්මන් ශ්‍රී ලාංකික නායකයින් සමගින් තෙදින සාකච්ඡාවක් සඳහා මාර්තු 9වැනි දින දිවයිනට පැමිණියේය. මහනුවරට සංචාරය කළ ෆෙල්ට්මන් මුස්ලිම් ප්‍රජා නායකයින් හමුවූයේ ය. ෆෙල්ට්මන් විසින් 'නීතියේ හා සාමයේ බිඳ වැටීමත් මුස්ලිම් ජනතාව හා ඔවුන්ගේ දේපළ මත සිදුවූ ප්‍රහාරයත් හෙළාදකින' ලදී.[84]සංචාරය අතරතුර ෆෙල්ට්මන් ගේ වාගාලංකාරයෙන් වැඩිකොටසක් මගින් ප්‍රචණ්ඩත්වය සඳහා වරදකරුවන් යුක්තිය ඉදිරියට ගෙන ඒම සඳහා රජයේ කැපවීම පිළිබඳ විමසන ලදී. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් සයිඩ් රාද් අල් හුසේන් ද සිදුවීම් පිළිබඳ අදහස් පළ කරමින් තමන් 'සංක්‍රාන්ති යුක්ති න්‍යායපත්‍රය ඉදිරියට ගෙනයන මෙන් යළි යළිත් රජය උනන්දු කරන' බව පැවසූ අතර 'වගවීම සහ සංක්‍රාන්ති යුක්තිය සම්බන්ධයෙන් ප්‍රගතිය අත් කරගැනීම වින්දිතයින් වෙනුවෙන් කඩිනමින් සිදු කළයුතු බව' තර්ක කළේ ය. ගෝලීය වශයෙන් මානව හිමිකම්වල තත්වය පිළිබඳව නිකුත්කළ වඩාත් පුළුල් වාර්ෂික වාර්තාවක කොටසක් වූ මෙම ප්‍රකාශය ප්‍රචණ්ඩකාරී සිදුවීම් සමගින් සමපාත විය.[85]සිවිල් සමාජය රජය ඉලක්ක කළහ - රටේ සුළුතර කණ්ඩායම්වලට එරෙහිව ප්‍රචණ්ඩත්වය චිරස්ථාපනය කරන්නන් භුක්ති විඳින වරදට දඬුවම් නොලබා සිටීමේ රටාව අවසාන කරන්නට නොපමාව ක්‍රියාමාර්ග ගන්නා මෙන් ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා බලධාරීන්ගෙන් ඉල්ලා සිටින ලදී. මාර්තු 6වැනි දින පළ කළ ලිපියක ඇම්නෙස්ටි සංවිධානයේ දකුණු ආසියානු අධ්‍යක්ෂ 'හදිසි අවස්ථා තත්වයක් තවදුරටත් මානව හිමිකම් අපයෝජනය කිරීම සඳහා යොදගන්නා ව්‍යාජ හේතුවක් නොවිය යුතුය' යැයි අනතුරු අඟවන ලදී.[86]

විදේශ අමාත්‍යාංශවලින් ලබාදුන් ප්‍රතිචාරය තුළ වූ විවේචන පොදු ඒවා වූ අතර, පොදුවේ සංකල්පිත මානව හිමිකම් ආරක්ෂා කරගැනීමේ වැදගත්කම උද්දේශනය කෙරෙන ප්‍රකාශ නිකුත් කර තිබුණි. මෙම ප්‍රකාශ පොදුවේ ශ්‍රී ලංකා රජය වෙත යොමුකරන ලද ඒවා විය. යුරෝපීය සංගමයේ තානාපතිවරුන් විසින් නිකුත් කළ ඒකාබද්ධ ප්‍රකාශයක, දේශපාලන හා ප්‍රජා නායකයින් විසින් ඒකමතිකව ප්‍රචණ්ඩත්වය හෙළාදකිනු දැකීමට ඔවුන් තුළ ඇති කැමැත්ත ප්‍රකාශ කර තිබුණි. එසේ ම 'හදිසි අවස්ථා තත්වය යටතේ ගන්නා ඕනෑම ක්‍රියාමාර්ගයක් ප්‍රමාණානුකූල වනු ඇතැයි සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල අයිතිවාසිකම් හා නිදහසට ගරු කරනු ඇතැයි ද' බලාපොරොත්තු වන බව ඔවුන් ප්‍රකාශ කර තිබුණි.[87]මානව හිමිකම් සහ මූලික නිදහස ආරක්ෂා වන බව සහතික කරගැනීම සඳහා ශ්‍රී ලංකා රජය පාර්ශවයෙන් නොපමාව ක්‍රියාමාර්ග ගැනීමේ වැදගත්කම පිළිබඳව එක්සත් ජනපද තානාපති කාර්යාලයෙන් තර්ක කර තිබුණි.[88]'මුස්ලිම් පුද්ගලයින් ඉලක්ක වූ අන්තර්-වාර්ගික ප්‍රචණ්ඩත්වය' සම්බන්ධයෙන් තමන්ගේ රජයේ සැලකිල්ල යොමුවී ඇති බව ප්‍රකාශ කරමින් කැනේඩියානු විදේශ කටයුතු ඇමතිනී ක්‍රිස්ටියා ෆ්‍රීලන්ඩ් විසින් ප්‍රකාශයක් නිකුත් කර තිබුණි. වැරදි තොරතුරු පතුරුවන ප්‍රචාරක ව්‍යාපාර නොපමාව අවසන් කරන මෙන් උදක් ම ඉල්ලා සිටි අමාත්‍යවරිය 'සියළුම සුළුතර කණ්ඩායම්වල ආරක්ෂාව සහතික කිරීමටත්, සියළුදෙනාගේම මානව හිමිකම් සහ මූලික නිදහස ආරක්ෂා කිරීමටත්, ප්‍රචණ්ඩත්වය සඳහා වගකිවයුතු පුද්ගලයින් ඒ

---

[83]"Sri Lanka: UN Condemns Anti-Muslim Violence", *Aljazeera*, 11 Mar 2018
https://www.aljazeera.com/news/2018/3/11/sri-lanka-un-condemns-anti-muslim-violence
[84]"Sri Lanka: UN Condemns Anti-Muslim Violence", *Aljazeera*, 11 Mar 2018
https://www.aljazeera.com/news/2018/3/11/sri-lanka-un-condemns-anti-muslim-violence
[85]UNOHCHR, High Commissioner's Global Update of Human Rights Concerns, 2018,
https://www.ohchr.org/EN/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=22772
[86]Amnesty International, *Sri Lanka: State of Emergency must Respect Human Rights*, 2018,
https://www.amnesty.org/en/latest/news/2018/03/sri-lanka-soe-must-respect-human-rights/
[87]EEAS, *EU Ambassadors Call for Perpetrators of Hate Crimes to be Swiftly Brought to Justice*. 2018,
https://eeas.europa.eu/delegations/sri-lanka/40968/node/40968_tk
[88]U.S. Embassy in Sri Lanka, *Statement from the U.S. Embassy, 2018* https://lk.usembassy.gov/statement-u-s-embassy/

සඳහා වගවන බව සහතික කරගැනීමටත් කටයුතු කරන මෙන්' රජයෙන් ඉල්ලා සිටියා ය.[89]චීන විදේශ අමාත්‍යාංශයේ ප්‍රකාශක ගෙං ෂුවෑං අනෙත් අතට යෝජනා කර සිටියේ මෙම කරුණ 'ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර කටයුත්තක්' බවයි.[90]

2018 මාර්තු 7වැනි දින ප්‍රකාශයක් නිකුත් කළ ඉස්ලාමික සහයෝගිතා සංවිධානය 2018 පෙබරවාරි 28 සහ මාර්තු 4 ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාවට එරෙහිව අන්තවාදී කලහකාරී පිරිස් විසින් මුදාහල, නැවත නැවතත් සිදු වූ ප්‍රචණ්ඩත්ව සිදුවීම් සම්බන්ධයෙන් බරපතළ ලෙස තම අවධානය යොමු වී ඇති බැව් ප්‍රකාශ කරන ලදී.[91]එම සංවිධානයේ මහලේකම් ආචාර්ය යූසුෆ් අල්-ඔතයිමීන්, අන්තවාදී කණ්ඩායම් විසින් ප්‍රචාරණය කරන වෛරය සහ ප්‍රචණ්ඩත්වයට ආමන්ත්‍රණය කිරීමටත්, ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාවගේ දේපළ හා ජීවනෝපාය ආරක්ෂා කෙරෙන බව සහතික කරගැනීමටත් ප්‍රත්‍යක්ෂ ක්‍රියාමාර්ග ගන්නා මෙන් ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටියේ ය. එසේ ම, ප්‍රජාවන් අතර සන්සුන් හා සාමකාමී සබඳතා ඇති කරගන්නා මෙන් ඉල්ලා සිටි ආචාර්ය යූසුෆ් අල්-ඔතයිමීන් නීතියේ ආධිපත්‍ය ක්‍රියාත්මක කරන මෙන්, සිදුවීම් විමර්ශනයට ලක් කරනමෙන් සහ වරදකරුවන් යුක්තිය ඉදිරියට පමුණුවන මෙන් ආණ්ඩුව උනන්දු කළේ ය.[92]

**පසුවදන සහ අවසාන නිර්දේශ**

2018 මහනුවර දිස්ත්‍රික්කයේ ඇතිවූ ප්‍රචණ්ඩත්වය, ඉන් පසුව සිදුවූ සිදුවීම් වන දේශීය මුස්ලිම් සටන්කාමීන් විසින් සිදුකළ පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාර, ඊට සති කිහිපයකට පසු වයඹ පළාතේ මුස්ලිම් ගම්මාන මත සිදුකළ ප්‍රහාර, සහ වඩාත් මෑතකාලීනව කෝවිඩ්-19 වසංගතය අතරතුර සහ මැතිවරණ ව්‍යාපාරය අතරතුව වර්ධනය වූ මුස්ලිම් විරෝධී මතවාද යන පසුබිමෙහි සලකා බලන කල ඉන් උගත හැකි පාඩම් බොහෝ ය. විශේෂයෙන් ම, 2018 මහනුවර සිදුවීම, ශ්‍රී ලාංකික ජනතාව අතරේ මුස්ලිම් ජනතාව විශේෂයෙන් කේන්ද්‍ර කරගත් සුළුතර කණ්ඩායම් විරෝධී සමුද්දේශ රාමුවක් ක්‍රමානුකූල ලෙස සකස් කිරීමේ ක්‍රියාවලියේ විශේෂ පුරුකක් වශයෙන් පවතියි. මෙම සුළුතර කණ්ඩායම් විරෝධී මතවාදය 2012 පටන් වගාකොට පෝෂණය කරන ලද්දක් වන අතර ඉන් පසුව එළඹුනු වර්ෂයන්හි දී එය විවිධ දේශපාලන සහ ආර්ථික අවශ්‍යතා සඳහා ප්‍රයෝජනයට ගෙන තිබේ.

2012 පටන් සංවිධානාත්මකව සිදුවන මුස්ලිම් විරෝධී අදහස් ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම සම්බන්ධයෙන් අද වනතුරුත් රජයෙන් ප්‍රතිවිරෝධය පෑම සිදුවී ඇත්තේ සුළුවෙනි. යුද්ධය අවසන් වූ වහාම සිදු වූ පශ්චාත් යුධ සිංහල ආධිපත්‍ය උත්කර්ෂවත් කිරීමේ කොටසක් වශයෙන් මුස්ලිම් විරෝධී ව්‍යාපාරයට පෝෂණය වී වැඩෙන්නට පාලනතන්ත්‍රය විසින් ඉඩ හරින ලදී. එම පාලන තන්ත්‍රය, ස්වකීය රාජවංශික අභිලාෂ සුජාත කිරීමටත්, මුදුන්පත් කරගැනීමටත් පශ්චාත් යුධ විජයග්‍රහණ වාගාලංකාරය සහ සුළුතර කණ්ඩායම් ආන්තීකරණයේ වාගාලංකාරය යොදාගන්නා ලදී. එම පාලන තන්ත්‍රය 2015 දී පරාජය වූ විට පීඩාවෙන් සිටි මුස්ලිම් ජනතාවට ඇති වූ සහනයක් ගෙනදුන් හැඟීම් මහනුවර සිදුවීමත් සමගින් නැති වී ගියේ ය. නව යහපාලන ආණ්ඩුව ප්‍රචණ්ඩත්වයට සහාය දෙන බවක් හෝ අවම වශයෙන් ප්‍රචණ්ඩත්වය ඇතිවීම වළක්වාගැනීමට අසමර්ථ/ උනනදුවක් නොදක්වන බවක් පෙනෙන්නට විය. යහපාලන රජයේ පාලන සමය තුළ විරුද්ධ පාර්ශවය තවදුරටත් ස්වකීය වේදිකාවේ කොටසක් වශයෙන් සුළුතර කණ්ඩායම් විරෝධී වාගාලංකාර යොදාගත් අතර බලයේ සිටි ආණ්ඩුව බහුත්වවාදය සම්බන්ධ යෙදුම් භාවිතා කරමින්, පශ්චාත් යුධ 'සංහිඳියා' ක්‍රියාවලියේ නිරතවෙමින් සිටියද, විරුද්ධ පාර්ශවයේ එකී වාගාලංකාරය තර්ජනයක් ලෙසින් හඳුනාගැනීමට හෝ එය එලදායී අන්දමින් නිෂ්ප්‍රභා කරදැමීමට අසමත් විය.විරුද්ධ පාර්ශවයේ ස්ථාවරය, දේශපාලන තර්ජනයක් මිස වෙනයමක් ලෙස ආණ්ඩුවෙන් සලකා නොමැති බවක් පෙනෙන්නට ඇති අතර, ඒ සඳහා විකල්පයක් ඉදිරිපත් කිරීමට එතරම් යමක් කර

---

89 "Canada Deeply Concerned by Violence in Sri Lanka", Global Affairs Canada, 7 March 2018 https://www.canada.ca/en/global-affairs/news/2018/03/canada-deeply-concerned-by-violence-in-sri-lanka.html

90 http://lk.china-embassy.org/eng/xwdt/t1540295.htm

91 "OIC Calls upon Government to take Immediate Action to Protect Muslims in Sri Lanka," Organisation of Islamic Cooperation, March 2018 https://www.oic-oci.org/topic/?t_id=17455&t_ref=9254&lan=en

92 එම

නොමැත (හනීෆා 2018). වර්තමානයේ දී, සිංහල බහුතරවාදී හිමිකම පිළිබඳ හැඟීම සිත් සතන් තුළ ගැඹුරින් කා වැදී ඇති අතර එදිනෙදා භාවිතා කරන භාෂාව තුළ පවා දරුණු වූ මුස්ලිම් විරෝධී මතවාද ඇතුළුව සුළුතර කණ්ඩායම් විරෝධී න්‍යාය සාමාන්‍යකරණය වී තිබේ. 2019 ජනාධිපතිවරණයෙන් පසුව ඉස්මතු වූ ක්‍රමවේදය, බහුතරය හා සුළුතරය අතරේ ඇති ධුරාවලිගත වෙනස පිළිබඳව වූ ගැහැටකාරී හැඟීමෙන් වාසි ලබාගන්නා අන්දමේ දේශපාලනයකට කැපවී ඇත.එහෙත්, වර්තමාන මැතිවරණ ව්‍යපාරය තුළ සක්‍රිය විරුද්ධ පාර්ශවයේ කණ්ඩායම් කිසිවක් විසින් මේය විවෘතව විවාදයට ලක් කර නැත. ඉන් ගම්‍ය වන්නේ ප්‍රධාන කතිකාව තුළ ඇති වෙනස්කම් වන්නේ ප්‍රමාණය සම්බන්ධයෙන් ඇති වෙනස්කම් බවකි. ආරක්ෂාකරණය සහ හමුදාකරණය මත පදනම් වූ වත්මන් ජනාධිපතිවරයාගේ මැතිවරණ වේදිකාව බිය සහ අනාරක්ෂිතබව පෝෂණය කිරීම මත ශක්තිමත් වන අතර ප්‍රශ්නයට භාජනය නොවූ බෞද්ධ ආධිපත්‍යයෙන් දැවී තරමට මව්යට වාසි වේ.

යුද්ධය අවසාන වූ වහාම එළඹිසමයේ දී වෛරී වාගලංකාරවලට එරෙහිව සිවිල් සමාජය ඒකරාශී වී මෙහෙයවීම ද සිදුවූයේ සෙමෙනි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සමාජ මාධ්‍යතුළ සිදුවන වෛරී කථනය අධීක්ෂණය කිරීම, ඊට ව්‍යතිරේක වශයෙන් සිදුවූ කටයුතු අතලොස්සෙන් එකකි. කෙසේ නමුත්, පාස්කු බෝම්බ ප්‍රහාරවලින් පසුව, එවැනි කණ්ඩායම් කිහිපයක්ම ඇති වූ අතර Watch Dog සහ Hate Speech Monitor ඒවායින් කිහිපයක් වේ. වෛරී කථනය සිදුකළ විට අදාළ සමාජ මාධ්‍ය වෙබ් අඩවි මගින් ඒවා ඉවත් කරවාගැනීමට සාර්ථකව කටයුතු කිරීම සඳහා මෙම අධීක්ෂණ කණ්ඩායම් හා සංවිධාන සමත් වෙමින් සිටිති. කෙසේ නමුත්, විද්‍යුත් මාධ්‍ය ආයතන විසින් විවෘතව ම ජාතිවාදී අන්තර්ගතය විකාශය කිරීම තවදුරටත් පාලනයකින් තොරව සිදුවෙමින් පවතියි. මුස්ලිම් විරෝධී වාගාලංකාර සහ අදහස් පිළිගැනීමට සමාජය දක්වන සූදානම සහ ස්වකීය දේශපාලනය තුළ එවැනි වාගාලංකාර යොදාගැනීමට වත්මන් පාලනතන්ත්‍රය දක්වන කැපවීම සලකා බලන කල, මාධ්‍යවල මෙම ප්‍රතිපත්තියක් නොමැති ක්‍රියා පුදුමයට කාරණයක් නොවන්නා සේම ඒවාට විරුද්ධවීම සඳහා ඉඩ ද අල්ප කරවයි.

මහනුවර සිදුවීමෙන් පසුව වරදකරුවන් ලෙස චෝදනා ලැබූවන් විශාල සංඛ්‍යාවක් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුති පනත යටතේ ඇප රහිතව රිමාන්ඩ් බන්ධනාගාරගත කරන ලදී. කෙසේ නමුත්, එම නඩු කටයුතු ඉදිරියට ගෙන ගොස් නොමැති අතර අත් අඩංගුවට ගත් බොහෝදෙනා දැන් නිදහස් කර තිබේ. වර්තමානයේ දී සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිපනත යොදාගැනෙන්නේ විරුද්ධ මත දරන්නන් මැඩලීමටයි. එය කොතරම් දුරකට සිදුවන්නේ ද යත්, වෛරී කථනයේ නිරත වන්නන්ට සහ සුළුතර කණ්ඩායම්වලට එරෙහිව ප්‍රචණ්ඩත්වය අවුළුවන්නන්ට එරෙහිව එය යොදාගැනීම පසුව ආ අදහසක් මෙන් පෙනී යයි. මෑතකදී, මුස්ලිම් මාධ්‍යවේදියකු හා ලේඛකයකු වූ රම්සි රසීක් මුස්ලිම් විරෝධී ජාතිවාදයට එරෙහිව මතවාදීය ජිහාඩයක් ඉල්ලා සිටි විට, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිපනතේ 3වැනි වගන්තිය යටතේ ඔහුට විරුද්ධව චෝදනා කරන ලදී. මෙම වාර්තාව සම්පූර්ණ කරන අවස්ථාව වන විටත් ඔහු රිමාන්ඩ්භාරයේ සිටියි.

යුද්ධය අවසන් වූ තැන් පටන් වගාකර පෝෂණය කරන්නා වූ මුස්ලිම් විරෝධී මතවාද ප්‍රකාශනය තුළ රටාවක් තිබේ. මැතිවරණ සමයේ දී සහ අප්‍රේල් මාසයේ සිංහල දෙමළ අළුත් අවුරුද්දට සාප්පු සවාරි ආරම්භ වන සමයේ දී මෙය විශේෂයෙන් බලපැවැත්වේ. වෛරී වාගාලංකාර පැතිරී යාම සක්‍රීය ලෙස මැඩපවත්වන ප්‍රතිචාර ක්‍රියාවලියක් ක්‍රියාධර කණ්ඩායම් විසින් සංවිධානය කිරීම අත්‍යාවශ්‍ය වේ. මුස්ලිම් පුද්ගලයා යක්ෂයෙකු මෙන් පිළිබිඹු කිරීම සහ මුස්ලිම් පුද්ගලයාගේ පුද්ගලත්වය සිඳලීම කොතරම් දුරකට තීව්‍ර වී ඇත් ද යත්, කෝවිඩ්-19 අර්බුදය අතරතුර ජාත්‍යන්තරයේ පුළුල්ව පිළිගත් පූර්වාදර්ශ සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශ නොතකා මුස්ලිම් මළසිරුරු භූමදාන කිරීම ප්‍රතික්ෂේප කිරීම කළයුතු යුක්තිසහගත දෙය වශයෙන් සලකන ලදී. එහිදී, මුස්ලිම් ජනතාව සැලකිල්ල යොමුකරන කරුණු සඳහා ඉඩ දීමට තබා ඒවාට ආමන්ත්‍රණය කිරීමට වත් කිසිදු වෑයමක් නොදැරූ අතර, දේශපාලනඥයින් සහ වෛද්‍ය-විද්‍යා ප්‍රජාව විසින් එවැනි

ඉඩසැලසීමක් කිරීම අවශ්‍ය බවක් හෝ සිතා බැලුවේ නැත.[93]මුස්ලිම් ජනතාව අදාළ නොවන බවට සහ ඔවුන්ගේ ද්‍රෝහීත්වය සම්බන්ධයෙන් වන එවැනි අදහස් පවතින පසුබිමක එවැනි අදහස් වර්ධනය වන්නට පටන් ගන්නා විට, විශේෂයෙන්ම කලින් කලට සමාජ මාධ්‍ය තුළ ඉස්මතුවන විට, යොදගත හැකි ප්‍රතිචාර යාන්ත්‍රණ සූදනම් කරතැබීම අත්‍යාවශ්‍ය වේ.

අනාගතය පිළිබඳ එතරම් සුභ පෙරනිමිති නොපෙන්වන්නා වූ භයානක, අන්තර්-ප්‍රජා බෙදීම් රේඛා ඇති කරවමින්, ප්‍රචණ්ඩත්වයේ ප්‍රතිවිපාකයක් ලෙස ප්‍රජාව බිඳී විසිරීගිය ආකාරය දිගන හා ඒ අවට ප්‍රදේශවල දී නිරීක්ෂණය කිරීමට අපට ලැබුණු ප්‍රවේශය හරහා ලැබූ දැනුම හා අවබෝධය මත මෙම නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ. එබැවින් මෙම නිර්දේශ ප්‍රජාතන්ත්‍රවාදයේ සහ ශ්‍රී ලංකාවේ ඇති අර්බුදයකට ආමන්ත්‍රණය කරන අතර රටේ විවිධ ක්ෂේත්‍ර පුරා ඒවායෙයහි ප්‍රතිඵල ගෙන දෙනු ඇත. සුළුතරය ආන්තීකරණය කිරීමේ වාගාලංකාරය වර්ධනය කිරීම ශක්තිමත් වන්නේ කලින් කලට ඇතිවන ප්‍රචණ්ඩත්වයෙනි. ඒවාට ඉඩ සලසන්නා වූ කොන්දේසි පාස්කු බෝම්බ ප්‍රහාර සමගින් තවත් උග්‍ර වී තිබේ. එබැවින්, මෙම ප්‍රශ්නවලට ආමන්ත්‍රණය කිරීම නොපමාව කළයුතු වේ.

**මතවාදීමය හා විචාරාත්මක හේතු සහ ප්‍රතිවිපාක**

1. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුති පනත යටතේ අත් අඩංගුවට ගෙන ඇප රහිතව රිමාන්ඩ් බන්ධනාගාරගත කිරීමට තරම් වරදක් වන යමක් තමන්ගේ දායකයින් විසින් සිදුකළ බවක් බොහෝ භික්ෂූන් වහන්සේලා නොසිතූහ. වාර්තාවේ දැක්වෙන අන්දමට, 'එවැනි ක්‍රියා' සිදුකළහොත් ඇප රහිතව අත් අඩංගුවට ගන්නා බවක් ජනතාව දැනුවත් කර තිබිය යුතු යැයි ඔවුහු පැවසූහ. යම් ප්‍රජා සම්මතයක් උල්ලංඝනය කළ බවක් පෙනෙන, එතරම් බලයක් නොමැති පුද්ගලයින්ට එරෙහිව ප්‍රජාවේ සංවිධානාත්මක කණ්ඩායම් විසින් ප්‍රචණ්ඩ ක්‍රියාමාර්ග ගැනීම ශ්‍රී ලංකාවේ ගම්මානවල සාමාන්‍යයෙන් සිදුවන පරිචයකි. ලියලමින් පැවති මුස්ලිම් 'තර්ජනය' සම්බන්ධයෙන් ද එම යාන්ත්‍රණ ඇසුරින් කටයුතු කිරීම කණගාටුදායක, එහෙත් සාමාන්‍ය සහ අමුත්තක් නොමැති දෙයක් වශයෙන් භික්ෂූන් වහන්සේලා විසින් සැලකූ බවක් පෙනේ.

ඒ අවස්ථාවේ බලයේ සිටි ආණ්ඩුවේ අමාත්‍යවරුන් (2018 මාර්තු) එම හැසිරීම අපරාධ හැසිරීමක් වශයෙන් හැඳින්වූ අතර ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය සඳහා පොළඹවන හෝ සහභාගී වන පුද්ගලයින්ට ලබාදිය හැකි බලවත් ම දඬුවම ලබාදියයුතු බව පවසන ලදී. කෙසේ නමුත්, ප්‍රාදේශීය මට්ටමේ දී මෙම ගැටළුව එතරම් බරපතළ යැයි සලකනු නොලැබූ අතර රජයේ ක්‍රියාමාර්ග සලකනු ලැබුවේ අපරාධයේ තරමට වඩා බෙහෙවින් පමණ ඉක්මවූ ප්‍රතිචාරයක් වශයෙනි. අත් අඩංගුවට ගනු ලැබූ අය නිදහස් කරගැනීමට ප්‍රදේශයේ මුස්ලිම් ජනතාව පහසුකම් නොසැලසීම සලකනු ලැබුවේ සිංහල තරුණයින්ගේ දුක්පීඩා තවත් උග්‍ර කිරීමක් වශයෙන් සහ මිත්‍රශීලී අන්දමින් ගැටළුව විසඳගැනීමට දරන වෑයම් සිතාමතාම නැතිකරදැමීමක් වශයෙනි.

*සිදුකරන ඕනෑම දැනුවත් කිරීමේ හෝ සාමය ගොඩනැගීමේ ක්‍රියාමාර්ගයක දී මුලින් ම කළ යුතු වන්නේ ප්‍රජාවේ අනුමැතියෙන් සිදුකෙරෙන එවැනි ප්‍රචණ්ඩකාරී මැදිහත්වීම්වල නීතිවිරෝධී ස්වභාවය සම්බන්ධයෙන් පොදු එකඟතාවයක් නිර්මාණය කිරීමයි. මෙවැනි මැදිහත්වීම් තවදුරටත් නීත්‍යානුකූල ලෙස පැවතියහොත්, ජාතික මට්ටමේ බලවේගයන්ට ප්‍රචණ්ඩත්වය සඳහා ප්‍රාදේශීය ක්‍රියාකාරීන් ඒකරාශී කර මෙහෙයවිය හැකි යාන්ත්‍රණ වශයෙන් ඒවා ඉදිරියටත් ක්‍රියාත්මක වනු ඇත.*

2. ප්‍රචණ්ඩත්වය සහ හිංසනය සාධාරණීකරණය කරන මුස්ලිම් විරෝධී මතවාදය සහ තමන් නිරන්තරයෙන් තර්ජනයට මුහුණ දී සිටින්නේ යැයි මුස්ලිම් ජනතාව තුළ ඇති හැඟීම මේවන විට, ප්‍රාදේශීය මට්ටම තුළ තදින්ම කාවැදී තිබේ. සිවිල් සමාජ මැදිහත්වීම්මෙම පවත්නා තත්වය ස්වභාවික යැයි සැලකීම අභියෝගයට ලක් කිරීමටත්, එම තත්වය යම්කිසි

[93] භූමදාන කිරීමේ හැකියාව පිළිබඳ ඇගැයුම් කරන්නට මණ්ඩලයක් පත්කරන මෙන් ඉල්ලා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ ප්‍රකාශය සැලකිල්ලට ගන්නා ලදී.

ඉතිහාසයක හා දේශපාලනයක පිහිටුවිය යුතු බව තරයේ කියා සිටීමටත් කටයුතු කළයුතු වේ. රජය ද විවිධ දේශපාලන අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා, පවතින මෙම ධ්‍රැවීකරණය යොදාගැනීම සඳහා කැපවී සිටින බවක් පෙනෙන පසුබිමක් තුළ, *මෙම ධ්‍රැවීකරණය ආපසු හැරවීම සඳහා ප්‍රතිවිරුද්ධ කතිකාවක් ගොඩනැංවීමට සිවිල් සමාජය විසින් යම් ක්‍රියාමාර්ගයක් ගැනීම අත්‍යාවශ්‍ය වේ.*

3. ශ්‍රී ලංකාවේ ජනප්‍රිය පරිකල්පනය තුළ මුස්ලිම්වරුන් යනු ජාතිවාදීකරණය වූ ප්‍රජාවක්ය යන අදහස වේගයෙන් පැතිර යමින් පවතියි. ඔවුන්ගේ සියළුම ක්‍රියාවන්, මුස්ලිම්වරුන් වශයෙන් ඔවුන්ට ඇති අනන්‍යතාවයෙන් පමණක් ම පැන නගින බවක් සලකනු ලැබේ. විශේෂයෙන් ම, පාස්කු බෝම්බ ප්‍රහාරවලින් පසුව, මුස්ලිම් ජනයා සම්බන්ධයෙන් සහ මුස්ලිම්වරුන්ට ම විශේෂ යැයි සැලකෙන ව්‍යවහාරයන් සම්බන්ධයෙන් විශාල කුතුහලයක් ඇති වී තිබේ. සිදුකෙරෙන සිවිල් සමාජ මැදිහත්වීම්, එවැනි ජාතිවාදීකරණයක් සම්බන්ධයෙන් විවේචනාත්මක වන්නා වූ ස්ථාවරයක් හරහා දැනුවත් විය යුතු ය. එසේම, තනි 'මුස්ලිම් ප්‍රජාවක්' යන අදහස ඇතැම්විටෙක මුස්ලිම්වරුන් විසින් ම පවා ප්‍රචාරය කරන, ප්‍රබන්ධයක් බව අවධානයට ගතයුතු වේ. තවද, මුස්ලිම්වරුන් සියළු ම ක්‍රියා ඔවුන්ගේ මුස්ලිම්බව තුළින්ම ම පැනනගින ඒවා යැයි සැලකීම ද ප්‍රශ්න කළයුතුව තිබේ. ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනගහනය වන පුද්ගලයින් මිලියන 2 ක පමණ සංඛ්‍යාවසැලකූ විට ඔවුන් අතරේ ඇත්තේ ඉතාමත් සුළු සමානකම් කිහිපයක් පමණි. අනෙකුත් ඕනෑම අනන්‍යතාවයක දී මෙන් මෙහි දී ද, සියලු දෙනා එක සමාන යැයි උපකල්පනය කිරීම ඔවුන් අතර ඇති සැලකියයුතු වෙනස්කම් සඟවාලයි. ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන්ගේ සමාජ සෑදුම විශ්ලේෂණය කරන්නේ නම්, පන්තිය, ස්ත්‍රීපුරුෂ සමාජභාවය හා ප්‍රදේශය මෙන්ම ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ සඳහා දක්වන අනුබද්ධතාවය සහ (අදාළ වේ නම්) විවිධ ප්‍රතිසංස්කරණ කණ්ඩායම්වල සාමාජිකත්වය අනුව වෙන් වෙන් වශයෙන් සලකා බැලිය යුතු වේ. වර්තමානයේ දී, ටාරිකාස් සාමාජිකයින් වශයෙන් ('සාම්ප්‍රදායික' මුස්ලිම්වරුන් වශයෙන් හඳුන්වාගනු ලබන සුෆි මුස්ලිම්වරුන්) තමන්ව හඳුන්වාගන්නා මුස්ලිම්වරුන් සහ ප්‍රතිසංස්කරණවාදී සංවිධාන සමගින් යම් ආකාරයකින් සම්බන්ධ පුද්ගලයින් අතර වෙනස පැහැදිලිව පෙනෙන්නට තිබේ.

*බැඳී සිටීම සහ අන්‍යෝන්‍ය සහයෝගය වෙනුවෙන් තමන් 'එකම' පිරිසක් යැයි මුස්ලිම්වරුන් විසින් ම පවා කියනු ලැබුව ද මේ සම්බන්ධයෙන් කරන විශ්ලේෂණයක දී මෙකී වෙනස්කම් සැලකිල්ලට ගත යුතු වේ. ලබාදෙන ප්‍රතිචාර එම විශ්ලේෂණයෙන් දැනුවත් විය යුතු ය.*

4. 2018 දී දිගන ප්‍රදේශයේ අත්විඳි ආකාරයේ සමාජමය සහ දේශපාලනමය වශයෙන් අනුමැතිය ලත් 'වර්ගවාදී' ප්‍රචණ්ඩත්වය මූලික වශයෙන් ම පද්ධතිගත වෙනස්කොට සැලකීමේත් මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් හා මූලධර්ම පිරිහීමේත් ප්‍රතිවිපාකයකි. එසේම, ජාතික ආරක්ෂාව පිළිබඳ පටු වැටහීම් සහ තමන්ට තර්ජනයක් එල්ල වෙතැයි බහුතරය තුළ ඇති බිය සුළුතර කණ්ඩායම්වලට හා ප්‍රධාන ප්‍රවාහයට අයත් නොවන කණ්ඩායම්වලට එරෙහිව පෙළඹවීමට ලක් කිරීම මගින් ඊට පහසුකම් සලසනු ලැබේ.හමුදාකරණය සහ වෙනස් දේවල් සම්බන්ධයෙන්, විශේෂයෙන් ම සුළුතර කණ්ඩායම් සම්බන්ධයෙන් බිය පැතිරවීම හරහා මෙවැනි ප්‍රජාතන්ත්‍ර විරෝධී නැඹුරුතා ක්‍රියාත්මක වේ. ජනවාර්ගික ප්‍රතිසන්ධානය, රෝග පාලනය, ප්‍රාදේශීය පරිපාලනය සහ පොදු සුභසිද්ධිය වැනි, මූලික වශයෙන් හමුදාමය නොවන භූමිකා හා කර්තව්‍යයන් හමුදාවේ භාරයට පවරන අතර, සිවිල් සමාජයට සහ පුද්ගලයාගෙන් පුද්ගලයාට විශ්වාසය ගොඩනැංවීම සඳහා ඇති අවකාශය අයුතු ලෙස පැහැරගනු ලැබේ. සමථකරු වශයෙන් වත්මන් පසුබිම තුළ හමුදාව භාෂාමය වශයෙන්, සංස්කෘතිකමය වශයෙන්, මතවාදීමය වශයෙන් පක්ෂග්‍රාහී වන අතර; දැනටමත් ප්‍රජාවන් අතරේ භේද ඇතිකිරීමට හේතු වී ඇති, සහ ප්‍රජාතන්ත්‍රවාදී හා ස්වභාවික අන්දමින් විසඳලිය යුතු මූලික ගැටළු තවදුරටත් උග්‍ර කරවන අන්දමින් ස්ත්‍රීපුරුෂ සමාජභාවීය වීම, ජනවාර්ගීකරණය වීම හා ආගම්කරණ වීම සිදු වී ඇත.

*එබැවින්, තිරසාර, කල්පවත්නා ප්‍රතිසන්ධානය සහිත යුක්ති ක්‍රියාවලියක් ජනතාව අතරේ පිළිගැනීමට ලක්වීමට නම්, හමුදාකරණය සහ හමුදා න්‍යායයන් නිෂ්ප්‍රභා කළයුතු වන අතර මෙම පසුබිම තුළ හමුදාකරණය ඔස්සේ පුරවැසියන්ට අභිමිකරවන්නා වූ, සුරක්ෂිත ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයක් සහ හැකියාව ඇතිකරවන පරිසරයක් තුළ සාධනීය සංවාදයක*

*නිරතවීම සඳහා ජනතාවට ඉඩ දෙන පරිදි, දැනට නිර්මාණය වී ඇති වාගාලංකාරවලට එලදායී අන්දමින් එරෙහිව ක්‍රියාකළ යුතු වේ.*

**රාජ්‍යයේ සහ ආණ්ඩුවේ භූමිකාව සහ ප්‍රතිචාරය**

1. මුස්ලිම් විරෝධී මතවාද වල ව්‍යාප්තිය, ඊට ප්‍රතිවිරුද්ධව ක්‍රියාකරන ව්‍යාපාරයක් හරහා නැවැත්විය යුතු වේ. ආණ්ඩුවේ ඉහළ ම මට්ටමින් දේශපාලන නායකත්වය විසින් විශේෂයෙන් ම මුස්ලිම්වරුන් පිළිබඳව සහ පොදුවේ සුළුතර කණ්ඩායම් පිළිබඳව සහ අනෙකුත් අවදානම්පාත්‍ර කණ්ඩායම් පිළිබඳව ජාතික වාගාලංකාරය හැඩගැස්වීමට කටයුතු කිරීම හරහා මෙය සිදුකළයුතු වේ. එසේ ම, වඩාත් හොඳ දැනුවත්භාවයක් ඇති ප්‍රජාවේ දැනුඋගතුන් විසින් ප්‍රාදේශීය මට්ටමෙන් ඇතිවන සංවාදවලට මැදිහත්වීම ඔස්සේ ප්‍රාදේශීය මට්ටමින් මැදිහත්වීම් සිදුකිරීම ද අවශ්‍ය වේ. වර්තමානයේ දී මුස්ලිම්වරුන් පිළිබඳව ඇති ඒකාකෘති හරහා ඔවුන් තත්වාකාරයෙන් ම අපරාධකරුවන් ගනයෙහි ලා සලකන තත්වයක් උදාවී ඇති බැවින් එහි ප්‍රබලත්වය කොතරම් ද යත් ඊට ප්‍රතිවිරුද්ධ යමක් කීම දුෂ්කර විය හැකිය. *එබැවින්, ඊට ප්‍රතිවිරුද්ධ ව්‍යාපාරය ආණ්ඩුවේ ක්‍රමෝපායයෙහි ම කොටසක්වීම අත්‍යාවශ්‍ය වේ.*

2. පූජ්‍ය උපාලි ඥානිස්සර හිමියන්ට තමන්ගේ ගමේ ප්‍රචණ්ඩත්වය පැතිරීම පාලනය කරගත හැකි වුවත්, පල්ලි කමිටුව, පොලීසිය සහ පළාත්පාලන ආයතනවල දේශපාලනඥයින් සිදුකළ මැදිහත්වීම් හරහා සිදුවීම් සමනය කරගැනීමට හෝ මුස්ලිම් විරෝධී මතවාදය පුළුල්ව පැතිරුණු ප්‍රචණ්ඩත්වයක් කරා උත්සන්න වීම කෙසේ හෝ වළක්වාගැනීමට නොහැකි වී තිබේ. පොලීසියේ ප්‍රතිචාරය සම්බන්ධයෙන් අභ්‍යන්තර විමර්ශනයක් සිදුකරනු ලැබීය. චූදිතයින්ට එරෙහිව නඩු පැවරීම සඳහා අධිකරණයෙන් ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව රජයෙන් තවදුරටත් විමසුම් කළයුතු අතර, එවැනි නඩුකටයුතු ඉදිරියට ගෙනයාම වළක්වන යම් අඩුපාඩු පද්ධතිය තුළ ඇත්නම් ඒවා ආමන්ත්‍රණය කිරීමට කටයුතු කළයුතු වේ.

*එසේම, අනෙකුත් හදිසි අවස්ථා සේවාවන්හි ප්‍රතිචාරය සම්බන්ධයෙන් ද රජය විමර්ශනය කළ යුතු ය. උදාහරණ වශයෙන්, ගින්නකට ප්‍රතිචාර දැක්වීමට පැමිණි ගිනි නිවන රථයට ජලය පුරවාගෙන නොපැමිණියේ කෙසේද? අවධානය යොමු නොවූ අංග මොනවාදැයි සලකා බැලීමට සහ ප්‍රචණ්ඩත්වය ඇතිවීමට හා ඊට නිදහසේ ක්‍රියාත්මක වීමට ඉඩසලසන ලද කොන්දේසි මොනවාද යන්න සලකා බැලීමට වඩාත් වැඩි අවධානයක් යොමුකළ යුතු ය.*

3. මියගිය කුමාරසිංහගේ ගමේ මුස්ලිම් ජනතාවට එරෙහිව ප්‍රචණ්ඩත්වය ඇති නොවන බව සහතික කරගැනීමට පූජ්‍ය උපාලි ඥානිස්සර හිමියන්ට හැකි විය. උන්වහන්සේගේ එම ක්‍රියාවන් සමාජ ආර්ථික වශයෙන් වලංගුතාවයට පත් කරමින් ඒ අවස්ථාවේ උන්වහන්සේට උදව් කළ තරුණයින් දෙදෙනාට රැකියා ලබාදීමටත් ගමට යන මාර්ගය ඉදිකරදීමටත් කටයුතු කර රජයේ මැදිහත්වීමෙන් උන්වහන්සේගේ මුලපිරීමේ වලංගුතාවය සහතික කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව එම හිමියෝ පැවසූහ. එම හිමියන්ගේ මුලපිරීම සඳහා වලංගුතාවයක් ලබාදීම සඳහාපමණක් නොව මෙම ප්‍රජාවන් හා ඔවුන්ගේ නායකත්වය මුහුණ දෙන අනේකවිධ ගැටළු හා අභියෝග අවබෝධ කරගැනීම සඳහා සහ නිර්මිත වාර්ගික-ආගමික එදිරිවාදිකම් යන ප්‍රශ්නය කළමනාකරණය කරගත හැකි විකල්ප ක්‍රම වලට අනුමැතිය ලබාදීම සඳහා එම හිමියන්ගේ ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීම අවශ්‍ය වේ.

4. අලුත්ගම (2014) සඳහා වන්දි 2018 දී ගෙවන ලදී. මහනුවර ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වින්දිතයින්ට ගෙවූයේ සොච්චම් වන්දියක් වූ අතර ඇතැමුන්ට තවමත් එය ගෙවා නැත. අලුත්ගම දී විනාශවූ නිවෙස් සහ හානිවූ ව්‍යාපාරික ස්ථාන අළුත්වැඩියා කිරීම සඳහා හමුදාව ගෙන එන ලදී.[94] දිගන දී මෙය සිදු නොකරන ලදී. සිවිල් සමාජ ඇස්තමේන්තු අනුව, සිදුවූ හානිය රුපියල් බිලියනයක් පමණ වන නමුත් ආණ්ඩුවේ ඇස්තමේන්තුව වූයේ රුපියල් මිලියන 28 කි. එබැවින්, පීඩාවට පත් වූ ජනයාට තමන්ගේ ව්‍යාපාර නැවත ආරම්භ කරගැනීම සඳහා අවශ්‍ය කරන සම්පත් සොයාගැනීමට මුස්ලිම් ආගමික හා සිවිල් සමාජ

[94] හමුදාවට කිසිදු සම්බන්ධයක් නැති රජයේ කටයුතු සඳහා හමුදාව වැඩිවැඩියෙන් සම්බන්ධවීම අපි හෙළාදකින අතර මෙහිදී මේ පිළිබඳව සඳහන් කරන්නේ අළුත්ගම සිදුවීමේ දී නැවතඉදිකිරීමේ පිරිවැය රජයෙන් දැරූ බව පෙන්නුම් කිරීමටයි. දිගන දී එසේ නොකළ අතර, එය සැලකියයුතු කරුණක් වශයෙන් අපි සලකන්නෙමු.

සංවිධානවල සහායෙන් මුදල් එකතුකරගැනීමට සිදුවිය. ප්‍රජාවේ සම්පත් ඒකරාශී කර යෙදවීමට සිදුවූ බවත්, රජයෙන් අවශ්‍ය කරන ආධාර නොලැබුණු බවත් පීඩාවට පත්වූ මුස්ලිම් ජනයා තුළ වූ තමන් තනි වී ඇතැයි යන හැඟීම තවදුරටත් තදින් ඔවුන් තුළට කා වද්දන ලද අතර ඔවුන් වෙත අරමුදල් ලැබෙන්නට සැලැස්වූ ප්‍රජාවේ බලවත් චරිත හා ආයතන තවදුරටත් ස්ථාපිත කළේ ය.

*ආණ්ඩුවේ වන්දි යෝජනාක්‍රම කඩිනමින් ක්‍රියාත්මක කළයුතු ය. පීඩාවට පත් ප්‍රජාවන්ට රජය තමන් අත්හැර දමා ඇති බවක් නොහැඟිය යුතු ය. තවද, රජයෙන් පරිබාහිර ආයතන අනිසි ලෙස ශක්තිමත් කරවන අන්දමේ ක්‍රියා මගහරවා ගැනීම පිණිස රජයේ ආයතන විසින් කටයුතු කරන බවක් පෙනිය යුතු ය.*

5. පොලීසියේ ප්‍රතිචාරය ප්‍රමාණවත් නොවන බවක් සලකනු ලැබූ අතර බොහෝදෙනෙක් එය එම තත්වය උත්සන්න කිරීමට පවා හේතු බව සලකන ලදී. ප්‍රදේශයේ පොලිස් නිලධාරීන් ප්‍රදේශයේ ජාලවලට සහ වරදකරුවන් වශයෙන් චෝදනා එල්ලවූවන්ට පක්ෂපාතී වීම පිළිබඳව, සහ බෞද්ධ-මුස්ලිම් වෙනස්කම් පිළිබඳ වෘත්තාන්තයට ඔවුන්ගේ කැපවීම පිළිබඳව ද අප සිදුකළ සම්මුඛ සාකච්ඡාවලදී සඳහන් වුනි. ප්‍රදේශයේ පොලිස් බලකායේ කොස්තාපල්වරුන් මුළුමනින්ම පාහේ සිංහල බෞද්ධයින් වීම ප්‍රහාරවලට ප්‍රතිචාර දැක්වීමේ දී ප්‍රශ්නයක් ඇතිකරන බවක් පෙනී යයි.

*ප්‍රාදේශීය පොලිස් බලකාය තුළ ප්‍රදේශයේ සියළුම ප්‍රජාවන් වඩාත් හොඳින් නියෝජනය වී තිබිය යුතු අතර නාමිකව හෝ වගකීමක් ලෙස ඔවුන් නොසලකාමැදිහත්වීම් සිදුකිරීම සඳහා ඔවුන් සවිබලගැන්වීම අවශ්‍ය වේ.*

6. පොලීසියේ එක් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් වර්ගවාදී ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ගැටළු වලට ආමන්ත්‍රණය කිරීම සඳහා පොලීසියට ප්‍රමාණවත් තරම් පහසුකම් නොමැති බව පැවසූ අතර අනෙක් නිලධාරියා පැවසුවේ ඔවුන්ට සම්පත් බෙහෙවින් ම අඩු බවත් පුහුණුව නොමැති බවත් ය. මෙවැනි ප්‍රචණ්ඩත්වය කොතරම් දුරකට නිතර නිතර ඇතිවන්නේ ද යන්න සලකා බලන විට, එවැනි සිදුවීම් සඳහා ප්‍රතිචාර දැක්වීමට පොලීසියට හැකියාව ඇතිකරන්නට ක්‍රියාමාර්ග ගතයුතු ව තිබේ.

*අන්තර් වාර්ගික/ ආගමික ප්‍රචණ්ඩත්වය සහ වෙනස්කොට සැලකීම යනාදිය සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳව පොලීසියට සහ නීතිය ක්‍රියාත්මක කරන අදාළ අනෙකුත් කාර්යමණ්ඩල වලට (සහතික ලබාදෙන) විශේෂ පුහුණු ලබාදිය යුතු වන අතර මෙවැනි අර්බුද අවස්ථාවලදී පැහැදිලි සහ බාධා රහිත බලවරම් ලබාදී ඔවුන්ව ඒ සඳහා යෙදවිය යුතු වේ. ඔවුන් බිම් මට්ටමේ ප්‍රජාව සමගින් සම්බන්ධතා සහ විශ්වාසය ගොඩනගාගත යුතු අතර එය දීර්ඝ කාලීන සහ දිගින්දිගටම සිදුවන ක්‍රියාවලියක් වියයුතු ය.*

7. මුස්ලිම් ජනතාව කථා කරන භාෂාව කථා කරන රාජ්‍ය නිලධාරීන් නොමැතිවීමෙන් රජයේ ආයතන සම්බන්ධයෙන් මුස්ලිම් ප්‍රජාවට ඇති අවිශ්වාසය සහ රජයේ නිලධාරීන් සමගින් සම්බන්ධවීමට ඇති දුෂ්කරතාවය තවත් උත්සන්න කරවයි. විශේෂයෙන් ම, වඩාත් වැඩි මුස්ලිම් පුද්ගල සංකේන්ද්‍රනයක් ඇති ප්‍රදේශවල මෙම අසමතුලිතබව ආමන්ත්‍රණය කළයුතුව තිබේ. *රාජ්‍ය අංශයේ නිලධාරීන් අතරේ වඩාත් වැඩි සුළුතර කණ්ඩායම් නියෝජනයක් තිබිය යුතුය, විශේෂයෙන් ම පරිපාලන නිලධාරීන් අතර එසේ වියයුතු වේ.*

**සිවිල් සමාජයේ භූමිකාව සහ ප්‍රතිචාරය**

1. මහනුවර සිදුවූ ප්‍රචණ්ඩත්වය මෙන්, කලින් ම වේදිකා කළමනාකරණය කර ජනවාර්ගික වශයෙන් හානි පැමිණවීමට ඇතිකරනු ලබන 'හදිසි ඇවිලවීම්' පිළිබඳ දීර්ඝ ඉතිහාසයක් ශ්‍රී ලංකාවට තිබේ. නිසඟයෙන් ම ඇතිවූ අවිශ්වාසය සහ බිය කලක් තිස්සේ ඒකරාශී වී මේ අන්දමින් විශාල ප්‍රදේශයක් පුරා ප්‍රචණ්ඩකාරී සිදුවීම් ඇවිලයන තත්වයකට තුඩු දුන්නේ ය යන අදහස අභියෝගයට ලක් කළයුතුව තිබේ. ප්‍රේරක සඳහා ප්‍රතිචාර දැක්වීමට ඒකරාශී කර මෙහෙයවා ඇත්තේ කාවද, එසේ මෙහෙයවීමකින් හා ප්‍රචණ්ඩත්වයෙන් වැඩියෙන්ම වාසි වන්නේ කා හටද, මෙවැනි ක්‍රියා සිදුකිරීමට අවශ්‍ය සම්පත් ලබාදෙන්නේ කවුරුන්ද (පෙට්‍රල්, මුගුරු, මත්පැන්) යනාදි කරුණු දැනගතයුතු වේ. ඉහත සඳහන් කළ පරිදි ප්‍රචණ්ඩත්වයේ සංවිධානාත්මක ස්වරූපය අවධාරණය කරන අතරෙහි ම, එවැනි බලවේගවලට ක්‍රියාත්මකවීමට හැකි අන්දමේ ස්ථාන සපයාදීමට තුඩුදෙන බිම් මට්ටමේ පරිචයන් පිළිබඳ විචාරයක් මගින් එය ඌණපූරණය කළයුතු වේ. *එබැවින්, මෙවැනි සිදුවීම් සම්බන්ධයෙන් කෙරෙන ඕනෑ ම වාර්තාකරණයක දී එහි සංවිධානාත්මක ස්වරූපය පිළිබඳව අවධාරණය කළයුතු බවත් ප්‍රදේශයේ දේශපාලනය පිළිබඳ විස්තීර්ණ විශ්ලේෂණයක් සිදුකළයුතු බවත් නිර්දේශ කරමු.*

2.මුස්ලිම් විරෝධී කතිකාව සඳහා වර්තමානයේ දී විකල්ප කතිකාවක් නොමැත. ප්‍රචණ්ඩත්වයට විරුද්ධ සහ මුස්ලිම් විරෝධී ව්‍යාපාරයේ මතවාදයට එකඟ නොවන අයට සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් යහපත් බවත් නව පරම්පරාව යහපත් නොවන බවත් පැවසීම හැර ඒ සඳහා යොදගත හැකි වෙනත් විකල්ප භාෂාවක් නොමැත. *වපුරා පෝෂණය කරන ලද දැනුම් සම්භාරයක් වශයෙන් මුස්ලිම් ද්‍රෝහිකම පිළිබඳ අදහස් මෙසේ මතුවීම හා ඒවායේ දේශපාලනීකරණය අවබෝධ කරගත හැකි විකල්ප රාමුවක් ප්‍රතිවිරුද්ධ ව්‍යාපාරයක් විසින් ලබාදීම අත්‍යාවශ්‍ය වේ. බාලවියේ දීම ජනතාව අතරේ මාධ්‍ය සාක්ෂරතාවය සහ ජාතිවාදි භාෂා භාවිතය හා පණිවුඩ සම්බන්ධයෙන් වන සාක්ෂරතාවය වර්ධනය කළයුතු වේ. ජාතිවාදී හා කුපිතකරවනසුළු අන්තර්ගතය පළකෙරෙන්නේදැයි සොයාබැලීම සඳහා සමාජ මාධ්‍ය භාවිතය අධීක්ෂණයට ලක් කළයුතු වන අතර එවැනි පණිවුඩ පැතිර යාම සීමාවන අන්දමින් ඒවාට ප්‍රතිචාර දැක්වියයුතු අන්දම පිළිබඳව මහජනතාව දැනුවත් කළ යුතු ය.*

3.මෙම ක්‍රියාවන් සඳහා සහභාගිවන සිංහල බෞද්ධ තරුණයින් එසේ කිරීමට පෙළඹෙන්නේ ඇයිදැයි යන්න පිළිබඳව විශ්ලේෂණයක් කිරීම අවශ්‍ය ය. ජනවාර්ගික ආගමික හැඟීම් අතින් ඔවුන්ට වු පෙළඹවීම පමණක් ම අවබෝධ කරගැනීම ප්‍රමාණවත් නොවේ. රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියෙන් ඔවුන් ආන්තීකරණය වී තිබීම, ඔවුන්ගේ ජීවිතවලට බලපාන තීරණ ගැනීමේ වේදිකාවලින් ඔවුන් බැහැර කර තිබීම යනාදිය අසහනය පෝෂණය කරන්නා වූ සාධක වේ. *සාමය ගොඩනැංවීමේ මුලපිරීම් තරුණ පිරිස් සමගින් වඩාත් හොඳින් සම්බන්ධ වියයුතු වේ. කෝලාහලවලට වැඩිපුර ම සම්බන්ධ වූයේ තරුණයින් වන බැවින් ශ්‍රී ලංකාවේ සියළුම ජනවාර්ගික ආගමික ප්‍රජාවන් තුළ වලංගුතාවය ලබාදෙන සටන්කාමී පිරිමිබව පිළිබඳ විශ්ලේෂණයක් සහ විචාරයක් කිරීම ද අවශ්‍ය වේ.*

4.සිවිල් සමාජ මැදිහත්වීම් මුස්ලිම් විරෝධී ව්‍යාපාරයේ පන්ති මානය පිළිබඳව ද දැනුවත්විය යුතු ය. සමාජ සචලතාවය සඳහා අතිශයින් ම සීමිත අවස්ථා සහිත තරුණ පිරිස් සුළුතර කණ්ඩායම්වලට එරෙහි ප්‍රහාරවලට සහභාගි වේ; 'කෝලාහල' අතරතුර, ඉස්ලාමික ආගමික ග්‍රන්ථ විනාශ කිරීමටත් මැද පාන්තික මුස්ලිම්වරුන්ගේ දේපළ විනාශ කිරීමටත් වියරුවක් ඇති වේ. මුස්ලිම් විරෝධී මතවාදය සහ මුස්ලිම් ජනයාට එරෙහි වෛරය මීට අභිප්‍රේරණය කළ සාධක මෙන් පෙනුනද, එමෙන්ම, ප්‍රහාරයට ලක්වූ මුස්ලිම් ජනයා විවිධ උපකරණ හිමි මධ්‍යමපාන්තිකයින් පමණක්ම නොවන බව පෙනුන ද, මෙම කලහකාරීන් විසින් දේපළ කුමන ආකාරයෙන් ඉලක්ක කර ඇත්තේ ද යන්න නොසලකා සිටිය යුතු නොවේ. *මුස්ලිම්වරුන්ට එරෙහිව වපුරා පෝෂණය කළ වෛරය සහ අමනාපය දේපළ විනාශ කිරීම සඳහා ඒකරාශී කර මෙහෙයවනු ලැබීම ස්ථාන කිහිපයක ම දකින්නට තිබුණු දෙයකි. එබැවින්, එවැනි ආකාරයේ ඒකරාශී කර මෙහෙයවීම්, ජනවාර්ගික එදිරිවාදිකම් පෙන්නුම් කළත් ඒවා එකම සාධකයකට ලඝු කළ නොහැකි බව හඳුනාගෙන එය ආමන්ත්‍රණය කළයුතුව තිබේ.*

5.මුස්ලිම් ව්‍යාපාර විනාශ කිරීම, සංවිධානාත්මක කලහකාරී පිරිස්වල ප්‍රමුඛතාවයක් වූ බව අපගේ පර්යේෂණවලින් පෙනී ගියේ ය. *මෙවැනි ප්‍රචණ්ඩ සිදුවීම් අතරතුර මුස්ලිම් ව්‍යාපාර හඳුනාගෙන ඒවාට පහරදීමක් සිදුවන බව පිළිගත යුතු අතර ප්‍රදේශයේ ආර්ථිකයට ඉන් ඇතිවන බලපෑම මෙන්ම ජන කණ්ඩායමක් වශයෙන් මුස්ලිම්වරුන්ගේ ආර්ථිකය ඉලක්කය කරගෙන තිබීම සම්බන්ධයෙන් වඩාත් වැඩි අවබෝධයක් ලබාගත යුතුව තිබේ.*

6.මුස්ලිම් විරෝධී ව්‍යාපාරයට සහ මුස්ලිම්වරුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට මුස්ලිම් සිවිල් සමාජයෙන් මෙතෙක් දැක්වූ ප්‍රතිචාරය තත්කාර්ය, අසංවිධිත සහ සැලකිය යුතු *ඓතිහාසික හෝ සමාජවිද්‍යාත්මක විශ්ලේෂණයක් හෝ දීර්ඝ කාලීන සැලසුමක් පදනම් කරගත්තක් නොවේ. සංවිධානාත්මක වර්ගවාදය සහ එහි ප්‍රතිවිපාක සඳහා දක්වන මැදිහත්වීම් ජාතික මට්ටමේ දැක්මක් සහ සියළුම ප්‍රජාවන් එක හා සමාන පාර්ශ්වකරුවන් වන රටක් සඳහා වන අරමුණ පදනම් කරගෙන සිදුකිරීම වැදගත් වේ.* එවැනි, සම්බන්ධීකරණය සහිත මැදිහත්වීම් ආරම්භ වන බවක් පෙනේ. මේවා සඳහා සහායදීමට සහ ඒවා පවත්වාගෙන යාමට කටයුතු කළයුතු වේ.

7.කාලයෙන් කාලයට අඩු වැඩි වෙමින් ගලායන මුස්ලිම් විරෝධී රැලි නැවත නැවතත් ඇතිවන පසුබිමක මුස්ලිම් ප්‍රජාවන්ට දිනපතාම බියෙන් ජීවත්වන්නට සිදුව තිබීම සැලකිල්ලට ගතයුතු වේ. ප්‍රචණ්ඩත්වයෙන් දැනටමත් පීඩාවට පත්වූ අය නැවතත් ප්‍රහාර ඇතිවේ දෝයි දක්වන බිය ද ඊට ඇතුළත් වේ. අප ගිය එක් ගම්මානයක පල්ලියකට කිසිදු හානියක් සිදුකර නොතිබුණි. පහරදුන් පුද්ගලයින් ආපසු යන ගමනේ දී ඒ අවට බියෙන් තැතිගෙන බලාසිටියවුන්ට පවසා ඇත්තේ එම පල්ලිය 'ඊළඟ වතාවට' ඉතුරු කළ බවකි. තවත් ප්‍රහාරයක් සිදුවීම අනිවාර්යය බවට ඔවුන් තුළ වූ බිය ප්‍රකටව ම පෙනෙන්නට තිබුණි. මාධ්‍ය තුළ සිදුකරන නිහීන ජාතිවාදය අභිමුව, විශේෂයෙන්ම මුස්ලිම් ජනතාව ද නරඹන සිංහල රූපවාහිනි නාලිකා තුළ ඇති ජාතිවාදය අභිමුව, රටේ සෑමතැනකම සිටින මුස්ලිම් ප්‍රජාවට මේ අන්දමින් දරන්නට සිදුව ඇති මානසික බර නියත වශයෙන් ම යම් ප්‍රතිවිපාක ඇතිකරනු ඇත.  මෙම අත්දැකීම් මගින් මුස්ලිම් ප්‍රජාව මත ඇති කරවන මානසික සෞඛ්‍ය ප්‍රතිවිපාක වලට ආමන්ත්‍රණය සඳහා ක්‍රියාමාර්ග ගතයුතුව තිබේ.

# ආශ්‍රේය ලේඛන නාමාවලිය

## පුවත්පත්


Anandasangaree, G. "Sri Lanka's Culture of Impunity Leads to Violence."*The Star*, March 7, 2018.https://www.thestar.com/opinion/contributors/2018/03/07/sri-lankas-culture-of-impunity-leads-to-violence.html

"Anti-Muslim Riots in Sri Lanka Signal a New Social Fissure."*The Economist*, March 8, 2018. https://www.economist.com/asia/2018/03/08/anti-muslim-riots-in-sri-lanka-signal-a-new-social-fissure

Bandara,Kelum."FourMinistersWantActionagainstAmparaViolence."*DailyMirror*,1March 2018.http://www.dailymirror.lk/article/Four-Ministers-want-action-against-Ampara-violence-146600.html

"Clash in Digana: Police Use Teargas." *Daily Mirror*, 5 March 2018. http://www.dailymirror.lk/article/Clash-in-Digana-Police-use-teargas-146773.html

"Fresh Violence Erupts in Sri Lanka as Muslim-Owned Restaurant Comes under Attack."*Hindustan Times*, March 11, 2018.https://www.hindustantimes.com/world-news/fresh-violence-erupts-in-sri-lanka-as-muslim-owned-restaurant-comes-under-attack/story-s26tFY8iCGONiq7pYsdEwN.html

Fonseka, Piyumi. "Anti-Muslim Attacks: Process of Compensation Causes Trickle of Unease." *DailyMirror*,2019Availableathttp://www.dailymirror.lk/news-features/Anti-Muslim-attacks%3A-Process-of-compensation-causes-trickle-of-unease/131-168220[Accessed 25/10/19]

"Govt. to Declare State of Emergency for 10 days." *Daily Mirror*, 6 March 2018 http://www.dailymirror.lk/article/Govt-to-declare-State-of-Emergency-for-days--146826.html

"Kandy Communal Violence: Main Suspect Arrested." *Daily News*, March 9th 2018, http://www.dailynews.lk/2018/03/09/local/145064/kandy-communal-violence-main-suspect-arrested

"OIC Voices Concern over Attacks against Muslims in Sri Lanka."*Saudi Gazette*, March2,2018. http://saudigazette.com.sa/article/529535/SAUDI-ARABIA/OIC-voices-concern-over-attacks-against-Muslims-in-Sri-Lanka

"Muslim M Ps May Vote against P M if not Violence Controlled:Harees."*Daily Mirror*,7 March 2018. http://www.dailymirror.lk/146915/Muslim-MPs-may-vote-against-PM-if-not-violence-controlled-Harees

"No Infertility Tablets in Western Medicine: Health DG." *Daily Mirror*, 4 March 2018. http://www.dailymirror.lk/article/No-infertility-tablets-in-western-medicine-Health-DG-146732.html

Perera,Yohan and Ajith Siriwardana."Muslim MP smay Voteagainst PM ifnot Violence Controlled: Harees." *Daily Mirror*, 7 March 2018.http://www.dailymirror.lk/article/Muslim-MPs-may-vote-against-PM-if-not-violence-controlled-Harees-146915.html

Perera,Yohan."P M Orders to Probe Ampara Incident."*Daily Mirror*,4 March 2018 http://www.dailymirror.lk/146738/PM-orders-to-probe-Ampara-incident

"Police Curfew in Kandy Administrative District." *Daily Mirror*, 5 March 2018 http://www.dailymirror.lk/article/-Police-curfew-in-Kandy-administrative-district-146776.html

"President Declares State of Emergency."*Daily Mirror*, March 21, 2018. http://www.dailymirror.lk/breaking_news/President-declares-State-of-Emergency-/108-146832

Ramanayake, Indika and Tharindu Jayawardena. "Ampara: Carbohydrate Clumps; not Sterilizing Chemical- Govt. Analyst." *Daily Mirror*, 8 March 2018.http://www.dailymirror.lk/article/Ampara-Carbohydrate-clumps-not-sterilizing-chemical-Govt-Analyst-146954.html

Sanjeewa,Darshana."81SuspectsArrestedoverKandyViolence,FourduringCurfew."*Daily Mirror*,8March2018.http://www.dailymirror.lk/article/-suspects-arrested-over-Kandy-violence-four-during-curfew-146962.html

Srinivasan,Meera."It was not a Sinhala-Muslim Clash,it wa sa Mob Attackon Muslims:Sri Lanka Minister Rauff Hakeem." *The Hindu*, 14th March, 2018. https://www.thehindu.com/opinion/interview/it-was-not-a-sinhala-muslim-clash-it-was-a-mob-attack-on-muslims/article23229464.ece

Siriwardana, Ajith and Yohan Perera. "Govt. Used Digana Violence to Divert Attention: Wimal."*DailyMirror*,6March2018http://www.dailymirror.lk/article/Govt-used-Digana-violence-to-divert-attention-Wimal-146845.html

"SF Denounces Appointment of New Law and Order Minister." *Daily Mirror*, 8 March 2018 http://www.dailymirror.lk/article/SF-denounces-appointment-of-new-Law-and-Order-Minister-146966.html

"Situation under Control, Riots have Dealt a Huge Blow to Economy: PM." *Daily Mirror*, 8 March 2018. http://www.dailymirror.lk/article/Situation-under-control-riots-have-dealt-a-huge-blow-to-economy-PM-146980.html

Taub, A and M.Fisher."Where Countries are Tinder boxes and Facebook Isa Match."*TheNew York Times*, April 21, 2018. https://www.nytimes.com/2018/04/21/world/asia/facebook-sri-lanka-riots.html

Wintour, P. "Sri Lankan Reform has 'Ground to a Halt' with Torture Used Freely-UN."*The Guardian*, July 23, 2018.https://www.theguardian.com/world/2018/jul/23/sri-lankan-reform-has-ground-to-a-halt-with-torture-used-freely-un

**ප්‍රකාශන**

Amnesty International. (*Sri Lanka: State of Emergency must Respect Human Rights.*2018,https://www.amnesty.org/en/latest/news/2018/03/sri-lanka-soe-must-respect-human-rights/

Canada ca. *Canada Deeply Concerned by Violence in Sri Lanka. 2018.* https://www.canada.ca/en/global-affairs/news/2018/03/canada-deeply-concerned-by-violence-in-sri-lanka.html

"CPA calls Authorities to take Swift Action to Prevent Further Violence and to Arrestand Prosecute Individuals Advocating National, Racial and Religious Hatred."Centrefor Policy Alternative: Colombo, 6 March2018.

EEAS. *EU Ambassadors Call for Perpetrators of Hate Crimes to be Swiftly Brought to Justice.* 2018.https://eeas.europa.eu/delegations/sri-lanka/40968/node/40968_tk

Embassy of PRC in Sri Lanka. *Foreign Ministry Spokesperson's Comment on the Current Situation in Sri Lanka, 2018.*http://lk.china-embassy.org/eng/xwdt/t1540295.htm

U.S. Embassy in Sri Lanka. *Statement from the U.S. Embassy,2018* https://lk.usembassy.gov/statement-u-s-embassy/

UNOHCHR. High Commissioner's Global Update of Human Rights Concerns, 2018. https://www.ohchr.org/EN/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=22772

**පුවත් වෙබ් අඩවි**

Allard,TomandShiharAneez.“Police, Politicians Accused of Joining Sri Lanka's Anti-Muslim Riots.”*Reuters*,25March2018.https://uk.reuters.com/article/uk-sri-lanka-clashes-insight/police-politicians-accused-of-joining-sri-lankas-anti-muslim-riots-idUKKBN1H102O

Aneez, Shihar and Aditi Shah. “Hardline Sri Lanka Monk calls for Buddhist Sinhalese Government.“*Reuters*,7July2019https://www.reuters.com/article/us-sri-lanka-buddhist-idUSKCN1U2078

Amza, A. “Sri Lanka’s Communal Violence Explained.” *TRT World*, March 16, 2018.https://www.trtworld.com/asia/sri-lanka-s-communal-violence-explained-15970

Arif, Yusuf. “Main Suspect in Kandy Incident Arrested.” *Ada Derana*, March 8, 2018 http://www.adaderana.lk/news/46301/main-suspect-in-kandy-incident-arrested

Ariff, Yusuf. “Kandy Schools Closed until Further Notice.” *Ada Derana*, March 7, 2018 http://www.adaderana.lk/news/46279/kandy-schools-closed-until-further-notice

Ariff,Yusuf.“IGPD is patches 3 Special Police Teams to Kandy.”*AdaDerana*,March7,2018 http://www.adaderana.lk/news/46275/igp-dispatches-3-special-police-teams-to-kandy

Ariff,Yusuf.“Leave of al lPolice Officers Cancelled.”*AdaDerana*,March7,2018 http://www.adaderana.lk/news/46285/leave-of-all-police-officers-cancelled

Ariff,Yusuf.“Govt to Declare State of Emergency for 10 days.”*AdaDerana*,March 6,2018. http://www.adaderana.lk/news/46261/govt-to-declare-state-of-emergency-for-10-days

Ariff, Yusuf. “Govt Condemns Incidents of Violence in Ampara and Digana.” *Ada Derana*, March 6, 2018. http://www.adaderana.lk/news/46253/govt-condemns-incidents-of-violence-in-ampara-and-digana

Ariff, Yusuf.“Curfew in Kandy Administrative District during the Night.” *Ada Derana*, March 9, 2018. http://www.adaderana.lk/news/46324/curfew-in-kandy-administrative-district- during-the-night

“Compensation for Victims Soon – PM.” *Ada Derana*, March 9, 2018 http://www.adaderana.lk/news/46311/compensation-for-victims-soon-pm

De Sayrah, Amalini. “Digana: One Year On.” *GroundViews*, 2019. Available at *https://groundviews.org/2019/03/05/digana-one-year-on/*[Accessed 25/10/2019]

“Erasing the Rohingya, Point of no Return.” *Reuters*, May 2017 https://www.reuters.com/investigates/special-report/myanmar-rohingya-return

"Govt. Condemns Acts of Violence." *Daily Mirror*, 5 March 2018
http://www.dailymirror.lk/146797/Govt-condemns-acts-of-violence

"Mosque Vandalised in Ampara." *Aljazeera*, 27 Feb 2018
https://www.aljazeera.com/news/2018/02/mosque-vandalized -sri-lanka-ampara -180227144548660.html

Niwas, Afrah. "Through the Scorched Frames: The aftermath in Welekade." *GroundViews*, 03/20/2018. https://groundviews.org/2018/03/20/through-the-scorched-frames-the-aftermath-in-welekade/

"OIC Calls upon Sri Lanka Government to take Immediate Action to Protect Muslims."*Saudi Press Agency*, March 7, 2018. https://www.spa.gov.sa/viewfullstory.php?lang=en&newsid=1734420

"OIC Call sUpon Government to take Immediate Actionto Protect Muslims in Sri Lanka." Organisation of Islamic Cooperation,March 2018https://www.oic-oci.org/topic/?t_id=17455&t_ref=9254&lan=en

Perper, Rosie. "After Declaring a State of Emergency, Sri Lanka has Banned Facebook, Instagram, and WhatsApp." *Business Insider*, Mar 8, 2018, http://www.businessinsider.com/sri-lanka-bans-facebook-to-stop-violence-2018-3

"President Orders Impartial Probe into Digana Incidents." *Ada Derana*, March 5, 2018 http://www.adaderana.lk/news/46248/president-orders-impartial-probe-into-digana-incidents

Rasheed,Z&I.Cader."SriLanka'ontheBrink'AmidFreshAnti-MuslimViolence."*AlJazeera,* March 8, 2018.https://www.aljazeera.com/news/2018/03/sri-lanka-brink-fresh-anti-muslim-violence-180307203031915.html

Rasheed, Zaheena. "In Sri Lanka, Hate Speech and Impunity Fuel Anti-Muslim Violence." *Aljazeera,13Mar2018*https://www.aljazeera.com/news/2018/3/13/in-sri-lanka-hate-speech-and-impunity-fuel-anti-muslim-violence

"Sri Lanka: UN Condemns Anti-Muslim Violence."*Al Jazeera*, March 12, 2018. https://www.aljazeera.com/news/2018/03/sri-lanka-condemns-anti-muslim-violence-180311194229544.html

Silva, Manushi. "Police Curfew in Kandy Administrative District Re-imposed." *Ada Derana*, March7,2018.http://www.adaderana.lk/news/46273/police-curfew-in-kandy-administrative-district-re-imposed

“Sri Lanka: When a Government Shrugsits Shoulders & Turnsa Blind Eye to the Violence being

Perpetrated against its own Citizens..-M.A.Sumanthiran (MP,TNA).”*Sri Lanka Brief,* 12March2018.https://srilankabrief.org/2018/03/sri-lanka-when-a-government-shrugs-its-shoulders-turns-a-blind-eye-to-the-violence-being-perpetrated-against-its-own-citizens-m-a-sumanthiran-mp-tna/

“Sri Lanka Violence: State of Emergency Declared over Attacks.”*BBC,* March 6, 2018. https://www.bbc.com/news/world-asia-43300913

“Sri Lanka Declares State of Emergency after Buddhist-Muslim Clash.”*Reuter,* March 6, 2018..https://www.reuters.com/article/us-sri-lanka-clashes/sri-lanka-declares-state-of-emergency-after-buddhist-muslim-clash-idUSKCN1GI0WG

“Sri Lanka: UN Condemns Anti-Muslim Violence.” *Aljazeera,* 11 Mar 2018 https://www.aljazeera.com/news/2018/3/11/sri-lanka-un-condemns-anti-muslim-violence

“Sri Lanka Buddhist Monks Denounce Anti-Muslim Riots.” *Al Jazeera*, 9 Mar 2018, https://www.aljazeera.com/news/2018/03/sri-lanka-buddhist-monks-denounce-anti-muslim-riots-180309192840779.html

Usuf, MassL.“Protest Opposite th eMalay Military Mosque in Kandy.”*ColomboTelegraph*,June 9, 2016. https://www.colombotelegraph.com/index.php/protest-opposite-the-malay-military-mosque-in-kandy

Zubair,L.,C Malge, F Shakira,T Hadgie S Rameez, and A Nijamdeen,“Is the State Grossly Under estimating the Losses from the Mob Violence in Kandy?”*Groundviews*,24June 2018,https://groundviews.org/2018/06/24/is-the-state-grossly-underestimating-the-losses-from-the-mob-violence-in-kandy/

**වාර්තා සහ ග්‍රන්ථ**

Haniffa, Farzana, Harini Amarasuriya, Vishakha Wijenayake, Gehan Gunatillake, *Where Have All the Neighbours Gone? Aluthgama Riots and Its Aftermath:A Fact-Finding Mission to Aluthgama, Dharga Town, Valipanna, and Beruwela*. Law and Society Trust 2014, https://lstlanka.org/wp-content/uploads/2017/11/aluthgama-report-final-english.pdf

Haniffa, Farzana, *Conflict legacies and plural histories: what are the possibilities for Sri Lanka's future?* In Transitional Justice in Sri Lanka: moving beyond promises. Edited by Bhavani Fonseka. Colombo: Center for Policy Alternatives 2017.

**බ්ලොග් අඩවි**

Hewage, Senal, Cassendra Pinto and Barana Waidyatilake. "International Reactions to Anti-MuslimRiotsinSriLanka,"21March2018,https://lki.lk/blog/international-reactions-to-anti-muslim-riots/

"Kandy: What Lingers, Two Years On." http://lawandsocietytrust.blogspot.com/2020/03/kandy-what-lingers-two-years-on.html